# පොදු ගුරු මාර්ගෝපදේශය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

## දෙවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

# විෂය නිර්දේශය සහ
# ගුරු මාර්ගෝපදේශය

# දෙවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපැල : info @ nie.lk

**විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය**

**දෙවන ශ්‍රේණිය**

ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කිකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කිකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු අත්පොත් නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු අත්පොත්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු අත්පොත ශික්ෂකයා හට ද, දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු අත්පොත තවත් පෙළපොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු අත්පොත යන සම්පත් ද්‍රව්‍ය දෙකම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මිකවීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු අත්පොත පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාබුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්,
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# හැඳින්වීම

2017 වසරේ දී දෙවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 2007 වර්ෂයේ හඳුන්වා දුන් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය වසර අටක් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන සංස්කරණය කරන ලද්දකි. එසේම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩසටහන මගින් ලබාගත් තොරතුරු ද, විවිධ ආයතන මගින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබාගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මෙම සංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තම පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතුවල සංවිධානය කර ගැනීමට මග පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මග පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන් ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියක පසුවන්නන් ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැගෙන්නේත්, හැඩගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. සිසුන්ගේ ඉගෙනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ ආසන්න පරිසරය ඉතාම සාර්ථකව යොදාගත හැකි ය. මෙම වයස් සීමාවේ පසුවන සිසුන්ගේ ඉගෙනීම සම්පූර්ණයෙන්ම සිදු වන්නේ පරිසරයත් සමග අන්තර්ක්‍රියා කිරීමෙනි. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස භාවිත කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී විනෝදජනක වැඩ සහ ක්‍රීඩාවලට වැදගත් තැනක් දී තිබේ. සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථාවන් තිබීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ. එමෙන් ම ඔවුන්ගේ අනාගත ජීවිතයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීමේ පදනම ද ඇති කළ යුතුය. ඒ සඳහා පන්ති කාමරය තුළ හැකිතාක් අවස්ථා සම්පාදනය කිරීම වැදගත් ය. තමාගේ පන්තියේ ඉගෙන ගන්නා සිසුන් ඉගෙනුම් ක්‍රියාවලිය සමග කොතරම් හොඳින් සම්බන්ධ වන්නේ ද යන්න පිළිබඳව නිරන්තරයෙන් සැලකිලිමත් ව සිට අවශ්‍ය පිළියම් යොදමින් කටයුතු කිරීම ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. තක්සේරු කිරීම යනුවෙන් අදහස් කරන මෙම ක්‍රියාවලියෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ සෑම සිසුවෙකුගේම ඉගෙනීම වැඩිදියුණු කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, ගුරු විද්‍යාල, අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද සහය ලබාගන්නා ලදී. ඒ සියලු දෙනාම දැක්වූ දායකත්වය වෙනුවෙන් අපගේ කෘතඥතාව පළකරමු. එසේම නිරන්තරයෙන් අපට අවශ්‍ය මගපෙන්වීම් ලබාදෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ජයන්ති ගුණසේකර මහත්මිය ද කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇපකැප වී ක්‍රියා කළ අපගේ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ගේ හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවය ද ඉතා ඉහළින් අගය කරමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
අධ්‍යක්ෂ,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

i. **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

ii. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

iii. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව

ඉගෙනීම වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශනය :** | ආචාර්ය ජයන්ති ගුණසේකර<br>අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය |
| **අධීක්ෂණය :** | එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා<br>මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **සංස්කරණය හා සම්බන්ධීකරණය :** | ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය) |
| **විෂයමාලා කමිටුව :** | (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)<br>එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)<br>ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)<br>එස්. උදයසන්දිරන් මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)<br>ඩබ්ලිව්. ජී. එස්. කුමාර මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)<br>එස්. එම්. සඳමාලි දේශප්‍රිය මිය (කථිකාචාර්ය)<br>එච්. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. සජීවා රඹුක්වැල්ල මිය (කථිකාචාර්ය)<br>ටී. චන්ද්‍රිකා පීරිස් මිය (කථිකාචාර්ය)<br>ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය (සහකාර කථිකාචාර්ය)<br>එච්. ගයානා වනසේකර මිය (සහකාර කථිකාචාර්ය)<br>කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය (සහකාර කථිකාචාර්ය) |
| **චිත්‍ර :** | ඩබ්ලිව්. එම්. තිලක්ෂි වීරකෝන් මිය |
| **භාෂා සංස්කරණය :** | ශ්‍රීනාත් ගණේවත්ත මයා |
| **පරිගණක වචන යෙදුම :** | බී. ඒ. එන්. බටවල මිය |
| **විවිධ සහය :** | ඩබ්ලිව්. එච්. ටියුඩර් සිල්වා මයා<br>එස්. පී. ඒ. සරත් කුමාර මයා |

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම

**ජාතික පොදු නිපුණතා**

- සන්නිවේදන නිපුණතා
- පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා
- පරිසරයට අදාළ නිපුණතා
- වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
- ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා
- ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
- 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා

**දරුවන් හැඳින ගැනීම**

## 1 ප්‍රධාන අවධිය

1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය

- මව්බස
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- විෂය සමගාමී ක්‍රියාකාරකම්

**1 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**

## 2 ප්‍රධාන අවධිය

3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- විෂය සමගාමී ක්‍රියාකාරකම්


**2 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**

## 3 ප්‍රධාන අවධිය

5 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- සිසු ලැදියා හා රුචිකත්ව සඳහා වන වෛකල්ප විෂයයෝ
- විෂය සමගාමී ක්‍රියාකාරකම්

**3 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**



# 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

- වසර පහකින් සමන්විත ප්‍රාථමික අධ්‍යාපන චක්‍රය විෂයමාලා සංවර්ධන හා අනෙකුත් සංවිධාන කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.
  - 1 ප්‍රධාන අවධිය - 1 සහ 2 ශ්‍රේණි
  - 2 ප්‍රධාන අවධිය - 3 සහ 4 ශ්‍රේණි
  - 3 ප්‍රධාන අවධිය - 5 ශ්‍රේණිය
- පළමු වන ශ්‍රේණියට ඇතුළු වන දරුවන් හඳුනා ගැනීමට පහසු වන ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.
- සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේ දී සිසුන් විසින් වර්ධනය කරගත යුතු යැයි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු අඩිතාලමක් සැපයෙන පරිදි සැකසුණු විෂයමාලාවක් වීම. - නිපුණතා පාදක විෂයමාලාවක් වීම.
- විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාව හතරකට සීමා වීම.
  * භාෂාව * ගණිතය * ආගම * පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂා හා ගණිත නිපුණතාවලට අමතර ව තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. (*උදා :* සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සාරධර්ම, ශාරීරික වර්ධනය, සෞඛ්‍යය හා පෝෂණය.) මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුන්ට ගැළපෙන තේමා මඟින් මතුකර ඉගෙනීමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි තේමා 16කින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම
- පළමු වන ශ්‍රේණියේ සිට ම දිගට ම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස් වන ශ්‍රේණියේ දී සිසු ළැදියා හා අවශ්‍යතාවලට ගැළපෙන වෛකල්පික විෂයවලටත් කාලසටහන තුළ ඉඩප්‍රස්තාව සැපයීම.
- ප්‍රාථමික අවධියේ දී යොදාගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.
  - සෙල්ලම් හා විනෝදජනක වැඩ
  - ක්‍රියාකාරකම්
  - ආසනගත වැඩ
- පළමුවන ප්‍රධාන අවධියේ දී සෙල්ලම්වලට සහ ක්‍රියාකාරකම්වලට වැඩි බරක් ද ආසනගත වැඩවලට අඩු බරක් ද ලැබේ. මේ අන්දමට ප්‍රධාන අවධි තුන තුළ ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රමවේද සැකසෙන ක්‍රම අනුක්‍රමයෙන් වෙනස් වීම.
- සිසු ඉගෙනුම් ප්‍රගතිය හා දුෂ්කරතා පිළිබඳ ව තොරතුරු රැස් කිරීම පිණිස අවිධිමත් තක්සේරු කිරීම් විධිවලට ප්‍රමුඛතාව දෙන අඛණ්ඩ ව කරගෙන යා යුතු පාසල් පාදක තක්සේරු කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලැබෙන ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.
- සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින් ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන් එක් එක් ප්‍රධාන අවධි අවසානයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් ම නිපුණතාව ප්‍රදර්ශනය කළ යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.
- එක් එක් ප්‍රධාන අවධියේ දී අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලු ම සිසුන්ට ලබාදීම ඉලක්ක කරගෙන එම එක් ප්‍රධාන අවධිය එක ම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.
- එක් සිසුවකුගේ සාධනය තවත් සිසුවකුගේ සාධනය සමග සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ නිර්ණායකයක් සමඟ සාධනය සසඳා තීරණ ගැනීමට සමත් නිර්ණායක මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.
- පළමුවන ප්‍රධාන අවධියේ සිසුන්ට 6 වන ශ්‍රේණියේ සිසුන් සමඟ එක් වී සංවිධානාත්මක ව ක්‍රියාකාරකම් සහ සැලසුම්ගත සෙල්ලම්වල යෙදීමට කාර්ය සංවිධානය කිරීම.
- 2007 වර්ෂයේ සිට පළමු වන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම.
- 2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂය සඳහා ද භාවිත කිරීම.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

වර්ෂ 2016 සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙම (සංශෝධිත) ගුරු මාර්ගෝපදේශය සිසුන්ට වඩාත් අර්ථවත් මෙන් ම ගුණාත්මක බවින් යුතු ඉගෙනුමකට මඟ පෙන්වන ගුරු මාර්ගෝපදේශයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

සිසුන්ගේ ගුණාත්මක ඉගෙනුමක් සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කළ යුත්තේ කෙසේ ද යන්නට මඟපෙන්වීමක් මෙමඟින් සිදු කෙරේ.

මව්බස, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන ප්‍රධාන විෂය මෙන් ම දෙවන ජාතික භාෂාව, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, සිසු ප්‍රගතිය තක්සේරු කිරීම, සෙල්ලම් මිදුල භාවිතය යන කොටස් මෙහි අන්තර්ගත කර ඇත. මේ හැරුණු විට ගණිත විෂයය සහ ආගම් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් සකස් වූ ගුරු මාර්ගෝපදේශ ද වේ. ගණිත විෂයය සඳහා ගණිත වැඩ පොතක් ද, මව්බස විෂයය සඳහා පෙළ පොතක් සමඟ වැඩ පොතක් ද, ආගම් විෂයය සඳහා පෙළ පොතක් ද, පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් වෙනුවෙන් සකස් කර ඇත.

දරුවන් හඳුනා ගැනීමේ වැඩසටහන මඟින් අනාවරණය කරගන්නා තොරතුරුවලට අනුව සිසුන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා කිරීම සඳහා ඵලදායී ඉගෙනුමකට යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශය අර්ථවත් ව පරිශීලනය කිරීම අවශ්‍ය වේ. එබඳු සාර්ථකත්වයක් කරා ළඟා වීමට නම් මෙම ගුරු මාර්ගෝපදේශයෙහි අන්තර්ගත සියලු කරුණු හොඳින් කියවා අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර ඒ ඒ විෂය කොටස් යටතේ දෛනික ඉගැන්වීමේ කටයුතු සැලසුම් කර ගැනීමට ද එය ඔබට උපකාරී වනු ඇත.

මව්බස විෂයය සඳහා එක් එක් පාසල් වාරයක දී ඉගැන්වීමට භාජනය කළ යුත්තේ කුමක් ද යන්න පැහැදිලි ව ඔබට ඉදිරිපත් කර ඇත. මෙම විෂයයේ දී සවන් දීම, කථා කිරීම, කියවීම, ලිවීම යන ක්ෂේත්‍ර අතර සමෝධානයක් සිදු වන බැවින් එක් එක් ක්ෂේත්‍රයකට අදාළ කොටස් වෙන වෙන ම ඉගැන්වීමක් නොකළ යුතු ය. මව්බස විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් පෙළ පොත හා වැඩ පොත සහය කර ගැනීම අනිවාර්ය වන අතර, එසේ නොවී පෙළ පොත හා වැඩපොත අඛණ්ඩ ව කරගෙන යාමක් සිදු නොවිය යුතු ය. තව ද මෙහි සාර්ථකත්වය සඳහා වඩාත් අර්ථවත් මෙන් ම වඩාත් උචිත ඉගෙනුම් උපකරණ භාවිත කිරීම ද කළ යුතු වේ.

පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් යන විෂයය ද ප්‍රාථමික විෂයමාලාවේ තවත් එක් ප්‍රධාන විෂයයකි. සිසුනට සමීප භෞතික, ජෛව මෙන් ම සමාජ පරිසරය කෙරෙහි අවධානය යොමු කරමින් තේමා 16ක් හඳුනාගෙන ඇති අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් සමූහයක් ඉදිරිපත් කර ඇත. මෙම විෂයය සඳහා ගුරුවරයාට තිබෙන එක ම මූලාශ්‍රය වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත කොටස පමණි. පරිසර ගවේෂණය, විද්‍යාව, සෞන්දර්ය, නිර්මාණ, ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්, සෞඛ්‍යය හා පෝෂණය වැනි විෂය ක්ෂේත්‍ර කිහිපයකින් සමන්විත වූ මෙම විෂය සමෝධානික මෙන් ම සම්බන්ධීකරණ විෂයයක් ලෙස පුළුල් විෂය පරාසයක් ආවරණය කරමින් නිර්මාණය වී ඇත. මෙම සියලු කොටස් පිළිබඳ ව ගුරුවරයා මනා අවබෝධයකින් යුතු ව කටයුතු කිරීම වැදගත් වේ.

නිර්මාණශීලී ගුරුවරයකුට මෙහි අන්තර්ගත ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නොවී නව ක්‍රියාකාරකම් සැලසුම් කර, සිසුනට වඩාත් ඵලදායී ඉගෙනුම් අවස්ථා උදා වන අයුරින් කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශයෙහි අවශ්‍ය තරම් ඉඩ ප්‍රස්තාව ඇත.

මිලදී ගනු ලබන ඉගෙනුම් සම්පත් වෙනුවට හැකි තාක් තම අවට පරිසරයෙන් සපයා ගත හැකි ස්වාභාවික සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. තව ද අන්තර්ගත ක්‍රියාකාරකම්වලට ගැළපෙන විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කරමින් සිසුන් ක්‍රියාකාරී ව දායක කර ගනිමින් වින්දනාත්මක ඉගෙනුමට යොමු කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී මෙන් ම ගණිත විෂයයේ දී භාවිත කිරීමට ඔබට අවස්ථා සලසා ඇත. ඉංග්‍රීසි භාෂාව සිසුන්ට හුරු කිරීම සඳහා එදිනෙදා භාවිතයට ගැනෙන වචන සහ වගන්ති පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ තේමා යටතේ අදාළ පරිදි ගොනු කර ඇත.

දෙවන ජාතික භාෂාව (දෙමළ) භාවිතය පිළිබඳ ව ද මෙම ගුරු මාර්ගෝපදේශයෙහි මඟපෙන්වීමක් කර ඇත. ඊට අදාළ විෂය නිර්දේශය සහ ක්‍රියාකාරකම් සමූහයක් ද ඉදිරිපත් කර ඇති අතර එය උචිත පරිදි ගළපා ගනිමින් හා සංවිධානය කර ගනිමින් සිසුන්ට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ක්‍රියාකරකම් පාදක වාචික ඉංග්‍රීසි සහ දෙවන ජාතික භාෂාව යන කොටස් ඉගැන්වීමේ දී උචිත ඉගෙනුම් සම්පත් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙසේ සෑම විෂයයකින් ම අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා කරා ළඟා වූයේ ද යන්න පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර සිසුනට අවශ්‍ය මඟපෙන්වීම් සඳහා උදවු ලබාදීමට ගුරුවරයා කටයුතු කළ යුතු වේ.

අවිධිමත් ව මෙන් ම විධිමත් ව සිදු කරන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය මඟින් හඳුනා ගැනෙන සිසු ප්‍රබලතාවලට හා දුබලතාවලට දෛනික ව සිදු කරන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවශ්‍ය මගපෙන්වීම් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසු තක්සේරු කිරීමට අදාළ තක්සේරු නිර්ණායක ඇතුළත් පත්‍රිකා මෙම ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කර ඇත.

මෙම කාර්යයේ සාර්ථකත්වය සඳහා ඒ ඒ විෂයවලට අදාළ ව කාලය වෙන්කර ඇති අතර එම කාලය උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට ගුරුවරයා කටයුතු කළ යුතු වේ.

දෙවන ශ්‍රේණියට ප්‍රවේශ වන දරුවන්ගේ ස්වභාවය එකිනෙකාට වෙනස් වන අතර ඉගෙනුම් රටා විවිධ ය. එම නිසා ඒ පිළිබඳ සංවේදී ව ඉහත දැක්වූ කරුණු සියල්ල පිළිබඳ ව සෑම ගුරුවරයකුම අවධානය යොමු කරමින් සිසුන් මනා ව හඳුනාගනිමින් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ආර්. එම්. කුමුදුමලී ද සිල්වා**
විෂයමාලා සම්බන්ධීකාරක
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික
අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙවන ශ්‍රේණි)

| | විෂයය | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මව්බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියකට මුළු කාලය** | **පැය 21.15** |

## පළමුවන ශ්‍රේණිය - විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශය

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1.0 | මව්බස (සිංහල) - විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය | 1 |
| 2.0 | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ | 94 |
| 1 | අපයි පාසලයි | 106 |
| 2 | අපේ ගෙදර | 111 |
| 3 | වත්තට එන සත්තු | 116 |
| 4 | ජලය සමඟ සෙල්ලම් | 121 |
| 5 | අවුරුදු කාලය | 127 |
| 6 | අපට පෙනෙන අහස | 131 |
| 7 | අප කන බොන දේ | 136 |
| 8 | තොරතුරු ලැබෙන හැටි | 142 |
| 9 | වටාපිටාවේ සිදුවන වෙනස්කම් | 147 |
| 10 | අපේ යහපැවැත්ම | 152 |
| 11 | අපට ඕනෑ දේ ලැබෙන හැටි | 157 |
| 12 | ගමන් බිමන් | 162 |
| 13 | එළිය (ආලෝකය) සමඟ සෙල්ලම් | 168 |
| 14 | මිනිසුන් වැඩ කරන තැන් | 174 |
| 15 | වටාපිටාවේ වෙනස් තැන් | 178 |
| 16 | අපේ උදවු ඕනෑ අය | 182 |
| 3.0 | ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි | 186 |
| 4.0 | දෙවන ජාතික භාෂාව - (දෙමළ) හැඳින්වීම හා විෂය නිර්දේශය | 200 |
| 5.0 | සෙල්ලම් මිදුල | 226 |
| 6.0 | සිසු ප්‍රගතිය තක්සේරු කිරීම | 234 |
| 7.0 | අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | 236 |


**ගණිතය, ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත් වෙන වෙන ම ඉදිරිපත් කෙරේ.**

# 1.0 මව්බස (සිංහල) - විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය

## 1. හැඳින්වීම

මව්බස යනු පුද්ගලයකුගේ ජීවිතයේ මූලික අඩිතාලම සපයන ප්‍රමුඛතම මාධ්‍යය යි. මව්බස නිසි ලෙස නොදැනීම පුද්ගල ජීවිතයක සාර්ථකත්වය අරභයා විවිධ ප්‍රශ්න ඇති කරයි. එහෙයින් සමස්ත මානව ක්‍රියාවලිය ම උදෙසා 'මව්බස' නිසි ලෙස දැන සිටීම ඉතා ම වැදගත් වේ.

මව්බස විෂයයක් ලෙස ඉගෙනීම පාසලේ පළමුවන ශ්‍රේණියේ සිට ම ආරම්භ වෙයි. එය සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය උදෙසා ම වැදගත් වෙයි.

සියලු විෂයයන් හැදෑරීමේ පදනම වන්නේ, මව්බස පිළිබඳ ව සිසුවා ලබන පරිචය යි. භාෂා දැනුමෙන් වියුක්ත ව අන් කිසිදු විෂයයක් පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම උගහට ය.

එමෙන් ම පුද්ගල චින්තනයෙහි ලා තාර්කික බව, නිර්මාණශීලීත්වය උදෙසා මව්බස නිසි ලෙස ඉගෙනීම වැදගත් වේ. අනාගත තරගකාරී සමාජ ජීවිතයේ නොසැලෙන සහ නිවැරදි චින්තනයක් සහිත පුද්ගලයන් බිහි කිරීම උදෙසා මව්බස නිවැරදි ව දැන සිටීම හා මව්බස විෂයයේ හරය අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වෙයි.

මේ නිසා පාසල් විෂයමාලාවේ දී මව්බස විෂයයට ඉතා වැදගත් තැනක් හිමි වෙයි. සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන චතුර්විධ ක්ෂේත්‍ර අරභයා මව්බස විෂයය ව්‍යාප්ත වෙයි. මෙම චතුර්විධ ක්ෂේත්‍ර සමෝධානිත ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගැනෙයි.

මව්බස ගුරු මාර්ගෝපදේශයෙහි සැලසුම්ගත සෙල්ලම්, විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් මඟින් පළමු ශ්‍රේණියේ සිසුන්ට නිර්මාණශීලී සහ තර්කානුකූල ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ඇත. එමෙන් ම සාහිත්‍යය මඟින් සිසුන්ගේ මනස රසඥතාවෙන් සුපෝෂණය කරලීමත්, ඉගෙනුම් අවස්ථා ලබා දීමත් සිදු කර ඇත. එමෙන් ම,

- ප්‍රියමනාප හා රුචිකත්වයක් සහිත විෂයයක් ලෙස මව්බස විෂයය කෙරෙහි ආකල්ප ඇති කර ගැනීම
- නිවැරදි අවබෝධයකින් යුතු ව භාෂාව හැසිරවීම
- ආත්ම විශ්වාසයකින් යුතු ව අදහස් හා සිය මතය ප්‍රකාශ කිරීම
- මූලික භාෂාමය හරය අවබෝධ කර ගැනීම
- නිර්මාණශීලී චින්තනයකට මග විවර කිරීම
- තාර්කික චින්තනයෙන් විෂය ප්‍රවීණතාවට සුදුසුකම් ලැබීම
- කාල්පනික චින්තනයෙන් සාහිත්‍යමය වටපිටාවක් ඇති කර ගැනීම
- දෛනික සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මව්බස නිවැරදි ව භාවිත කිරීම
- අනෙකුත් විෂය ඉගෙනීම සඳහා මව්බස විෂයය උපයෝගී කර ගැනීම
- තව දුරටත් මව්බස විෂයයක් ලෙස ඉගෙනීම සඳහා අවශ්‍ය පදනම ලබා ගැනීම

යන අවස්ථාවලින් මව් බසක ප්‍රායෝගික වටිනාකම ද සවුට කෙරෙනු ඇත. ඒ අනුව මව්බස විෂයයේ පදනම නිවැරදි ව හා නිරවුල් ව ලබා දීමෙන් පුද්ගලයකුගේ අනාගත පෞද්ගලික, සමාජ හා වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කුසලතා වර්ධනය කරලීමට හැකි වනු ඇත.

## 2. (අ) ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

- අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි
- රසවින්දනය සඳහා සවන් දෙයි
- එදිනෙදා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි.
- වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි.
- සන්නිවේදනය සඳහා සවන් දෙයි.
- භාෂාව හසුරුවීමේ කුසලතා වර්ධනය සඳහා සවන් දෙයි.
- මතක ශක්තිය සංවර්ධනය සඳහා සවන් දෙයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි
- අවබෝධය සඳහාත් නිර්මාණ කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් අවබෝධයෙන් සවන් දෙයි
- සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන් දෙයි
- අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ස්වාභාවික ලෙස කතා කරයි.

- එදිනෙදා කාර්ය ඉටුකර ගැනීම සඳහා කතා කරයි.
- වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි.
- සන්නිවේදනය සඳහා කතා කරයි.
- භාෂාව හසුරුවීමේ කුසලතා වර්ධනය සඳහා කතා කරයි.
- කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.
- අවබෝධ කර ගත් දේ පිළිබඳ ව නිර්මාණශීලී ව අවස්ථෝචිත ව කතා කරයි.
- සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.
- කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.
- රස වින්දනය සඳහා කියවයි.
- එදිනෙදා කාර්ය ඉටුකර ගැනීම සඳහා කියවයි.
- වාංමාලා සංවර්ධනය සඳහා කියවයි.
- සන්නිවේදනය සඳහා කියවයි.
- භාෂාව හසුරුවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි.
- කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.
- අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහා අවබෝධයෙන් කියවයි.
- සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි.
- ලිවීමේ කාර්යය සඳහා කායචලන කුසලතා සහිත ව ලිවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් ලියයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි.
- එදිනෙදා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ලියයි.
- වාංමාලා සංවර්ධනය සඳහා ලියයි.
- සන්නිවේදනය සඳහා ලියයි.
- භාෂාව හසුරුවීමේ කුසලතා වර්ධනය සඳහා ලියයි.
- ලිවීමේ කුසලතා වර්ධනය සඳහා ලියයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි.
- අවබෝධයෙන් ලිවීම සඳහාත්, නිර්මාණ කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් ලියයි.
- සම්මත භාෂා ව්‍යවහාරය හා භාෂා අභ්‍යාස සඳහා ලියයි.

## 3. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

දෙවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම් වැඩි වශයෙනුත්, අසුන්ගත වැඩ අඩුවෙනුත් යොදා ගැනෙන පරිදි සංවිධානය කිරීම අපේක්ෂා කෙරෙයි. තනි ව කරන වැඩ, යුගල වශයෙන් කරන වැඩ, කුඩා කණ්ඩායම් වැඩ, විශාල කණ්ඩායම් වැඩ සහ පන්තිය ම කණ්ඩායමක් ලෙස ගෙන කරන වැඩ ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම වැදගත් වේ.

මූලික වශයෙන් ම මවුබස කියවීම සහ ලිවීමට සම්බන්ධ ක්‍රියාකාරකම් තනි ව කිරීම ඉතා ම වැදගත් වේ. මූලික කියවීමේ හා ලිවීමේ අවස්ථා තනි තනි ව සිසුන්ට ලබා දීමෙන් මූලික භාෂාමය දුර්වලතා මඟහැරීමටත්, එක් එක් සිසුවා කෙරෙහි අවධානය යොමු කිරීමටත් හැකි වනු ඇත. එනමුත් මව්බස විෂයය සඳහා ඇති සෙසු ක්‍රියාකාරකම් යුගල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස කළ හැකි ය.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාහිත්‍යමය කොටස් සිසුන් එළිමහනට ගෙන ගොස් කිරීම වඩාත් උචිත ය. ලබා දී ඇති ක්‍රියාකාරකම් සාර්ථක ව ඉටු කිරීමෙන් සිසුන් තුළ ආත්ම විශ්වාසය ඇති වන අතර, තව දුරටත් එම ක්‍රියාකාරකමෙහි නිරත වීමට එය පෙලඹවීමක් වනු ඇත. ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ලබා ගන්නා නිපුණතා අසුන්ගත වැඩ මඟින් තව දුරටත් තහවුරු කළ හැකි ය. එමෙන් ම ඉගෙනුම් උපකරණ භාවිතය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අනිවාර්ය වෙයි.

ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී අවශ්‍ය තැන්වල දී පෙළ පොත සහ වැඩ පොත යොදා ගත යුතු ය. එමෙන් ම සැම සිසුවකු කෙරෙහි ම ගුරුවරයා අවධානය යොමු කළ යුතු අතර, සැම සිසුවකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කළ යුතු ය. එසේ අභ්‍යාස පොත් පරීක්ෂා කරන අතර වැරදි වෙතොත් ඒ අවස්ථාවේ දී ම සිසුවාට පැහැදිලි කර නිවැරදි කළ යුතු ය. අකුරු, වචන, වාක්‍ය කියවීම හා ලිවීම සැම සිසුවකු ලවා ම සිදු කළ යුතු අතර, ඔවුන්ගේ නිවැරදි උච්චාරණය හා නිවැරදි ලිවීම පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. වැරදි සමඟ සිසුවා ඉදිරියට නොයා යුතු ය. එහෙයින් සැම සිසුවකුගේ ම දුර්වලතා අවම කිරීමට එකී අවස්ථා හඳුනාගත් මොහොතේ සිට ම ක්‍රියා කළ යුතු ය.

**සිසුන්ට 'ගෙදර වැඩ' ලබාදිය යුත්තේ ද ඉගෙනුම් අවස්ථා තහවුරු කරලීමට හා දුර්වලතා අවම කරගැනීමට මිස අනවශ්‍ය බරක් නොවන පරිද්දෙන් ය. සැම ක්‍රියාකාරකමට ම ගෙදර වැඩ ලබා දීම අපේක්ෂා නො කෙරෙයි.**

**'මව්බස විෂය සඳහා දෙවන ශ්‍රේණියේ දී භාවිත කළ යුත්තේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන පොත්වලට අමතර ව පස්රුල් පොත සහ තනිරුල් පොත පමණි. එක් එක් විෂය කොටස් සඳහා වෙන් වෙන් වශයෙන් පොත් භාවිත කිරීම සිදු නොකළ යුතු ය.'**

මේ අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගනු පිණිස ඉහත සඳහන් පරිදි ක්‍රියා කිරීම ඉතාමත් වැදගත් වේ.

## 4. පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

මව්බස විෂයය හා බැඳුණු වැඩසටහන් රැසක් පාසල තුළ ක්‍රියාත්මක වෙයි. මව්බස විෂයය පන්ති කාමරයට, කියවීම් පොතට සහ වැඩ පොතට පමණක් සීමා නොකර බාහිර පරිසරයට ද මුදාහළ යුතු ය. මව්බස විෂයය යාන්ත්‍රික ව ඉගෙන ගන්නා ඉගෙනුම් න්‍යායවලින් පමණක් පෝෂණය වූවක් නො වේ. සමස්ත සමාජය ම මව්බස විෂයය හා බැඳුණකි.

පාසලේ උදෑසන රැස්වීම්, පන්ති රැස්වීම්, විවිධ ප්‍රසංග, ප්‍රදර්ශන, අවුරුදු උත්සවය, සිඟිති පොළ, ආගමික වැඩසටහන්, ගුරු දෙගුරු දින යනාදිය ඉන් කිහිපයකි.

එමෙන් ම පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ගායනා තරග, විවාද තරග, නාට්‍ය තරග, දැනුම මිනුම තරග, සතියේ චිත්‍රය පිළිබඳ අදහස්, බිත්ති පුවත්පත, පන්ති මට්ටමින් කතන්දර පොත් සැකසීම, පුස්තකාල පරිහරණයට අවස්ථා දීම යනාදි විවිධ අවස්ථා පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ය. මෙම අවස්ථා මඟින් සිසුන් ඇගයීම ද අනිවාර්ය වේ.

## 5. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

මව්බස විෂය හදාරන සෑම සිසුවකු පිළිබඳ ව ම නිරන්තර අවධානය යොමු කිරීම ඉතා ම අවශ්‍ය වේ. මේ මඟින් සිසුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් අවබෝධයක් ලැබීමත්, සිසුවාගේ දුබලතා, ගැටලු, දුෂ්කරතා පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමටත් හැකි වනු ඇත.

සිසුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ලබන අවබෝධය මඟින් ඊට වඩා වැඩි ඉගෙනුම් අවස්ථා ලබා දීමට හැකි වනු ඇත. සිසුවාගේ ප්‍රබලතා, ගැටලු, දුෂ්කරතා පිළිබඳ ව ලබන අවබෝධය මඟින් එම දුර්වලතා, ගැටලු, දුෂ්කරතා මඟහරවා ගැනීමටත් සිසුවාට සහාය වීමට හැකි වනු ඇත.

මෙලෙස දරුවා පිළිබඳ තොරතුරු ලබා ගත යුත්තේ දෛනික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී ය. මෙවන් අවිධිමත් තක්සේරු කිරීම් සිසුන්ගේ දුර්වලතා අවබෝධ කර ගැනීම පහසු කරවනු ඇත.

සැලසුම්ගත සෙල්ලම්, ක්‍රියාකාරකම්, පෙළ පොත හා වැඩ පොත භාවිතයේ දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න මඟින් සිසුන් තනි තනිවත්, කණ්ඩායම් වශයෙනුත් ක්‍රියාකාරකම්වල නිරත වන අතර, ඒ මඟින් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු රැස් කළ හැකි ය. මෙම තොරතුරු ක්‍රමවත් ව සටහන් කර ගැනීම ද ඉතා ම වැදගත් වූවකි. මෙලෙස සටහන් තබා ගැනීම ඉතා නිවැරදි ව කළ යුතු අතර එය හුදෙක් තොරතුරු සටහන් කිරීමක් ලෙස පමණක් සිදු නොවිය යුතු ය. මෙම තොරතුරු සිසුවාගේ සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ තීරණය ද වනු ඇත.

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| L1 S1 | L1 අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි. | L1 • පවසන දෙයට සවන් දීම<br>• පින්තූර බලා පවසන දෙයට සවන් දීම<br>• කතන්දරවලට සවන් දීම<br>• පින්තූර කතාවලට සවන් දීම |
| | S1 අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලිවන සේ කතා කරයි. | S1 • නිදහසේ කතා කිරීම<br>• පින්තූර බලා කතා කිරීම<br>• නිදහසේ කතන්දර කීම<br>• පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම |
| R1 W1 | R1 කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. | R1 • කියවීමට සූදානම් වීම<br>- කියවීම සඳහා අසුන් ගැනීම සහ පොත තබා ගන්නා ආකාරය<br>• පිලි රහිත අකුරු කියවීම<br>• පිලි රහිත අකුරු එකතුකර වචන කියවීම<br>• පිලි රහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිලි සහිත අකුරු කියවීම<br>• පිලි සහිත අකුරු එකතුකර වචන කියවීම<br>• පිලි සහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිලි සහිත සරල වැකි කියවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව කියවීම<br>• කොමාවට අනුගත ව කියවීම |
| | W1 සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | W1 • ලිවීමට සූදානම් වීම<br>- නිවැරදි ව අසුන් ගැනීම<br>• පිලි රහිත අකුරු ලිවීම<br>• පිලි රහිත අකුරු එකතුකර වචන ලිවීම<br>• පිලි රහිත සරල වාක්‍යාංශ ලිවීම<br>• පිලි සහිත අකුරු ලිවීම<br>• පිලි සහිත අකුරු එකතුකර වචන ලිවීම<br>• පිලි සහිත සරල වැකි ලිවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව ලිවීම<br>• කොමාව නිවැරදි ව භාවිත කරමින් ලිවීම. |

L සවන් දීම S කතා කිරීම R කියවීම W ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_2$ $S_2$ $R_2$ $W_2$ | $L_2$ සවන් දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි. | $L_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| | $S_2$ කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි. | $S_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| | $R_2$ කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි. | $R_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| | $W_2$ ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි. | $W_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| $L_3$ $S_3$ | $L_3$ කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි. | $L_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• අනුකරණය |
| | $S_3$ කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි. | $S_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• අනුකරණය |
| $R_3$ $W_3$ | $R_3$ කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි. | $R_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස් |
| | $W_3$ කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි./අඳියි. | $W_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• චිත්‍ර (ළමා ගීත හා ළමා කතන්දර සම්බන්ධ) |

**L** සවන් දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_4$ $S_4$ $R_4$ $W_4$ | $L_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි. | $L_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු |
| | $S_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි. | $S_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු<br>- තමා පිළිබඳ විස්තර |
| | $R_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි. | $R_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු<br>- තමා පිළිබඳ විස්තර |
| | $W_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි. | $W_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු<br>- තමා පිළිබඳ විස්තර |
| $L_5$ $S_5$ $R_5$ $W_5$ | $L_5$ වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි. | $L_5$ • කතන්දර<br>• තේරවිලි |
| | $S_5$ වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි. | $S_5$ • කතන්දර<br>• තේරවිලි<br>• සංකේත<br>• කියවන විට ලිවීම (තෝරාගත් වචන) |
| | $R_5$ වාංමාලා සංවර්ධනය සඳහා කියවයි. | $R_5$ • කතන්දර<br>• තේරවිලි<br>• සංකේත<br>• කියවන විට ලිවීම (තෝරාගත් වචන) |
| | $W_5$ වාංමාලා සංවර්ධනය සඳහා ලියයි. | $W_5$ • කතන්දර<br>• තේරවිලි<br>• සංකේත<br>• කියවන විට ලිවීම (තෝරාගත් වචන) |

**L** සවන් දීම  **S** කතා කිරීම  **R** කියවීම  **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_6$ $S_6$ | $L_6$ සන්නිවේදනය සඳහා සවන් දෙයි. | $L_6$ • යහළුවෝ<br>• ගුරුවරු<br>• වෙළෙඳ පොළ (සංවාද)<br>• දුරකථන (සංවාද) |
| | $S_6$ සන්නිවේදනය සඳහා කතා කරයි. | $S_6$ • යහළුවෝ<br>• ගුරුවරු<br>• වෙළෙඳ පොළ (සංවාද)<br>• දුරකථන (සංවාද) |
| $R_6$ $W_6$ | $R_6$ සන්නිවේදනය සඳහා කියවයි. | $R_6$ • ද්‍රව්‍යවල නම් (පන්ති කාමරය)<br>• මිල සටහන්<br>• ලේබල් |
| | $W_6$ සන්නිවේදනය සඳහා ලියයි. | $W_6$ • ද්‍රව්‍යවල නම් (පන්ති කාමරය)<br>• මිල සටහන්<br>• ලේබල් |
| $L_7$ $S_7$ $W_7$ $R_7$ | $L_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා සවන් දෙයි. | $L_7$ • පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $S_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කතා කරයි. | $S_7$ • පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $W_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා ලියයි. | $W_7$ • පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $R_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි. | $R_7$ • පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |

**L** සවන් දීම    **S** කතා කිරීම    **R** කියවීම    **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_8$ $S_8$ $W_8$ $R_8$ | $L_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි. | $L_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $S_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි. | $S_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $W_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි. | $W_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $R_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි. | $R_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| $L_9$ $S_9$ $W_9$ $R_9$ | $L_9$ අවබෝධය සඳහාත් නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන් දෙයි. | $L_9$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සත්තු)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා කතන්දර පොත් |
| | $S_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව කතා කරයි. | $S_9$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සත්තු)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා කතන්දර පොත් |
| | $W_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව ලියයි. | $W_9$ • ළමා ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සත්තු)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා කතන්දර පොත් |
| | $R_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව කියවයි. | $R_9$ • ළමා ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සත්තු)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා කතන්දර පොත් |

**L** සවන් දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| $S_{10}$ $L_{10}$ $R_{10}$ | $L_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි. | $L_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා |
| | $S_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන්දෙයි. | $S_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා |
| | $R_{10}$ සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි. | $R_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා<br>• භාෂා අභ්‍යාස<br>- සමානාර්ථ පද<br>- විරුද්ධාර්ථ පද<br>- ගැහැනු පිරිමි හඟවන පද<br>- ඒකවචන හා බහුවචන පද |
| $W_{10}$ | $W_{10}$ සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි. | $W_{10}$ • භාෂා අභ්‍යාස<br>- අකුරු හඳුනා ගැනීම<br>- අකුරු එකතු කර වචන සකස් කිරීම<br>- රූපවලට අදාළ වචන ලිවීම<br>- සමානාර්ථ පද<br>- විරුද්ධාර්ථ පද<br>- ගැහැනු පිරිමි හඟවන පද<br>- ඒකවචන හා බහුවචන පද<br>- පිළිවෙළට සකස් කිරීම<br>- හරි වැරදි යෙදීම<br>- හිස්තැන් පිරවීම<br>- වාක්‍යාංශ<br>- සරල වැකි<br>- ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම |

**L** සවන් දීම    **S** කතා කිරීම    **R** කියවීම    **W** ලිවීම

## වර්ෂය තුළ මව්බස විෂයය ක්‍රියාත්මක විය යුතු ආකාරය

| වාරය | නිපුණතාව | විෂය අන්තර්ගතය | දින ගණන |
|---|---|---|---|
| පළමුවන වාරය | $L_1$ $S_1$<br><br><br><br>$R_1$ $W_1$ | • පවසන දෙයට සවන් දීම<br>• පින්තූර බලා පවසන දෙයට සවන් දීම<br>• නිදහසේ කතා කිරීම<br>• පින්තූර බලා කතා කිරීම<br><br>• පිලි රහිත අකුරු කියවීම හා ලිවීම (2 ශ්‍රේණියේ දී අලුතෙන් හඳුන්වා දෙන අකුරු 24)<br>• පිලි රහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම<br>• හල් කිරීමේ ලකුණ සහ පළමු වන ශ්‍රේණියේ දී උගත් පිලි නැවත හඳුන්වා දීම<br>• 2 ශ්‍රේණියේ දී අලුතින් හඳුන්වා දෙන පිලි (ෘ, ෲ, ෛ, ෞ)<br>• යංශය හා රකාරාංශය හඳුන්වා දීම | 60 |
| දෙවන වාරය | $L_1$ $S_1$<br><br><br><br>$R_1$ $W_1$<br><br><br><br>$L_2$ $S_2$ $R_2$ $W_2$<br><br>$L_3$ $S_3$<br><br>$R_3$ $W_3$<br><br>$L_4$ $S_4$ $R_4$ $W_4$ | • කතන්දරවලට සවන් දීම<br>• පින්තූර කතාවලට සවන් දීම<br>• නිදහසේ කතන්දර කීම<br>• පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම<br><br>• පිලි සහිත වචන එකතු කර වාක්‍යාංශ හා වැකි කියවීම හා ලිවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව කියවීම හා නැවතීමේ ලකුණ යොදා ලිවීම<br>• ප්‍රශ්නාර්ථ ලකුණට අනුගත ව කියවීම හා ප්‍රශ්නාර්ථ ලකුණ යොදා ලිවීම<br>• කොමාවට අනුගත ව කියවීම හා කොමාව යොදා ලිවීම | 60 |

| වාරය | නිපුණතාව | විෂය අන්තර්ගතය | දින |
|---|---|---|---|
| තුන් වන වාරය | $L_5$ $S_5$ $R_5$ $W_5$<br>$L_6$ $S_6$<br>$R_6$ $W_6$<br>$S_7$ $L_7$ $R_7$ $W_7$<br>$L_8$ $S_8$ $W_8$ $R_8$<br>$L_9$ $S_9$ $R_9$ $W_9$<br>$L_{10}$ $S_{10}$ $R_{10}$<br>$W_{10}$ | | 65 |

මව්බස පාඩම් සැලසුමක් සකස් කිරීමේ දී නිපුණතාව, අන්තර්ගතය, ඉගෙනුම් පල, සම්පත්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගතවන කාලය, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය (සැකෙවින්), තක්සේරුකරණය යන කරුණු ඇතුළත් කිරීම වැදගත් වේ.

**නිපුණතා : $L_1$ අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.**

**$S_1$ අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.**

ඉගෙනුම් පල : • පවසන දේ පිළිබඳ අවබෝධයෙන් යුතු ව සවන් දී ක්‍රියා කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පවසන දෙයට සවන් දීම.**

ක්‍රියාකාරකම 1 (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- සිසුන් අඩ කවයක ආකාරයට වාඩි කරවන්න.
- පහත සඳහන් ඡේදය සිසුන්ට හොඳින් ඇසෙන සේ කිහිප වරක් කියවන්න.

'හෙට නිවාඩු දවසක් නේ. අපි කොළ කැඳ හදමු' අම්මා යෝජනා කළා. 'ඒක හොඳ අදහසක් අපි හැමෝම එකතු වෙලා කොළ කැඳ හදමු' තාත්තා කිවුවා. 'අපි කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද?' දූව ඇසුවා. 'ගොටුකොළයි, හාතාවාරියයි, ඉරමුසුයි දමමු' අම්මා කිවුවා. 'පොල්පලාත් දමමු' තාත්තා කිවුවා. 'තව මොනව ද අම්මේ ඕනෑ' 'කැකුළු හාලුයි, පොල් කිරියි, ලුණුයි.' 'මම හරි ආසයි කොළ කැඳ බොන්න' පුතා කිවුවා.

- ඡේදය ඇසුරෙන් සකස් කරන ලද ප්‍රශ්න කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කර ප්‍රතිචාර ලබා ගන්න.

*උදා :* * කොළ කැඳ සෑදීමට යෝජනා කළේ කවු ද ?
 * මේ අය කොළ කැඳට දමන කොළ ජාති මොනවා ද ?
 * පොල්පලා දැමීමට යෝජනා කළේ කවු ද ?

**පින්තූර බලා පවසන දෙයට සවන් දීම**

ක්‍රියාකාරකම 2

- දවසේ සිදුවීම් ප්‍රකාශ වන පින්තූර කිහිපයක් සකස් කරගන්න.
  *උදා :* උදෑසන, සවස, රාත්‍රිය, වැසි අවස්ථාවක්,
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ප්‍රදර්ශන පුවරුවේ වරකට එක් පින්තූරය බැගින් ප්‍රදර්ශනය කරන්න. (එක් පින්තූරයක් පිළිබඳ ව කතා කළ යුත්තේ එක් කණ්ඩායමක් පමණි.)
- මෙලෙස පින්තූර වෙනස් කර, ප්‍රදර්ශන පුවරුවේ රඳවමින් අනෙක් කණ්ඩායම්වලට ද කතා කිරීමට අවස්ථාව දෙන්න.
- එක් කණ්ඩායමක් කතා කරන විට අනෙක් කණ්ඩායම්වලට අවධානයෙන් සවන් දීමට යොමු කරන්න.

**කතන්දරවලට සවන් දීම**

ක්‍රියාකාරකම 3 (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- සිසුන් අඩ කවයක් ආකාරයට වාඩි කරවන්න.
- පහත සඳහන් 'තාරා පැටියා' කතන්දරයට සවන් දීමට සිසුන් යොමු කරන්න.
- කතන්දරය ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගන්න.
- මෙලෙස තවත් කතන්දරවලට සවන් දීමටත් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථා සලස්වන්න.

*උදා :* * සීසෑමේ පණිවිඩය අන්දරේ හරකුන්ට කියූ හැටි
 * කියවීම් පොතේ ඇතුළත් කතා

## තාරා පැටියා

තාරා පවුලක තාරා අම්මයි, තාරා තාත්තයි, තාරා පැටවු හතර දෙනෙකුයි සිටියා. පුංචි තාරා පැටවු එහා මෙහා යන කොට හරි ම ලස්සන යි. තාරා පැටවුන්ට පීනන්න ලස්සන විලක් තිබුණා. විලේ මල් පිපිලා. මාළු රංචු පීනනවා. තාරා අම්මා පැටවු එක්ක විලේ පීනන්න ගියා. එක තාරා පැටියෙක් විලට බහින්න අකමැති යි. 'එන්න පැටියෝ, බය වෙන්න එපා. මේ අනිත් අය පීනන්නේ.' තාරා අම්මා කිවුවා. 'අනේ, මට බැහැ. මට බයයි.' තාරා පැටියා අඬන්න පටන් ගත්තා. තාරා අම්මා හරි අමාරුවෙන් පැටියා විලට ගත්තා. 'සීතල යි, සීතල යි, අනේ මට සීතල යි' කියා කෑගසමින් පැටියා ගොඩට ආවා. අනිත් පැටවු සතුටින් පීනුවා. තාරා පැටවු හවස් වෙලා අම්මත් එක්ක ගෙදර ගියා. විලට බහින්න බයවුණු තාරා පැටියා අඬඅඬා නිදා ගත්තා. තාරා අම්මා නින්දට ගියේ හෙට නම් කොහොම හරි පැටියට පීනන්න පුරුදු කරන්න ඕනෑ කියලා හිතාගෙන.

තාරා අම්මා උදෙන් ම අවදි වුණා. පැටියට කතා කළා. 'පැටියෝ, ඇයි ඔයා වතුරට බය ? අද අපි දෙන්න ම පීනමු. අම්මත් එක්ක ඉන්න කොට බය වෙන්නේ මොකට ද?' කියලා අම්මා පැටියගේ හිත හැදුවා. තාරා අම්මා පැටියා තුරුල් කරගෙන, වතුරට බැස්සා. අම්මා පැටියත් එක්ක කතා කරකර පැටියා ළඟට ම වෙලා හිටියා. අම්මා පුංචි පැටියගෙ බය නැති කළා. දැන් මේ පුංචි තාරා පැටියට වතුරට තිබුණු බය නැති ව ගියා. සතුටින් පීනන්නට වුණා.

ඒ අතරේ අනෙක් පැටවු අවදි වුණා. පුංචි පැටියා, අම්මා එක්ක පීනනවා දැක්කා. හැමෝම කෑගසමින්, තටු සලමින්, විලට පැන්නා. පැටියා වට කරගෙන සෙල්ලම් කළා. ගොඩට වෙලා හිටපු තාරා තාත්තටත් හරි ම සතුටු යි. තාරා තාත්තත් විලට පැන්නා. හැමෝම එකතු වෙලා පීනපීනා සෙල්ලම් කළා. තාරා පවුලට ම එදා හරි ම සතුටු දවසක්.

### පින්තූර කතාවලට සවන් දීම

**ක්‍රියාකාරකම 4**

- මේ සඳහා පින්තූර පැහැදිලි ව පෙනෙන කාඩ්පත් හතරකින් සකස් කරගත් කතාවක් යොදා ගන්න.
- අර්ථවත් කතාවක් ගොඩනැගෙන සේ පින්තූර අනුපිළිවෙළට ස්ථානගත කරමින් කතාව කියන්න.
- ඉන් පසු ව සමස්ත කතාව ම ගුරුතුමා ප්‍රකාශ කරන විට සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- සිසුන් මෙම කථාව ග්‍රහණය කරගෙන ඇත් දැයි බැලීමට, වාචික ව ප්‍රශ්න කිහිපයක් අසන්න.
- සිසුන්ගෙන් පිළිතුරු ලබාගන්න.

**නිදහසේ කතා කිරීම**

**ක්‍රියාකාරකම 5** (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- සෙල්ලම් ගෙවල් කිහිපයක් සකස් කරන්න.
- සිසු කණ්ඩායම් සෙල්ලම් ගෙවල්වලට යොමු කරවන්න.

  සෙල්ලම් ගෙවල්වලදී කරන ක්‍රියාකාරකම් සඳහා උදාහරණ :

  * අපේ ගෙදර අය - නෑදෑයෝ ඇවිල්ලා
  * සෙල්ලම් ඉස්කෝලේ
  * ඩිස්පෙන්සරියක්
  * සෙල්ලම් කඩයක්

- සෙල්ලම් ගෙදර දී නිදහසේ කතා කරමින් සෙල්ලම් කළ යුතු බව සිසුන් දැනුම්වත් කරන්න.
- සෙල්ලම් ගෙවල්වල සිසුන් කතා කරන ආකාරය නිරීක්ෂණය කරන්න.

**පින්තූර බලා කතා කිරීම**

**ක්‍රියාකාරකම 6**

- පහත නම්කර ඇති පින්තූරවලින් එක් පින්තූරයක් පැහැදිලි ව දක්වෙන පරිදි ඇඳ ප්‍රමාණයෙන් විශාල කර සකසා ගන්න.

  *උදා* : පාසලේ උදෑසන දර්ශනයක්/වැසි අවස්ථාවක්/මුහුදු වෙරළේ සැඳෑ දසුනක්/ගොවිපොළක්/ නගරයක දර්ශනයක්

- එම පින්තූරය සිසුන්ට පැහැදිලි ව දර්ශනය වන පරිදි නිදහස් තැනක එල්ලන්න.
- සිසුන්ට නිදහසේ අදහස් දක්වීමටත්, සවන් දීමටත් අවස්ථාව ලබා දෙන්න.

**නිදහසේ කතන්දර කීම**

**ක්‍රියාකාරකම 7**


- සිසුන් දන්නා කතන්දර පිළිබඳ විමසන්න.
- සිසුන් වැඩි දෙනෙක් දන්නා කතන්දරයක් තෝරා ගන්න.
- එම කතන්දරය දන්නා සිසුන් ඉදිරියට කැඳවන්න.
- කතන්දරයේ ආරම්භය ගුරුවරයා විසින් සිදු කරන්න.
- ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව සිසුන්ට ද කතන්දරයේ කොටස් පැවසීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස සිසුන් දන්නා තවත් කතන්දර තෝරා ගෙන, ක්‍රියාකාරකම සිදු කරන්න.

**පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම**

**ක්‍රියාකාරකම 8**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- පින්තූර කතාවක අවස්ථා කිහිපයක් දැක්වෙන රූප රාමු සකස් කර ගන්න.
- එවැනි කතා කිහිපයක පින්තූර රාමු කණ්ඩායම් ගණන අනුව සකස් කර ගන්න.
- එක කතාවකට අදාළ පින්තූර රාමු කට්ටලය බැගින් එක් එක් කණ්ඩායමට ලබා දෙන්න.
- පින්තූරවල පෙනෙන දේවල් කණ්ඩායමේ සිසුන් සමඟ සාකච්ඡා කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- පින්තූර ඉදිරිපත් කරමින් කතාව පැවසීමට එක් එක් කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- පින්තූර රාමු කට්ටල කණ්ඩායම් අතර මාරු කර ගනිමින් කතා ගොඩනැඟීමට අවස්ථාව ලබා දෙන්න.

පින්තූර කතාව 2



**නිපුණතා : $R_1$ කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.**
**$W_1$ සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.**

**ඉගෙනුම් පල :**
- අකුරු එකතු කර වචන සාදා වැකි ලියයි.
- නිවැරදි අර්ථ ගැන්වීමක් සඳහා කොමාව උචිත පරිදි භාවිත කරයි.
- ප්‍රශ්නාර්ථ ලකුණ නිවැරදි අර්ථ ගැන්වීමක් සඳහා වැකිවල යොදයි.


## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### අකුරු හඳුන්වා දීම.


අකුරු 60කින් යුත් සිංහල වර්ණ මාලාවේ අකුරු 36ක් පළමුවන ශ්‍රේණියේ දී සිසුන්ට හඳුන්වා දී තිබේ. ඍ,ඎ අකුරු දෙක හැර තවත් අකුරු 22ක් දෙවන ශ්‍රේණියේ දී හඳුන්වා දීමට නිර්දේශ කර ඇත. මීට අමතර ව භාවිතයේ දී අවශ්‍ය වන ළු හා ෆ අක්ෂර දෙක ද දෙවන ශ්‍රේණියේ දී ඉගැන්වීමට නියමිත ය. දෙවන ශ්‍රේණියට නියමිත අකුරු අනුක්‍රමය සැකසීමේ දී පළමුවන ශ්‍රේණියේ දී අනුගමනය කළ ක්‍රමවේදය ම අනුගමනය කරන ලදි. ළු හා ෆ අකුරු දෙක සිංහල වර්ණ මාලාවට ඇතුළත් නොවන බැවින් අදාළ අක්ෂර වර්ගයේ අගට යොදා ඇත. දෙවන ශ්‍රේණියට නියමිත අකුරු හා ඉගැන්වීමේ අනුක්‍රමය පහත දැක්වේ.

මධ්‍ය අක්ෂර (09)


1




2




3




4




5




6




7



8




9




ආරෝහණ අක්ෂර (13)


10




11




12




13




14




15




16




17




18




19




20



21




22




අවරෝහණ අක්ෂර (2)

23




24



පළමුවන ශ්‍රේණියේ දී අකුරු ලිවීම සඳහා භාවිත කළ පස් රූල, දෙවන ශ්‍රේණියේ දී අලුතින් හඳුන්වා දෙන අකුරු හා පිලි ලිවීම සඳහා ද භාවිත කළ යුතු ය.

පස් රූල් අතර පරතරය පහත සඳහන් පරිදි විය යුතු ය.




**අකුරු කියවීම හා ලිවීම උගන්වන ආකාරය**

- 'ෆ' ශබ්දය මුලට යෙදෙන වචන දෙකක් ශබ්ද නඟා කියන්න. *උදා* : ෆරීනා, ෆරීඩා, . . .
- ෆරීනා, ෆරීඩා වචන 'ෆ' ශබ්දයෙන් ආරම්භ වන බව කියන්න.
- 'ෆ' ශබ්දයෙන් ආරම්භ වන වෙනත් වචන ද කියන්න.
- සිසුනට ද 'ෆ' ශබ්දය සහිත වචන පැවසීමට අවස්ථාව දෙන්න.
- 'ෆ' ශබ්දයට අදාළ අක්ෂර රූපය පෙන්වන්න.
- එම අකුරේ ශබ්දය 'ෆ' බව කියන්න.
- 'ෆ' අකුර පස් රූලේ ලියා පෙන්වන්න.
- ලියන දිශාව පැහැදිලි කරන්න.
- සිසුන්ට ද පස් රූලේ ලිවීමට දෙන්න.
- පස් රූලේ ලියා පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ගේ ලිවීම තක්සේරු කර අවශ්‍ය ප්‍රතිකාර්ය ලබා දෙන්න.
- පිලි රහිත ෆ අකුර සමග මෙතෙක් උගත් අකුරු යෙදුණු වචන කියවීමට, ලිවීමට අවස්ථාව ලබා දෙන්න. *උදා* : ෆරීනා, ෆරීඩා, ෆලූඩා, ෆයිසර්, බෆල්, . . .
- 'ෆ' අකුර කියවීම හා ලිවීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය ම අනුගමනය කරමින් අනෙක් අකුරු ද උගන්වන්න.
- **ඍ, ඎ, ඓ, ඖ අකුරු, ස්වර අකුරු බැවින් ඒවාට පිලි නොයෙදේ. අං, අඃ අකුරු දෙකට ද පිලි යෙදෙන්නේ නැත.**

- **හල් කිරීමේ ලකුණ හඳුන්වා දීම.**

හල් කිරීමේ ලකුණ දෙ ආකාර යි.

රැහැන -    කොඩිය -

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :**
- පහත සඳහන් සිදුවීම බ්‍රිස්ල් බෝඩ් එකක පැහැදිලි ව ලියා ගන්න.
- හඳුන්වා දීමට යන හල් කිරීමේ ලකුණ වෙනත් වර්ණයකින් සටහන් කරන්න.

  (  - රතු,   - කොළ වශයෙන්)
- එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

> අම්මා පන් මල්ල ගත්තා. මිදුලට ගියා. මුළු පරිසරය ම අඳුරු යි. මහ වැස්සක් වහින්න වගෙයි. අම්මා හණිකට මල්ලී සමඟ කඩයට ගියා. වට්ටක්කා, බණ්ඩක්කා, මිරිස් හා තක්කාලි ගත්තා. 'අම්මේ, පපඩම් ගන්න. අත්තම්මාට කෙසෙල් ගෙඩිත් ගන්න' මල්ලී කිවුවා. වැස්සට පෙර බඩු අරගෙන අම්මාත් මල්ලීත් ගෙදර ආවා.

- පහත සඳහන් පරිදි ප්‍රශ්න කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කර සාකච්ඡා මාර්ගයෙන් පිළිතුරු ලබා ගන්න.

  උදා : * කඩයට ගියේ කවුරු ද? අම්මා, මල්ලී
  * අම්මා කඩයට යන විට ගෙන ගියේ කුමක් ද ? පන් මල්ල
  * මල්ලී ගන්න කිවුවේ මොනවා ද ? පපඩම්, කෙසෙල් ගෙඩි
- පිළිතුරු සඳහා දෙන වචන ඔස්සේ කොඩිය හා රැහැන යන හල් කිරීමේ ලකුණු දෙක ම තහවුරු කරවන්න.

**පියවර 2 :**
- පහත සඳහන් වචන හුනු පුවරුවේ ගොඩනගන්න.

| 1 | 2 | 3 |
|---|---|---|
| ගත්තා<br>වැස්සක්<br>මල්ලී<br>බණ්ඩක්කා<br>කෙසෙල්<br>ගෙඩිත් | පපඩම්<br>අම්මා | අත්තම්මා<br>වට්ටක්කා |

- සිසුන් කියවීමට යොමු කරන්න.
- සමහර වචනවලට කොඩිය හා රැහැන යන දෙක ම යෙදෙන ආකාරය තුන් වන තීරුව ඇසුරෙන් පැහැදිලි කරන්න.

**පියවර 3 :**
- ඉහත සිදුවීම/කතාව ඇතුළත් පිටපතක් සෑම සිසුවකු ට ම ලබා දෙන්න.
- ගුරුවරයා පවසන හල් කිරීමේ ලකුණ යෙදෙන වචන කොටු කිරීමට උපදෙස් දෙන්න.
- එම වචන කියවීමට අවස්ථාව දෙන්න.

**පියවර 4 :**
- පියවර 2 දී හුනු පුවරුවේ ලියන ලද වචන බලා ලිවීමට යොමු කරන්න.

පියවර 5 : • හල් කිරීමේ ලකුණු දෙක ම සහිත සරල වැකි අසා ලිවීමට දෙන්න.

## පිලි සහිත වචන හඳුන්වා දීම

- **පිලි ඉගැන්වීම**

  * පළමුවන ශ්‍රේණියට හඳුන්වා දුන් පිලි සියල්ල නැවත දෙවන ශ්‍රේණියේ දී ද සිහිපත් කළ යුතු ය.

  * පළමුවන ශ්‍රේණියේ දී හඳුන්වා දුන් පිලිවලට අමතර ව අනු අංක 16, 17, 18 හා 19 දැක්වෙන පිලි ද හඳුන්වා දීම දෙවන ශ්‍රේණියේ දී කළ යුතු ය. ඊට අමතර ව යංශය (්‍ය) හා රකාරාංශය (්‍ර) ද හඳුන්වා දෙනු ලැබේ.

- **පිලි ඉගැන්වීමේ අනුක්‍රමය**

| අනු අංකය | පිල්ලේ නම | පිලි | නියෝජනය වන ස්වරය | උදාහරණ |
|---|---|---|---|---|
| 01. | ඇලපිල්ල | ා | ආ | කා |
| 02. | කෙටි ඇදපිල්ල | ැ | ඇ | කැ |
| 03. | දික් ඇදපිල්ල | ෑ | ඈ | කෑ |
| 04. | කෙටි ඉස්පිල්ල | ි | ඉ | කි |
| 05. | දික් ඉස්පිල්ල | ී | ඊ | කී |
| 06. | කෙටි කොන් පාපිල්ල | ු | උ | ලු |
| 07. | කෙටි වක් පාපිල්ල | ු | උ | කු |
| 08. | කෙටි ඇද පාපිල්ල | ැ | උ | රු |
| 09. | දික් කොන් පාපිල්ල | ූ | ඌ | ලූ |
| 10. | දික් වක් පාපිල්ල | ූ | ඌ | කූ |
| 11. | දික් ඇද පාපිල්ල | ෑ | ඌ | රූ |
| 12. | කොම්බුව | ෙ | එ | කෙ |
| 13. | කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ | ෙ<br>ෙ ් | ඒ | කේ<br>වේ |
| 14. | කොම්බුව සහිත ඇලපිල්ල | ෙ ා | ඔ | කො |
| 15. | කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ | ෙ ෝ | ඕ | කෝ |
| 16. | ගැටඇලපිල්ල | ෟ | ඍ | කෘ |
| 17. | ගැටඇලපිලි දෙක | ෲ | ඎ | කෲ |
| 18. | කොම්බු දෙක | ෛ | ඓ | කෛ |
| 19. | කොම්බුව සහ ගයනුකිත්ත | ෙ ෟ | ඖ | කෞ |

## පිලි හඳුන්වාදීම

- **ඇලපිල්ල** (තනි රූල් පොත යොදා ගන්න.)

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පළමුවන ශ්‍රේණියේ දී ඉගෙන ගත් 'මාල මාල මාල මාල' කවිය නැවත මතකයට නංවන්න.
- එම කවිය ලියූ කාඩ්පත යොදා ගනිමින් ඇලපිල්ල යෙදුණු අකුරු කියවන්න.
- එහි දී ඇසෙන ශබ්දය 'ආ' බවත්, 'ආ' ශබ්දය සඳහා ඇලපිල්ල යොදන බවත් පහදන්න.

| ා |
|---|

- පන්තියේ ප්‍රදර්ශනය කර ඇති සිංහල වර්ණ මාලාවේ ව්‍යඤ්ජන අකුරුවලට ඇලපිල්ල සහිත කාඩ්පත තබමින් එම අකුරුවලට ඇලපිල්ල යෙදෙන විට ශබ්දවන ආකාරය උගන්වන්න.

පියවර 2 :
- පහත සඳහන් පරිදි කාඩ්පත් සූදානම් කර ගන්න.

* මුල අකුරට ඇලපිල්ල යෙදෙන වචන

| මාලය | තාලය | පාසල | දානය | සාලය |
|---|---|---|---|---|

* මැද අකුරට ඇලපිල්ල යෙදෙන වචන

| පනාව | නළාව | වරාය | රටාව | කසාය |
|---|---|---|---|---|

* අග අකුරට ඇලපිල්ල යෙදෙන වචන

| සරලා | පඹයා | නයනා | තමරා | වරකා |
|---|---|---|---|---|

- සකස් කරගත් කාඩ්පත් කට්ටලය බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- වචන පත්‍රිකාවල මුලට ඇලපිල්ල යෙදුණු වචන, මැදට ඇලපිල්ල යෙදුණු වචන හා අගට ඇලපිල්ල යෙදුණු වචන වෙන් කිරීමට උපදෙස් දෙන්න
- එක් එක් කණ්ඩායමේ සිසුන්ට මෙම වචන කට්ටල කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- කියවීමට ගත් වචන කට්ටල තනි රූල් පොත්වල බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- පහත නම් සඳහන් කාඩ්පත්වලට පින්තූර සකස් කර ගන්න.

| තාරාවා | රබාන | වලහා | අවාන | මාලය |
|---|---|---|---|---|

- ඉහත පින්තූරවලට අදාළ වචන සැකසීමට අවශ්‍ය වන අකුරු ද පිලි ද ප්‍රමාණවත් ව ලබා දෙන්න.
- කණ්ඩායමේ මේසය මත ඉහත පින්තූරවලට අදාළ වචන සැකසීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් වචන සකසා අවසන් වූ පසු ඒවා හුනු පුවරුවේ ලියන්න.
- සිසුන් සමඟ වචන කියවන්න.
- එම වචන බලා ලිවීමට දෙන්න.
- ලියන ලද වචන කියවීමට යොමු කරන්න.

පියවර 2 : • පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.

* මාමා පාරට එනවා.
* වාසනා මාතර යනවා.
* අක්කා වරකා කනවා.

## • කෙටි ඇදපිල්ල

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත සඳහන් ඡේදය බ්‍රිස්ල් බෝඩ් එකක ලියාගන්න.

• කෙටි ඇදපිල්ල යෙදෙන වචනවලට යටින් රතු පැහැයෙන් ඉරක් අඳින්න.

• එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

වැද්දා කැත්ත ගත්තා. කැලය මැදට ගියා. කැන්ද ගස් කැපුවා. පැලක් හදන්නට ඉනි කැපුවා. වැල් පොටවල් ගෙන ගහට නැග්ගා. කැපූ ඉනි ගහ උඩින් තැබුවා. පැල හදා ගැට ගැසුවා. වැද්දා බිමට බැස්සා. කොළ අතු ගෙන උඩට නැග්ගා. පැලේ වහලය හැදුවා.

• ඡේදය සිසුන් ලවා කියවන්න.

• ඡේදය ඇසුරෙන් සකස් කළ පහත සඳහන් ප්‍රශ්න අසා, පිළිතුරු ලබා ගන්න.

*උදා* : * කැත්ත ගත්තේ කවුද ? වැද්දා

* වැද්දා ගියේ කොහේ ද ? කැලය මැදට
* ඉනි කැපුවේ කුමකට ද? පැල සෑදීමට

• වාචික ව ලබා ගත් පිළිතුරු හුනු පුවරුවේ ලියන්න.

• එම පිළිතුරු කිහිප වරක් ශබ්ද නගා සිසුන් ලවා කියවන්න.

පියවර 2 : • වැද්දා, කැලය, මැදට, පැල වැනි වචනවල මුල් අකුරේ 'ඇ' ශබ්දය යෙදෙන බවත්, ඒ සඳහා කෙටි ඇදපිල්ල (ැ) යෙදෙන බවත් පහදා දෙන්න.

• ක, ග ආදී අකුරකට පසු ව කෙටි ඇදය යෙදූ විට කැ, ගැ ආදි වශයෙන් වෙනස්වන බව කියා දෙන්න.

• මෙතෙක් උගත් සියලු අකුරුවලට කෙටි ඇදය සහිත කාඩ්පතක් තබමින් එම අකුරු සිසුන් ලවා කියවන්න.

| ැ |
|---|

• පහත සඳහන් වචන හුනු පුවරුවේ ලියන්න.

ගැට කැත්ත වැල්

නැග්ගා බැස්සා

• එම වචන කිහිප වතාවක් සිසුන් ලවා කියවන්න.

• එම වචන සිසු අභ්‍යාස පොතේ බලා ලිවීමට දෙන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** • පහත සඳහන් අකුරු යෙදෙන වචන ලිවීමට දෙන්න.

ගැ   හැ   සැ   තැ   මැ   කැ   බැ   රැ

**පියවර 2 :** • පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.

* වැද්දා කැලයට පැන්නා.
* නැන්දා හැළප හදනවා.
* රැල්ල වැල්ලට එනවා.

- **දික් ඇදපිල්ල**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :** • පහත සඳහන් කවිය ගායනා කරන්න.

කැරගලේ සැය උඩින්
රැන් රැන් රැන ගිරවු
කැම සොයා උදෑසනින්
ඉගිළී එනවා

මැ ඇට කැ  රැන ගිරවු
රැ බෝවෙන්නට ඉස්සර
කැරගලේ සැය උඩින්
ආපසු යනවා

- මෙම කවිය තාල තබමින් අංගචලනය සහිත ව ගායනා කරන්න.
- කවියේ සඳහන් දික් ඇදපිල්ල සහිත වචන මතු කර කියන්න.
- ගුරුවරයා කියන විට සිසුන් ලවා ශබ්ද නඟා කියවන්න.
- 'ඈ' ශබ්දය සඳහා දික් ඇදපිල්ල යෙදෙන බව අවධාරණය කර පිල්ල සහිත කාඩ්පත පෙන්වන්න.

ෑ

- එය උගත් සියලු අකුරුවලට යොදමින් අකුර ශබ්දවන ආකාරය පහදා දෙන්න.
- කවියේ 'ඈ' ශබ්දය සහිත වචන හුනු පුවරුවේ ලියා කියවන්න.

**පියවර 2 :** • මෙම වචනවලට අදාළ අකුරු කාඩ්පත් සකස් කරගන්න.

| ප | ත් | තැ | යා |   | කැ | ස් | බැ | වා |   | ක | ළු | ලැ | ල් | ල |
| බැ | ග | ය |   | කෑ | ර | ලා |   | මැ | වැ | ල |

- මෙම කාඩ්පත් අහඹු ලෙස සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා වචනය ශබ්ද නඟා කියවන්න.
- එම වචනයට අදාළ අකුරු අතැති සිසුන් පන්තිය ඉදිරියට පැමිණ වචනය සෑදිය යුතු බවට උපදෙස් දෙන්න.

- මේ ආකාරයට වචන සියල්ල ම ගොඩනඟා කියවන්න.
- සකස් කළ වචන ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- එම වචන හුනු පුවරුවේ ලියන්න.
- බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • දික් ඇදපිල්ල සහිත වචන දෙවන ශ්‍රේණිය සිංහල කියවීම් පොතෙන් සොයා ලිවීමට යොමු කරන්න.

පියවර 2 : • පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.

* කැරලා මෑ ඇට කෑවා.

* පෑන බෑගයට දැම්මා.

* නෑනා දෑකැත්ත ගත්තා.

- **කෙටි ඉස්පිල්ල**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත කවිය තාල තබමින් ගායනා කරන්න.


ටිකිරි ටිකිරි ටිකිරි සිනා
මිහිරි මිහිරි සින්දු කියා
ගිගිරි ගිගිරි තාල තබා
සිඟිති නටයි පාද තියා

- සිසුන් සමඟ ගායනා කරන්න.

පියවර 2 : • කවියේ 'ටිකිරි, මිහිරි, ගිගිරි, සිඟිති' යන වචනවල ඇති 'ඉ' ශබ්දය මතුකර දක්වන්න.

- 'ඉ' ශබ්දය සඳහා ඉස්පිල්ල අකුරුවලට ඉහළින් යෙදෙන බව පහදා දෙන්න.
- ඉස්පිල්ල [ ි ] කාඩ්පත පෙන්වන්න.
- අකුරු සියල්ලට ම ඉස්පිල්ල යොදා ශබ්දවන ආකාරය පැහැදිලි කරන්න.

පියවර 3 : • පහත සඳහන් රවුමේ ඇති අකුරු යොදා වචන සකස්කර ලිවීමට උපදෙස් දෙන්න.




පියවර 4 : • පහත වැකි අසා ලිවීමට දෙන්න.

* සිඟිති සිහින දැක්කා.

* මිහිරි මිදි කෑවා.

* ටිකිරිලියා ළිඳට ගියා.

- **දීක් ඉස්පිල්ල**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත සඳහන් පත්‍රිකාව සකස්කර සිසුන් සියලු දෙනාට ම පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.

| |
|---|
| මීයා |
| මීකිරි |
| මීවදය |
| මීමැස්සා |
| මීදුම |
| මීමින්නා |

- ඉහත පත්‍රිකාවේ සඳහන් වචන ශබ්ද නඟා කියවන්න.
- සිසුන් සමඟ ද කියවන්න.
- සැම වචනයක ම මුල් අකුර 'මී' බවත්, ශබ්දවන විට 'ඊ' ශබ්දය ඇසෙන බවත් ඒ සඳහා දීක් ඉස්පිල්ල යෙදී ඇති බවත් පැහැදිලි කරන්න.
- පිලි රහිත අකුරු කාඩ්පත් කට්ටලයෙන් ක, ග, ජ, ච . . . වැනි අකුරු කිහිපයක් ගන්න.
- දීක් ඉස්පිල්ල සහිත කාඩ්පත තබමින් එම අකුරු කියවන්න.

| |
|---|
| ී |

පියවර 2 : • පහත සඳහන් වචන පත්‍රිකා කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.

| සී | දී | ලී | චී | මී |
|---|---|---|---|---|
| -- යා | -- සිය | -- ක්ස් | -- ත්තය | -- යා |
| -- පද | -- පිකා | -- ටරය | -- නය | -- කිරි |
| -- ගිරිය | -- කිරි | වය--නය | -- වරය | -- දුම |
| -- තල | -- මනාව | දීපාව -- | -- ටා | -- මින්නා |
| ක -- රට | -- පවාලී | | | -- මැස්සා |

- එක් එක් පත්‍රිකාවට අදාළ අකුරු පටිය බැගින් ලබා දෙන්න.

*උදා :*

| | | | | |
|---|---|---|---|---|
| සී | සී | සී | සී | සී |

- අකුරු කපා හිස්තැනට තබා/අලවා වචන කියවීමට යොමු කරන්න.
- කණ්ඩායම්වල පත්‍රිකා මාරු කරමින් කියවීමට යොමු කරන්න.

පියවර 3 : • දෙවන ශ්‍රේණිය සිංහල කියවීම් පොතේ දීක් ඉස්පිල්ල යෙදුණු වැකි සොයා ලිවීමට දෙන්න.

- **කෙටි පාපිල්ල**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :** • පහත සඳහන් 'අලුත් යහළුවා' කතාව සිසුන්ට රසවත් ලෙස කියා දෙන්න.

## 'අලුත් යහළුවා'

සුමුදු, කුමුදු හා රුවන් හොඳ යාළුවෝ. සිකුරාදා සුමුදුගේ ගෙදර සෙල්ලම් කරන දවස. කුමුදුයි, රුවනුයි එකතු වෙලා සුමුදුගේ ගෙදර ගියා. සුමුදුගේ ගේ ළඟ බුරුත ගහ යට පුංචි බලු පැටියෙකුට කපුටෝ රංචුවක් කොටනවා රුවන් දැක්කා. කුමුදුයි, රුවනුයි දුවලා ගිහින් කපුටෝ එළෙව්වා. පුංචි බලු පැටියා සුමුදුගේ ගෙදරට අරගෙන ගියා. සුමුදුගේ අම්මා බලු පැටියා පිරිසිදු කරලා තුවාලවලට බෙහෙත් දැම්මා. කිරි ටිකකුත් හදලා පෙව්වා. බලු පැටියට ජුකී කියලා නමකුත් දැම්මා. යහළුවෝ තුන් දෙනාට තව යහළුවෙකු එකතු වුණා.

- කතාව ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කර පිළිතුරු ලබා ගන්න.

*උදා :* * 'අලුත් යහළුවා' කතාවේ සඳහන් යහළුවන්ගේ නම් කියන්න.- සුමුදු, කුමුදු, රුවන්
  * සුමුදුගේ ගෙදර සෙල්ලම් කරන දවස කවදා ද ? සිකුරාදා
  * බලු පැටියා හිටියේ කොහේ ද ? බුරුත ගහ යට
  * බලු පැටියාට කෙටුවේ කවුද ? කපුටෝ
  * බලු පැටියාට දැමූ නම කුමක් ද ? ජුකී

**පියවර 2 :** • කතාවේ එන යහළුවන් තුන් දෙනාගේ නම් ලියන ලද කාඩ්පතක් සකස් කරගන්න.
- මේ වචන කිහිප වතාවක් කියවන්න.
- එවිට ඇසෙන ශබ්දය 'උ' බව සිසුන්ට අවබෝධ කරවන්න.
- 'උ' ශබ්දය සඳහා පාපිල්ල යෙදෙන බව කියා දෙන්න.
- පාපිල්ල යෙදෙන ආකාර තුනක් ඇති බව පැහැදිලි කරන්න.

| පාපිල්ල | පිල්ලේ නම | උදාහරණ |
|---|---|---|
| ු | කෙටි කොන් පාපිල්ල | සු |
| ු | කෙටි වක් පාපිල්ල | කු |
| ු | කෙටි ඇද පාපිල්ල | රු |

- එක් එක් අකුරුවලට පාපිල්ල යෙදෙන අයුරු හුනු පුවරුවේ ලියමින් පහදා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • කතන්දරය බ්‍රිස්ල් බෝඩ් එකක අකුරු විශාල කර ලියා ගන්න. පාපිලි තුන (ු, ෘ, ූ) වර්ණ තුනකින් ලියා ගැනීමට කටයුතු කරන්න.

- ගුරුවරයා විසින් කතාව සිසුන් ලවා කියවන්න.
- කතන්දරය කියවා පාපිල්ල යෙදුණු වචන සොයා අභ්‍යාස පොතේ ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- අභ්‍යාස පොතේ ලියූ වචන ශබ්ද නගා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 2 : • කෙටි පාපිල්ල සහිත වැකි අසා ලිවීමට දෙන්න.

* සුමුදු කුරුලු පැටවු දැක්කා.
* රුවන් මුහුදු ගියා.
* නයා තුඹසට රිංගුවා.

- **දික් පාපිල්ල**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත සඳහන් ආකාරයට වචන ප්‍රදර්ශනය කරන්න.

| 1 | 2 | 3 |
|---|---|---|
| දූපත<br>පූජාව<br>සූරයා<br>බූන්දි<br>නූල | කූඩුව<br>කූඩාරම<br>කූනිස්සා | රූපය<br>රූස්ස<br>රූකඩ |

- ගුරුවරයා ඉහත වචන කිහිප වතාවක් කියවන්න.
- එම වචන සිසුන් සමඟ ද ශබ්ද නගා කියවන්න.
- එක් එක් වචනවල මුල් අකුරේ අගට ඇසෙන ශබ්දය මතුකර ගන්න. *උදා :* දූ, පූ, සූ, කූ, රූ, . . . ආදි වශයෙන්.
- ඇසෙන ශබ්දය 'ඌ' බව කියා දෙන්න.
- 'ඌ' ශබ්දය සඳහා දික් පාපිල්ල යෙදෙන බව තහවුරු කරන්න.
- පහත සඳහන් ආකාරයේ පත්‍රිකා තුනක් සකස් කර ගන්න.

| දික් කොන් පාපිල්ල | ූ |
|---|---|

| දික් වක් පාපිල්ල | ූ |
|---|---|

| දික් ඇද පාපිල්ල | ෲ |
|---|---|

- කෙටි පාපිල්ල මෙන් ම දික් පාපිල්ල ද ආකාර තුනක් බව පැහැදිලි කරන්න.
- සකස් කරන ලද වචන පත්‍රිකාවේ ඉහළින් පළමු තීරයේ දික් කොන් පාපිල්ල ලෙස ද දෙවන තීරයේ දික් වක් පාපිල්ල ලෙස ද, තුන්වන තීරයේ දික් ඇද පාපිල්ල ලෙස ද සඳහන් පත්‍රිකා තුන රඳවන්න.
- නැවත එම වචන ශබ්ද නගා සිසුන් සමඟ කියවන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** • පහත සඳහන් පැවරුම සකස් කර ගන්න.

පහත සඳහන් අකුරු යොදා ප්‍රහේලිකා පුරවන්න.

| | | |
|---|---|---|
| | වි | ලි |
| ප | | |
| ත | | |

| | | |
|---|---|---|
| | දු | රු |
| කි | | |
| රි | | |

| | | |
|---|---|---|
| | න් | දි |
| රු | | |
| වා | | |

| | |
|---|---|
| | සා |
| ජා | |
| ව | |

| | | |
|---|---|---|
| | ඩ | ය |
| ඩු | | |
| ව | | |

| | | |
|---|---|---|
| | ක | ඩ |
| ප | | |
| ය | | |

දූ සූ රූ කූ බූ පූ

- සිසුන්ට ප්‍රහේලිකා සඳහන් පැවරුම බැගින් බෙදා දෙන්න.
- ප්‍රහේලිකාවට අදාළ අකුර තෝරාගෙන හිස්තැනෙහි ලිවීමට උපදෙස් දෙන්න.
- එම වචන කියවා අභ්‍යාස පොතෙහි ලිවීමට දෙන්න.

**පියවර 2 :** • පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.

* රූපා රූකඩ හැදුවා.
* සූකිරි කූඩයක් තිබුණා.
* බූලාත්, පූසාත් නූල අදිනවා.

- **කොම්බුව**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :** • පහත සඳහන් වාක්‍ය බ්‍රිස්ල් බෝඩ් පටිවල ලියා සකස් කර ගන්න.

* වෙද මහතා නෙල්ලි බෙහෙතට ගත්තා.
* සෙව්වන්දි, හෙට පෙරහැර තිබෙනවා ද ?
* ෂෙහාන් බෙරය පෙට්ටගම උඩ තබන්න.
* නෙළුම් මල් දෙක ම යෙහෙනිට දෙන්න.


- එක් එක් වැකිය ගුරුවරයා පැනල් පුවරුවේ රඳවමින් කියවන්න.
- ඉරි ඇඳි අකුරුවල 'එ' ශබ්දය ඇති බවත්, ඒ සඳහා කොම්බුව යෙදී ඇති බවත් පැහැදිලි කරන්න.

ෙ

- අකුරු පටියක් සකස් කර ගන්න.

- අකුරු පටියේ සෑම අකුරක් ළඟට ම කොම්බුව ගෙන යමින් කොම්බුව අකුරට එක් වුණු විට ශබ්ද වන ආකාරය පැහැදිලි කරන්න.

*උදා :*




**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- සිංහල කියවීම් පොතේ පාඩම්වලින් කොම්බුව යෙදුණු වචන සෙවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට පාඩම් වෙන්කර දෙන්න.
- සොයා ගත් වචන ලිවීමට කඩදාසි සපයන්න.
- එම වචන කණ්ඩායම් වශයෙන් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- එම පත්‍රිකා ගුරුවරයාගේ නිරීක්ෂණයෙන් අනතුරු ව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- හැකි අවස්ථාවල සිසුන්ට අනෙක් කණ්ඩායම් ලියූ පත්‍රිකා කියවා බලන්න යැයි උපදෙස් දෙන්න.

පියවර 2 :
- පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.
  - * හෙට පෙරහැර තිබෙනවා.
  - * බෙහෙත් පෙට්ටියට දමන්න.
  - * වෙහෙස වෙලා වැඩ කරමු.


- **කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- කොම්බුව සහිත හල් කිරීමේ ලකුණට (ෙ ් / ෙ ) වැඩි අවධානයක් යොමු කරමින් පහත සඳහන් ඡේදය කියවන්න.

ලේනා පේර ගහ දිගේ ආවා. පේර ගස යට වතුර බේසමක් තිබුණා. ලේනා වතුර බේසමට වැටුණා. චේතනා මේ සිද්ධිය දැක්කා. ලේනා බේසමෙන් ගොඩට ගත්තා. චේතනා, ලේනා ගේට්ටුව උඩින් තිබ්බා. ගේට්ටුව දිගේ ගිය ලේනා පේර ගසේ තිබූ ලේන් කුඩුවට රිංගුවා. චේතනාට හරි සතුටුයි.

- 'ඒ' ශබ්දය වෙනුවට යෙදෙන පිල්ල දෙ ආකාරයකින් යෙදෙන බව පැහැදිලි කරන්න.



- අකුරුවල හල් කිරීමේ ලකුණු යෙදෙන ක්‍රම දෙක සිහිපත් කර ඒ අනුව මෙම වෙනස වඩාත් පැහැදිලි කරන්න.

- මෙහි දී කොම්බුව හා හල් කිරීමේ ලකුණ හඳුන්වා දීමට යොදා ගත් ඡේදයේ වචන උදාහරණ ලෙස දක්වමින් මෙම වෙනස පැහැදිලි කරන්න.

පියවර 2 : • මේ ආකාරයේ වචන කාඩ්පත් සකස්කර අකුර පමණක් ගෙන යමින් වචන කියවීමේ අවස්ථා ලබා දෙන්න.

උදා :

| | |
|---|---|
| පේ | ර |
| | නවා |
| | නුව |
| | ළිය |
| | ශි |
| | සර |

| | |
|---|---|
| සේ | ර |
| | න |
| | දුවා |
| | ලය |
| | යාව |
| | කර |

- කාඩ්පත් මාරු කරමින් කියවන්න.
- එම වචන ලිවීමට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • කියවීම් පොතේ පාඩම් නම් කර එක් එක් කණ්ඩායම්වලට කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ යෙදෙන වචන ලිවීමට උපදෙස් දෙන්න.

පියවර 2 : • පහත වැකි අසා ලිවීමට දෙන්න.

   * අහසේ දේදුන්න පායලා.
   * ගේට්ටුවේ ලේනෙක් ඉන්නවා.
   * බේසමට මේස් දමා සේදුවා.

- **කොම්බුව සහිත ඇලපිල්ල**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත කවිය ගුරුවරයා ගායනා කරන්න.

කොස් පොල් ගස් හරි උසයි
ලොවි මොර ගස් ගෙඩි බෙදයි
කොහොඹ ගසත් සිසිල දෙයි
අපේ වත්තෙ ගස් ගොඩයි

- අනතුරු ව සිසුන් සමඟ ද ගායනා කරන්න.
- කවියේ ඇති ගස්වල නම් සිසුන්ගෙන් විමසන්න.
- 'ඔ' ශබ්දය සඳහා කොම්බුව සහිත ඇලපිල්ල යෙදෙන බව සිසුන්ට පැහැදිලි කරන්න.

| ෙ ා |
|---|

- කොම්බුව සහිත ඇලපිල්ල ලකුණ ස්ථාවර ව තබා අකුර වෙනස් කරමින් කියවීමට උපකරණයක් සකස් කර ගන්න.
- උපකරණය භාවිත කරමින් සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- කවියේ සඳහන් ගස්වල නම් හුනු පුවරුවේ ලියන්න.
- ඒවා බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

පියවර 2 : • කොම්බුව හා ඇලපිල්ල යෙදුණු වචන කියවීම් පොතෙන් සෙවීමට අවස්ථාව ලබා දෙන්න. එක් එක් කණ්ඩායම්වලට පාඩම් වෙන් කර දෙන්න.
- වචන ලිවීමට පත්‍රිකාවක් ලබා දෙන්න.
- සොයා ගත් වචන පත්‍රිකාවේ ලිවීමට උපදෙස් දෙන්න.
- එම වචන සිසුන් ලවා කියවන්න.
- කියවීමට ගත් වචන කිහිපයක් අභ්‍යාස පොත්වල ලිවීමට දෙන්න.

පියවර 3 : • කොම්බුව සහිත ඇලපිල්ල යෙදුණු වැකි අසා ලිවීමට දෙන්න.
 * කොස්, පොල් ගස් හරි උසයි.
 * කොකාගේ හොට ගොඩක් දිගයි.
 * ගොවියා පොල් පැළයට පොහොර දැම්මා.

- **කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ**


**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත කවිය ගායනා කරන්න.

රෝස ගසේ මල් පිපිලා<br>
බෝල බෝල පිනි වැටිලා<br>
දෝණි රෝස මල් කඩලා<br>
පෝච්චියට මල් දැම්මා

- සිසුන් සමඟ ද ගායනා කරන්න.
- කවිය ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් අසන්න.
 * පිපී ඇති මල් මොනවා ද ? රෝස
 * පිනි කොයි වගේ ද? බෝල වගේ
 * රෝස මල් කඩන්නේ කවුද ? දෝණි
 * මල් දැම්මේ කුමකට ද ? පෝච්චියට
- සිසුන්ගේ පිළිතුරු හුනු පුවරුවේ ලියන්න.
- එම පිළිතුරු කිහිපවතාවක් කියවන්න.
- මුලට යෙදෙන අකුර ශබ්ද නඟා කියන්න.
 *උදා :* රෝ, බෝ, දෝ, පෝ, . . .
- 'ඕ' ශබ්දය සඳහා කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදෙන බව පැහැදිලි කරන්න.

පියවර 2 : • පහත උපකරණය කාඩ්බෝඩ්/ලීවලින් සකස් කර ගන්න.
- එය සිසුන්ට පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කරන්න.



- අකුරු කාඩ්පත් සකස් කරගන්න.

උදා : ක ග ජ . . .

- එක් එක් අකුර උපකරණයේ රඳවමින් අකුර ශබ්ද නඟා කියන්න. 'ඕ' ශබ්දය සඳහා කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ ෙ ෝ යෙදෙන බව පැහැදිලි කරන්න.
- එම උපකරණය භාවිතයෙන් සියලු අකුරු හඳුන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** 
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පහත පැවරුම් පත හා අකුරු කාඩ්පත් ලබා දෙන්න.

| | | |
|---|---|---|
| | ය | පෝ |
| | ස | රෝ |
| | ල | බෝ |
| | වා | ගෝ |
| | නා | නෝ |

- අකුරු නිවැරදි ව තබා කියවීමට යොමු කරන්න.
- එම කාඩ්පත් අදාළ ස්ථානයේ ඇලවීමට උපදෙස් දෙන්න.
- ඇලවූ කාඩ්පත් කණ්ඩායම් වශයෙන් කියවීමට යොමු කරන්න.
- පැවරුම් පතේ සඳහන් වචන පොත්වල ලිවීමට සලස්වන්න.

**පියවර 2 :** 
- කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු වචන කියවීම් පොතෙන් සොයා ලිවීමට දෙන්න.

**පියවර 3 :** 
- පහත සඳහන් වැකි අසා ලිවීමට දෙන්න.
  - * රෝසි බෝනික්කා සේදුවා.
  - * දෝණි, සෝමා සමඟ රෝහලට ගියා.
  - * නෝනා සෝයා බෝංචි ඉවුවා.

- **ගැටඇලපිල්ල**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :** 
- පහත සඳහන් වචන, පත්‍රිකාවක ලියා සකස් කර ගන්න.

| | | | |
|---|---|---|---|
| කෘතිය | පෘථිවිය | ගෘහය | පෘෂ්ඨ |
| තෘණ | මෘදු | වෘත්ත | දෘෂ්ටි |
| වෘකයා | හෘදය | වෘක්ෂ | දෘශ්‍ය |

- හඳුන්වා දීමට අදාළ ගැටඇලපිල්ල යෙදෙන අකුර යටින් ඉරක් අඳින්න.
- එම පත්‍රිකාව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

පියවර 2 : • මුළු පන්තියේ ම සිසුන් සහභාගි කර ගනිමින් වචන පත්‍රිකාව ගුරුවරයා කියවන විට ශබ්ද නඟා කියවන්න.

• දෙතුන් වතාවක් කියවීමට යොමු කරන්න.

• 'ඍ' යන ශබ්දය සඳහා යොදන පිල්ල, 'ගැටඇලපිල්ල' බව හඳුන්වා දෙන්න.

ෘ

• අකුරෙන් අකුරට ශබ්ද වන ආකාරය නැවත පැහැදිලි කරන්න.

කෘ, ගෘ, තෘ, දෘ, හෘ පෘ, මෘ, වෘ

පියවර 3 : • මෙම අකුරු පස් රූල් පොත්වල ලිවීමට දෙන්න.

• කියවීමට යොදා ගත් වචන පස් රූල් පොත්වල බලා ලිවීමට අවස්ථාව දෙන්න.

පියවර 4 : • පහත සඳහන් පැවරුම් පත සෑම සිසුවකුට ම ලබා දෙන්න.

• ක්‍රියාකාරකම සිදු කරන අයුරු සිසුන්ට පැහැදිලි කරන්න.

**නිවැරදි අකුර යොදා හිස්තැන් පුරවන්න**

- - - රුමිණියා
- - - මීන්
(කු කෘ)

- - - ත්තලම
- - - ථිවිය
(පෘ පු)

- - - වා
- - - දු
(මු මෘ)

- - - රුතු
- - - ශ්‍ය
(දෘ දු)

පියවර 5 : • උගත් වචන අසා ලිවීමට දෙන්න.

• **ගැටඇලපිලි දෙක**

**ක්‍රියාකාරකම** 1

පියවර 1 : • පහත ඡේදය බ්‍රිස්ල් බෝඩ් එකක ලියා ගැටඇලපිලි දෙක සහිත වචන යටින් ඉරි ඇඳ සකස්කර ගන්න.


<u>බෲ</u>නායි රටේ පදිංචි වී සිටින ඇන්<u>ඩෲ</u>, උදෙන් ම <u>බෲ</u>ස්ලි හමු වීමට ආවා. <u>කෲ</u>සෝ මේ දිනවල අසනීප ව සිටින බව <u>බෲ</u>ස්ලි කිවුවා. ඇන්<u>ඩෲ</u>ත්, <u>බෲ</u>ස්ලිත් එක් වී <u>කෲ</u>සෝ බැලීමට ගියා.

- මෙම ඡේදය කිහිප වතාවක් ශබ්ද නඟා කියවන්න.
- සිසුන් සවන් දීමට යොමු කරන්න.

**පියවර 2 :**
- 'ඎ' ශබ්දය යෙදී ඇති වචන ශබ්ද කරමින් සිසුන් ලවා ද කියවන්න.
- පසුව එම අකුරුවල ශබ්දය හඳුනාගෙන අකුරු කියවීමට යොමු කරන්න.

  බෲ, ඩෲ, කෲ, පෲ, තෲ, ගෲ

*උදා :*



- ඉහත අකුරු කිහිප වතාවක් ශබ්ද කරවන්න. ගැටඇලපිලි දෙක යෙදෙන විට ශබ්දවන ආකාරය පැහැදිලි කරන්න.
- නැවත සිසුන් ලවා ගැටඇලපිලි දෙක යෙදුණු වචන කියවා හුනු පුවරුවේ ලියන්න.
- එම වචන පස් රූලේ බලා ලිවීමට දෙන්න.

**පියවර 3 :**
- පියවර 1 දී යොදා ගත් ඡේදය ඇතුළත් ඡායා පිටපත් අකුරට යටින් අඳින ලද ඉරි ඉවත් කර සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා කියන වචන යටින් ඉරක් අඳින ලෙස උපදෙස් දෙන්න.

  බෲනායි, ඇන්ඩෲ, බෲස්ලි, කෲසෝ

**පියවර 4 :**
- උගත් වචන අසා ලිවීමට දෙන්න.

- **කොම්බු දෙක**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :**
- පහත වචන හුනු පුවරුවේ ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| චෛත්‍ය | වෛද්‍ය | ධෛර්ය | දෛවය | ශෛල |
| තෛලය | සෛල | නෛතික | දෛනික | භෛරව |
| ජෛව | මෛත්‍රිය | කෛරාටික | | |


- ගුරුවරයා මෙම වචන ශබ්ද නඟා කියවන්න.
- 'ඓ' ශබ්දය සඳහා යෙදෙන පිල්ල 'කොම්බු දෙක' බව හඳුන්වා දෙන්න.
- ඒ අනුව අකුරුවලට කොම්බු දෙක යෙදෙන විට ශබ්දවන ආකාරය පැහැදිලි කරන්න.

  *උදා :* කෛ, ගෛ, ජෛ, නෛ, හෛ, ශෛ, වෛ

**පියවර 2 :**
- හුනු පුවරුවේ ලියූ වචන ලැයිස්තුව සිසුන් සමඟ ශබ්ද නඟා කියවන්න.
- කණ්ඩායම් වශයෙන් ද කියවන්න.
- තනි තනි ව කියවීමටත් අවස්ථා ලබා දෙන්න.

**පියවර 3 :**
- කොම්බු දෙක සහිත අකුරු පස්රූල් පොත්වල ලිවීමට දෙන්න.

  *උදා :* කෛ, ගෛ, ජෛ, නෛ, තෛ, හෛ, ශෛ, . . .




- අනතුරු ව එවැනි අකුරු සහිත වචන පස් රූල් පොත්වල ලිවීමට දෙන්න.
- උගත් අකුරු සහිත වචන අසා ලිවීමට දෙන්න.

- **කොම්බුව හා ගයනුකිත්ත**

**ක්‍රියාකාරකම 1**

**පියවර 1 :** • පහත සඳහන් නම් ලියූ පත්‍රිකා සකස් කර ගන්න.




- සකස් කරගත් බෝනික්කන්ට/ළමා රූපවලට මෙම නම් ලියා අලවා ගැනීමට ද හැකි ය.
- මගේ නම කෞමිණ, මගේ නම නෞමිණ, මම සෞම්‍යා හා මම ගෞරවී ආදි වශයෙන් ගුරුවරයා මෙම බෝනික්කන්/ළමා රූප පිටුපසට ගොස් හොඳින් ශබ්දකර කියන්න.
- සිසුන්ට නම ඇසීමට කියන්න. ගුරුවරයා බෝනික්කන්/ළමා රූප පිටුපසට වී ශබ්ද නඟා මෙම ප්‍රශ්නය අසන්න.

  *උදා :* ඔයාගේ නම මොකක් ද ?
  මගේ නම කෞමිණ

**පියවර 2 :** • සකස් කරගත් බෝනික්කන්ගේ/ළමා රූපවල නම් නැවත පවසන්න.

  *උදා :* අද අපේ පන්තියට අලුත් යහළුවෝ හතර දෙනෙක් ඇවිත් නේද ?
  ඒ තමයි කෞමිණ, ගෞරවී, නෞමිණ, සෞම්‍යා

- මේ අයගේ නම් හුනු පුවරුවේ ලියන්න. අලුතෙන් හඳුන්වා දෙන ගයනුකිත්ත වෙනත් වර්ණයකින් ලියන්න.

| ෙ ෟ |
|---|

- කෞ, ගෞ වැනි ශබ්දවල 'ඖ' ශබ්දය සඳහා කොම්බුව හා ගයනුකිත්ත යෙදෙන බව පැහැදිලි කරන්න.
- තවත් අකුරුවලට කොම්බුව හා ගයනුකිත්ත යොදා ශබ්ද කිරීමට අවස්ථාව දෙන්න.
- කිහිප වතාවක් පියවර 2 හි ආරම්භයේ හඳුන්වා දුන් වචන ශබ්ද නඟා සිසුන් සමඟ කියවන්න.

**පියවර 3 :** • කොම්බුව සහ ගයනුකිත්ත යෙදුණු අකුරු කාඩ්පත් සකස් කර සිසුන්ට ලබා දෙන්න. (එක් සිසුවෙකුට එක බැගින්)

- ගුරුවරයා ශබ්ද කරන අකුර අතැති සිසුන්ට නැගිටීමට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට ක්‍රියාකාරකම අකුරු මාරු කරමින් කරවන්න.

**පියවර 4 :** • ගයනුකිත්ත යෙදෙන පහත සඳහන් වචන හුනු පුවරුවේ ලියන්න.


බෞද්ධ      ගෞතම      ලෞකික      යෞවන
පෞද්ගලික      මෞලි      සෞඛ්‍ය      නෞකාව

- මේ වචන සිසුන් සමඟ කියවන්න.
- වචනවල මුල් අකුර පමණක් ශබ්දකර පෙන්වන්න.
- නැවත වචන කියවන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** • කොම්බුව සහ ගයනුකිත්ත සහිත අකුරු පස් රූලේ ලිවීමට දෙන්න.

*උදා :*




- පියවර 1හි හා 4හි කියවීම සඳහා ගත් වචන පස් රූලේ ලිවීමට දෙන්න.

**පියවර 2 :** • පහත සඳහන් පැවරුම සෑම සිසුවකුට ම ලබා දෙන්න.

- එම ක්‍රියාකාරකම සිදු කරන අයුරු පැහැදිලි කරන්න.

| නිවැරදි අකුර තෝරා හිස්තැන් පුරවන්න. |
|---|
| -------- කාව |
| -------- ශල්‍ය |
| -------- ඛ්‍ය |
| -------- ද්‍ර |
| -------- ද්ගලික |
| (කෞ,  රෞ,  සෞ,  පෞ,  නෞ) |

## යංශය හා රකාරාංශය

යංශය හා රකාරාංශය යනු ව්‍යඤ්ජන නියෝජනය කිරීම සඳහා යෙදෙන සංකේත යි. 'ය' හා 'ර' අකුරුවල යෙදීම් විශේෂයක් ලෙස යංශය හා රකාරාංශය හැඳින්විය හැකි ය.

- **යංශය (්‍ය) හඳුන්වා දීම**

යංශය (ය+අංශය) යන ව්‍යවහාරයට අනුව යංශය යනු 'ය'කාරයේ කොටසකි. 'ය', 'ර' හැර අනෙකුත් ඕනෑ ම හල් අකුරකට පසු ව යෙදෙන 'ය'කාරය 'යංශය' ලෙස යෙදෙයි.

*උදා :* සත්‍ය, අවශ්‍ය, තුල්‍ය, ආඛ්‍යාත, විද්‍යාල

හල් අකුරට පසු ව යංශය යෙදෙන බැවින් යංශය ඊට මුලින් ඇති අකුරට බැඳෙන සේ ලිවිය යුතු ය. එවිට ඊට මුලින් ඇති අකුරට හල් ලකුණ යෙදීම අවශ්‍ය නො වේ. මුද්‍රිත අකුරුවල යංශය නොබැඳි ව ඇතත්, ලිවීමේ දී යංශය පෙර අකුරු හා බැඳ ලිවීම ලේඛන සම්ප්‍රදාය යි.

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • යංශය 'ය' යෙදෙන නම් කිහිපයක් පහත සඳහන් පරිදි කාඩ්පත්වල ලියා සකස් කර ගන්න. (පන්තියේ සිසුන්ගේ නම්වලට යංශය යෙදී ඇත් නම් ඒ නම් ද ඇතුළත් කර ගත හැකි ය.)

• යංශය වෙනත් වර්ණයකින් ලියා ගත යුතු ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| ආදිත්‍ය | කාශ්‍යප | ශාක්‍ය | කාව්‍යා | ත්‍යාගි | හිරණ්‍ය |
| නිත්‍යා | රම්‍යා | ශ්‍යාමා | සුරම්‍යා | සන්ධ්‍යා | |

පියවර 2 : • මෙම වචන පැනල් පුවරුවේ හෝ සුදුසු ස්ථානයක සියලු ම සිසුන්ට පෙනෙන පරිදි රඳවන්න.

• එක් එක් වචනය පෙන්වමින් ගුරුවරයා එම වචන දෙතුන් වතාවක් කියවන්න.

• ගුරුවරයා එක් එක් වචනය කියන විට සිසුන්ට කියවීමට උපදෙස් දෙන්න.

• කිහිප වතාවක් එසේ කියවන්න.

• වෙනත් වර්ණයකින් ලියා ඇත්තේ 'යංශය' බව පැහැදිලි කරන්න.

පියවර 3 : • පහත සඳහන් වචන පත්‍රිකා සූදානම් කරගන්න.

| | |
|---|---|
| ගද්‍ය | විද්‍යාව |
| පද්‍ය | විද්‍යාලය |
| කාව්‍ය | ව්‍යායාම |
| මාධ්‍ය | ව්‍යාපාර |
| නම්‍ය | ත්‍යාගය |
| වාක්‍ය | සංඛ්‍යාව |

• මෙම වචන ගුරුවරයා කියන විට සිසුන්ට කියවීමට උපදෙස් දෙන්න.

• එක් එක් කණ්ඩායමට කියවීමට සලස්වන්න.

• මුළු පන්තිය ලවා ම කියවන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • සිසුන් කණ්ඩායම් කරන්න.

• කියවීමට ගත් වචන පහ බැගින් කාඩ්පත් සකස් කරගන්න.

*උදා :*


| |
|---|
| ආදිත. . . . |
| සංඛ. . . .ව |
| විද. . . .ව |
| වාක. . . . |
| ත. . . .ගය |

්‍යා ්‍ය ්‍යා ්‍ය ්‍යා

• මෙම කාඩ්පත් හා යංශය සහිත කාඩ්පත් කණ්ඩායම්වලට ලබා දෙන්න.


- හිස්තැනට අදාළ යංශය සහිත කාඩ්පත් නිවැරදි ව වචන කාඩ්පතේ තැබීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම එක් වී වචන කියවීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් අතර කාඩ්පත් මාරු කරමින් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- තනි තනි ව කියවීමට යොමු කරන්න.

**පියවර 2 :**
- පහත සඳහන් ආකාරයේ පියවර අනුගමනය කරමින් '්‍ය' ලිවීම හුරු කරවන්න.
- 'යංශය' සහිත හිදැස් පත් ලබා දී, හිදැස පාට කිරීමට යොමු කරන්න.



- වැලි කඩදාසි මත ඇඟිල්ල ගෙන යාමේ ක්‍රියාකාරකම් ලබා දෙන්න.
- යංශය පස්රුලේ කඩ ඉරි මත ලිවීමට දෙන්න.

*උදා :*




- යංශය යෙදෙන කියවීමට ගත් සරල වචන බලා ලිවීමට අවස්ථා ලබා දෙන්න.
- ලියන ලද වචන තනි තනි ව කියවීමට යොමු කරන්න.

## රකාරාංශය හඳුන්වා දීම.

රකාරාංශය (රකාර + අංශය) යන ව්‍යවහාරයට අනුව රකාරාංශය 'ර'කාරයේ කොටසකි. 'ය' 'ර' හැර ඕනෑ ම හල් අකුරකට පසු ව යෙදෙන 'ර'කාරය රකාරාංශය ලෙස මුලින් තිබුණ අකුරේ පහළින් බැඳී සිටී.

*උදා :* ප්‍රවේශ (ප් + ර = ප්‍ර)

ද්‍රව්‍ය (ද් + ර = ද්‍ර)

ක්‍රමය (ක් + ර = ක්‍ර)

රකාරාංශය එය යෙදී ඇති අකුරේ පහළින් අකුරට බැඳ ලිවීම සිංහල ලේඛන සම්ප්‍රදාය යි.

**ක්‍රියාකාරකම 1**

පියවර 1 : • පහත සඳහන් ඡේදය විශාල ලෙස බ්‍රිස්ල් බෝඩ් එකක ලියාගන්න. රකාරාංශය වෙනත් වර්ණයකින් ලියන්න.

> ප්‍රාථමික අංශ භාර ප්‍රධාන ගුරුතුමා විභාග ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට ප්‍රාථමික අංශයේ රැස්වීමක් සංවිධානය කළා. එහි දී ප්‍රධාන ගුරුතුමා කතා කරමින් ප්‍රමුදිත පුතා ලංකාවේ ම ප්‍රථම ස්ථානය ලබා ගෙන ඇති බවත්, මෙය අප පාසලට මහත් ගෞරවයක් බවත් ප්‍රකාශ කළා. තම ශ්‍රමය හා කාලය කැප කරමින් නිවැරදි ක්‍රමයට පාඩම් වැඩ කළ නිසා තමා දිවයිනේ ම ප්‍රථමයා බවට පත් වූ බව ප්‍රමුදිත ද ප්‍රකාශ කළා. පාසලේ සියලු ගුරු මහත්ම මහත්මීන් තමාට මේ ජයග්‍රහණය ලබා ගැනීමට ශ්‍රමය හා කාලය කැප කිරීම ගැනත් ප්‍රමුදිත තම ප්‍රණාමය පුද කළා.

පියවර 2 : • 'ප' අකුරට රකාරාංශය යොදා ඇති ස්ථාන පෙන්වන්න. ශබ්දය 'ප්‍ර' බව කියා දෙන්න.

- ප්‍රමුදිත වචනයේ 'ප' අකුරට යටින් වක්‍රව/රවුමට දමා ඇති කොටස රකාරාංශය බව කියා දෙන්න.
- 'ප්‍ර' අකුර යෙදී ඇති වචන ශබ්ද නඟා කියවන්න.

  ප්‍රධාන, ප්‍රතිඵල, ප්‍රකාශ, ප්‍රශංසාවක්, ප්‍රථමයා, ප්‍රමුදිත, ප්‍රණාමය
- අනෙක් අකුරුවලට රකාරාංශය යෙදී ඇති වචන ද මේ ආකාරයට ම පෙන්වා දෙන්න.

  ක්‍රමය, ජයග්‍රහණය, ශ්‍රමය


පියවර 3 : • එම ඡේදයේ මුද්‍රිත ඡායා පිටපතක් සිසුන්ට ලබා දෙන්න.

- ඉන් පසු ව රකාරාංශය සහිත වචන කොටු කිරීමට උපදෙස් දෙන්න.

  [ප්‍රධාන] [ප්‍රමුදිත] . . . ආදි වශයෙනි.

පියවර 4 : • අකුරුවලට රකාරාංශය යොදා පස්රූලේ ලිවීමට අවස්ථාව දෙන්න.

උදා :



- ප්‍රහේලිකා ක්‍රමය භාවිත කරමින් රකාරාංශය යෙදෙන වචන ලිවීමට දෙන්න.

| ප්‍ර | | | |
|---|---|---|---|
| | | ධා | න |
| | ශ | | |
| | ං | | |
| | සා | | |

| ප්‍ර | | | | |
|---|---|---|---|---|
| | | ථ | ම | යා |
| | ණා | | | |
| | ම | | | |
| | ය | | | |

- මෙලෙස තවත් සුදුසු අභ්‍යාස සකස් කර රකාරාංශය නිවැරදි ව හඳුනා ගැනීමට හා ලිවීමට සිසුන් යොමු කරන්න.

**පියවර 5 :** • රකාරාංශය යෙදුණු වචන පස්රූලේ ලිවීමට අවස්ථාව දෙන්න.

- **සරල වැකි කියවීම හා ලිවීම**
  - * මේ වන විට සිංහල හෝඩියේ සියලු ම අකුරු හඳුන්වා දී ඇත.
  - එම අකුරු යෙදුණු වචන කියවීමේ හා පස් රූලේ ලිවීමේ ක්‍රියාකාරකම් ද සිදුකර අවසාන යි.
  - තනි රූලේ අකුරු පිහිටන ආකාරය පහත පරිදි වේ.
  - මධ්‍ය අක්‍ෂර, ආරෝහණ අක්‍ෂර, අවරෝහණ අක්‍ෂර, තනිරූලේ ලියා ඇති ආකාරය පැහැදිලි කරන්න.

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ

ඍ ඎ එ ඒ ඓ ඔ ඕ ඖ

අං අඃ

ක ඛ ග ඝ ඞ ඟ

ච ඡ ජ ඣ ඤ ඦ

ට ඨ ඩ ඪ ණ ඬ

ත ථ ද ධ න ඳ

ප ඵ බ භ ම ඹ

ය ර ල ව

ශ ෂ ස හ ළ ෆ

ඏ ඐ

- මීළඟට තනි රූලේ වාක්‍ය ලිවීම ආදර්ශනය කර පෙන්වන්න.
- සකස් කර ගත් වැකි වරකට එක බැගින් හුනු පුවරුවේ ලියා ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට ද එම වාක්‍ය තනි රූලෙහි ලිවීමට දෙන්න.
- තනි රූල් පොතේ ලිවීමේ දී රූල් දෙකක් හැර රූලක් ලෙස ලිවීමට උපදෙස් දෙන්න.
- සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂා කර, අවශ්‍ය ප්‍රතිකාර්ය ලබා දෙන්න.
- මෙලෙස සරල වැකි, කියවීමට හා ලිවීමට වැඩි අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ට තනි රූලේ ලිවීමට පුහුණු කරන්න.

## විරාම ලකුණු හඳුන්වා දීම

1.
- 'තිත' නැවතීමේ ලකුණ ලෙස යොදා ගත් ඡේදයක් ගෙන කියවීම ආදර්ශනය කරන්න.
- එම ඡේදයේ 'තිත' නැවතීමේ ලකුණ ලෙස යෙදුණු තැන් අවධාරණය කරන්න.
- වාක්‍ය අවසානය හැඟවීම සඳහා 'තිත' යෙදෙන බව පැහැදිලි කරන්න.
- එම ඡේදය කියවා 'තිත' යෙදෙන ආකාරය නැවත ආදර්ශනය කරන්න.
- නැවතීමේ තිතට අවධානය යොමු කරමින් සිසුන් සමඟ ද එම ඡේදය නැවත කියවන්න.
- සිසුන්ට තනි තනි ව කියවීමට දෙන්න.
- එම ඡේදයේ වැකි දෙකක් බලා ලිවීමටත්, වැකි දෙකක් අසා ලිවීමටත් දෙන්න.
- සිසුන් 'තිත' නිවැරදි ව යොදන්නේ දැයි තක්සේරු කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

2.
- ප්‍රශ්නාර්ථ ලකුණ යොදාගත් ඡේදයක් ගෙන කියවීම ආදර්ශනය කරන්න.
- 'ප්‍රශ්නාර්ථ ලකුණ' ගැන අවධාරණය කරන්න.
- ප්‍රශ්න අසන වාක්‍යවල අග, ප්‍රශ්නාර්ථ ලකුණ යොදන බව පැහැදිලි කරන්න.
- ප්‍රශ්නාර්ථය යෙදුණු වාක්‍ය කියවීමේ දී ද විරාමය තැබිය යුතු බව පැහැදිලි කරන්න.
- ලිවීමේ දී ද ප්‍රශ්න අසන වාක්‍යවල ද, වාක්‍ය අවසානයේ ප්‍රශ්නාර්ථ ලකුණ යෙදිය යුතු බව පැහැදිලි කරන්න.
- නැවතීමේ ලකුණ ලෙස 'තිත' පුහුණු වීමට දුන් ක්‍රියාකාරකම් මේ සඳහා ද අනුගමනය කරන්න.

3.
- 'කොමාව' ලකුණ යොදාගත් ඡේදයක් ගෙන කියවීම ආදර්ශනය කරන්න.
- 'කොමාව' ලකුණ ගැන අවධාරණය කරන්න.
- වාක්‍යයක් අවසන් වීමට පෙර තබන විරාමය සඳහා කොමාව යොදන බව පැහැදිලි කරන්න.
- නැවතීමේ ලකුණ ලෙස තිත පුහුණු වීමට දුන් ක්‍රියාකාරකම් මේ සඳහා ද අනුගමනය කරන්න.

4.
- නැවතීමේ තිත, ප්‍රශ්නාර්ථ ලකුණ, කොමාව යන විරාම ලකුණු තුන ම සඳහන් ඡේදයක් කියවීම් පොතෙන් තෝරා ගෙන කියවීම ආදර්ශනය කරන්න.
- විරාම ලක්ෂණ තුන ම ගැන කරුණු සිහිපත් කරන්න.
- විරාම ලකුණු සහිත කෙටි ඡේදයක් දී තිත, කොමාව, ප්‍රශ්නාර්ථය සලකුණු කිරීමට අවස්ථා දෙන්න. (තිත = රවුමක්, කොමාව = යටින් ඉරක්, ප්‍රශ්නාර්ථය = කොටුවක්)
- විරාම ලකුණු යොදා බලා ලිවීමට අභ්‍යාස දෙන්න.
- විරාම ලකුණු යොදා අසා ලිවීමේ අභ්‍යාස දෙන්න.
- විරාම ලකුණු කෙරෙහි සැලකිලිමත් ව කියවීමට වැඩිපුර අවස්ථා ලබා දෙන්න.
- විරාම ලකුණු රහිත කෙටි වැකි කිහිපයක් දී සුදුසු විරාම ලකුණු යෙදීමට අවස්ථාව දෙන්න.
- විරාම ලකුණු රහිත කෙටි වැකි සහිත සරල ඡේදයක් දී සුදුසු විරාම ලකුණු යෙදීමේ අභ්‍යාසයක නිරත කරවන්න.

**නිපුණතා** : **$L_{2}$, සවන් දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි.**

**$S_{2}$, කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.**

**$R_{2}$, කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.**

**$W_{2}$ ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි.**

ඉගෙනුම් පල :
- වචනවල ශබ්දමය වෙනස්කම් හඳුනා ගෙන භාවිත කරයි.
- නිවැරදි ලෙස අකුරු එකතුකර වචන කියවයි.
- වචනයක ඇති ශබ්ද හඳුනා ගෙන ලියා දක්වයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### පිලි රහිත අකුරු දෙකේ වචන

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- පහත සඳහන් පරිදි වචන මාලා සකස් කර ගන්න.

| | | | |
|---|---|---|---|
| උස | ඉස | බස | කස |
| උල | ඉල | බල | කල |
| උඩ | ඉඩ | බඩ | කඩ |
| උණ | ඉණ | බණ | කණ |
| උර | ඉර | බර | කර |

- මෙම වචන කට්ටල ගුරුවරයා ශබ්ද නගා කියවන්න.
- පළමු ව හරහටත්, දෙවනු ව පහළටත් කියවමින් සිසුන් සවන් දීමට යොමු කරන්න.

පියවර 2 :
- වචන මාලා සිසුන්ට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර වචනවල ශබ්ද ගැන කතා කරන්න.

  *උදා* : උස උල උඩ උණ උර
- මුලින් ඇසෙන ශබ්දය කුමක් දැයි ප්‍රශ්නකර පිළිතුරු ලබා ගන්න.
- එසේ ම උස, ඉස, බස, කස යන වචනවල අගට ඇසෙන ශබ්දය කුමක් දැයි අසා පිළිතුරු ලබා ගන්න.
- මේ ආකාරයට ම අනෙක් වචන මාලාවල මුලට, අගට ඇසෙන ශබ්ද පිළිබඳ කතා කරන්න.

පියවර 3 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- වචන මාලාවේ සඳහන් වචනවලට අදාළ අකුරු කාඩ්පත් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- එක අකුරකින් පටන් ගන්නා වචන සහිත කාඩ්පත් එක පෙළකට තබන ලෙස දැනුම්වත් කරන්න.
- ගුරුවරයා පවසන වචනයට අදාළ අකුරු එකතු කර වචන සෑදීමට සිසුන් යොමු කරන්න.
- ඒවා කියවීමට යොමු කරන්න.

පියවර 4 :
- පියවර 1හි සඳහන් වචන දහයක් අසා ලිවීමට දෙන්න.

**පිලි රහිත අකුරු තුනේ වචන**

ක්‍රියාකාරකම 2

පියවර 1 : • පහත සඳහන් වචන ඇතුළත් කාඩ්පත් සකස් කර ගන්න.

| ග | හ | ය | ස | ප |
|---|---|---|---|---|
| ගහල | හවස | යකඩ | සරම | පහන |
| ගමන | හටන | යදම | සවල | පහත |
| ගණක | හසළ | යවන | සතය | පවන |
| ගලන | හතර | යහන | සබය | පදම |
| ගණය | හබල | යසස | සතර | පළල |

- එක් එක් වචන ගුරුවරයා කියවන විට සිසුන්ට සවන් දීමට යොමු කරන්න.
- මුලින් ඇසෙන ශබ්ද හඳුනා ගැනීමට උපදෙස් දෙන්න.
- වචන කාඩ්පත් කියවා මුලින් ඇසෙන ශබ්දය සිසුන්ගෙන් අසන්න.

පියවර 2 : • සිසුන් කණ්ඩායම් කරන්න.

- පියවර 1හි දී භාවිත කළ වචන පත්‍රිකා පහත සඳහන් පරිදි කණ්ඩායම්වලට ලබා දෙන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 කණ්ඩායම | ගහල | හවස | යකඩ | සරම | පහන |
| 2 කණ්ඩායම | ගමන | හටන | යදම | සවල | පහත |
| 3 කණ්ඩායම | ගහට | හබල | යවන | සතය | පවන |
| 4 කණ්ඩායම | ගලන | හතර | යහන | සබය | පදම |
| 5 කණ්ඩායම | ගණය | හසළ | යසස | සතර | පළල |

- ගුරුවරයා 'ග' ශබ්දය කියූ විට සැම කණ්ඩායමක ම 'ග ' ශබ්දයෙන් පටන් ගන්නා වචන ඇති සිසුන්ට නැඟිට එම වචනය කියවීමට උපදෙස් දෙන්න.
- එලෙස ම 'හ', 'ය', 'ස', 'ප' ශබ්ද කියවූ විට අදාළ ශබ්දයෙන් ආරම්භ වන වචන ඇති සිසුන්ට නැඟිට එම වචන කියවීමට උපදෙස් දෙන්න.

පියවර 3 : • කියවීම් පොතේ පාඩම බැගින් නම් කර, එක් එක් කණ්ඩායමට එම පාඩම් ලබා දෙන්න.

- පාඩමේ ඇති පිලි රහිත අකුරු තුනේ වචන සොයා ලිවීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා විසින් සිසුන් ලියූ වචන හුනු පුවරුවේ ලියන්න.
- එම වචන සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- කියවන ලද වචන අසා ලිවීමට දෙන්න.

**පිලි රහිත අකුරු හතරේ වචන**

ක්‍රියාකාරකම 3

පියවර 1 :
- පහත සඳහන් කතන්දරය බ්‍රිස්ල් බෝඩ් එකක ලියා ගන්න.
- ඉරි ඇඳි වචනවල වචන කාඩ්පත් වෙන ම සකස් කර ගන්න.
- පහත සඳහන් කතන්දරය සිසුන්ට සවන් දීමට යොමු කරන්න.

පබසර, සමනලගේ හොඳ ම යහළුවා. හැමදා ම පබසර සවසට සමනලගේ ගෙදර යනවා. සමනලගේ අම්මා වත්ත පුරා ලස්සනට මල් වවලා. මල් පඳුරු අතර ලොකු හබරල පඳුරක් තිබුණා. හබරල පඳුර ළඟ තිබුණු ටයරය ඇතුළේ වතුර පිරිලා තියෙනවා පබසර දැක්කා. අර බලන්න සමනල, ටයරය ඇතුළේ වතුර. ඩෙංගු මදුරුවෝ බෝ වෙයි. සමනල කලබල වුණා. මේ ටයරයට වැලි පුරවලා තියමු. එතකොට වතුර පිරෙන්නේ නැහැ. මතක ද අපට ගුරුතුමී කියා දුන්නා. සමනලත්, පබසරත් ටයරයට වැලි පිරෙවුවා.

- දෙවන වතාවේ කතන්දරය කියන විට පහත වචන සඳහන් කාඩ්පත් එකින් එක පැනල් පුවරුවේ රඳවන්න.

*උදා :*

| | | |
|---|---|---|
| පබසර | සවසට | සමනල |
| හබරල | ටයරය | කලබල |

- මේ ආකාරයට සියලු වචන සිසුන්ට පෙනෙන පරිදි රඳවන්න.
- පැනල් පුවරුවේ රඳවන ලද වචන සිසුන් සමඟ කිහිපවරක් කියවන්න.

පියවර 3 :
- පහත වචන වගුව සිසුන්ට පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| කරවල | කරමල | කරණම | තවලම | ජලචර |
| කඨනය | මනහර | වරලස | ගනකම | ටකරම |
| කරදර | නගරය | යකඩය | තරණය | යහපත |
| තහනම | සහනය | මලකඩ | මතකය | බඹරය |
| ඉරණම | හඳහන | මකනය | වහලය | පටලය |
| බලතල | ශතකය | දශකය | සංජය | දහවල |

- එක් එක් සිසුන්ට එම වචන මාලාව නිවැරදි ව සහ වේගයෙන් ශබ්ද නඟා කියවීමට උපදෙස් දෙන්න.

පියවර 4 :
- ඉහත වචන මාලාවෙන් තෝරා ගත් වචන දහයක් අසා ලිවීමට දෙන්න.

**පිලි සහිත අකුරු දෙකේ වචන**

ක්‍රියාකාරකම 4

පියවර 1 : • පහත සඳහන් පරිදි වචන ඇතුළත් කාඩ්පත් සකස් කර ගන්න.

| 1 | 2 | 3 |
|---|---|---|
| මල - මාල | පැන - පෑන | සිත - සීත |
| පද - පාද | සැම - සෑම | නිල - නීල |
| නද - නාද | දැල - දෑල | තිර - තීර |

| 4 | 5 | 6 |
|---|---|---|
| සුර - සූර | පෙර - පේර | බොර - බෝර |
| කුර - කූර | වෙද - වේද | තොර - තෝර |
| මුදු - මූදු | ගෙන - ගේන | මොර - මෝර |

- සිසුන් සවන් දීමට යොමු කර එක් එක් වචන කාඩ්පත ගුරුවරයා ශබ්ද නගා කියවන්න.
- වචන දෙක අතර වෙනස සිසුන්ගෙන් විමසන්න.
- 'ම' - කෙටි ශබ්දයක් බවත්, 'මා' - දීර්ඝ ශබ්දයක් බවත් පැහැදිලි කරන්න. මේ ආකාරයට පද - පාද හා නද - නාද යන වචනවල මුල් අකුරේ ශබ්ද කෙටි ව හා දීර්ඝ ව ආරම්භ වන බව පැහැදිලි කරන්න.

පියවර 2 : • සකස් කරගත් වචන කාඩ්පත්වල කෙටි ශබ්දය ගුරුවරයා පවසන විට දීර්ඝ ශබ්දය සිසුන් ලවා කියවන්න.

*උදා :*

| **ගුරුවරයා** | | **සිසුන්** |
|---|---|---|
| මල | - | මාල |
| පද | - | පාද |
| නද | - | නාද |

- එක් එක් කාඩ්පත පිළිවෙළින් කියන්නට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3 : • සිසුන් කණ්ඩායම් කරන්න.

- කාඩ්පත බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට කාඩ්පත කියවන්නට අවස්ථාව දෙන්න.
- කාඩ්පත් කණ්ඩායම් අතර මාරු කරමින් කියවන්න.

පියවර 4 : • පහත සඳහන් පැවරුම සිසුන්ට ලබා දෙන්න.

- එම පැවරුම සම්පූර්ණ කරන ආකාරය පිළිබඳ උපදෙස් දෙන්න.

| | |
|---|---|
| මල - ......<br>...... - පාද<br>නද - ...... | පැන - ......<br>...... - සෑම<br>දෑල - ...... |
| සිත - ......<br>...... - නීල<br>තිර - ...... | දුර - ......<br>...... - කූර<br>...... - සූර |
| පෙන - ......<br>...... - වේද<br>ගෙන - ...... | ...... - බෝර<br>තොර - ......<br>මොර - ...... |

## පිලි සහිත අකුරු තුනේ වචන

### ක්‍රියාකාරකම 5

පියවර 1 : • පහත සඳහන් වචන කාඩ්පත්වල ලියා සකස් කර ගන්න.

| | |
|---|---|
| කුඩය - කූඩය | බුරුත - බූරුවා |
| පුටුව - පූජාව | මුහුද - මූසිල |
| රුලං - රූකඩ | තුඹස - තූර්ය |
| යුගය - යූරියා | සුමුදු - සූකිරි |
| නුවර - නූගත් | |

- ක්‍රීඩාවක් කිරීමට යන බව පවසා පහත උපදෙස් ලබා දෙන්න.
- ගුරුවරයා 'මීයෝ' කියන විට බිම වාඩි වන ලෙසත්, 'මීමෝ' කියන විට නැගිටින ලෙසත් පවසන්න.
- කිහිප වරක් ක්‍රියාකාරකම කළ පසු තමා වචන වෙනස් කරන බවත්, කෙටි ශබ්දය ඇසෙන විට වාඩි වන ලෙසත්, දීර්ඝ ශබ්දය ඇසෙන විට නැගිටින ලෙසත් උපදෙස් දෙන්න.

  *උදා :* කුඩය (වාඩි වෙන්න)

  කූඩය (උස් වෙන්න)
- මේ ආකාරයට සකස්කර ගත් වචන සියල්ලට ම සවන් දී ප්‍රතිචාර ලබා ගන්න.

**පියවර 2 :** • සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.

• එක් කණ්ඩායමක් වචන ප්‍රකාශ කිරීමටත්, අනෙක් කණ්ඩායම ක්‍රියාකාරකම කිරීමටත් යොදවන්න.

*උදා* : A කණ්ඩායම - වචන ප්‍රකාශ කිරීම (කුඩය - කූඩය)

B කණ්ඩායම - ක්‍රියාකාරකම කිරීම (වාඩි වීම - උස් වීම)

• කණ්ඩායම් දෙක මාරු වී නැවත ක්‍රියාකාරකම කරවීම. (එක් එක් අවස්ථාවල ප්‍රකාශ කරන වචන දෙක ගුරුවරයා ලබා දිය යුතු ය.)

**පියවර 3 :** • සිසුන් පන්තියට කැඳවා ගෙන එන්න.

• කාඩ්පත් සිසුන්ට ලබා දෙන්න. *උදා* : කුඩය කූඩය

• ගුරුවරයා ප්‍රකාශ කරන වචනය අතැති සිසුන්ට කාඩ්පත රැගෙන නැගිටින්නට උපදෙස් දෙන්න.

• එම සිසුන්ට ශබ්ද නඟා කාඩ්පතේ ඇති වචනය කියවීමට උපදෙස් දෙන්න.

• මේ ආකාරයට වචන සියල්ල ම කිහිප වරක් කියවීමට අවස්ථා ඇති කරන්න.

**පියවර 4 :** • පළමු පියවරේ දී යොදා ගත් වචන අසා ලිවීමට දෙන්න.

**නිපුණතා : $L_3$ කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.**
**$S_3$ කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.**

ඉගෙනුම් පල : • ළමා කවි/ගීතවලට සවන් දෙමින් වින්දනාත්මක ව ප්‍රතිචාර දක්වයි.
• කවි/ගීත, කතන්දර කියවා අවබෝධ කරගෙන එහි අන්තර්ගතය ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

**ළමා ගීත**

ක්‍රියාකාරකම 1

- පහත ගීතය කිහිප වරක් සවන් දීමට අවස්ථාව දෙන්න.
- ගීතය ගායනා කරමින් වින්දනාත්මක ව ප්‍රතිචාර දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගීතයේ අන්තර්ගතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- මෙහි දී සිසුන්ගේ අදහස් ලබා ගන්න.

**ඉරෙන් හඳෙන්**

ඉරෙන් හඳෙන් එළිය අරන් - ගහෙන් වැලෙන් සුවඳ අරන්
ඇළෙන් දොළෙන් සිසිල අරන්
අපට සැදුණු අපේ ලෝකයේ - සතුටු වෙන්න එන්න යාළුවේ //

සමනල තටු සිඳින්නෙපා - පාට මැකී යයි දේදුන්නේ
ගහවැල සිඳ දමන්නෙපා - පොළොව දැවී යයි ඉර ගින්නේ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට සදා රකිමු යාළුවේ //

නටා ගයන බට්ටි මලිත්තෝ - අපා දෙපා සිවුපා ඇත්තෝ
ඉරේ හඳේ ගහේ වැලේ - අපි වගේ ම උරුමය ඇත්තෝ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට බෙදා ගනිමු යාළුවේ //

*පද රචනය - ආචාර්ය සෝමරත්න දිසානායක*
*සංගීතය - ආචාර්ය රෝහණ වීරසිංහ*
*ගායනය - විශාරද හර්ෂණ දිසානායක*
*'සූරිය අරණ 'චිත්‍රපටය*

**කතන්දර**

**ක්‍රියාකාරකම 2 (එළිමහන් ක්‍රියාකාරකමකි)**

- පහත සඳහන් කතන්දරය රසවත් ව පවසන්න.
- කතන්දරයේ අන්තර්ගතය එහි සුන්දරත්වය හා එයින් ලැබෙන පණිවිඩය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මේ සඳහා කතාව ඇසුරින් සකස් කර ගත් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.
- මෙහි දී කතන්දරයේ අන්තර්ගතය විස්තරාත්මක ව කියවෙන පරිදි ප්‍රශ්න අසන්න.

උදා :

## වලාකුළු යාළුවෝ

ගස්වැල්වලින් පිරුණු ලොකු කැලෑවක් තිබුණා. මේ කැලෑව හරි ම ලස්සන යි. වෙනත් තැන්වල ඉඳලත් කුරුල්ලෝ, සමනල්ලු මේ කැලෑවට එනවා. ඒ අය එන්නේ කැලෑවේ ලස්සන මල්වල පැණි බොන්න, පැණි පිරුණු පලතුරු කන්න. සත්තු එනවට ගස්වැල් ගොඩක් සතුටු වුණා.

මෙහෙම කාලයක් හැම දෙනා ම සතුටින් ඉන්න අතරෙ කැලෑවට වැස්ස අඩු වුණා. මල් පිපෙන එකත්, පලතුරු හැදෙන එකත් ටික ටික අඩු වුණා. මේ හින්දා කුරුල්ලෝ, සමනල්ලු කැලෑවට ආවෙත් නැහැ. මේ ගැන ගස්වැල් හරියට දුක් වුණා. වැස්සක් වහින්න කළු වලාකුළු අහසට එනවද කියලා, ගස්වැල් හැමදා ම දුකෙන් අහස දිහා බලාගෙන හිටියා. ගස්වැල්වලට අහස දිහා බලා ඉන්න බැරි තරමට උණුසුමක් දැනුණා. සමහර ගස්වල කොළත් හැලිලා. මේ නිසා පුංචි ගස්වලට හෙවණත් නැති වුණා. ලොකු ගස් බලාගෙන ඉන්න අතරෙ පුංචි ගස් මැලවුණා. ලොකු ගස්වලට හරි ම දුක යි. දුක වැඩි නිසා ම අහසට ඇහෙන්න තරම් හයියෙන් කෑගැසුවා. කෑගහන්නේ කවුද කියලා අහසේ පාවුණ සුදු වලාකුළු සෝදිසි කර බැලුවා. වලාකුළු දැක්කා කෑගහන්නේ කැලෑවේ ගස්වැල් කියලා. එයාලා දැක්කා ලස්සනට තිබුණු කැලෑවට වෙලා තියෙන දේ. සුදු වලාකුළුවලට ගොඩක් දුක හිතුණා. සුදු වලාකුළු කළු වලාකුළුවලට කතා කළා. 'ඇයි ඔයාලා නිහඬ ව ඉන්නේ ? පහළ තිබෙන කැලෑවට වෙලා තියෙන දේ දැක්කෙ නැද්ද ?' කියලා ඇසුවා. ඒක අහලා කළු වලාකුළු කැලෑව දෙස බැලුවා. 'අපි කාලෙකින් කැලෑවට වැස්ස ලබා දුන්නේ නැහැ. අපි කළ යුතු දේ හරියට ඉටු කරලා නැහැ' කියලා කළු වලාකුළු දුක් වුණා. කළු වලාකුළු අහසේ පාවෙලා ඇවිත් ටිකෙන් ටික පරිසරය ම අඳුරු කළා. කැලෑවට වුණු විපත දැකලා කළු වලාකුළු ලොකු වැස්සක් ලබා දුන්නා.

කැලෑවේ ගස්වැල්වලට හරි ම සතුටුයි. මැලවුණ පුංචි පැළවලටත් ටිකෙන් ටික පණ ආවා. කැලෑවේ ගස්වැල් ඔක්කොම එකතු වෙලා, එයාලට සතුටින් ඉන්න උදවු කළාට වලාකුළුවලට ගොඩක් ස්තුති කළා.

### ඇඟිලි රූකඩ දෙබස්

**ක්‍රියාකාරකම 3**

- සිසුන්ගේ මහපට ඇඟිලිවලට පැළඳිය හැකි ආකාරයේ සමනලයෙකුගේ හා ළමයෙකුගේ මුහුණක් බැගින් සිසුන් සංඛ්‍යාවට අනුව සකස් කරගන්න.
- ගුරුවරයා පළමුව මහපට ඇඟිලි දෙකට මුහුණු දමා කිහිප වරක් දෙබස් පවසන්න.
- සිසුන් අඩකවයකට වාඩි කරවන්න.
- පහත සඳහන් දෙබස සිසුන්ට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.
- සැම සිසුවකුට ම සමනලයාගේ මුහුණ මහපට ඇඟිල්ලකට පැළඳ ගැනීමට පවසන්න.
- දෙබසෙහි එන 'ළමයා'ගේ කොටස ගුරුවරයා පවසන්න.

- 'සමනලයා'ගේ කොටස සිසුන්ට පැවසීමට දෙන්න.
- මෙලෙස දෙබසෙහි චරිත මාරු කර ගුරුවරයා හා සිසුන් දෙබස ඉදිරිපත් කරන්න.
- පිළිතුරු දෙන විට මුහුණු පැලඳි ඇඟිල්ල චලනය කොට පිළිතුරු දීමට සිසුන්ට පවසන්න.
- සිසුන් යුගල කර, කණ්ඩායම් කර මෙම දෙබස ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- දෙබස ඇසුරින් සිසුන්ගෙන් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

*උදා* : **දෙබස**

**ළමයා** : සමනලයෝ . . . //

**සමනලයා** : ඇයි ළමයෝ . . . //

**ළමයා** : කොහේද ඔබ ඉගිළෙන්නේ

**සමනලයා** : පැණි සොයමින් ඉගිළෙන්නේ

**ළමයා** : අපේ ගෙදර මල් වත්තේ - මල් පිපිලා හැම පැත්තේ

**සමනලයා** : එහෙනම් මට මල් වත්තට - යන්නට අවසර දෙන්නේ

**ළමයා** : ඕක අහන්නත් දෙයක් ද ? - මල් හැමට ම අයිති නේ ද ?

**සමනලයා** : ඔයා වගේ පුංචි ළමයි - හැමදෙනාට කරුණාව යි

**අනුකරණ**

**ක්‍රියාකාරකම** 4 (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- ගෙදර සිටින අය කරන වැඩ පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම වැඩට සිසුන් සහය වන ආකාරය පිළිබඳ විමසන්න.
- ඉන් පසු පහත ගීතයට සවන් දීමට අවස්ථාව දෙන්න.
- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායම්වලට ගීතයේ කියවෙන චරිත අනුකරණයට ලබා දෙන්න.
- පළමු ගීතයේ සිට පිළිවෙළින් කණ්ඩායම්වලට ගීත ගායනා කිරීමට සලස්වන්න.
- ගායනා කරමින් චරිත අනුකරණය කිරීමට උපදෙස් දෙන්න.

  - ආච්චි හරි සිරියාවයි - ආදරයෙන් මා සනසයි
    අසනීපෙන් සිටින විට දි - උදවු දෙන්නෙ මම තමයි //
  - සීයා මට ආදරෙයි - වත්ත පුරා පැළ සිටුවයි
    සීයා පැළ සිටුවන විට - උදවු දෙන්නෙ මම තමයි //
  - අම්මත් මට ආදරෙයි - නිතර ම මා ගැන සොයයි
    අම්මා ගෙදර උයන විට දි - උදවු දෙන්නෙ මම තමයි //
  - තාත්තා මගෙ හරි හොඳයි - හැම විට අවවාද දෙයි
    තාත්තා වැඩ කරන විට දි - උදවු දෙන්නෙ මම තමයි //

**නිපුණතා** : $R_3$ **කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.**
$W_3$ **කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි**

ඉගෙනුම් පල :
- කවි/ගීත/කතන්දර දෙබස් අවබෝධ කර ගෙන එහි අන්තර්ගත වචන නිවැරදි ව ලියයි.
- කවි/ගීත/කතන්දර හා දෙබස් අවබෝධ කර තමා කැමති ආකාරයට චිත්‍ර ලෙස ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ළමා කවි/ගීත

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- ඉරෙන් හඳෙන් ගීතය පැහැදිලි ව ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.
- ගීතය ඇසුරෙන් සකස් කරන ලද පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.

  *උදා* : 1. එළිය ගන්නේ කුමකින් ද ?
  2. සිසිල ලැබෙන්නේ කුමකින් ද ?
  3. නටා ගයන්නේ කවුරුන් ද ?

- සිසුන්ගෙන් ලැබුණු නිවැරදි පිළිතුරු හුනු පුවරුවේ ලියන්න.
- හුනු පුවරුවේ ලියන ලද වචන කියවීමට අවස්ථාව දෙන්න.

පියවර 2 :
- සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න.
- ගීතය පළමු කොටස එක් කණ්ඩායමකට ද, දෙවන කොටස වෙනත් කණ්ඩායමකට ද, තෙවන කොටස අනෙක් කණ්ඩායමට ද බෙදා දෙන්න.
- $A_4$ කඩදාසිය බැගින් සිසුන්ට ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු කොටස් අවබෝධ කර ගෙන තනි තනි ව චිත්‍රයක් ඇඳීමට උපදෙස් දෙන්න.
- තමා අඳින ලද චිත්‍රයට යටින් වැකියක් ලිවීමට ද උපදෙස් දෙන්න.
- ලියන ලද වැකිය කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ නිර්මාණ ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.

### කතන්දර

ක්‍රියාකාරකම 2


පියවර 1 :
- 'වලාකුළු යාළුවෝ' කතන්දරය ඡායා පිටපත් කර සිසුන්ට බෙදා දෙන්න.
- කතන්දරය දෙවතාවක් සිසුන් සමඟ කියවන්න.
- කතන්දරය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- කතන්දරය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් අසන්න.
  * කැලෑවට එන සත්තු කවුරු ද ?
  * සත්තු කැලෑවට එන්නේ කුමකට ද ?
  * කළු වලාකුළුවලට කතා කළේ කවුද ?
  * වැස්ස ලබා දුන්නේ කවුරු ද ?

**පියවර 2 :** • වලාකුළු යාළුවෝ යැයි හුනු පුවරුවේ මැද කොටුවක් තුළ ලියන්න.

• වලාකුළු යාළුවෝ කතන්දරයට සම්බන්ධ චරිත හෝ දේවල් මොනවා දැයි සිසුන්ගෙන් අසන්න.

• ඒවා හුනු පුවරුවේ පහත සඳහන් පරිදි ගොඩනඟා ගන්න.

*උදා :*




• ගොඩනඟන ලද චරිත/දේවල් ගැන වාක්‍යය බැගින් ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
*උදා :* * මේ කැලෑව හරි ම ලස්සන යි.

• සිසුන් ලියන ලද වැකි කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇඟිලි රූකඩ දෙබස්**

**ක්‍රියාකාරකම** 3

**පියවර 1 :** • 'සමනලයා සහ ළමයා' දෙබස හුනු පුවරුවේ ලියන්න.

• එම දෙබස ශබ්ද නඟා කියවන්න.

• ගුරුවරයා සමඟ සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.

• අනතුරු ව ගුරුවරයා විසින් දෙබසෙහි සඳහන් ළමයා පවසන දෙය කියවන්න.

• සිසුන්ට දෙබසෙහි සමනලයා පවසන දෙය කියන ලෙස උපදෙස් දෙන්න.

*උදා :* ගුරුවරයා : සමනලයෝ //

සිසුන් : ඇයි ළමයෝ //

• මේ ආකාරයට සිසුන් මාරු වෙමින් සමනලයා හා ළමයා චරිත මාරු කර ගනිමින් සම්පූර්ණ දෙබස කිහිප වරක් කියවන්න.

පියවර 2 : • දෙබස ඇසුරින් සකස් කරන ලද පහත සඳහන් පැවරුම ඡායා පිටපත් කර සිසුන්ට ලබා දෙන්න.

| |
|---|
| වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැනට ලියන්න.<br>1. මෙම දෙබස පවසන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .<br>(ළමයා සහ සමනලයා/ළමයා සහ මීමැස්සා)<br>2. සමනලයා ඉගිළෙන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .<br>(ගෙදර යන්න/පැණි සොයන්න)<br>3. මල් පිපිලා තිබෙන්නේ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .<br>(මල් වත්තේ/පාසල් වත්තේ)<br>4. ළමයා මල් පැණි බීමට . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .<br>(අවසර දුන්නේ නැහැ/අවසර දුන්නා)<br>5. පුංචි ළමයි හැම දෙනාට . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .<br>(කරුණාව යි/අකීකරු යි) |

**චිත්‍ර**

**ක්‍රියාකාරකම 4**

- මීට පෙර උගත් කතන්දරයෙන්/ඇඟිලි රූකඩ දෙබසින් තමා සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සියලු ම සිසුන්ගේ චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- සිසුන් චිත්‍ර ඉදිරිපිට අඩ කවයකට වාඩි කරවන්න.
- එම චිත්‍රවලින් තමා විසින් අඳින ලද චිත්‍රය පිළිබඳ ව පැවසීමට සැම සිසුවකුට ම අවස්ථාව දෙන්න.

නිපුණතා : $L_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන් දෙයි.

$S_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි.

$R_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි.

$W_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි.

ඉගෙනුම් පල :
- ලබාදෙන උපදෙස් අවබෝධ කර ගෙන ඒ අනුව ක්‍රියා කරයි.
- තොරතුරු අවබෝධ කර ගෙන ඒ අනුව ක්‍රියා කරයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### උපදෙස්

ක්‍රියාකාරකම 1

- උපදෙස්වලට සවන් දී කළ හැකි ක්‍රියාකාරකමක් තෝරා ගන්න.
  *උදා :* බෝට්ටුවක්/ගෙයක්/කුරුල්ලෙක්/බල්ලෙක් සෑදීම වැනි ඔරිගාමි ක්‍රියාකාරකමක්
- එම ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය වන උපකරණ හා ද්‍රව්‍ය ලබා දෙන්න.
- පළමු ව සෑදීමට බලාපොරොත්තු වන නිර්මාණය නම් කරන්න.
- අනතුරු ව ගුරුවරයා නිර්මාණය සාදන ආකාරය සිදු කර පෙන්වන්න.
- පියවරෙන් පියවර පැහැදිලි කරමින් සිසුන් සමඟ නිර්මාණය කරන්න.
- නිර්මාණයට සුදුසු නමක් යොදා පැහැදිලි ව පෙනෙන ලෙස ඇලවීමට උපදෙස් දෙන්න.
- ප්‍රදර්ශනය කරන ලද නිර්මාණ නැරඹීමට අවස්ථාව දෙන්න.
- සිසුන් ලියා ඇති නම් කියවීමට සෑම සිසුවකු ම යොමු කරන්න.
- තමා කරන ලද නිර්මාණය පිළිබඳ ව වැකි දෙකක් අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.

### තොරතුරු

ක්‍රියාකාරකම 2

- පහත සඳහන් නිවේදනයට සවන් දීමට සිසුන් යොමු කරන්න.

> 'අපේ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පෙබරවාරි මස 6 වැනි බදාදා පස්වරු 1.00ට පාසල් ක්‍රීඩා පිටියේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා සහභාගි වෙයි. සියලු ම සිසුන් පාසල් නිල ඇඳුමින් ක්‍රීඩා උත්සවයට සහභාගි විය යුතු ය. දෙමව්පියන් ද උත්සවයට සහභාගි වීම අනිවාර්ය වේ.'

- නිවේදනයේ සඳහන් තොරතුරු පිළිබඳ ප්‍රශ්න අසමින් සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කරන අවස්ථාවේ දී ම එම තොරතුරු හුනු පුවරුවේ සටහන් කරන්න.

*උදා :* <u>නිවාසාන්තර ක්‍රීඩා උත්සවය</u>

පැවැත්වෙන දිනය - පෙබරවාරි මස 6

ස්ථානය - පාසල් ක්‍රීඩා පිටියේ දී

ප්‍රධාන අමුත්තා - ගරු අධ්‍යාපන ඇමතිතුමා

- හුනු පුවරුවේ ලියන ලද තොරතුරු සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- නිවේදනය ඇසුරින් ප්‍රශ්න කිහිපයක් සකස් කර හුනු පුවරුවේ ලියන්න.
- ඒවාට පිළිතුරු ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**තමා පිළිබඳ තොරතුරු**

**ක්‍රියාකාරකම** 3 (එළිමහන් ක්‍රියාකාරකමකි.)

පියවර 1 :
- සිසුන් රවුමක ආකාරයට පෙළ ගස්වන්න.
- ගුරුවරයා රවුම මැද සිටින්න.
- එක් සිසුවකුට මල් මිටක්/සෙල්ලම් සතෙක් වැනි දෙයක් ලබා දෙන්න.
- ලබා දෙන විධානයට අනුව එය අතින් අත යැවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ගුරුවරයා විධානයක් ලබා දුන් විට අතින් අත යැවීම නතර කරන ලෙසට පවසන්න.
- විධානයට අනුව අතින් අත යාම නැවැත්වීමේ දී උපකරණය අත තිබුණු සිසුවා රවුම මැදට පැමිණ තමා පිළිබඳ විස්තර පවසන ලෙසට උපදෙස් දෙන්න.
- ගුරුවරයා එය කරන ආකාරය ආදර්ශනය කර පෙන්වන්න.
- මෙහි දී තමාගේ නම, වයස, ගම, කැමති ම සතා, කැමති ම කෑම වර්ගය මොනවාදැයි පැවසීමට උපදෙස් දෙන්න.
- මෙහි දී මගේ නම, මගේ වයස, . . . යනාදි ලෙස විස්තරාත්මක වැකි යොදා කීමට සිසුන් දැනුම්වත් කරන්න.
- මෙලෙස තොරතුරු පැවසීමේ දී මයික්‍රෆෝනයක් හෝ මයික්‍රෆෝනයක ආදර්ශයක් ලබා දෙන්න.
- එක් සිසුවකු තොරතුරු පැවසූ විට එම සිසුවා ද නැවත රවුමට එකතු කරගන්න.
- තොරතුරු කියූ සිසුන් හැර අන් සිසුන් අසල දී විධානය දෙන්න.
- මෙලෙස සියලු ම සිසුන් සහභාගි කර ගනිමින් ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.

පියවර 2 :
- පහත සටහන් දෙක පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

**සටහන 1**

**පිරිමි ළමයා**

මගේ නම හිරුෂ
මගේ වයස අවුරුදු 07 යි.
මගේ ගම මහරගම.
මම කැමති ම සතා ලේනා.
මම පලතුරු කන්න කැමතියි.

**සටහන 2**

**ගැහැනු ළමයා**

මගේ නම හිරුණි
මගේ වයස අවුරුදු 07 යි.
මගේ ගම මාතර.
මම කැමති ම සතා ගිරවා.
මම බත් කන්න කැමතියි.

- සටහන් දෙක සිසුන්ට ඇසෙන පරිදි ශබ්ද නගා කියවන්න.
- සිසුන්ට ද එය කියවීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ට තමාගේ රූපයක් ඇඳ පාට කර තමාගේ තොරතුරු ලිවීමට යොමු කරන්න.

**නිපුණතා : $L_5$ වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි.**

**$S_5$ වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි.**

**$R_5$ වාංමාලා සංවර්ධනය සඳහා කියවයි.**

**$W_5$ වාංමාලා සංවර්ධනය සඳහා ලියයි.**

ඉගෙනුම් පල :
- කතන්දර අසා අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- දෙන ලද තොරතුරු අවබෝධ කර ගෙන ගැටලු විසඳයි.
- සංකේත හඳුනා ගෙන අවබෝධයෙන් යුතු ව අර්ථ පැහැදිලි කරයි.
- අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව වචනවලට සවන් දී නිවැරදි ව ලියා පෙන්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

**කතන්දර**

ක්‍රියාකාරකම 1

පියවර 1 : • පහත කතන්දරය රසවත් ව පවසන්න.

**පාට පාට සමනල්ලු**

රන්දි කියලා පුංචි ගැහැනු ළමයෙක් හිටියා. එයා හරි ම ලස්සන යි. රෝස මලක් වගෙයි. රන්දි සමනලුන්ට හරි ම ආසයි. හැම වෙලාවක ම සමනලුන්ගේ චිත්‍ර අඳිනවා. සමනල්ලු හදනවා. ඒවා බිත්තිවල අලවනවා. එල්ලනවා.

රන්දි දවසක් අම්මාට මෙහෙම කිවුවා. 'අම්මේ අපේ වත්තට සමනල්ලු එන්නේ නැහැනේ. කොහොමද අම්මේ හැමදාම සමනල්ලු ගෙන්වා ගන්නේ.'

'දුවේ, අපි අපේ වත්තෙ ලස්සන මල් වවමු. ඒ ගස්වල මල් පිපුණම මල් පැණි බොන්න සමනල්ලු රැන් රැන් ඒවි. හෙට තාත්තාට නිවාඩු දවසක් නෙ. අපි හෙට මල් පැළ ටිකක් හිටවමු.' පසුවදා අම්මයි තාත්තයි රන්දියි එකතු වෙලා රෝස, අටපෙතියා, දාස්පෙතියා හා පිච්ච මල් පැළ හිටෙවුවා. හැමදාම මල් පැළවලට සාත්තු කළා. ඒ නිසා මල් ගස් සරුවට හැදුණා. ගස්වල මල් පිපෙන තුරු රන්දිට ඉවසුමක් නැහැ.

දවසක් දා රන්දි උදේ පාන්දර නැඟිටලා වත්තට ගියා. රෝස පඳුරක පුංචි පුංචි රෝස පොහොට්ටු තියෙනවා දැක්කා. රන්දි අම්මාට කතා කළා. අම්මා දුවගෙන ආවා.

'අර බලන්න අම්මේ, කහ රෝස පඳුරේ මල් පොහොට්ටු ගොඩයි.' රන්දි උඩ පැන පැන අත්පුඩි ගැහුවා. 'මල් පිපෙන්න ගොඩක් කල් යාවි ද? අම්මේ' රන්දි ඇහුවා.

'දුවේ, ඔයාට බලාගන්න පුළුවන් වේවි මලක් පිපෙන්න කොපමණ කලක් යාවිද කියලා.' රන්දි හැමදා ම උදේ ම නැගිටලා මල් බලනවා. මල් පොහොට්ටු දවසින් දවස හිනාවෙනවා වගේ රන්දිට දැනුණා. අනෙක් ගස්වලත් මල් පිපෙන්න ළඟයි. රන්දිට හරි ම සතුටුයි. දවසක් රන්දි රෝස පඳුර ළඟට ගියා. රෝස මල් සේරම පිපිලා සුවඳත් හමනවා. ඒ රෝස මල් උඩ තව මල් වගේ දෙයක් රන්දි

දැක්කා. රන්දි ටිකක් ළං වෙලා බැලුවා. එතකොට ම ඒ මල උඩට ගියා. රන්දි හොඳට බැලුවා. බලන කොට ඉගිලුනේ මල් පැණි බිබී හිටපු සමනල්ලු. රන්දි අම්මාට කතා කළා. 'අම්මේ සමනල්ලු ඇවිත්, සමනල්ලු ඇවිත් ' රන්දි සතුටින් කෑගැසුවා.

'දුවේ, සමනල්ලු අපි ඉන්න කොට පැණි බොන්න බය ඇති. කරදරයක් වේවි කියලා. අපි ඈතට වෙලා බලාගෙන ඉඳිමු.'

අනිත් ගස්වලත් මල් පිපෙන්න ළඟයි. මුළු වත්ත ම මල් සුවඳ යි. පාට පාට සමනල රෑන් රන්දිගේ වත්තට ආවා. රන්දි සමනලයින්ට ආදරේ බව සමනලයින්ට තේරුණා. රන්දි මල් වත්තෙ ඉන්න වෙලාවටත් සමනල්ලු බය නැතිව ඇවිත් මල් පැණි බිවුවා. රන්දි වටේ සමනල්ලු පියාඹලා රන්දිට 'ස්තුතියි' කියලා යන්නත් අමතක කළේ නැහැ.

රන්දි සතුටින් ඉන්නවා දැකලා අම්මාත් තාත්තාත් සතුටු වුණා. 'අපේ දුවට දැන් පාළු නැහැ. සමනල යහළුවෝ ගොඩක් ඉන්නවා' තාත්තා කිවුවා. ගෙදර හැමෝට ම හරි ම සතුටුයි.

- කතන්දරය ආශ්‍රයෙන් ප්‍රශ්න අසන්න.

  *උදා :* * රන්දි කැමති ම සතා කවුරු ද ?
  * මල් පැළ හිටවන්න එකතු වුණේ කවුරු ද ?
  * රන්දිගේ වත්තේ හිටවපු මල් වර්ග මොනවා ද ?
  * රන්දි මල් යැයි රැවටුණේ කවුරුන්ට ද ?
  * මුළු වත්ත ම සුවඳ වුණේ කොහොම ද ?
- මෙවැනි තවත් ප්‍රශ්න සකස් කර අසා පිළිතුරු ලබා ගන්න.

පියවර 2 :
- පහත සඳහන් ප්‍රකාශ කිවුවේ කවුරු දැයි සිසුන්ගෙන් අසන්න.

  උදා : * අම්මේ අපේ වත්තට සමනල්ලු එන්නේ නැහැනේ.
  * දුවේ, අපි අපේ වත්තේ ලස්සන මල් වවමු.
  * අර බලන්න. කහ රෝස පඳුරේ මල් පොහොට්ටු.
  * පුතේ සමනල්ලු අපි ඉන්නකොට පැණි බොන්න බය ඇති.
  * අපේ දුවට දැන් පාළු නැහැ. සමනල යාළුවෝ ගොඩක් ඉන්නවා.

පියවර 3 :
- කතන්දරය ඡායා පිටපත් කර සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- ගුරුවරයා පවසන පහත සඳහන් වචන ඡේදයෙන් සොයා කොටු කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම වචන කිහිප වතාවක් කියවීමට සිසුන් යොමු කරන්න.

| |
|---|
| සමනල්ලු, රෑන්, මල් පැළ, සාත්තු කළා, සරුවට, පොහොට්ටු, මල් පැණි, පියඹලා, ස්තුතියි , යහළුවෝ |

- කතන්දරයේ සඳහන් ඉහත කොටුවේ වචන අසා ලිවීමට දෙන්න.

## තේරවිලි

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පහත සඳහන් තේරවිලි කඩදාසි තීරුවල ලියා රෝල් කර, පෙට්ටියකට දමන්න.
- කණ්ඩායමකට එක් තේරවිල්ල බැගින් ගැනීමට කියන්න.
- ගුරුවරයා විසින් නම් කරන ලද කණ්ඩායම තේරවිල්ල කියන ලෙසත්, ඉතුරු කණ්ඩායම් පිළිතුර කියන ලෙසටත් උපදෙස් දෙන්න.
- මේ ආකාරයට සියලු ම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.





1. පෙට්ටි ගොඩයි - රෝද ගොඩයි
   හූ කියමින් - වේගෙන් යයි. (පිළිතුර : කෝච්චිය)
2. අව්වයි වැස්සයි - ඇති විට
   අහස පුරා - පාට හතයි (පිළිතුර : දේදුන්න)
3. බිත්තියෙ ඉන්නවා - ටක් ටක් ගානවා
   කටු කැරකෙනවා - කියන්න මගෙ නම (පිළිතුර : ඔරලෝසුව)
4. මලක් උඩ මලක්
   පියාඹන මලක් (පිළිතුර : සමනලයා)
5. සුදු පාටට නිල් පාටට - උදේට හිස් වට්ටියක්
   සුදු පාටින් දිලිසි දිලිසි - රෑටත් මල් වට්ටියක් (පිළිතුර : අහස)

**පියවර 2 :**
- ඉහත තේරවිලි ඇතුළත් පැවරුම් පතක් සිසුන්ට ලබා දෙන්න.
- තේරවිලි කියවා ඉදිරියෙන් ඇති හිස් තැනෙහි පිළිතුර ලිවීමට උපදෙස් දෙන්න.

## සංකේත

**ක්‍රියාකාරකම 3** (එළිමහන් ක්‍රියාකාරකමකි)

**පියවර 1 :**
- පහත සඳහන් සංකේත $A_4$ ප්‍රමාණයට ඇඳ රැඳවීමට හැකි ආකාරයට සකස් කර ගන්න. සංකේතයට අදාළ වචන පත්‍රිකා ද සකස් කර ගන්න.

| | | | | |
|---|---|---|---|---|
| සංකේත |  |  |  |  |
| වචන පත්‍රිකා | බස් රථ නැවතුම | ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි | රෝහල | පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි |

මහා මාර්ගෝපදේශ සංග්‍රහය, 2000
මෝටර් රථවාහන දෙපාර්තමේන්තුව.

- සකස් කර ගත් සංකේත සුදුසු ස්ථානයක් තෝරා ගෙන රඳවන්න.
- සංකේත ගැන සිසුන් සමඟ කතාබහ කරන්න.
- අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම සංකේත දුටු තැන් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 2 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් වරකට එක් කණ්ඩායමකට භූමිකා රංගනයෙහි නිරත වීමට අවස්ථාව ලබා දී අනෙක් සිසුන් නැරඹීම සඳහා නිරත කරවන්න.
- භූමිකා රංගනය සඳහා පහත සඳහන් අවස්ථාව යොදා ගන්න.
- පියවර 1හි යොදා ගත් සංකේත මේ සඳහා භාවිත කරන්න.

ළමයි කණ්ඩායමක් පාසල් යන්න පිටත් වුණා. පාර මාරු වෙන්න කහ ඉර ළඟ බලා ගෙන හිටියා. දෙපැත්තේ ම වාහන නතර කළාට පසුව පාර මාරු වුණා. බස් නැවතුම ළඟ බසය එන තුරු හිටියා. බසයක් ආවා. බසයට ගොඩ වුණා. පාසල ළඟට ආවා. හැමෝම පාසලට ගියා. එදා ක්‍රීඩා තරග තිබුණා. එක යාළුවෙක් වැටිලා තුවාල වුණා. එයාව රෝහලට ගෙන ගියා.

- මේ කතාවට අනුව භූමිකා රංගනයක නිරත වීමට සිසුන් මෙහෙයවන්න.

**පියවර 3 :**
- පන්ති කාමරයේ සිසුන්ට පෙනෙන පරිදි ඉහත සංකේත ප්‍රදර්ශනය කරන්න. වචන පත්‍රිකා ද අදාළ සංකේතය යට රඳවන්න.
- අදාළ වචන පත්‍රිකා සිසුන් ලවා කිහිප වරක් කියවන්න.
- වචන පත්‍රිකා පුවරුවෙන් ඉවත් කරන්න.
- උගත් සංකේත පමණක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සංකේතය අභ්‍යාස පොතේ ඇඳ ඊට අදාළ ප්‍රකාශය ලිවීමට උපදෙස් දෙන්න.

## නිපුණතා : $L_6$ සන්නිවේදනය සඳහා සවන් දෙයි.
## $S_6$ සන්නිවේදනය සඳහා කතා කරයි.

ඉගෙනුම් පල : • අන් අය හා සංයමයෙන් යුතු ව සන්නිවේදනය කරයි.
• අන් අයගේ අදහස්වලට තම අදහස් එකතු කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**යහළුවෝ**

**ක්‍රියාකාරකම** 1

- සිසුන් කැමට කැමති පලතුරු වර්ග පිළිබඳ ව සාකච්ඡාවක් පවත්වන්න.
- සිසුන් තිදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- ඩිමයි කොළයකින් බාගයක් ගෙන හිස් වට්ටියක රූපයක් ඇඳ කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.
- බහු මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දේ කණ්ඩායම්වලට සපයන්න. (පාට හුනු කුරු, වර්ණ කිහිපයකින් වාර්නිෂ් කොළ, ගම්, ඇට වර්ග, . . . වැනි)
- 'දැන් අපි පලතුරුවලින් වට්ටි පුරවමු.' යැයි සිසුන්ට යෝජනා කරන්න.
- සිසුන් කළ යුතු දේ පිළිබඳ ව පහත උපදෙස් ලබා දෙන්න.
  * කණ්ඩායමේ තිදෙනා එක ළඟ වාඩි වෙන්න.
  * කණ්ඩායම මැද්දෙන් මේසය මත ඩිමයි කොළය තබා ගන්න.
  * තිදෙනා ම එකතු වී වට්ටිය පලතුරුවලින් පුරවන්න.
  * ඇඳීම, පාට කිරීම, ඇලවීම වැනි විවිධ ක්‍රමවලින් නිර්මාණය කළ යුතු බවට දැනුම්වත් කරන්න.
  * කණ්ඩායම සාකච්ඡා කර සුදුසු ම ද්‍රව්‍ය තෝරා ගත යුතු බවට උපදෙස් දෙන්න.
  * සිසුන් තිදෙනා කතා කරමින්, ද්‍රව්‍ය තෝරමින්, වෙනස් කරමින්, අදහස්, යෝජනා ඉදිරිපත් කරමින් නිර්මාණ කළ යුතු බවට උපදෙස් දෙන්න.
  * විවිධ අදහස් එක් කරන්නේ ද යන්න පිළිබඳ ව අවධානයෙන් සිටින්න.
  * අවසානයේ පලතුරු වට්ටි සියල්ල ප්‍රදර්ශනය කරන්න.

**ගුරුවරු**

**ක්‍රියාකාරකම** 2

- සිසුන් කවාකාර ව වාඩි කරවන්න.
- ගුරුවරයා විසින් වඩාත් ප්‍රියජනක ආකාරයට වැල් කතාවක් ගොඩනැඟීම අරඹන්න.
- කතාව ඇරඹීමෙන් අනතුරු ව දෙවන පියවරේ දී ගුරුවරයා නම් කරන ලද සිසුවාට එම කතාව ඉදිරියට ගෙන යාම සඳහා වැකියක් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- නැවතත් ගුරුවරයා වැකියක් කතාවට එකතු කරන්න.
- මේ ආකාරයට සිසුන් සියලු දෙනාට ම එක් වැකියක් බැගින් ප්‍රකාශ කිරීමටත්, එම වැකිවලට සවන් දීමටත් සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසු වැකියක් අවසානයේ ම ගුරුවරයා ද වැකියක් එක් කරන්න.

**වෙළෙඳ පොළ**

**ක්‍රියාකාරකම** 3

- සිසුන් සමඟ වෙළෙඳ පොළ පිළිබඳ ව කතාබහක යෙදෙන්න. (වෙළෙඳාම් කරන අයුරු, බඩු මිල දී ගන්නා අයුරු, ආදිය . . .)
- ආදර්ශ වෙළෙඳ පොළක් සංවිධානය කිරීමට යෝජනා කරන්න.
- පෙර වසරේ අත්දැකීම් ද යොදා ගැනීමට උපදෙස් දෙන්න.
- වෙළෙඳ පොළ සංවිධානයේ දී,
  * පවත්වන ස්ථානය
  * ගෙන ආ යුතු දේ
  * සහභාගි වීමට ආරාධනය කළ යුතු අය . . . පිළිබඳ ව සිසුන්ට යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- විකිණීමට ගෙන ආ ආහාර වෙළෙඳ පොළ තුළ ස්ථානගත කිරීමට අවස්ථාව සිසුන්ට ලබා දෙන්න.
- වෙළෙඳපොළ පැවැත්වීමේ දී,
  - විනීත ව හැසිරීම
  - වචන භාවිතයේ ප්‍රායෝගිකත්වය, ගුණාත්මක භාවය

  යන කරුණු පිළිබඳ ව ගුරුවරයා අවධානයෙන් සිට ඊට මඟ පෙන්වන්න.
- ගුරුවරුන්ට, දෙමව්පියන්ට සහ වෙනත් ශ්‍රේණිවල සිසුන්ට බඩු මිල දී ගැනීමට අවස්ථාව සලසන්න.

**දුරකථන**

**ක්‍රියාකාරකම** 4

- සෙල්ලම් දුරකථනයක් සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය පෙර දින සූදානම් කර ගන්න.
- මෙහි දී හිස් සබන් පෙට්ටියකට ඩිමයි කොළ හෝ පාට $A_4$ කඩදාසි අලවන්න.
- සිසුන් ලවා ම අංක හා අවශ්‍ය සංකේත ලියවන්න.
- සුදුසු පරිදි පාට කරවන්න.
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- දුරකථනයකින් කතා කළ යුතු ආකාරය තවත් ගුරුවරයෙකුගේ ද සහය ඇති ව ආදර්ශනයක් කර පෙන්වන්න. එහිදී පහත සඳහන් අවස්ථා පිළිබඳ ව වැඩි අවධානය යොමු කරන්න.
  * සුහදශීලී ආරම්භය
  * පැහැදිලි වචන උච්චාරණය
  * සවන් දෙමින් තම අදහස් ඉදිරිපත් කිරීම
  * සුහදශීලී සමු ගැනීම
- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- ආදර්ශනයේ දී දුටු හා ඇසුණු දේ මතකයට නඟා ගනිමින් කණ්ඩායම්වලට පහත මාතෘකා ඔස්සේ කතා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  1. ඊයේ පාසලට නොපැමිණි යහළුවන් සමඟ
  2. හෙට පාසලට ගෙන ආ යුතු දේවල් පිළිබඳ දැනුම්වත් වීමට
  3. මගේ පොතක් නැති වෙලා. ඔබේ බෑගයේ තිබේ දැයි දැන ගැනීමට
- ආදර්ශනයේ දී වැඩි අවධානය යොමු කළ අවස්ථා පිළිබඳ ව ගුරුවරයා අවධානය යොමු කරන්න.


**නිපුණතා : $R_6$ සන්නිවේදනය සඳහා කියවයි.**
**$W_6$ සන්නිවේදනය සඳහා ලියයි.**

**ඉගෙනුම් පල** : • මිල සටහන්වල හා ලේබල්වල ඇති දේ කියවා ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### ද්‍රව්‍යවල නම්

**ක්‍රියාකාරකම 1**




- සිසුන්ගේ උසට ගැළපෙන ආකාරයට, වෘත්තාකාර කොටස කරකැවීමට හැකි වන සේ 'වාසනා චක්‍රයක' අනුරුවක් සකස් කර ගන්න.
- පින්තූරයේ පෙනෙන පරිදි වෘත්තයේ බෙදා ඇති කොටස් විවිධ වර්ණවලින් ද, ඊතලය වෙනත් වර්ණයකින් ද සකස් කරගන්න.
- වෘත්තයේ කොටස්වලට යෙදූ වර්ණවලින් යුත් පෙට්ටි කිහිපයක් ද සකස් කර ගන්න.
- පන්ති කාමරයේ ඇති ද්‍රව්‍යවල නම් කාඩ්පත්වල ලියා පෙට්ටිවල බහා තබන්න.
- එක් එක් සිසුවා වාසනා චක්‍රය කැරකැවීමටත්, ඊ හිස රැඳෙන වර්ණයට අනුව පෙට්ටිය තෝරා ගැනීමටත් උපදෙස් දෙන්න.
- අනතුරු ව එක් කාඩ්පතක් ඉවතට ගෙන ශබ්ද නඟා කියවා පැනල් පුවරුවේ රැඳවීමට යොමු කරන්න.
- අවසානයේ සියලු ම සිසුන් පැනල් පුවරුවේ රඳවා ඇති වචන නිශ්ශබ්ද ව කියවමින් වචන අටක් තෝරා අභ්‍යාස පොතේ ලිවීමටත් යොමු කරන්න.

### මිල සටහන්

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** • බ්‍රිස්ල් බෝඩ් එකක පහත මිල දර්ශනය ලියා සකස් කර ගන්න.

**මිල දර්ශනය**

| | |
|---|---|
| අඹ ගෙඩියක් | රුපියල් 10 |
| ඇපල් ගෙඩියක් | රුපියල් 15 |
| අන්නාසි ගෙඩියක් | රුපියල් 20 |
| කෙසෙල් ගෙඩියක් | රුපියල් 5 |
| දොඩම් ගෙඩියක් | රුපියල් 12 |

- මිල දර්ශනය ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- එය සිසුන් සමඟ කිහිප වරක් පමණ කියවන්න.

- මිල දර්ශනය ඇසුරෙන් සරල ප්‍රශ්න කිහිපයක් අසන්න.

  *උදා :* * මිල දර්ශනයේ තිබෙන පලතුරු මොනවා ද ?

  * අන්නාසි ගෙඩියක් කීය ද ?
  * රුපියල් 15ට ගත හැකි පලතුර කුමක් ද ?

පියවර 2 : • සිසුන් කණ්ඩායම් කරන්න.

- කණ්ඩායමකට බ්‍රිස්ල් බෝඩ් බාගය බැගින් දෙන්න.
- 'අපි ලස්සනට මිල දර්ශනයක් හදමු' යැයි සිසුන්ට යෝජනා කරන්න.
- මිල දර්ශනය බලන්නාගේ සිත් ඇද ගන්නා පරිදි සකස් කළ යුතු බවට ද උපදෙස් දෙන්න.
- සිසුන් මිල දර්ශනය සකස් කරන අයුරු නිරීක්ෂණය කරන්න.
- කණ්ඩායම්වල මිල දර්ශන සකස් කළ පසු ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- මිල දර්ශන සකස් කර ඇති ආකාරය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ලේබල්**

**ක්‍රියාකාරකම** 3

- සිසුන් සෙල්ලම් මිදුලේ ඇති සෙල්ලම් ගෙදරට කැඳවා ගෙන යන්න.
- 'අපි අද සෙල්ලම් ගෙදර මුළුතැන්ගෙයට අවශ්‍ය ධාන්‍ය වර්ග, කුළුබඩු වර්ග, බෝතල්වල/ටින්වල අහුරමු. ලේබල් අලවමු' යැයි සිසුන්ට යෝජනා කරන්න.
- ඒ සඳහා අවශ්‍ය හිස් භාජන හා හිස් ලේබල් සූදානම් කර ගන්න.
- ළමයි කණ්ඩායම්වලට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායම් සඳහා ලේබල් කළ හැකි ද්‍රව්‍ය ලැයිස්තු ලබා දෙන්න. (*උදා :* කඩල, තල, පරිප්පු, මුං, අබ, ගම්මිරිස්, . . . වැනි) හිස් බඳුන් ද ලබා දෙන්න.
- සිසුන්ට ද්‍රව්‍ය ලැයිස්තුව කියවා හිස් ලේබල්වල ලියා, බඳුන්වල ඇලවීමට උපදෙස් දෙන්න.
- සෑම සිසුවකුට ම ලේබලයක් ලිවීමේ හා ඇලවීමේ අවස්ථාව ඇති කරන්න.
- සෙල්ලම් ගෙදර තුළ ලේබල් කරන ලද බඳුන් ස්ථානගත කිරීමට සිසුන් මෙහෙයවන්න.

**නිපුණතා** : **$S_7$ භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.**

**$L_7$ භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි.**

**$R_7$ භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.**

**$W_7$ භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි.**

ඉගෙනුම් පල :
- පින්තූරවල ඇති දේ අවබෝධ කර ගෙන ඒ පිළිබඳ සටහන් තබයි.
- ජනක්‍රීඩා හා උත්සව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

**පින්තූර**

ක්‍රියාකාරකම 1

පියවර 1 : • පහත පින්තූරය විශාල කර ප්‍රදර්ශනය සඳහා සූදානම් කර ගන්න.



- පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරය දෙස බලා, ඒ පිළිබඳ ව කතා කිරීමට සිසුන්ට ඉඩ ලබා දෙන්න. (රූපයේ පෙනෙන දෙයට වඩා වැඩි අරුතක් දෙන වැකි සැකසීමට සිසුන් යොමු කරන්න. *උදා :* කිරිල්ලී කෑම රැගෙන පැටවුන් ළඟට ඇවිල්ලා)
- අහඹු ලෙස තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුට සකස් කළ වැකි පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
- එම වැකි හුනු පුවරුවේ ලියන්න.
- ලියූ වැකි සිසුන් සමඟ කියවන්න.

පියවර 2 : • පින්තූරයට අදාළ වැකි සහිත පහත සඳහන් පැවරුම සිසුන්ට ලබා දෙන්න.

| |
|---|
| පළමු වැකිය කියවා දෙවන වැකිය සම්පූර්ණ කරමු.<br><br>* කිරිල්ලී පැටවුන්ට කෑම දෙනවා.<br>කුරුලු පැටවුන් . . . . . . . . .<br><br>* කිකිළී කෑම සොයනවා.<br>පැටවුන් . . . . . . .<br><br>* පූස් පැටියා මනුති ළඟ ඉන්නවා.<br>මනුති, පැටියාගේ . . . . . . .<br><br>* එළදෙන වසු පැටියා නාවනවා.<br>වසු පැටියා . . . . . . . |

**ජන ක්‍රීඩා**

**ක්‍රියාකාරකම 2 - රාහු බැලීම** (එළිමහන් ක්‍රියාකාරකමකි.)

පියවර 1 : • රාහුගේ මාලිගය ලෙස එක් ස්ථානයක් තෝරා ගන්න. (*උදා* : ගසක්/ගොඩනැගිල්ලක් අසල) (ක්‍රීඩාව ආරම්භ කරන ස්ථානයේ සිට මීටර් 40ක් පමණ ඉදිරියෙන් මාලිගය තිබේ නම් සුදුසුයි.)

- රාහු ලෙස සිසුන්ගෙන් කෙනෙකු තෝරා ගන්න.
- රාහු ලෙස තෝරා ගත් සිසුවාට මාලිගය දෙසට යන ලෙසත්, අනෙක් සිසුන්ට රාහුට පිටුපසින් ගමන් කරන ලෙසත් පවසන්න.
- ගුරුවරයා විධානය දුන් පසු පහත ගීතයේ පළමු ගී ඛණ්ඩය කියමින්, රාහුට මාලිගය දෙසට යන ලෙස උපදෙස් දෙන්න.
- සෙසු අයට පිළිතුරු ගී ඛණ්ඩය කියමින් රාහුට පිටුපසින් පැමිණීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා ද තාලානුකූල ව ගී ඛණ්ඩ කියමින් ක්‍රීඩාවේ යෙදෙන්න.

රාහු : රන්තරු අස්සේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : පුන්සඳ අස්සේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : රන්ගිර මත්තේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : සමුදුර මත්තේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : ගුවන් තලාවේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : නිල්තුරු වදුලේ
පිරිස : ඉදල ද එන්නේ . . . ?
රාහු : මාගේ දරුවෝ
පිරිස : අපි වෙමු දරුවෝ

(හෙළ ජන කෙළි සෙල්ලම් - රෝහිණී කුමාරි මුවන්දෙණිය)

- 'අපි වෙමු දරුවෝ' යැයි කියනවාත් සමඟ ම රාහු පිටුපස බැලිය යුතු බවටත්, අනෙක් සිසුන් බිම වාඩි විය යුතු බවටත් උපදෙස් දෙන්න.

- වාඩි වීමට නොහැකි වූ සිසුවකුට හෝ සිසුන්ට, රාහුගේ දරුවන් ලෙස රාහුගේ අත අල්ලා ගෙන ඉදිරියට ගමන් කිරීමට සලස්වන්න.
- මාලිගය අසලට යන තෙක් රාහුට සහ දරුවන්ට ඉදිරියට ගමන් කරමින් ගීතය ගායනා කරන ලෙසටත්, ඉතුරු පිරිසට ද පිළිතුරු ගී ඛණ්ඩ කියමින් යන ලෙසත් පවසන්න.
- අවසාන වශයෙන් රාහුට අසු නොවූ සිසුන් රාහුගෙන් බේරුණු අය බව පවසන්න.
- රාහුට අසු වූ සිසුන් විසින් රාහුට අසු නොවූ සිසුන් අත්පොළොසන් දී පිළිගැනීමට අවස්ථාව සලසන්න.
- සිසුන්ට ක්‍රීඩාව වඩාත් තහවුරු කිරීමට වෙනත් සිසුවකු රාහු ලෙස යොදවා ක්‍රීඩාව නැවත කරන්න.

**පියවර 2 :** • පහත සඳහන් පැවරුම සිසුන්ට ලබා දෙන්න.

හිස් තැනට සුදුසු පදය පහත වරහනින් තෝරා ලියන්න.

රාහු : . . . . . අස්සේ
පිරිස : ඉඳල ද එන්නේ . . . ?

රාහු : පුන්සඳ . . . . .
පිරිස : ඉඳල ද එන්නේ . . . ?

රාහු : රන්ගිර . . . . .
පිරිස : ඉඳල ද එන්නේ . . . ?

රාහු : සමුදුර මත්තේ
පිරිස : . . . . . ද එන්නේ . . . ?

රාහු : . . . . . තලාවේ
පිරිස : ඉඳල ද එන්නේ . . . ?

රාහු : නිල්තුරු . . . . .
පිරිස : ඉඳල ද එන්නේ . . . ?

රාහු : මාගේ . . . . .
පිරිස : අපි වෙමු දරුවෝ


(රන්තරු/වදුලේ/මත්තේ/ අස්සේ/ගුවන්/ඉඳල/දරුවෝ)

- පැවරුම් සම්පූර්ණ කර එහි සඳහන් ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.

**උත්සව**

**ක්‍රියාකාරකම** 3

**පියවර** 1 : • පහත පින්තූරය සිසුන්ට පැහැදිලි ව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.



- පින්තූරයේ පෙනෙන්නේ කුමන අවස්ථාවක්දැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගේ පිළිතුරට අනුව ක්‍රීඩා උත්සවය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

**පියවර 2 :** • සිසුන් කණ්ඩායම් කරන්න.

• පහත සඳහන් වැකිවලට අදාළ වචන කාඩ්පත්වල ලියා වෙන වෙන ම සකස් කර ගන්න.

* | ජාතික | කොඩියට | ගරු | කරමු. |
* | විදුහල්පතිතුමා | තෑගි | දුන්නා. |
* | දෙමව්පියෝ | ක්‍රීඩා | උත්සවය | බලනවා. |
* | ළමයි | තරගයට | දුවනවා. |
* | නිවාස | සරසලා | තිබුණා. |

• සිසු කණ්ඩායම් ප්‍රමාණයට අනුව වචන කාඩ්පත් කට්ටලය බැගින් සකස් කර ගන්න.

• කට්ටලයේ සඳහන් වචන ගළපා වැකි සකස්කර ලිවීමට උපදෙස් දෙන්න.

**නිපුණතා : $L_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි.**
**$S_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.**
**$W_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි.**
**$R_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.**

**ඉගෙනුම් පල** :
- තම අත්දැකීම් චිත්‍ර මඟින් ඉදිරිපත් කර ඒ පිළිබඳ පැහැදිලි කරයි.
- තම අත්දැකීමක් අන් අය හා ප්‍රකාශ කර අදහස් දැන ගනියි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

### අඳින ලද චිත්‍ර

**ක්‍රියාකාරකම 1 :**

- නිවාඩු දිනවල දී සිසුන් කරන වැඩ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- සැම සිසුවකුට ම සාකච්ඡාවට සහභාගි කරවන්න.
- $A_4$ කොළය බැගින් සිසුන්ට ලබා දෙන්න.
- නිවාඩු දිනයක දී තමා කළ දෙයක් චිත්‍රයට නැඟීමට අවස්ථාව ලබා දෙන්න.
- සැම සිසුවකු ම විසින් අඳින ලද චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- සිසුන් ප්‍රදර්ශන පුවරුව ඉදිරිපිට අඩ කවයකට වාඩි කරවන්න.
- එක් එක් සිසුවා බැගින් ප්‍රදර්ශන පුවරුව අසලට කැඳවන්න.
- තමාගේ චිත්‍රය දෙස බලා වැකිය බැගින් ශබ්ද නගා පැවසීමට අවස්ථාව දෙන්න.
- තමා අඳින ලද චිත්‍රය දෙස බලා වැකි තුනක් අභ්‍යාස පොතේ ලිවීමට අවස්ථාව දෙන්න.
- අභ්‍යාස පොත් නිරීක්ෂණයේ දී වැකි කියවීමට උපදෙස් දෙන්න.

### චාරිකා

**ක්‍රියාකාරකම 2 :**

- ගුරුවරයා විසින් පහත සඳහන් ස්ථානවලින් එකක් හෝ සුදුසු වෙනත් ස්ථානයක් තෝරා ගෙන සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* කෞතුකාගාරය, ග්‍රහලෝකාගාරය, ළමා උද්‍යානයක්, මුහුදු වෙරළ, කඳුකරය, දිය ඇල්ලක්, ගොවි බිමක්
- තෝරා ගත් ස්ථානය පිළිබඳ ව වීඩියෝ පටයක් හෝ පින්තූරයක් ආධාරයෙන් පැහැදිලි කර දෙන්න.
- ඒ පිළිබඳ ව සිසුන්ට ගුරුවරයාගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් ස්ථානය පිළිබඳ ව සිසුන්ට වැකි තුනක් ලිවීමට දෙන්න.
- සිසුන් විසින් ලියන ලද වැකි පරීක්ෂා කරන්න.
- ලියූ වැකි තනි තනි ව කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**සහභාගි වූ අවස්ථා**

**ක්‍රියාකාරකම 3 :**

**පියවර 1 :**
- උදාහරණයේ සඳහන් පරිදි සුදුසු අවස්ථාවක් තෝරා ගන්න.

  *උදා :* පාසලේ ක්‍රීඩා උත්සවය/අවුරුදු උත්සවය/චාරිකා/විවිධ ප්‍රසංගය/සිසුන් සියලු දෙනා සහභාගි වූ වෙනත් අවස්ථා
- තෝරා ගත් අවස්ථාව පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙහි දී ඡායාරූප, චිත්‍ර, පින්තූර, සංයුක්ත තැටි උපයෝගී කර සාකච්ඡාව රසවත් කර ගන්න.
- සාකච්ඡාව ඇසුරින් සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.

**පියවර 2 :**
- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- වැකි ලිවීම සඳහා සෑම සිසුවකුට ම කඩදාසි තීරුව බැගින් ලබා දෙන්න.
- සාකච්ඡා කළ අවස්ථාව පිළිබඳ ව වැකියක් ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එක් එක් කණ්ඩායම්වල ලියන ලද වැකි වෙන වෙන ම ඩිමයි කොළවල අලවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කර සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**නිපුණතා : $L_9$ අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන් දෙයි.**

**$S_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව හා අවස්ථෝචිත ව කතා කරයි.**

**$W_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව හා අවස්ථෝචිත ව ලියයි.**

**$R_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව හා අවස්ථෝචිත ව කියවයි.**

ඉගෙනුම් පල :
- කවි/ගීත, කතන්දර, දෙබස්වල ඇතුළත් දේ පිළිබඳ සරල අදහසක් ඉදිරිපත් කරයි.
- තොරතුරු සොයා ඒ පිළිබඳ අදහසක් ඉදිරිපත් කරයි.
- ළමා කතන්දර පොත් කියවා එහි ඇතුළත් දේ පිළිබඳ ප්‍රකාශ කරයි.
- ළමා කතන්දර පොත් කියවා වැකි දෙකක් ගොඩනඟයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

- **ළමා කවි/ගීත**

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- කුරුම්බැට්ටි මැෂිමක් සකස් කර ගෙන ඒමට උපදෙස් දෙන්න.
- සිසුන්ට තමාගේ කුරුම්බැට්ටි මැෂිම හඬ නැංවීමට අවස්ථාව දෙන්න.
- අනතුරු ව පහත සඳහන් ගීතය සුදුසු ක්‍රමවේදයක් උපයෝගී කර ගෙන සිසුන්ට සවන් දීමට සලස්වන්න.

**කුරුම්බැට්ටි මැෂිමේ**

කුරුම්බැට්ටි මැෂිමේ
මගෙ කුරුම්බැට්ටි මැෂිමේ //
ගවුම් පොඩිත්තක් මහලා ඕනැ ද
කමිස පොඩිත්තක් මහලා ඕනැ ද //
කුරුම්බැට්ටි මැෂිමේ . . . .

පියවර 2 :
- කුරුම්බැට්ටි මැෂිම හඬ නංවමින් ගීතයට සවන් දීමට යොමු කරන්න.
- සම්පූර්ණ ගීතය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ගීතය සිසුන් සමඟ තාලයට ගායනා කරන්න.
- අනතුරු ව ගීතය ඇසුරෙන් සකස් කර ගත් සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසා පිළිතුරු ලබා ගන්න.

පියවර 3 :
- ගීතය ඇසුරෙන් සකස් කරන ලද පහත ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට අවස්ථාව දෙන්න.
  1. කමිස හා ගවුම් මහන්නේ කුමකින් ද ?
  2. කොස් කොළයෙන් මහන්නේ කුමක් ද ?
  3. හිල් විදින්නේ කුමකින් ද ?
  4. ගොක් කොළ රෙද්දෙන් මහන්නේ මොනවා ද ?

- **ළමා කතන්දර**

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :**
- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- පහත කතන්දරය දෙවතාවක් පමණ සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- කතන්දරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

## අන්දරේ ගල ඉස්සූ කතාව

ගමරාල කෙනෙකුගේ කුඹුරක ලොකු ගලක් තිබුණා. ලියද්ද මැද්දේ ගලක් තිබීම ගොවිතැනට කරදරයක්. ගමරාල බොහෝ වියදම් කර, සෙනඟ උදවු කරගෙන ගල ඉවත් කරන්න ගොඩක් උත්සාහ කළා. ඒත් ඒ මොන විදියකට වත් ගල ඉවත් කරන්න තියා ගල හොල්ලන්න වත් බැරි වුණා.

මේ බව අසන්නට ලැබුණු අන්දරේ ගමරාලට විහිළුවක් කරන්න කල්පනා කළා. අන්දරේ ගමරාල හමු වී 'ගම මහත්තයා, ඔය ගල අරගෙන ගිහින් වෙන තැනකින් දමන්න මට පුළුවන්. හැබැයි මට මාසයක් පුරාවට හොඳට කන්න බොන්න දෙන්න ඕනෑ' යැයි පැවසුවා. ගමරාල අන්දරේගේ කීම පිළිගත්තා.

අන්දරේට දවස ගානේ බඩකට පුරා කන්න එක එක කෑම වර්ග ගමරාල හදලා දුන්නා. අන්දරේ දවසේ හැම වෙලාවේ ම කනවා, බොනවා, නිදා ගන්නවා. ආයෙත් ඇහැරෙනවා, කනවා, බොනවා, නිදා ගන්නවා. මේ විදියට මාසයක් ම අන්දරේ හොඳට කෑවා.

මාසය අවසන් වූ දවසේ අන්දරේ ගමරාලගේ කුඹුරේ ගල ඉවත් කරන්නට යන බව ගම පුරා පැතිර ගියා. ඒක බලන්න සෙනඟ ගොඩක් ආවා.

අන්දරේ එදත් බඩ පිරෙන්න කෑම කෑවා. කොළපතකුත් අතින් අරගෙන කුඹුරට ආවා.

අන්දරේ ගල ළඟට ගොස් කොළපත කරේ තබා ගෙන කුඹුරේ සිටි සෙනඟට මෙහෙම කිවුවා. 'හා, හා, දැන් හැම දෙනා ම එකතු වෙලා ඔය ගල ඔසවලා මගේ කරෙන් තියන්න.'

'අපි කොහොම ද ඔය ගල උස්සන්නේ ?' සෙනඟ කිවුවා.

'නුඹලා හැමෝට ම බැරි නම් මම තනිවම කොහොම කරන්න ද?' අන්දරේ කිවුවා.

මේක අන්දරේගේ තවත් විහිළුවක් බව රැස් ව සිටි සෙනඟට තේරුණා.

පියවර 2 : • කතන්දරය ඇසුරින් ප්‍රශ්න කිහිපයක් අසා වාචික පිළිතුරු ලබා ගන්න.

*උදා :* * ගමරාලගේ කුඹුරේ තිබුණේ කුමක් ද ?

* කුඹුරේ තිබූ ගල ඉවත් කරන්න ඉදිරිපත් වුණේ කවුද ?
* ගල ඉවත් කිරීමට පොරොන්දු වූ අන්දරේ ගමරාලගෙන් ඉල්ලුවේ මොනවා ද ?
* ගල ඉවත් කිරීමට කුඹුරට එන විට අන්දරේ රැගෙන ආවේ කුමක් ද ?
* අන්දරේ කොළපත කරේ තබාගෙන සෙනඟට කිවුවේ කුමක් ද ?

පියවර 3 : • පහත වැකි අනුපිළිවෙළට සකස් කර ලියන්න.

* හැමදා ම අන්දරේට කෑම ලැබුණා.
* ගල ඉවත් කරන්න අන්දරේ බාර ගත්තා.
* ගමරාලගේ කුඹුරේ ලොකු ගලක් තිබුණා.
* සෙනඟත් පිරුණා.
* ගල ඔසවලා තියන්න කාටවත් බැරි වුණා.
* අන්දරේ ගල ඉවත් කරන්න ආවා.

පියවර 4 : • පහත පරිදි පැවරුම් පතක් සකස් කරගන්න.

• එම පැවරුම් පත් සිසුන්ට ලබා දෙන්න.

ගැළපෙන කොටස යා කරන්න.

| | |
|---|---|
| 1. ගමරාලගේ කුඹුරේ | සෙනඟට තේරුණා. |
| 2. ගමරාල අන්දරේට | අන්දරේ කුඹුරට ආවා. |
| 3. අන්දරේ දවසේ හැම වෙලාවේ ම | ලොකු ගලක් තිබුණා. |
| 4. කොළපතක් අරගෙන | කනවා, බොනවා, නිදා ගන්නවා. |
| 5. අන්දරේ කළ විහිළුව | හොඳට කෑම බීම දුන්නා. |

- **දෙබස්**

**ක්‍රියාකාරකම 3**

**පියවර 1 :** • පහත සඳහන් දෙබස කිහිප වරක් සවන් දීමට සලස්වන්න.

## දෙබස

ළමයා : අඹ ගෙඩි පිරිලා කදිම යි
ඔබේ අඹ ගසේ
දුටුව ම අඹ කඩාගන්න
මට හිත දෙන්නේ

අඹ ගස : කඩා ගන්න හරි ම රස යි
ඉදුණු අඹ තිබේ
කාටත් මම අඹ දෙන්නෙමි
කන්නට සිත් සේ

ළමයා : ලේනුන් හා කුරුල්ලන් ද
ඇවිත් නිදහසේ
අඹ කන හැටි මම දුටුවෙමි
සතුටකි දැනුණේ

අඹ ගස : සතුන් ඇවිත් අඹ වාරෙට
ඉඳ අතු අතරේ
දුව පනිමින්, හරි සතුටිනි
මෙහි අඹ කන්නේ

ළමයා : නැති අයටත් දීම හොඳ යි
අපට තිබෙන දේ
අගය කරමි සැමදාමත්
ඔබ කරනා දේ

**පියවර 2 :** • දෙබසෙහි අන්තර්ගතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
• දෙබස ඇසුරින් සරල ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගන්න.

*උදා :* 1. කවි පන්තියෙන් කියවෙන්නේ කුමන ගසක් ගැන ද ?
2. මේ කවි පන්තියෙන් කියවෙන හොඳ පුරුද්දක් කියන්න.

**පියවර 3 :** • අඹ ගස හා ළමයා අතර දෙබසක් ගොඩනගා ලිවීමට සිසුන් යොමු කරන්න.

*උදා :* ළමයා - ආයුබෝවන් යාළුවේ.
අඹ ගස - ආයුබෝවන් පුංචි බබෝ
ළමයා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
අඹ ගස - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
ළමයා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
අඹ ගස - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

**පියවර 4 :** • සිසුන් ලියූ දෙබස් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
• සියලු සිසුන්ගේ දෙබස් නිර්මාණ කියවීමට අවස්ථාව සලසා දෙන්න.

- **තොරතුරු (සතුන්)**

**ක්‍රියාකාරකම 4**

පියවර 1 :
- සතුන් සිටින වීඩියෝ පටයක්/පින්තූරයක් සූදානම් කර ගන්න.
- වීඩියෝ පටයෙන්/පින්තූරය ආශ්‍රයෙන් සිසුන් වඩා කැමති සතුන් පිළිබඳ ව විමසන්න.
- එම සතුන් අතුරින් තමා කැමති සතෙක් පිළිබඳ ව කතා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 :
- අලියා හෝ මොනරා පිළිබඳ ව පහත දැක්වෙන ඡේදවල ඇතුළත් තොරතුරු බහුමාධ්‍ය භාවිතයෙන් හෝ සුදුසු ක්‍රමවේදයක් භාවිතකර සවන් දීමට සිසුන් යොමු කරන්න.
- ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඡේදය ඇසුරින් සකස් කරගත් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න.

පියවර 3 :
- තමා උගත් සතා පිළිබඳ ව තොරතුරු ඇතුළත් වැකි තුනක් මතකයෙන් ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 4 :
- එක් එක් සිසුන් විසින් ලියන ලද වැකි කියවීමට අවස්ථා ලබා දෙන්න.

**මොනරා**

මොනරා ශ්‍රී ලංකාවේ ජීවත් වන පක්ෂියෙක්. මොනරා වැඩිපුර සිටින්නේ අපේ රටේ වියළි කලාපයේ වනාන්තරවල යි. අනෙක් පක්ෂීන්ට වඩා මොනරා ප්‍රමාණයෙන් ලොකු යි. පිරිමි පක්ෂියා මොනරා නමින් හඳුන්වනවා. ගැහැනු පක්ෂියා හඳුන්වන්නේ සෙබඩ නමින්. මොනරා ලස්සන පක්ෂියෙක්. ඔටුන්න සහිත හිසක්, පාට පිහාටු සහ ලොකු පිල් කලඹක් ද මොනරාට තිබෙනවා. පිල් විදහා නටන්නේ මොනරා යි. සෙබඩ මොනරා තරම් ලස්සන පක්ෂියෙක් නොවෙයි. සෙබඩ මොනරාට වඩා කුඩා යි. පිල් කලඹ ද කෙටි යි. මොනරා කෘමී සතුන්, ධාන්‍ය වර්ග සහ ශාක පත්‍ර ආහාරයට ගන්නවා.

**අලියා**

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වනාන්තරවල වැඩි වශයෙන් අලි දක්නට ලැබෙනවා. සිවුපාවුන් අතරින් ලොකු ම සතා අලියා යි. අලියා ශාක වර්ග පමණක් ආහාරයට ගන්නවා. අලියා තණකොළ, ගස්වල පොතු, ඉදී වැටුණු පලතුරු, තාල වර්ගයේ ශාක පත්‍ර කෑමට කැමති යි. අලියා ඇතුළු වන සතුන් රැක ගැනීමට අපේ රටේ ජාතික වනෝද්‍යාන හා අභය භූමි තිබෙනවා. රෝගී වූ අලින්ට සහ අනාථ වූ අලින්ට රැකවරණය දෙන ස්ථාන දෙකක් ද අපේ රටේ තිබෙනවා. ඒ කෑගල්ලේ පින්නවල අලි අනාථාගාරය සහ උඩවලවේ ඇත් අතුරු සෙවණ යි. අපේ රටේ අලි, අලංකාර ඇඳුමින් සරසා පෙරහැරට සහභාගි කර ගැනීම විශේෂ දෙයකි.

(උපුටා ගැනීම : www.wikipedia.com)

**අන්තර්ජාලය**

**ක්‍රියාකාරකම 5**

- සිසුන් පරිගණක කාමරයට කැඳවා ගෙන යන්න./පන්ති කාමරය තුළ දෘශ්‍යාධාර භාවිත කරන්න.
- ළමා වෙබ් අඩවි හරහා දෘශ්‍යාධාර මඟින් ළමා ගීතයක්/කතන්දරයක් රස විඳීමට සලස්වන්න.
- සිසුන් විසින් රස විඳින ලද ගීතය ගායනා කිරීමටත්/කතන්දරය පැවසීමටත් අවස්ථාව ලබා දෙන්න.
- රස විඳින ලද ගීතයෙන්/කතන්දරයෙන් සිසුන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැඟීමට දෙන්න.
- සිසුන් විසින් අඳින ලද චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- ප්‍රදර්ශන පුවරුවට ගත් චිත්‍රය අයත් සිසුවාට තම චිත්‍රය පිළිබඳ අදහස් පැවසීමට අවස්ථාව දෙන්න.
- තමා විසින් අඳින ලද චිත්‍රය පිළිබඳ ව වැකි තුනක් ලිවීමට අවස්ථාව දෙන්න.
- ලියන ලද වැකි කියවීමට යොමු කරන්න.

- **ළමා පොත්පත්**

**ක්‍රියාකාරකම 6**

**පියවර 1 :**
- සිසුන් යුගල කරන්න.
- සැම සිසු යුගලයකට ම කතන්දර පොත බැගින් ලබා දෙන්න.
- සිසුන්ට කතන්දර පොත කියවීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- සැම සිසු යුගලයක් අසලට ම ගොස් කියවන ලද කතන්දර පිළිබඳ ව කෙටි සංවාදයක් ගොඩනගන්න.

**පියවර 2 :**
- කතන්දරය කියවා නිම වූ පසු ඒ ඇසුරින් චිත්‍රයක් ඇඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- තමා විසින් අඳින ලද චිත්‍රය පිළිබඳ වැකි තුනක් ලිවීමට උපදෙස් දෙන්න.
- එම වැකි කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**නිපුණතා : $S_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.**

**$L_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන් දෙයි.**

**$R_{10}$ සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි.**

ඉගෙනුම් පල :
- මාතෘකාවට අදාළ කරුණු පැහැදිලි ව ප්‍රකාශ කරයි.
- පින්තූර කිහිපයක් අතර සබඳතාව දකිමින් සාකච්ඡාවේ යෙදෙයි.
- සම්මත භාෂා ව්‍යවහාර සොයා ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

- **මාතෘකාවට අදාළ ව විස්තරයක් කිරීම**

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- ගුරුවරයා පාසල පිළිබඳ නිවැරදි තොරතුරු රැස් කර ගෙන එම තොරතුරු සිසුන් සමඟ කතා කරන්න.
  * පාසලේ නම
  * පාසල පිහිටි ගම
  * විදුහල්පතිතුමාගේ/තුමියගේ නම
  * ගුරු මණ්ඩලයේ සංඛ්‍යාව
  * පාසල - මිශ්‍ර පාසලක්/බාලිකා පාසලක්/බාලක පාසලක් . . . ආදි ලෙස
  * ශ්‍රේණි ගණන
  * ගොඩනැගිලි (*උදා* : විද්‍යාගාරය/පුස්තකාලය/බුදු මැදුර . . . ආදි ලෙස)
- පාසල පිළිබඳ දැනුම සිසුන්ට ලබා දීම සඳහා ඉහත තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :
- පාසල පිළිබඳ නිවැරදි තොරතුරු සහ වැරදි තොරතුරු පවසන බවත්, නිවැරදි තොරතුරක් පැවසූ විට අත් ඔසවන ලෙසත්, වැරදි තොරතුරක් පැවසූ විට අත් බැඳ ගන්නා ලෙසත් සිසුන්ට උපදෙස් දෙන්න.

  *උදා* : * අපේ පාසලේ නම (නිවැරදි නම කියන්න)

  * අපේ පාසල පිහිටි ගම (වැරදි ගමක නමක්)
- මේ ආකාරයට වැකි කිහිපයක් සකස් කර සවන් දීමට සලස්වා ප්‍රතිචාර ලබා ගන්න.


පියවර 3 :
- පාසල පිළිබඳ වැරදි තොරතුරු සහ නිවැරදි තොරතුරු සහිත වැකි කිහිපයක් සකස් කර ගන්න.
- එක් කාඩ්පතක එක් වැකියක් පමණක් ලියන්න.
- එවැනි වැකි කිහිපයක් සහිත කාඩ්පත් කට්ටල සකස් කර ගන්න.
- සෑම කණ්ඩායමකට ම කාඩ්පත් කට්ටලය බැගින් ලබා දෙන්න.
- කාඩ්පත් කියවා නිවැරදි තොරතුරු ඇතුළත් වැකි තෝරා ගැනීමටත්, වැරදි වැකි ඇතුළත් කාඩ්පත් ඉවත් කරන ලෙසටත් උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමකට ම තෝරා ගත් නිවැරදි වැකි ඇතුළත් කාඩ්පත් ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.

- **පින්තූර කතා**

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :** • පහත දැක්වෙන පින්තූර කතාවේ කොටස් වෙන වෙන ම විශාල ලෙස සකස් කර ගන්න.

පින්තූර කතාව - 1



**පියවර 2 :** • පින්තූර කාඩ්පත් ප්‍රදර්ශන පුවරුවේ පිළිවෙළකින් තොර ව රඳවන්න.
- පින්තූර නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් එක් පින්තූරයේ තිබෙන දේවල් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- කතාවේ සිද්ධි අනුපිළිවෙළින් ගොඩනැගෙන සේ පින්තූරවල අනුපිළිවෙළ, සිසුන් ලවා සකස් කරවන්න.
- කතාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 3 :** • ඉහත කතාවේ රාමු අනුපිළිවෙළට එකක් යට එකක් සිටින ලෙස සකස් කර ගන්න.
- එම පින්තූර රාමු ඡායා පිටපත් කර කණ්ඩායම්වලට ලබා දෙන්න.
- සැම පින්තූරයකට ම ගැළපෙන වැකියක් බැගින් ලියූ කඩදාසි තීරු සකස් කර කණ්ඩායම්වලට ලබා දෙන්න.
- පින්තූරයට ගැළපෙන පරිදි ලියූ වැකි තීරු සැම පින්තූරයක් ඉදිරියෙන් ම ඇලවීමට උපදෙස් දෙන්න.
- ගැළපෙන වැකි තීරු අලවා ඇත්දැයි පරීක්ෂා කරන්න.

ගුරු මාර්ගෝපදේශයේ ලබා දී ඇති වචන පමණක් සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද, ගැහැනු පිරිමි හඟවන පද, ඒකවචන, බහුවචන සඳහා ඉගැන්වීම අනිවාර්ය වේ. ඉන් පරිබාහිර වෙනත් වචන ප්‍රමාණය ද ඉක්මවා ඉගැන්වීම කිසි සේත් නොකළ යුතු ය.

- **සමානාර්ථ පද**

**ක්‍රියාකාරකම** 3

**පියවර 1 :** • පින්තූරය සිසුන්ට පෙනෙන පරිදි රඳවන්න.
- නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.

**පින්තූර කතාව - 2**



- පළමුවන ශ්‍රේණියේ දී උගත් සමානාර්ථ පද මතකයට නංවන්න.

**පියවර 2 :** • පහත සඳහන් වචන අර්ථවත් වන පරිදි පින්තූරය ඇසුරෙන් වැකි ගොඩනගා පවසන්න.

| | | |
|---|---|---|
| ගෙදර | = | නිවස |
| පාසල | = | විදුහල |
| ඔළුව | = | හිස |
| පාර | = | මාර්ගය |
| තරු | = | තාරකා |

*උදා :* * අපේ ගෙදර ලස්සන යි.
අපේ නිවස ලස්සන යි.

**විරුද්ධාර්ථ පද**

**ක්‍රියාකාරකම 4**

**පියවර 1 :** • පළමුවන ශ්‍රේණියේ දී විරුද්ධාර්ථ පද සඳහා උගත් වචන මතකයට නංවන්න.

*උදා :* උඩ - යට, උස - මිටි ලොකු - පොඩි

ගස උඩ පූසා | උස ගස | ලොකු මල්

ගස යට බල්ලා | මිටි ගස | පොඩි මල්

**පියවර 2 :** • පින්තූර කතාව 2 ප්‍රදර්ශනය කරන්න.

• පහත සඳහන් විරුද්ධාර්ථ පද පින්තූරය ඇසුරෙන් ගොඩනඟා ගන්න.

යනවා - එනවා

ඉදිරිපස - පිටුපස

පිපෙනවා - පර වෙනවා

ඉහළ - පහළ

පිරිසිදු - අපිරිසිදු

• ඉහත වචන අර්ථවත් වන පරිදි වාක්‍ය ගොඩනගන්න.

*උදා :* * නිවස ඉදිරිපස මල් ගස් තිබෙනවා.

නිවස පිටුපස ගස් තිබෙනවා.

**පියවර 3 :** • පහත සඳහන් පරිදි වචන කාඩ්පත් සකස් කර ගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගුරුවරයා සඳහා | යනවා | ඉදිරිපස | පිපෙනවා | පිරිසිදු | ඉහළ |
| සිසුන් සඳහා | එනවා | පිටුපස | පර වෙනවා | අපිරිසිදු | පහළ |

• මෙම කාඩ්පත් පන්තියේ සිසුන් ගණනට ප්‍රමාණවත් වන පරිදි සකස් කර ගන්න.

• ගුරුවරයා අතැති කාඩ්පතක් පෙන්වූ විට එම වචනයට අදාළ විරුද්ධාර්ථ පදය සහිත කාඩ්පත අතැති සිසුන්ට නැඟිටීමට උපදෙස් දෙන්න.

• මේ ආකාරයට වචන සියල්ල ගුරුවරයා පවසා ප්‍රතිචාර ලබා ගන්න.


• වචන කට්ටල හුනු පුවරුවේ ලියා කියවීමට අවස්ථාව ලබා දෙන්න.

- **ගැහැනු - පිරිමි හඟවන පද**

**ක්‍රියාකාරකම 5**

පියවර 1 : • පළමුවන ශ්‍රේණියේ දී ගැහැනු පිරිමි පද සඳහා උගත් වචන මතකයට නංවන්න.

• පහත සඳහන් පින්තූරය සහ තේරවිලිවලට අදාළ පිළිතුරු පත්‍රිකා සකස් කර ගන්න.




*උදා :*

1. උදේ රැයින්
අවදි වෙනවා
කුක්කු කූ
කෑ ගසනවා

[කුකුළා]

කොක් කොක් කොක්
චික් චික් චික්
පැටවු එක්ක
කෑම සොයයි

[කිකිළි]

2. තාත්තා වෙන්නට ආසයි
කඩයට යයි
බඩු ගෙන එයි

[පුතා]

අම්මා වෙන්නට ආසයි
කෑම උයයි
කෑම බෙදයි

[දුව]

- තේරවිලි කවි ගුරුවරයා කියා පිළිතුරු සිසුන්ගෙන් ලබා ගන්න. එම පිළිතුරු ලියූ පත්‍රිකා පැනල් පුවරුවේ රඳවන්න.

[කුකුළා] [කිකිළි]

[පුතා] [දුව]

**පියවර 2 :** • ඉහත සඳහන් තේරවිලි කවිවලට අදාළ වචන පත්‍රිකා සමඟ ම හඳුන්වා දීමට බලාපොරොත්තු වන ගැහැනු පිරිමි හඟවන පද ඇතුළත් වන පරිදි පහත සඳහන් කාඩ්පත් වර්ණ දෙකකින් සූදානම් කර ගන්න.

| | |
|---|---|
| කුකුළා | කිකිළි |
| පුතා | දුව |
| ගුරුතුමා | ගුරුතුමිය |
| රජ | රැජින |
| වෛද්‍යවරයා | වෛද්‍යවරිය |

*උදා :* කුකුළා - නිල් පාට
කිකිළි - රෝස පාට

• සිසුන් සවන් දීමට යොමු කර තේරවිලි කවි එකින් එක පවසන්න.

• ඒ අවස්ථාවේ දී පිළිතුරු පත්‍රිකා පැනල් පුවරුවේ රඳවන්න. කිහිප වතාවක් කියවන්න.

*උදා :* කුකුළා  කිකිළි

• මේ ආකාරයට තේරවිලි කවි සියල්ල ඉදිරිපත් කර මේ ගැහැනු පිරිමි හඟවන පද හඳුන්වා දෙන්න.

• තෝරා ගත් ඉතුරු පද සුදුසු පරිදි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**පියවර 3 :** • ඉහත යොදා ගත් වචනවලට අදාළ රූප පත්‍රිකා $A_3$ කොළයක අලවා ගන්න.

• කණ්ඩායමකට වචන කට්ටලයක් බැගින් වන සේ රූපවලට අදාළ වචන පත්‍රිකා සූදානම් කර සිසුන්ට ලබා දෙන්න.

• රූප පත්‍රිකාවලට අදාළ ව වචන පත්‍රිකා ගැළපීමට සිසුන්ට උපදෙස් දෙන්න.

• එක් එක් කණ්ඩායම් විසින් සම්පූර්ණ කරන ලද පත්‍රිකා කියවීමට අවස්ථාව දෙන්න.

- **ඒක වචන - බහු වචන**

**ක්‍රියාකාරකම 6**

**පියවර 1 :** • පහත සඳහන් පින්තූරය විශාල ලෙස සකස් කර ප්‍රදර්ශනය කරන්න.



- පළමුවන ශ්‍රේණියේ දී භාවිත කළ ඒක වචන හා බහු වචන පද මතකයට නංවන්න.

ගස - ගස්　　මල - මල්　　ගල - ගල්

අම්මා - අම්මලා　　තාත්තා - තාත්තලා

**පියවර 2 :** • 'අපි තවත් වචන ඉගෙන ගනිමු' යෝජනා කරමින්,

කුරුල්ලා - කුරුල්ලෝ

උදැල්ල - උදලු

ගොවියා - ගොවියෝ


බල්ලා - බල්ලෝ

ගවයා - ගවයෝ


පින්තූරයෙන් පෙන්වමින් පැහැදිලි කරන්න.

**පියවර 3 :** • යොදා ගන්නා වචන සඳහා අවශ්‍ය රූප කාඩ්පත් හා වචන කාඩ්පත් සකස් කර ගන්න.

*උදා :*



කුරුල්ලා



කුරුල්ලෝ

- මේ ආකාරයට සියලු ම වචන රූප පත්‍රිකා යොදා ගනිමින් ඒකවචන හා බහුවචන පද හඳුන්වා දෙන්න.
- එම වචන සිසුන් ලවා කිහිප වතාවක් කියවන්න.

  *උදා :* කුරුල්ලා - කුරුල්ලෝ

  ගොවියා - ගොවියෝ

  බල්ලා - බල්ලෝ

**පියවර 4 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- හඳුන්වා දෙන ඒක වචන හා බහු වචන පත්‍රිකා කට්ටල කණ්ඩායම් ගණන අනුව සකස් කර ගන්න.
- සකස් කරගත් කාඩ්පත් කට්ටලය බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එම කාඩ්පත් කට්ටලයෙන් එක් කාඩ්පතක් ගෙන ඊට අදාළ ඒක වචනය/බහු වචනය සහිත කාඩ්පත තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- මෙලෙස යුගල වශයෙන් සකස් කරගත් කාඩ්පත්, කණ්ඩායම්වලට එක් ව කියවීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතා : $W_{10}$ සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි.

ඉගෙනුම් පල :
- සම්මත භාෂා ව්‍යවහාර භාවිත කර භාෂා අභ්‍යාසයේ යෙදෙයි.
- උපදෙස් කියවා අදාළ පිළිතුරු සපයයි.
- සම්මත භාෂා ව්‍යවහාර සොයා ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

- **අකුරු හඳුනා ගැනීම**

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පහත සඳහන් වචන ලියූ කාඩ්පත් සකස් කර ගන්න.

| | | | |
|---|---|---|---|
| පහන | පාලම | පැදුර | පෑන |
| පිහිය | පීරිසිය | පුටුව | පූසා |
| පෙරහැර | පේර | පොත | පෝරුව |

- පන්තියේ සිටින කණ්ඩායම් ගණන අනුව කාඩ්පත් කට්ටල සකස් කර ගන්න.

පියවර 2 :
- කණ්ඩායම්වලට වචන පත්‍රිකා කට්ටල ලබා දෙන්න.
- එක් සිසුවකුට එක් කාඩ්පත බැගින් ගෙන ඉතුරු කාඩ්පත් සිසුන්ට පෙනෙන පරිදි මේසය මත තැබීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා පවසන අකුරින් පටන් ගන්නා වචනය සහිත කාඩ්පත් ඇති සිසුන්ට නැගිටින්නට උපදෙස් දෙන්න.

  *උදා* : (පැ) අකුර කියූ විට [ පැදුර ] වචනය අතැති සිසුන් නැගිටිය යුතු ය.
- මේ ආකාරයට අකුරු සියල්ල ම ප්‍රකාශ කර අකුරු හඳුනා ගැනීමට යොමු කරන්න.
- මෙම කාඩ්පත් කට්ටලයක් පැනල් පුවරුවේ රඳවන්න.
- එම වචන කියවන්න.

පියවර 3 :
- කියවන ලද වචන අසා ලිවීමට දෙන්න. (අනෙක් අකුරුවලට ද මෙවැනි ක්‍රියාකාරකම් සැලසුම් කර අකුරු හඳුනා ගැනීමට යොමු කරන්න.)

- **අකුරු එකතු කර වචන සකස් කිරීම**

ක්‍රියාකාරකම 2

පියවර 1 :
- ගුරුවරයා මුලට අකුරක් එකතු කළ විට අර්ථවත් වචනයක් ගොඩනගා ගත හැකි වන සේ පිලි රහිත අකුරු දෙකේ වචනයක් ප්‍රදර්ශනය කරන්න.

  *උදා* : හය
- එම වචනයේ මුලට එක් අකුරක් එකතු කරන්න.

  *උදා* : [න]හය , [දි]හය
- සෑදුණු වචන සිසුන් සමඟ කියවන්න.
- මේ ආකාරයට පිලි රහිත වචනවලට පිලි රහිත අකුරු එකතු කරමින් වචන ගොඩනැගීමට සිසුන් යොමු කරවන්න.

*උදා :* **ද**වස, **ස**වස

**ක**තර, **ස**තර

**පියවර 2 :** • පිලි රහිත අකුරු යෙදුණු වචනවලට පිලි සහිත අකුරක්/අකුරු කිහිපයක් එකතු කරමින් වචන ගොඩනැගීමට සිසුන් යොමු කරවන්න.

*උදා :* දර → **කෑ** දර, **ගින්** දර, **පාන්** දර, **සුන්** දර,

තර → **බිත්** තර, **පත්** තර, **උත්** තර, **විස්** තර

සල → **පින්** සල, **පැන්** සල, **පන්** සල, **සළු** සල


**පියවර 3 :** • පිලි සහිත අකුරු යෙදුණු වචනවලට පිලි සහිත අකුරක්/අකුරු කිහිපයක් එකතු කරමින් වචන ගොඩනැගීමට ද සිසුන්ට අවස්ථාව දෙන්න.

- **රූපවලට අදාළ වචන ලිවීම**

**ක්‍රියාකාරකම 3**

**පියවර 1 :** • පහත සඳහන් පැවරුම් පත සකස් කර එක් එක් සිසුවාට පිටපත බැගින් ලබා දෙන්න.
• රූපවලට අදාළ වචනය හිස් තැනෙහි ලිවීමට දෙන්න.

1. ඉදුණු - - - - - - රතු පාටයි.
2. මල්ලී - - - - - - යවනවා.
3. වාසනා - - - - - - - බලනවා.
4. තාත්තා - - - - - - - ඇන්දා.
5. ළමයා - - - - - - - කියවනවා.



පියවර 2 : • පියවර 1හි දී සම්පූර්ණ කරන ලද වැකි සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- එම වැකි අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.
- මෙවැනි තවත් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

- **සමානාර්ථ පද**

**ක්‍රියාකාරකම** 4

පියවර 1 : • සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමකට $A_3$ කඩදාසි එක බැගින් ලබා දෙන්න.
- ගෙදර, පාසල, පාර, ඔළුව, තරු යන පින්තූර $5 \times 5cm$ ප්‍රමාණයට ඇඳ කණ්ඩායම්වලට පින්තූර කට්ටලය බැගින් ද වචන ලිවීමට ප්‍රමාණවත් පරිදි කඩදාසි තීරු ද ලබා දෙන්න.
- එක් එක් සිසුවකුට එක් පින්තූරයක් ද කඩදාසි තීරු දෙකක් ද ලබා ගැනීමට උපදෙස් දෙන්න.
- තමාට ලැබුණු පින්තූරය කියවා නම් කර, එම පදයට සමානාර්ථ පදයක් ලිවීමට යොමු කරන්න.
- කණ්ඩායම එක් ව $A_3$ කඩදාසිය මත පින්තූර හා ලියූ පද දෙක පේළියට තැබීමට උපදෙස් දෙන්න.
- ඒවා කියවා බැලීමට යොමු කරන්න.
- එම රූප හා වචන $A_3$ කඩදාසියේ ඇලවීමට උපදෙස් දෙන්න.

පියවර 2 : • සමානාර්ථ පද යොදා වාක්‍යවල හිස්තැන් පිරවීමට අවස්ථා ලබා දෙන්න.

*උදා :* * අපේ <u>ගෙදර</u> ලස්සන යි. * සමන් <u>ඔළුව</u> පීරුවා.

අපේ ______ ලස්සන යි. * සමන් ______ පීරුවා.

- **විරුද්ධාර්ථ පද**

**ක්‍රියාකාරකම** 5

පියවර 1 : • විරුද්ධාර්ථ පද කාඩ්පතක ලියා සකස් කර ගන්න. නැතිනම් හුනු පුවරුවේ ලියන්න.

යනවා - එනවා

ඉදිරිපස - පිටුපස

පිපෙනවා - පර වෙනවා

ඉහළ - පහළ

පිරිසිදු - අපිරිසිදු

- මෙම වචන යෙදෙන අවස්ථා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

*උදා :* * <u>ඉහළ</u> අත්තේ අඹ ඉදිලා.

<u>පහළ</u> අත්තේ අඹ ඉදිලා.

* සමන් පේළියේ <u>ඉදිරිපස</u> ඉන්නවා.

නාමල් පේළියේ <u>පිටුපස</u> ඉන්නවා.

පියවර 2 : • සිසුන් යුගල කරන්න.

- වැකි ලිවීමට සුදුසු පරිදි කඩදාසි තීරු ලබා දෙන්න.
- සිසු යුගලයට ලබා දෙන කඩදාසි තීරුවල පිටුපස විරුද්ධාර්ථ පද දෙක ලියා දිය යුතු ය.
  *උදා :* යනවා - එනවා
- ඉහත ආකාරයට එම වචන දෙක වෙන වෙන ම යොදා වැකි ලිවීමට උපදෙස් දෙන්න.
- සිසුන් විසින් ලියන ලද වැකි පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ වැකි ඒ අවස්ථාවේ ම ප්‍රදර්ශන පුවරුවේ අලවන්න.

පියවර 3 : • එක් එක් කණ්ඩායම විසින් ගොඩනගන ලද වැකි අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.

- එම වැකිවල විරුද්ධාර්ථ පද යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

- **ගැහැනු පිරිමි හඟවන පද**

**ක්‍රියාකාරකම 6**

පියවර 1 : • ගැහැනු පිරිමි හඟවන පද හුනු පුවරුවේ ලියන්න.

කුකුළා - කිකිළි
පුතා - දුව
රජ - රැජින
ගුරුතුමා - ගුරුතුමිය
වෛද්‍යවරයා - වෛද්‍යවරිය

- එම වචන සිසුන් ලවා කිහිප වරක් කියවන්න.
- පහත සඳහන් වගුව පැවරුම් පතක් ලෙස සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයාගේ උපදෙස් පරිදි එක් වචන යුගලයක් සාකච්ඡා කරමින් පුරවන්න.
- ඉතුරු පද සිසුන්ට පින්තූර උදවු කර ගනිමින් සම්පූර්ණ කරන ලෙසට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් සාකච්ඡාවකින් පසු ඉතුරු පද යොදා වගුව සම්පූර්ණ කරන ලෙසට උපදෙස් දෙන්න.

| ගැහැනු පද | පිරිමි පද |
|---|---|
| කිකිළි | කුකුළා |
| | |
| | |
| | |
| | |
| | |

පියවර 2 : • පහත සඳහන් පරිදි පැවරුම් පතක් සිසුන්ට සකස් කර දෙන්න.

- එක් උදාහරණයක් පැහැදිලි කර දෙන්න.
- ඉතුරු වැකි සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

සුදුසු වචනය හිස්තැනෙහි ලියමු.

| | |
|---|---|
| 1. <u>කුකුළා</u> උදෙන් ම හඬලනවා.<br><u>කිකිළි</u> පැටවු සමඟ කෑම සොයනවා. | කිකිළි<br>කුකුළා |
| 2. ________ පොත් කියවනවා.<br>________බෝනික්කා නළවනවා. | පුතා<br>දුව |
| 3. ________ රට පාලනය කරනවා.<br>________ හරි ම ලස්සන යි. | රජ<br>රැජින |
| 4. ________ අපට උගන්වනවා.<br>________ ලස්සන සාරි අඳිනවා. | ගුරුතුමිය<br>ගුරුතුමා |

- **ඒක වචන හා බහු වචන පද**

**ක්‍රියාකාරකම 7**

**පියවර 1 :** • පහත සඳහන් ඡේදය ඡායා පිටපත් කර එක් එක් සිසුවාට ලබා දෙන්න.

'ඉර පායාගෙන එන උදෑසන හරි ම ලස්සන යි. අඹ ගහේ හිටිය බට්ටි කුරුල්ලා කෑ ගැසුවා. මමත් මිදුලට ගියා. අපේ බල්ලා අඹ ගස යට හිටියා. ඒ අසල ගවයා නිදි. අඹ ගහේ කුරුල්ලෝ පිරිලා. ඉහළ කුඹුරේ ගොවියා නියර හදනවා. ඈත පෙනෙන කුඹුරුවල ගොවියෝ වැඩ කරනවා. මම යහළුවා සමඟ කුඹුර දෙසට ගියා. වෙල් ඉපනැල්ලේ යහළුවෝ සරුංගල් යවනවා. ඒ අසල බල්ලෝ සතුටින් එහාට මෙහාට දුවනවා. කුඹුර ළඟ ඇති පිට්ටනියේ ගවයෝ තණකොළ කනවා.

- ඉහත සඳහන් ඡේදය පිටපත් කර එක් එක් සිසුවාට ලබා දෙන්න.
- එම ඡේදය කියවා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- හඳුනා ගත් ඒකවචන හා බහුවචන පද ගුරුවරයාගේ උපදෙස් පරිදි කොටු කිරීමට යොමු කරන්න.
- වර්ණ පහක පැන්සල් සිසුන්ට ලබා දී වචන යුගල සහිත කොටු පාට කිරීමට අවස්ථාව සලසන්න.

*උදා :* | කුරුල්ලා | | කුරුල්ලෝ | (කහ පාට)

**පියවර 2 :** • එසේ පාට කරන ලද ඒකවචන හා බහුවචන පද පහත සඳහන් පරිදි වගුවක් ඇඳ සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

- **හරි වැරදි යෙදීම**

**ක්‍රියාකාරකම 8**

**පියවර 1 :**
- සිසුන් ගණනට අනුව රතු පාට සහ කහ පාට කොඩි දෙක බැගින් සකස් කරගන්න.
- පහත ඡේදය සිසුන්ට අවස්ථා තුනක් පමණ සවන් දීමට සලස්වන්න.

ලස්සන රවුම් ඔරලෝසුවක් අපේ ගෙදර තිබෙනවා. එය නැන්දා අපට තෑගි කළ එකක්. සාලයේ බිත්තියක කාටත් පෙනෙන තැනක ඔරලෝසුව සවිකර තිබෙනවා. ඒ ඔරලෝසුවේ මුහුණත වටේට ඉලක්කම් දොළහක් පිළිවෙළට තිබෙනවා. ඔරලෝසුව නිතර ම ටික් ! ටික් !! ටික් !!! නද දෙනවා. එහි පැය කටුවක්, මිනිත්තු කටුවක් සහ තත්පර කටුවක් ද තිබෙනවා. වේලාව බලාගන්න ඔරලෝසුව අපට උදවු කරනවා. අප හැම දෙනාගේ ම වැඩ කටයුතු වේලාවට කරගැනීමට ඔරලෝසුව ඉමහත් සේවයක් සලසනවා.

- ඡේදයේ සඳහන් දේ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 2 :**
- සකස් කරගත් රතු හා කහ පාට කොඩි දෙක බැගින් සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- ගුරුවරයා පවසන වැකිවලට හොඳින් සවන් දී පැවසූ වැකිය 'හරි' නම් කහ පාට කොඩිය ඔසවන ලෙසත් වැකිය 'වැරදි' නම් රතු පාට කොඩිය ඔසවන ලෙසත් උපදෙස් දෙන්න.

*උදා :* * ඔරලෝසුව ආච්චි තෑගි කළ එකක්.
* ඔරලෝසුව සාලයේ බිත්තියක සවිකර තිබෙනවා.
* ඔරලෝසුවේ කටු හතරක් ඇත.
* වේලාව බලාගන්න ඔරලෝසුව අපට උදවු කරනවා.

- සිසුන් වැකියට අදාළ ව නිවැරදි කොඩිය ඔසවන්නේ දැයි පරීක්ෂා කරන්න.

**පියවර 3 :**
- හරි වැරදි ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත් වැකි, පැවරුම් පතක් ලෙස සකස් කර සිසුන්ට ලබා දෙන්න.
- පැවරුම් පත කියවා හරි/වැරදි යෙදීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- **හිස්තැන් පිරවීම**

**ක්‍රියාකාරකම 9**

**පියවර 1 :**
- පහත ඡේදය හිස්තැන් සහිත ව බ්‍රිස්ල් බෝඩ් එකක පැහැදිලි ව ලියා ගන්න.
- පිළිතුරු ඡේදයට පහළින් ලියන්න.
- සිසුන්ට ඇසෙන පරිදි හිස්තැන් සහිත ඡේදය කියවන්න.
- ඡේදයේ පහතින් ලියා ඇති පිළිතුරුවලින් සුදුසු වචනය තෝරා හිස්තැන්වලට ලිවීමට උපදෙස් දෙන්න.
- පහත පැවරුම සෑම සිසුවකුට ම ලබා දෙන්න.

> **හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**
>
> අපේ වත්තේ . . . ගසක් තිබෙනවා. එය සිටවූයේ අපේ . . . යි. ගසේ ගෙඩි කෑමට දවල්ට ගිරවු සහ . . . එනවා. රාත්‍රියට . . . එනවා. ඊයේ සීයා රඹුටන් කැඩුවා. එක . . . රඹුටන් ගෙඩි ටිකක් ඉතුරු කර තිබුණා. මම ඒ අත්තෙන් රඹුටන් කඩන්න හැදුවා. ''ඒ අත්තේ රඹුටන් . . . . කන්නයි ඉතුරු කළේ, පුතා ගෙදර තිබෙන රඹුටන් කන්න'' සීයා කිවුවා.
>
> (ලේන්නු / අත්තක / සීයා / සතුන්ට / වවුලෝ / රඹුටන්)

- **සරල වැකි**

**ක්‍රියාකාරකම 10**

**පියවර 1 :**

- පින්තූර කතාව 1හි රූප රාමු හතර වෙන වෙන ම ඩිමයි කොළ හතරක අලවන්න. ඒවා අංකනය කරන්න. *උදා* : 1, 2, 3, 4
- ඒවා සිසුන්ට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.
- පන්තියේ සිටින සිසුන් කණ්ඩායම් 4කට වෙන් කරන්න.
- අංකනය කරන ලද රූප රාමු කණ්ඩායම් හතරට බෙදා දෙන්න.
- එක් එක් සිසුවාට වැකි ලිවීමට අවශ්‍ය කඩදාසි තීරු ලබා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු රූප රාමුවට අදාළ ව වැකියක් ලියා අදාළ පින්තූර රාමුව යටින් ඇලවීමට උපදෙස් දෙන්න.
- සියලු ම සිසුන්ගේ වැකි ඇලවීමෙන් අනතුරු ව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් ලියන ලද වැකි පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
  * අදාළ බව
  * අර්ථවත් බව
  * වචන ගැළපීම
  * නිවැරදි අක්ෂර භාවිතය

- **ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම**

**ක්‍රියාකාරකම** 11

**පියවර 1 :**
- පින්තූර කතාව - 1 ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- පින්තූර නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පින්තූර කතාවේ සියලු රූප ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහක් සකස් කර ගන්න.
- ගුරුවරයා විසින් පින්තූර කතාව ඇසුරින් ප්‍රශ්න අසන බව සිසුන්ට පවසන්න.
- පිළිතුරු දන්නා සිසුන්ට අත් ඔසවන ලෙස ද උපදෙස් දෙන්න.
- සිසුන්ට ප්‍රශ්න ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා ගන්න.

  *උදා :* * ළමයා කරන්නේ කුමක් ද ?

  * ගස දිගේ පහළට එන්නේ කවුද ?

**පියවර 2 :**
- පින්තූර කතාව - 1 ඇසුරින් පැවරුම් පතක් සකස් කර ගන්න.
- සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් පරිදි පැවරුම් පත ඡායා පිටපත් කර ගන්න.
- සෑම සිසුවෙකුටම පැවරුම් පත බැගින් ලබා දෙන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

* **ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. පින්තූර කතාවේ සිටින සත්තු කවුරු ද ?

   ..............................................................................................................

2. ගස දිගේ පහළට එන්නේ කවුද ?

   ..............................................................................................................

3. කුරුල්ලන් කෑම කනවිට එතැනට එන්නේ කවුද ?

   ..............................................................................................................

4. ළමයා කරන්නේ කුමක් ද ?

   ..............................................................................................................

# 2.0 දෙවන ශ්‍රේණිය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
# විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය

## 1. හැඳින්වීම

*"පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජීය සහ ජෛව පද්ධති කෙරෙහි හා ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියක් කෙරෙහි යොමු කරන්නකි.*

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර අනුක්‍රමයෙන් එම වටාපිටාව සමඟ සාර්ථක ව අන්තර් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාංමාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම, රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑ ම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව වර්ධනය කිරීම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තුළ සාක්ෂරතාව, ගණිත දැනුම සහ ආගම පිළිබඳ නිපුණතාවලට අමතර ව තවත් ක්ෂේත්‍ර කිහිපයකට අයත් නිපුණතා වර්ධනය විය යුතු ය. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවල සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණ ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂය යටතේ එම නිපුණතා ශාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාව සලසා තිබුණි. එහෙත් නව විෂයමාලාවේ "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" නම් වූ පුළුල් විෂයයක් යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය පළමු වන ප්‍රධාන අවධියේ දී තේමා 16ක් මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මවුබස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" යොදා ගත හැකි ය. දෙවන ශ්‍රේණියේ දරුවන්ගේ කතාබහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මඟින් මතු කර ගත හැකි ය. මෙම විෂයයට අදාළ ක්‍රියාකාරකම් කිරීමේ දී ගුරුවරයාට තවත් සහායකයන් සිටීම ඒවා සංවිධානයට පහසු වනු ඇත. එම පාසලේ ම 6 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ සහාය මේ සඳහා ලබා ගත හැකි වනු ඇත.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැයි අදහස් නොකෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමාව තුළ ඇති දේ, සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නොවේ. එහෙයින් දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

මේ අනුව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කර ඇති එක් එක් තේමාවෙන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා වීමට, යෝජිත ක්‍රියාකාරකම් වෙනුවට වෙනත් ක්‍රියාකාරකම් ඔබට නිර්මාණය කර ගත හැකි අතර, එසේ කිරීමේ දී අපේක්ෂිත නිපුණතා ඉටු වන අයුරින් ක්‍රියාකාරකම් සොයා ගැනීමට වග බලා ගත යුතු ය.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමු වන ශ්‍රේණියේ සිට පස් වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය පරිශීලනය කිරීමෙන් සිසුන් තුළ පහත දැක්වෙන නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

- සිය වටපිටාවේ චමත්කාරය හඳුනාගෙන ඒ මඟින් වින්දනයක් ලබයි.
- ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාවට මුසු කර ක්‍රියා කරයි.
- සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යවල දී භාවිත කරයි.
- නීරෝග දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි.
- මිනිස් නිර්මාණ අගය කරයි.
- සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- මිනිස් සමාජය, මිනිස් හැසිරීම හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි.
- සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබා ගැනීම සඳහා තම පරිසරයේ ඇති ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍ය පරිදි හසුරුවයි.

## 3. පළමු වන ප්‍රධාන අවධියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ඉගෙනුම් නිපුණතා

- පාසල් පරිසරයට අනුගත ව කටයුතු කරයි.
- නිවසේ දී සතුටින් හා ඵලදායී ලෙස පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාවල නියැළෙයි.
- තොරතුරු රැස් කිරීම සඳහා නිරීක්ෂණ කරයි.
- අත්දැකීම් මඟින් සරල ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- සිරිත් විරිත්වලට අනුකූල ව ක්‍රියා කරයි.
- පාසල හා සම්බන්ධ අතීත තොරතුරු විමසා බලයි.
- සෞඛ්‍යවත් දිවිපෙවෙතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- සුහද කතාබහ ඔස්සේ නිවැරදි ව තොරතුරු හුවමාරු කර ගනියි.
- අවට පරිසරයේ සිදු වන වෙනස්කම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
- තමා හා තම අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- අන් අයට ප්‍රියජනක අන්දමින් තම ගති පැවතුම් පවත්වා ගනියි.
- මූලික ඉරියව් නිවැරදි ව පවත්වා ගනියි.
- එදිනෙදා කටයුතුවල දී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- අවකාශය උචිත ලෙස භාවිත කරමින් ක්‍රීඩාවල හා ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අරමුණුගත කාර්ය සඳහා සාමූහික ව වගකීමෙන් වැඩ කරයි.
- පරිසර විවිධත්වය කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.

- අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදවු කිරීමට ඉදිරිපත් වෙයි.
- රූප සංකේත හා ලිඛිත පුවරු මඟින් දැක්වෙන තොරතුරු ලබා ගනියි.
- තම අත්දැකීම් චිත්‍ර හා ඇඟීම් මඟින් ප්‍රකාශ කරයි.
- පරිසරයේ ශබ්ද, නාද, චලන සහ චරිත නිරූපණය කරයි.
- අභිනය දක්වමින් රංගනයේ හා ගායනයේ නිරත වෙයි.
- විවිධ කටයුතුවල දී සමායෝජනයෙන් යුතු ව චලන දක්වයි.
- විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ දේ නිර්මාණය කරයි.
- ලබාගත් අත්දැකීම් හා රැස් කරන ලද තොරතුරු තනි ව හෝ සාමූහික ව හෝ පිරිසකට ඉදිරිපත් කරයි.
- නිවසේ දී හා පාසලේ දී සිය යුතුකම් හා වගකීම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.

## 4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමුවක්

- මෙම නිර්දේශයේ දී දරුවාගේ වටපිටාව තේමා 16ක් ඔස්සේ විකාශය කර ඇත.
- සියලු දෑ තෘප්තිදායක අත්දැකීම් වශයෙන් ලබා ගැනීමට දරුවනට ඉඩ සැපයිය යුතු වා මෙන් ම ඒ සඳහා ප්‍රමාණවත් සැලැස්මක් හා සූදානමක් අවශ්‍ය වනු ඇත.
- මෙහි ඇති අදහස්වලට අනුකූල ව ඉගෙනුම් හා හඳුන්වා දීමේ ක්‍රම යොදා පාඩම් සැලසුම් කර ගත යුතු ය.
- තොරතුරු වාර්තා කිරීම, තොරතුරු සොයා ගැනීම තරම්ම වැදගත් ය. මුල් අවධියේ දී වාචික ව කටු සටහන් මඟින් සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට දරුවන් පොලඹවන්න. ක්‍රමයෙන් වචන ද වාක්‍ය ද තරමක් සවිස්තරාත්මක රූප සටහන් ද යොදා ගැනීමට දරුවන් යොමු කරවන්න.
- වැඩ සියල්ල හා උත්සාහය අගය කළ යුතු ය.
- සිසුන් කණ්ඩායම් වශයෙන් වැඩෙහි යොදවන්න. එහෙත් මුල් අවස්ථාවල දී කණ්ඩායමක කෙනෙකු වැඩ කළ යුතු ආකාරය පිළිබඳ ව දරුවනට මඟ පෙන්වීම් හා නිවැරදි කිරීම් අවශ්‍ය වනු ඇත.
- යම් තේමාවකට සම්බන්ධ ව ඉගෙනුම්-ඉගැන්වීම් කර ගෙන යන අවස්ථාවේ දී අනුක්‍රමයෙන් එක් රැස් වන තොරතුරු හා ද්‍රව්‍ය ක්‍රමයෙන් ගොඩ නැගෙන ප්‍රදර්ශනයක් බවට පෙරලන්න.
- තේමා ඉදිරිපත් කර ඇත්තේ නිශ්චිත පිළිවෙළකට නොවේ. ඕනෑ ම වේලාවකට උචිත තේමාවන් ඕනෑ ම තැනකින් තෝරා ගැනීමට නිදහසක් ඇත. කාලයට උචිත අයුරින් තේමා තෝරා ගැනීමෙන් සම්පත් පරිහරණය වඩා පහසු වනු ඇත.

## 5. ඉගෙනුම් – ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යෑමට හැකි ය. ඒ මඟින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපාය ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

## 6. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

දෙවන ශ්‍රේණිය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යටතේ පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටීම වෙනුවට විවිධ ඉරියව්වෙන් හා සතුටින් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

- පාසල් කාලය තුළ දී දෙවන ශ්‍රේණිය සිසුන් ප්‍රධාන වශයෙන් සෙල්ලම් ස්වරූපයක් ගත් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.
- එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- පාසලේ ක්‍රීඩා සෞන්දර්යාත්මක කටයුතු විශේෂ දින සැමරුම් අවස්ථා හා වෙනත් විෂය සමගාමී කටයුතුවල දී දෙවන ශ්‍රේණිය දරුවන් ද සහභාගි කර ගැනීම.
- පාසලේ ඉහළ පන්තිවල (6/5 වන ශ්‍රේණි) සිසුන්ගේ උදවු ද අවශ්‍ය අවස්ථාවලදී ලබාදීම.

## 7. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී ඔවුන් ඉගෙනීම සම්බන්ධයෙන් දක්වන හැකියා හා නොහැකියා පිළිබඳ සුවිශේෂ වැටහීමක් ගුරුවරුනට තිබිය යුතු ය. මේ සඳහා පන්ති කාමරය තුළ නිරන්තරයෙන් කරනු ලබන තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් අදහස් කෙරේ. සිසුන් තක්සේරු කිරීමේ පරමාර්ථ රාශියක් තිබේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල කරනු ලබන තක්සේරු කිරීම් ප්‍රධාන අරමුණු දෙකක් මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ඉන් පළමු වැන්න වන්නේ අනාවරණය යි. තමාගේ පන්ති කාමරයේ සිටින සැම සිසුවකුට ම ගැළපෙන ආකාරයේ අධ්‍යාපනයක් ලබාදීමට නම් ගුරුවරුන්හට ඒ සැම සිසුවකු පිළිබඳ ව ම වැටහීමක් තිබිය යුතු ය. දෙවැනි අරමුණ සිසුන් පිළිබඳ අනාවරණය කරගත් තොරතුරු පදනම් කරගෙන එක් එක් සිසුන් සඳහා උපදේශාත්මක පසු පෙවුමක් ලබා දීම ය. එම නිසා ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක තක්සේරු කිරීම් සිසුන් සඳහා ශ්‍රේණි ලබා දීම, සිසුන් එකිනෙකා සසඳමින් අගය කිරීම, සිසුන් ඔවුන්ගේ හැකියා අනුව වර්ග කිරීම වැනි කරුණුවලින් ඔබ්බට ගිය දෙයක් වශයෙන් සැලකිය හැකි ය.

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වන තක්සේරු කිරීම නිර්ණායක මූලික, ගුරුවරයා මුල් කරගත්, අවිධිමත් සම්භවන තක්සේරු කිරීමක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා අනුව ගොඩනගා ගත් ඇගයීම් නිර්ණායක ඇතුළත් කර ඇත. පන්ති භාර ගුරු මහත්ම-මහත්මීන් මේ නිර්ණායක කරා සිසුන් කෙතෙක් දුරට ළඟා වී ඇත් දැයි, තක්සේරු කිරීම යටතේ අනාවරණය කරගත යුතු ව ඇත.

කණ්ඩායම් වැඩවල නිරත වීමේ දී ප්‍රශ්න ඇසීම, අවිධිමත් ලෙස සිසුන් නිරීක්ෂණය කිරීම, ඔවුන් සමග සාකච්ඡා කිරීම, කාර්ය සාධන ගොනු පවත්වා ගෙන යාම, ගෙදර වැඩ ඇගයීම වැනි අවිධිමත් ක්‍රම ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඒවා අවශ්‍ය පරිදි භාවිත කිරීම, විශේෂයෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දී පන්ති භාර ගුරුවරයාගේ වගකීම යි. තක්සේරු කිරීම වාර අවසානයේ හෝ ඒකකයක් අවසානයේ හෝ නො ව ඉගැන්වීම් කටයුතු කරන අතරතුර ම ක්‍රියාත්මක විය යුතු දෙයකි. තක්සේරු කිරීම වඩාත් හොඳ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම පිණිස එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගැඹුරින් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වටහාගෙන කටයුතු කිරීම යෝග්‍ය ය.

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1. අපයි පාසලයි | • පාසලේ තිබෙන සුවිශේෂ හා වැදගත් ස්ථාන හඳුනා ගෙන එහි විවිධත්වවලට අනුකූල ව කටයුතු කරයි.<br>• පාසලේ කටයුතුවලට දායක වෙමින් පාසල් සංස්කෘතිය යහපත් ව පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br>• පාසලේ සිටින විවිධ පුද්ගල භූමිකා හඳුනා ගනිමින් ඔවුන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.<br>• පන්ති කාමරය අලංකාර ව පවත්වා ගෙන යාම සඳහා විවිධ මාධ්‍ය භාවිත කරමින් නිර්මාණවල යෙදෙයි.<br>• උපකරණ භාවිත කරමින් ස්නායු - පේශි සමායෝජන සඳහා චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.<br>• පාසලේ අගය ඉස්මතු කර දැක්වීම සඳහා වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරයි. | • පාසල් පරිසරය අලංකාර ව හා පිරිසිදු ව පවත්වා ගත යුතු බව<br>• පාසලේ පොදු දේපළ ආරක්ෂා කළ යුතු බව<br>• තම පාසලේ දී පවත්වා ගත යුතු හැසිරීම්<br>• තමාගෙන් පන්ති කාමරයට හා පාසලට ඉටු විය යුතු යුතුකම් සහ වගකීම්<br>• පාසලේ විවිධ කටයුතු කරන පුද්ගලයන් අගය කළ යුතු බව<br>• පන්ති කාමරයේ අලංකාරය පවත්වා ගැනීමට සුදුසු නිර්මාණ<br>• සෙල්ලම් මිදුල හා විවිධ උපකරණ භාවිත කරමින් සිදු කළ හැකි චාලක ක්‍රියාකාරකම්<br>• පාසලේ අගය ගැන කියවෙන කවි, ගීත |
| 2. අපේ ගෙදර | • නිවසේ හා නිවසට සම්බන්ධ පුද්ගලයන් මෙන් ම සතුන් කෙරෙහි ද යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.<br>• තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නිවස යහපත් ලෙස පවත්වා ගෙන යෑමට දායක වෙයි.<br>• එදිනෙදා නිවසේ ප්‍රයෝජනයට ගත හැකි දෑ නිපදවා ගැනීමට දායක වෙයි.<br>• නිවසේ අලංකරණය සහ පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා යොදා ගත හැකි නිර්මාණ සිදු කරමින් වින්දනයක් ලබයි.<br>• නිවෙස් පරිසරය ඇසුරු කර ගත් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙමින් වින්දනයක් ලබයි.<br>• නිවෙස් පරිසරය ආශ්‍රිත ව ලබන අත්දැකීම් වින්දනාත්මක ව ප්‍රකාශ කරයි. | • පවුලේ සමීපතම නෑදෑයන් හා නෑදෑ සබඳතා පිළිබඳ තොරතුරු<br>• දෙමවුපියන් හා නිවසේ සිටින අනෙකුත් සාමාජිකයන් තම යුතුකම් හා වගකීම් ඉටු කරන අයුරු<br>• තම පවුලේ සාමාජිකයන් සමඟ යහපත් සබඳතා පවත්වා ගත යුතු බව<br>• තමාගෙන් නිවසට ඉටු කළ හැකි යුතුකම්<br>• නිවසේ අලංකාරය හා පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා යොදා ගත හැකි නිර්මාණ<br>• නිවෙස් පරිසරය ඇසුරු කර ගත් සුළු ක්‍රීඩා<br>• පවුලේ සාමාජිකයන්ගේ භූමිකා නිරූපණය වන ආකාරයේ රංගන |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 03. වත්තට එන සත්තු | • අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• සතුන් ද පරිසරයේ ම කොටසක් සේ සලකා සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.<br>• අප අවට ඇති සතුන්ගේ චර්යා පිළිබඳව අවධානයෙන් යුතු ව චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.<br>• සතුන්ගේ විවිධ ලක්ෂණ හා හැසිරීම් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.<br>• විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ත්ව වාසස්ථාන නිර්මාණ කරයි. | • අවට පරිසරයේ සතුන්ගේ බාහිර ස්වරූපය අනුව වෙනස්කම්<br>• සතුන්ගේ විවිධ චර්යාවල වෙනස්කම්<br>• විවිධ සතුන් දෛනික ජීවිතයේ දී මිනිසාට ප්‍රයෝජනවත් වන අයුරු<br>• සතුන්ගේ පැවැත්ම සඳහා කළ හැකි දේ<br>• සත්ව චර්යා ඇසුරු කරගත් නිර්මාණාත්මක ක්‍රීඩා<br>• සතුන්ගේ විවිධ චලන හා ඉරියවු ඇසුරෙන් නිර්මාණාත්මක රංගන<br>• සතුන් හා සත්ත්ව වාසස්ථාන පිළිබඳ චිත්‍ර හා ආකෘති |
| 04. ජලය සමග සෙල්ලම් | • ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ලෙස භාවිත කරයි.<br>• නිරෝගී දිවි පැවැත්ම සඳහා ජලයේ වැදගත්කම අගයමින් නිසි පරිදි භාවිත කරයි.<br>• ජලයේ ස්වභාවය හා ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• ජලය විවිධ අයුරින් භාවිත කරමින් නිර්මාණ කරයි.<br>• ජලය උපයෝගී කර ගනිමින් නිර්මාණාත්මක චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• ජලය තේමා කොට ගත් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • ජලය සම්පතක් ලෙස සලකා ඵලදායී ව භාවිත කිරීමේ අවශ්‍යතාව<br>• ජලය තැනකින් තැනකට ගෙන යා හැකි ක්‍රම<br>• නිරෝගී පැවැත්ම සඳහා ජලය ප්‍රමාණවත් ලෙස පරිභෝජනය කළ යුතු බව<br>• විවිධ ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන අයුරු<br>• ජලයේ පාකර හැරිය හැකි නිර්මාණ<br>• ජලය සම්බන්ධ කර ගනිමින් නිර්මාණය කළ ක්‍රීඩා<br>• ජලය උපයෝගී කර ගනිමින් විවිධ නාද නිපදවිය හැකි ආකාර |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 05. අවුරුදු කාලය | • අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම් ගවේෂණය කර වාර්තා කරයි.<br>• අවුරුදු චාරිත්‍ර-වාරිත්‍රවල වැදගත්කම අගය කරමින් කටයුතු කරයි.<br>• අවුරුදු කාලයේ සිදු කරන ඇතැම් කටයුතුවලින් සිදු විය හැකි අනතුරු පිළිබඳ ව විමසිලිමත් වෙමින් ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• අවුරුදු සිරිය මතුවන විවිධ නිර්මාණවල යෙදෙමින් වින්දනය ලබයි.<br>• විවිධ ජන කොටස්වල අවුරුදු චාරිත්‍ර-වාරිත්‍රවලට ගරු කරයි.<br>• අවුරුදු උත්සව සමය හා සම්බන්ධ ක්‍රීඩාවල නිරත වෙමින් වින්දනයක් ලබයි.<br>• අවුරුදු කාලයට සුවිශේෂ වූ විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නියැලෙයි. | • අවුරුදු කාලයේ දී අවට පරිසරයේ සිදුවන වෙනස්කම්<br>• අවුරුදු කාලයේ දී සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර<br>• විවිධ ජන කොටස්වලට සුවිශේෂ වූ අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර<br>• අවුරුදු දිනවල සිදුවිය හැකි අනතුරු හා ඒවායින් ආරක්ෂාවන ආකාර<br>• අවුරුදු කාලය හා සබැඳි නිර්මාණ<br>• අවුරුදු කාලයට සුවිශේෂ වූ ජන ක්‍රීඩා<br>• අවුරුදු කාලයට සුවිශේෂ වූ ජන ගී, ජන කවි, රබන් පද ඇතුළු වින්දනාත්මක චලන ක්‍රියාකාරකම් |
| 06. අපට පෙනෙන අහස | • අහස හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>• හිරු එළියෙන්, සුළඟින්, වර්ෂාවෙන් සිදුවන බලපෑම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• විවිධ මාධ්‍ය භාවිත කරමින් අහස හා පාරිසරික වෙනස්කම් විදහා දැක්වෙන නිර්මාණ කරයි<br>• අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.<br>• අහසේ සුන්දරත්වය ප්‍රකාශනාත්මක මාධ්‍ය ඇසුරෙන් ඉදිරිපත් කර වින්දනයක් ලබයි. | • දවසේ විවිධ අවස්ථාවල දී අවට පරිසරයේ සිදු වන වෙනස්කම්<br>• හිරු එළියෙන්, වර්ෂාවෙන්, සුළඟින් සිදුවිය හැකි බලපෑම්<br>• අධික හිරු එළිය නිසා ශරීරයට සිදුවන අහිතකර තත්ත්වයන්ගෙන් ආරක්ෂා වන අයුරු<br>• විවිධ මාධ්‍ය භාවිත කරමින් ආකාශ වස්තු නිර්මාණය<br>• තිරස් සහ සිරස් අවකාශ භාවිත කිරීම හා සම්බන්ධ සුළු ක්‍රීඩා<br>• අහසේ සුන්දරත්වය පිළිබඳ කියවෙන ගී ගායනා, ප්‍රකාශනාත්මක චලන<br>• සුළඟ උපයෝගි කර ගෙන හඬ නිපදවිය හැකි භාණ්ඩ |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 07. අප කන බොන දේ | • ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනා ගනිමින් පරිභෝජනය කරයි.<br>• නිරෝගී පැවැත්ම සඳහා නිවැරදි සෞඛ්‍යය පුරුදු පවත්වා ගනියි.<br>• ආහාර අපිරිසිදු වන අයුරු හඳුනා ගෙන ඒවායින් ආහාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.<br>• විවිධ මාධ්‍ය භාවිතයෙන් ආහාර හා සම්බන්ධ නිර්මාණවල යෙදෙයි.<br>• ශක්ති වර්ධනයට උපකාරී වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• ආහාර ගැනීමේ දී පවත්වා ගත යුතු නිවැරදි පිළිවෙත් ප්‍රදර්ශනය වන නිර්මාණාත්මක රංගනවල යෙදේ. | • ආහාරයක් ලෙසට පළා වර්ගවල ඇති වැදගත්කම<br>• ආහාර වේලක් පිළියෙළ කර ගැනීම<br>• පෝෂ්‍යදායී ආහාර ගැනීමේ වැදගත්කම<br>• රෝගවලින් වැළකී සිටීමට අවශ්‍ය කරන ආහාර පුරුදු<br>• ආහාර නාස්තිය වළක්වා ගන්නා අයුරු<br>• විවිධ මාධ්‍ය ආශ්‍රයෙන් ආහාර වර්ගවල ආකෘති නිර්මාණය<br>• ශක්ති වර්ධනය සඳහා උපකාරී වන චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• ආහාර හා සබැඳි කවි, රබන් පද හා භූමිකා රංගන |
| 08. තොරතුරු ලැබෙන හැටි | • සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍ය හඳුනා ගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.<br>• සන්නිවේදනය හා බැඳුණු තාක්‍ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• සන්නිවේදනයේ දී ආචාරශීලී ව කටයුතු කරයි.<br>• තොරතුරු සන්නිවේදනය හා සම්බන්ධ විවිධ නිර්මාණ කරයි.<br>• විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• විවිධ සන්නිවේදන විධි යොදා ගනිමින් ප්‍රකාශනාත්මක චලන සහිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • තොරතුරු නිවැරදිව ලබා ගැනීමේ හා ලබා දීමේ හැකියා<br>• අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කරන අයුරු<br>• සන්නිවේදනය සඳහා යොදා ගන්නා තාක්‍ෂණික උපකරණ නිවැරදි ව භාවිතය<br>• තාක්ෂණික උපකරණ භාවිතයේ දී සිදුවිය හැකි අනතුරු<br>• තොරතුරු ලබා ගැනීමේ දී හා ලබාදීමේ දී ආචාරශීලී බව<br>• විවිධ මාධ්‍ය භාවිතයෙන් තොරතුරු සන්නිවේදනය සඳහා උචිත නිර්මාණ<br>• විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් සිදු කරනු ලබන චාලක ක්‍රියාකාරකම්<br>• අභිරූපනය මඟින් සන්නිවේදනය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 09. වටපිටාවේ සිදුවන වෙනස්කම් | • පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.<br>• ආසන්න පරිසරයේ අහිතකර වෙනස්කම් හිතකර බවට පත්කර ගනියි.<br>• ස්වාභාවික පරිසරයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• වටපිටාවේ වෙනස්කම් සමග ක්‍රියා කරවිය හැකි නිර්මාණ කරයි.<br>• සමීප පරිසරයේ සිදු වන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• අවකාශය භාවිත කරමින් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • ස්වාභාවික හේතු නිසා පරිසරයේ සිදුවන වෙනස්කම් (අව්ව, වැස්ස, සුළං ආශ්‍රිත ව)<br>• අව්ව, වැස්ස හා සුළං ආශ්‍රිත ව ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම් අතුරින් අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීම.<br>• සුළඟ ආධාරයෙන් ක්‍රියා කරවිය හැකි දෑ නිර්මාණය<br>• සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් නම්‍යතා වර්ධනයට උපකාරී වන චලන ගවේෂණ<br>• ස්වභාවික හේතු නිසා වටපිටාවේ සිදු වන වෙනස්කම් ඇසුරෙන් වින්දනාත්මක ක්‍රියාකාරකම් |
| 10. අපේ යහපැවැත්ම | • මනා සංවිධානයකින් යුතු ව කටයුතු කිරීමෙන් තම කාර්යයන් සාර්ථක ව සිදු කර ගනියි.<br>• යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වාගෙන යෑමට කටයුතු කරයි.<br>• වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.<br>• යහපැවැත්මට අදාළ නීතිරීති පිළිගනිමින් නීතිගරුක ව හැසිරෙයි.<br>• යහපුරුදු පවත්වා ගැනීම සඳහා ඉවහල් වන ආකාරයේ නිර්මාණ කරයි.<br>• ශාරීරික සහ මානසික යෝග්‍යතාව පවත්වා ගැනීමට ඉවහල් වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරමින් යහපත් චර්යා පිළිබිඹු කරයි. | • එදිනෙදා කටයුතුවල පිළිවෙළ හා ක්‍රමවත් බව<br>• පාසල තුළ යහපත් සිසුවකු ලෙස හැසිරිය යුතු බව<br>• සංයමයෙන් යුතු ව අදහස් ප්‍රකාශ කළ යුතු බව<br>• අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදවු කිරීමේ වැදගත්කම<br>• තමාගේ වාරය ලැබෙන තෙක් සිටීමට හුරු විය යුතු බව<br>• යහපුරුදු පවත්වා ගෙන යාම සඳහා උපකාරී වන නිර්මාණ<br>• සාමූහිකත්වය වර්ධනය වන කණ්ඩායම් ක්‍රීඩා<br>• යහපැවැත්ම පිළිබඳ අවධාරණය කෙරෙන ගීත, කවි, භූමිකා රංගන |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 11. අපට ඕනෑ දේ ලැබෙන හැටි | • අවශ්‍ය අවස්ථාවල දී අපට උදවු ලබා දෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් කටයුතු කරයි.<br>• වෙළෙඳපොළක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.<br>• තමාට ලැබුණු දේ අන්‍යයන් සමග බෙදා හදා ගැනීමේ යහගුණ පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br>• අපට අවශ්‍ය සමහර දෑ අපට ම නිෂ්පාදනය කර ගත හැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.<br>• එදිනෙදා අවශ්‍ය දෑ විවිධ ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරයි.<br>• ශාරීරික යෝග්‍යතා වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• අපට ඕනෑ දේ ලබා දෙන ස්ථානවලින් සිදු කරන කටයුතු වින්දනාත්මක ව ඉදිරිපත් කරයි. | • උදවු ලබාදෙන අය සහ ඔවුන්ගෙන් වන සේවය<br>• එදිනෙදා අපට අත්‍යවශ්‍ය භාණ්ඩ වෙළෙඳ පොළෙන් ලබා ගත හැකි බව<br>• වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය පිළිබඳ අත්දැකීම්<br>• තමාට ලැබෙන දේ අවශ්‍ය අවස්ථාවල දී අන් අය සමඟ ද බෙදා හදා ගැනීමේ පුරුද්දක් පවත්වා ගත යුතු බව<br>• එදිනෙදා අවශ්‍ය වන සමහර දේ තමා විසින් ම නිෂ්පාදනය කර ගැනීමේ වැදගත්කම<br>• මැහුම් සම්බන්ධ මූලික හුරුකම්<br>• විවිධ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් උලැඟිතා වර්ධනයට උපකාරී වන ක්‍රියාකාරකම්<br>• අපට ඕනෑ දේ ලැබෙන ස්ථානවලින් ඉටු කරන කාර්ය හා සම්බන්ධ භූමිකා රංගන |
| 12. ගමන් බිමන් | • ගමන්බිමන්වල දී නිවැරදි ඉරියවු පවත්වා ගනියි.<br>• පොදු ගමනාගමන සේවා පිළිබඳ දැනුම්වත් වෙමින් ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කරයි.<br>• ගමන් බිමන් යාමේ දී විය හැකි බාධක හා අනතුරු පිළිබඳ විමසිලිමත් ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• ගමන්-බිමන්වල දී අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.<br>• ගමනාගමන ක්‍රම විවිධ මාධ්‍ය මගින් නිර්මාණය කරයි.<br>• ගමන් කිරීම හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• විවිධ ගමන් විලාස ඇසුරෙන් නිර්මාණාත්මක රංගන ඉදිරිපත් කරයි. | • බර එසවීම හා සම්බන්ධ පවත්වා ගත යුතු නිවැරදි ඉරියවු<br>• විවිධ කාර්යයන් කිරීමේ දී පවත්වා ගත යුතු සමබරතාව<br>• ගමනාගමනය සඳහා යොදා ගන්නා පොදු වාහන හා මාර්ග ආරක්ෂා කරගත යුතු පොදු දේපළක් බව<br>• ගමන්-බිමන්වල දී විය හැකි අනතුරු සහ බාධකවලින් ආරක්ෂා වීමට ගත යුතු පියවර<br>• විවිධ මාධ්‍ය යොදා ගනිමින් වාහන ආකෘති නිර්මාණය<br>• ශරීරයේ සමබරතාව රැකෙන විවිධ ඉරියවු සම්බන්ධ ක්‍රියාකාරකම්<br>• විවිධ ගමන් විලාසවල රිද්ම ඇසුරෙන් නිර්මාණාත්මක චලන ක්‍රියාකාරකම් |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| 13. එළිය (ආලෝකය) සමඟ සෙල්ලම් | • ආලෝක ප්‍රභව, ආලෝකය හා ඇස අතර ඇති සබඳතාව අධ්‍යයනය කරයි.<br>• ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් දෛනික කටයුතුවල යෙදෙයි.<br>• ස්වාභාවික ව එළිය වෙනස් වීම් අනුව පරිසරයේ ඇති වන වෙනස්කම් සහ එළිය වෙනස් වීම් කළ හැකි අයුරු විමර්ශනය කර වාර්තා කරයි.<br>• අලංකරණය සඳහා ආලෝකය උපයෝගි කර ගනිමින් විවිධ නිර්මාණ කරයි.<br>• ස්වාභාවික ආලෝකයෙන් වන බලපෑම් පිළිබඳ විමසිලිමත් ව එළදායී අයුරින් ක්‍රීඩාවල යෙදෙයි.<br>• එළිය සමඟ සිදු කළ හැකි අභිනය මුල් කර ගත් වින්දනාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරයි. | • ආලෝකය ලැබෙන ආකාර<br>• දෛනික කටයුතුවල දී ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බව<br>• ස්වාභාවික ආලෝකයේ බලපෑම නිසා පරිසරයේ විවිධ දේවලට සිදුවන වෙනස්කම්<br>• ආලෝකය විහිදීම හා පරාවර්තනය<br>• ආලෝකය යොදා ගනිමින් කළ හැකි නිර්මාණ<br>• ස්වාභාවික ආලෝකය උපයෝගී කරගනිමින් සිදු කළ හැකි නිර්මාණාත්මක චාලක ක්‍රියාකාරකම්<br>• විවිධ ආලෝකවලට (එළියට) ප්‍රතිචාර දක්වන විට මුහුණෙහි සිදුවන වෙනස්කම් පිළිබඳ ව ප්‍රායෝගික ක්‍රියාකාරකම් |
| 14. මිනිසුන් වැඩ කරන තැන් | • සමීප හා ආසන්න පරිසරයේ පුද්ගලයන් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන සහ එම ස්ථානවල දී තම ආරක්ෂාව සලසා ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි.<br>• විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැලඳුම් හා උපකරණ හඳුනා ගෙන වාර්තා කරයි.<br>• මිනිසුන් ජීවිකාව සඳහා සිදු කරන කාර්යයන් හා ඒවායින් සිදු වන සේවය අගය කරයි.<br>• මිනිසුන් වැඩ කරන ස්ථාන ආශ්‍රිත චලන අනුකරණය හා සමබරතාව පවත්වා ගත යුතු චාලක ක්‍රියාකාරකම්වල යෙදේ.<br>• වැඩ කරන ස්ථාන, භාවිත භාණ්ඩ හා උපකරණ සම්බන්ධ නිර්මාණය කරයි.<br>• මිනිසුන් වැඩ කරන තැන් හා සම්බන්ධ තොරතුරු වින්දනාත්මක ව ප්‍රකාශ කරයි. | • ආසන්න පරිසරයේ මිනිසුන් ජීවිකාව සඳහා කරන කාර්ය හා ස්ථාන පිළිබඳ තොරතුරු<br>• මිනිසුන් වැඩ කරන ස්ථානවල දී ආරක්ෂාව සලසා ගන්නා ආකාර<br>• විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැලැඳුම් හා උපකරණ<br>• මිනිසුන් විසින් සිදු කරනු ලබන විවිධ කාර්යයන් හා ඒවායින් සිදුවන සේවය<br>• වැඩ කරන අවස්ථාවල දී මිනිසුන් භාවිත කරන භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය<br>• විශාල සහ සියුම් මාංශ පේශි වර්ධනයට උපකාරී වන චලන අනුකරණ<br>• මිනිසුන් වැඩ කරන විවිධ තැන් හා සම්බන්ධ ජන ගී, ජන නැටුම් හා අභිචලන |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 15. වටපිටාවේ වෙනස් තැන් | • පරිසරයේ විවිධ ස්ථානවල මිනිසා විසින් සිදු කරන අයහපත් වෙනස්කම් හඳුනා ගනිමින් එම ස්ථාන යහපත් ස්ථාන බවට පත් කර ගැනීමට කටයුතු කරයි.<br>• ස්වාභාවික ව හා මිනිස් ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදු වන බලපෑම් හා එම බලපෑම්වලින් පස රැක ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විමර්ශනය කරයි.<br>• පරිසරයේ විවිධත්වයන්ට ගැළපෙන නිර්මාණ කරමින් පරිසරයේ සුන්දරත්වය රැකගනියි.<br>• පාසල් පරිසරයේ වෙනස් වූ තැන් අනුව මූලික ශාරීරික යෝග්‍යතා වර්ධනය වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• වටපිටාවේ වෙනස් තැන්වල ඇති විවිධත්වය පිළිබිඹු කරන රිද්මානුකූල චලන වින්දනාත්මක ව ඉදිරිපත් කරයි. | • තම ප්‍රයෝජනය පිණිස මිනිසා විසින් පරිසරයේ සිදු කර ඇති වෙනස්කම්<br>• මිනිසා විසින් පරිසරයේ සිදුකර ඇති අයහපත් වෙනස්කම් නිසා ඇති වී තිබෙන බලපෑම්<br>• අහිතකර බලපෑම් හිතකර තත්ත්වයන්ට පත් කර ගැනීම සඳහා කළ හැකි දේ<br>• ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා පසට සිදු වී ඇති හානි<br>• පස රැක ගතහැකි විවිධ ක්‍රම<br>• පාසල් භූමියේ තෝරා ගත් ස්ථානයක ආකෘති නිර්මාණය<br>• විශාල පේශි හා කුඩා පේශි සමායෝජනය සඳහා චාලක ක්‍රියාකාරකම්<br>• ආදේශ භාණ්ඩ භාවිත කරමින් පරිසරයේ ඇසෙන විවිධ ශබ්ද හා නාද අනුකරණය |
| 16. අපේ උදවු ඕනෑ අය | • සමාජයේ උදවු අවශ්‍ය අය හඳුනා ගෙන උදවු කිරීමට කටයුතු කරයි.<br>• සාර්ථකත්වය සඳහා සහයෝගයෙන් යුතු ව කටයුතු කරයි.<br>• අන් අයට උපකාරී වන ආකාරයේ නිර්මාණ කරයි.<br>• අන්‍යොන්‍ය සහයෝගය වර්ධනය සඳහා චාලක ක්‍රියාකාරකම්වල යෙදේ.<br>• සමාජයේ විවිධ අය පිළිබඳ සංවේදීතාව මතු කර දක්වන භූමිකා රංගනවල නිරත වෙයි. | • අවශ්‍ය අවස්ථාවල දී අන් අයගේ ද උදවු අවශ්‍ය වන බව<br>• අවශ්‍ය අවස්ථාවල දී උදවු අවශ්‍ය අයට උදවු කිරීම<br>• සහයෝගී ව වැඩ කිරීමෙන් වැඩි ඵලයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බව<br>• අපේ උදවු අවශ්‍ය අයට ප්‍රයෝජනවත් වන ආකාරයේ නිර්මාණ<br>• සහයෝගයෙන් සිදු කළ හැකි චලන සමායෝජන ක්‍රියාකාරකම්<br>• විවිධ අවශ්‍යතා ඇති අය කෙරෙහි සංවේදීතාව මතු කරන ආකාර පිළිබඳ භූමිකා රංගන/කෙටි නාට්‍ය |

# 1. තේමාව : අපයි පාසලයි

**නිපුණතා** :

- පාසලේ තිබෙන සුවිශේෂ හා වැදගත් ස්ථාන හඳුනා ගෙන එහි විවිධත්වයන්ට අනුකූල ව කටයුතු කරයි.
- පාසලේ කටයුතුවලට දායක වෙමින් පාසල් සංස්කෘතිය යහපත් ව පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.
- පාසලේ සිටින විවිධ පුද්ගල භූමිකා හඳුනා ගනිමින් ඔවුන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
- පන්ති කාමරය අලංකාර ව පවත්වා ගෙන යාම සඳහා විවිධ මාධ්‍ය භාවිත කරමින් නිර්මාණවල යෙදෙයි.
- උපකරණ භාවිත කරමින් ස්නායු - පේශි සමායෝජන සඳහා චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- පාසලේ අගය ඉස්මතු කර දැක්වීම සඳහා වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරයි.

**ඉගෙනුම් පල** :

- පාසල පරිසරය අලංකාර ව, පිරිසිදුව හා ක්‍රමවත් ව පවත්වා ගෙන යාමට දායක වෙයි.
- පාසලේ පොදු දේපළ ආරක්ෂා කිරීමට තම දායකත්වය දක්වයි.
- තමාගෙන් පන්ති කාමරයට හා පාසලට විය යුතු යුතුකම් හා වගකීම් ඉටු කරයි.
- පාසලේ කටයුතුවලට උදවු කරන පුද්ගලයන් අගය කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් පන්ති කාමරයේ අලංකාරය පවත්වා ගැනීමට සුදුසු නිර්මාණ ඉදිරිපත් කරයි.
- ස්නායු - පේශි සමායෝජනය සඳහා සෙල්ලම් මිදුලේ උපකරණ භාවිත කරයි.
- පාසලේ අගය ගැන කියවෙන කවි, ගීත තාලානුකූල හා රිද්මානුකූල චලන සමඟින් ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- පාසල් පරිසරයේ ස්වභාවය නිරීක්ෂණය සඳහා සිසුන් සමඟ චාරිකාවක නිරත වන්න.
- මෙම චාරිකාවේ දී එම ස්ථානවල පිළිවෙළ/අපිළිවෙළ, පිරිසිදු/අපිරිසිදු බව වැනි කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- එම ස්ථාන එසේ වීමට හේතු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- මෙම ස්ථානවල අපිරිසිදු/අපිලිවෙල ස්ථාන වේ නම් ඒවා වඩාත් අලංකාර ව, පිරිසිදුව හා ක්‍රමවත් ව පවත්වාගෙන යාම සඳහා තමන්ට කළ හැකි දේ පිළිබඳව සිසුන් සමග කතා බහක නියැලෙන්න.

  *උදා :* * ස්ථාන නම් කිරීම.
  * පිරිසිදු කිරීම.
  * අනවශ්‍ය දේ ඉවත් කිරීම.
  * හොඳින් පිළිවෙළට ගොඩ නැගීම.

- ඒ අනුව පන්ති කාමරයේ/පාසලේ අපිළිවෙලට පවතින ස්ථානයක් තෝරාගෙන එය ක්‍රමවත්, පිරිසිදු, අලංකාර ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන්න.

  *උදා :* * අතුගෑම, වල් පැළ ගැලවීම
  * මල් පාත්ති සැකසීම
  * සකස් කරගත් පාත්ති හොඳින් පවත්වාගෙන යාම, ආදර්ශනය, ප්‍රදර්ශනය
  * පින්තූර එල්ලීම,
  * අවශ්‍ය ස්ථානවල තීන්ත ආලේප කිරීම

* කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම
* මකුළුදැල් කැඩීම
* පයට පැගෙන ගල් මුල් ඉවත් කිරීම . . . වැනි

- ගුරු සහය ඇති ව සිසුන්ගේ මට්ටමෙන් කළ හැකි මෙවැනි ඕනෑම වෙනසක් කිරීමට සිසුන් යොමු කරන්න.
- සැම සිසුවකු ම කාර්ය සඳහා දායක කරගන්න.
- කාර්ය සිදු කිරීමෙන් පසු සිසුන් අගය කිරීමට ලක් කරන්න.
- පසු ව මේ ආකාරයට කටයුතු කිරීම මඟින් අත්වන ප්‍රයෝජන පිළිබඳ ව ද සිසුන් සමග කතා බහක නියැළෙන්න.

  *උදා :* * ඉගෙනුම් කටයුතු කිරීමට සුදුසු පරිසරයක් සකස් වීම.
  * නීරෝග බව පවත්වාගෙන යාමට උදවු වීම.
  * ප්‍රසන්න පාසල් පරිසයක් ඇති වීම . . . වැනි

- මෙවන් පරිසරයක් පවත්වා ගැනීම සඳහා පහත සඳහන් පුරුදු නිරන්තර ව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.

  *උදා :* * පිළිවෙළට හා පිරිසිදු ව වැඩ කිරීම.
  * ගත් දෙයක් ගත් තැන ම තැබීම
  * තමා වැඩ කළ ස්ථාන පිරිසිදු කිරීම
  * කුණු කසළ නිවැරදි ව බැහැර කිරීම . . . වැනි

**ක්‍රියාකාරකම 2 :**

- පාසලේ පාවිච්චි කිරීමට ඇති ඩෙස්ක් පුටු, කළුලෑලි, වතුර කරාම , වැසිකිළි උපකරණ වැනි භාණ්ඩ, උපකරණවලින් හා ගොඩනැගිලිවලින් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සිසුන් සමඟ කතාබහ කරන්න.
- පසු ව සිසුන් පාසල අවට නිරීක්ෂණ චාරිකාවක යොදවා පාසලේ කැඩී බිඳී ගිය ස්ථාන හා බඩුමුට්ටු, ඩෙස් පුටු, පොත්පත් අක්‍රමවත් ව අසුරා ඇති තැන් වේ නම් ඒවා නිරීක්ෂණයට සලස්වන්න.
- තම නිරීක්ෂණ පිළිබඳ ව සිසුන් ගෙන් අදහස් විමසීමක් කරන්න.

  *උදා -* * සිසුන්ට දැනුණ දේ, හැඟුණ දේ,
  * එවැනි තැන් පාසලේ තිබීමෙන් පාසල් පරිසරයට සිදුවන අහිතකර බලපෑම

- ඉහත ස්ථාන හා උපකරණ එසේ වීමට හේතු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * අපිළිවෙළට හා අපිරිසිදු ව පොත් පරිහරණය
  * ඩෙස්ක් පුටු එහා මෙහා කිරීමේ දී ඇදගෙන යාම හා පුටුවේ කකුල් දෙකින් සිට පැද්දීම
  * ජලය කාන්දු වෙන ආකාරයට කරාම වැසීම
  * අනවශ්‍ය කුරුටුගෑම් ආදියෙන් බිත්ති අවලක්ෂණ කිරීම
  * නියමිත කාලවල දී යකඩ දැල්වල පින්තාරු නොකිරීමෙන් මලකඩ කෑමට ලක්වීම
  * කැඩී ගිය බිත්ති පිළිසකර නොකිරීමෙන් ඒවාට හානිවීම

- මෙම ස්ථාන, භාණ්ඩ හා උපකරණ ආරක්ෂා කළ යුත්තේ කුමන හේතු නිසා ද යන්න පහත කරුණු මුල් කරගනිමින් තව දුරටත් සිසුන් සමඟ කතා බහ කරන්න.
  * පාසල හා පන්ති කාමරය අපගේ පොදු පරිහරණය සඳහා ඇති ස්ථාන බව
  * ඒවා කඩාබිඳ දැමීම නොකළ යුතු බව
  * පරෙස්සමින් හා පිරිසිදු ව පාවිච්චි කළ යුතු බව
  * එසේ කිරීම මඟින් අනාගතයේ තමන්ගේ සහෝදර-සහෝදරියන්ටත් මේවා ක්‍රමවත් ව පාවිච්චි කිරීමට අවස්ථාව උදා වන බව
  * එයින් තවත් සිසුන් බොහෝ පිරිසකට සේවය සැලසෙන බව

* රජයෙන් අපට නොමිලේ ලැබෙන මේ දේවලට හානි කිරීමට මේවා විනාශ කිරීමට කිසිම සිසුවකුට අයිතියක් නොමැති බව
* මේවා ආරක්ෂා කිරීම අපේ යුතුකමක් බව

- පිරිසිදු ව හා පිළිවෙළට පොත්පත් පරිශීලනය කරන සිසුන් අගය කරන්න.
- අප පරිහරණය කරන දේවල් අපි විසින් ම සුරක්ෂිත කිරීමේ වැදගත්කම සිසුන්ට තහවුරු කිරීමට භූමිකා රංගනවල හෝ කෙටි නාට්‍යයක හෝ සිසුන් නිරත කරවන්න.
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් අගය කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- තමාගෙන් පන්ති කාමරයට හා පාසලට ඉටු විය යුතු දේ පිළිබඳ හඳුනා ගැනීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ඒ අනුව පාසලෙන් අපට ලබා දෙන දේ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

*උදා :* * යහපුරුදු ඉගැන්වීම.
* හොඳ අධ්‍යාපනයක් ලබා දීම.
* නිරෝගී ජීවිතයක් සඳහා අවශ්‍ය හුරුකම් ලබා දීම
* මිතුරු ඇසුරට අවස්ථාව ලැබීම . . . වැනි කරුණු

- මේ සියලු දේ ලබා දීම සඳහා ගුරුවරුන් බොහෝ වෙහෙස මහන්සි වන බව ද පෙන්වා දෙන්න.
- පාසලේ අගය පිළිබඳ කියැවෙන කවි, ගී රැස්කර ගන්න.
- ඒවා සිසුන් සමඟ ගායනා කරන්න.
- ඒවායෙහි දැක්වෙන අදහස් පිළිබඳව ද කතාබහ කරමින් පාසලේ අගය පිළිබඳ ව තවදුරටත් සිසුන් දැනුවත් කරන්න.
- එසේ ම අපෙන් ද පාසලට ඉටුවිය යුතු යුතුකම් ඇති බවත් ඒ අනුව පහත දැක්වෙන කරුණු මතු කර දක්වමින් පැහැදිලි කරන්න.

*උදා :* * ඉගෙනුම් කටයුතු හොඳින් සිදු කිරීම.
* ගුණගරුක ව හැසිරීම.
* තම පාසලට ගෞරවයෙන් යුක්ත ව සැලකීම.
* පාසලේ කීර්ති නාමයට හානිවෙන කිසිවක් නොකිරීම
* පාසලේ කීර්ති නාමය වැඩිදියුණු වන ආකාරයෙන් කටයුතු කිරීම
* ගුරුවරුන්ට කීකරු ව කටයුතු කිරීම
* පාසලේ සම්පත් ආරක්ෂා කිරීම
* පාසල අලංකාර ව පවත්වා ගැනීමට දායක වීම . . . වැනි

- මෙසේ කටයුතු කිරීම මගින් අප යහපත් සිසු දරුවන් බවට පත්වන බවත් ඒ හේතුවෙන් අප සමාජයේ ඇගයීමට ලක්වන බවත් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 4**

- පාසලේ කටයුතුවලට උදවු කරන පුද්ගලයන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
*උදා :* විදුහල්පති, ගුරුවරු, කාර්යාල කාර්ය සහායක, පිරිසිදු කරන අය, . . .
- ඔවුන් එක් එක් අය පාසලේ කටයුතු සඳහා උදවු කරන ආකාර පිළිබඳ විමසීමක් කරන්න.
- පාසලේ සේවය කරන අයකු පන්තියට කැඳවන්න. සුහද කතාබහක ආශ්‍රයයෙන් ඔවුන් පාසලට සිදුකරන සේවය පිළිබඳ ව දැනුම්වත් වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

*උදා :* * කාර්යාල කාර්ය සහයක - කාර්යාල විවෘත කිරීම හා අවශ්‍ය දේ පිළියෙළ කිරීම.
* නියමිත වේලාවල දී සීනුව නාද කිරීම . . . වැනි දේ

- ඒ අනුව ඔවුන් සිදු කරන විවිධ කාර්යයන් නිසා පාසලේ වැඩ කටයුතු පහසුවෙන් සිදු කිරීමට හා පාසලේ දියුණුවට ඉමහත් සේවයක් වන බව ද පෙන්වා දෙන්න.
- එදිනෙදා කටයුතු සිදු කිරීමේ දී පාසලේ විවිධ කාර්යවල නියැළෙන සෑම අයෙකු සමගම සුහද ව කාරුණික ව කටයුතු කළ යුතු බව ද පෙන්වා දෙන්න.
- එසේ කිරීමෙන් සියලු දෙනාට පාසල ප්‍රීතිමත් ස්ථානයක් වන බව ද කතාබහක් තුළින් මතු කර දක්වන්න.

**ක්‍රියාකාරකම 5 :**

- වර්ෂයේ විශේෂ දින සටහන් කිරීම සඳහා  පාසලේ ප්‍රදර්ශනය කල හැකි  දින දර්ශනයක් සෑදීමට සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක ම ප්‍රමාණයට සකස් කරගත් කොළ 12ක් ($A_3$ ප්‍රමාණයේ කඩදාසි වැනි) සහ දියරමය වර්ණ සිසු කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- දෙන ලද කොළය හරි මැදින් දෙකට නවා කොළයේ එක් කොටසක දියරමය වර්ණ ආශ්‍රයයෙන් අත්ලේ සහ ඇඟිලිවල මුද්‍රා තබමින් නිර්මාණයක් සිදු කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් විසින් කරන ලද නිර්මාණ සහිත කඩදාසිවල ජනවාරි, පෙබරවාරි ආදි වශයෙන් නම් කරන්න.
- කඩදාසියේ චිත්‍රය නිර්මාණය කළ කොටස හැර හිස් ව තිබෙන ඉතිරි කොටසේ තරමක් විශාල අකුරෙන් එම මාසයට විශේෂ  දින සටහන් කරන්න.

| *උදා :* | <u>මාසය</u> | <u>විශේෂිත දිනය</u> | <u>යෙදෙන දිනය</u> |
|---|---|---|---|
| | ජනවාරි මාසය | පසළොස්වක පෝය | |
| | | තෛපොංගල් උත්සව දිනය | |

- අවශ්‍ය නම් සෙනසුරාදා සහ ඉරිදා දිනයන් ද සටහන් කළ හැකි ය.
- ඉන් පසු එම කඩදාසි  සියල්ල දින දර්ශනයක ආකාරයෙන් සකස් කොට සුදුසු ආකාරයේ නිමාවකින් යුතු ව පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- සිසු නිර්මාණ  අගය කරන්න.


**ක්‍රියාකාරකම 6**

- පාසල පිළිබඳ සිසුන් තුළ යහපත් ආකල්ප ඇති කිරීම සඳහා උදවු වන පුවරු කිහිපයක් සකස් කිරීමට සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- එසේ පුවරුවල අන්තර්ගත කිරීමට සුදුසු ප්‍රකාශ කිහිපයක් තෝරා ගන්න.
  *උදා :* *  පන්තිය පිරිසිදු ව තබා ගනිමු.
  *  පොත්පත් පිළිවෙළට තබා ගනිමු. . . . වැනි කරුණු ඇතුළත් පුවරු
- මේවා සකස් කර ගැනීම සඳහා සුදුසු ආකාරයේ කඩදාසි තීරු කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එම තීරුවල ප්‍රකාශන ලියා කාඩ්බෝඩ්වල අලවා සුදුසු ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට යොමු කරන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 7**

- සෙල්ලම් මිදුලට සිසුන් රැගෙන යන්න.
- සෙල්ලම් මිදුලේ උපකරණ ආශ්‍රයයෙන් සිදු කරන ක්‍රියාකාරකම් මඟින් සිරුරට සිදුවන යහපත පිළිබඳ ව කතා බහ කරන්න.
- මෙම උපකරණ භාවිතයේ දී ආරක්ෂාව සලසා ගත යුතු ආකාරය පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.

- සිසුන්ට සෙල්ලම් මිදුලේ උපකරණ සමඟ ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පසු ව පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.
- සිසුන්ට රිංගීම සඳහා සුදුසු විවිධ ප්‍රමාණවලින් යුතු වළලු කිහිපයක් සකස් කර ගන්න.
- මේ සඳහා වේවැල්, පීවීසී බට යොදා ගැනීම සුදුසු ය.
- ඒවා රූප සටහනේ පරිදි සිසුන් කිහිප දෙනෙකු ලවා අල්ලා ගෙන සිටීමට සලස්වන්න. (වළලු දෙකක් අතර දුර ප්‍රමාණය මීටරයක් පමණ විය යුතු ය.)



- පසුව පන්තියේ අනෙක් සිසුන් පේළියක් ආකාරයට සිටුවන්න.
- ගුරුතුමිය ලබා දෙන සංඥාවකට අනුව පේළියේ සිසුන් එක් අයකු පසුපස අනෙකා ලෙස වළලු අතරින් රිංගා යා යුතු වේ.
- මේ අයුරින් සියලු සිසුන් සහභාගි වන තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.
- සකස් කරගත් වළලු අල්ලාගෙන සිටින සිසුන්ට ද ක්‍රියාකාරකම සඳහා සහභාගි වීමට අවස්ථාව සලසා දෙන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපේ කැලේ ඉස්කෝලේ'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 2. තේමාව : අපේ ගෙදර

**නිපුණතා** :

- නිවසේ හා නිවසට සම්බන්ධ පුද්ගලයන් මෙන් ම සතුන් කෙරෙහි ද යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
- තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නිවස යහපත් ලෙස පවත්වා ගෙන යෑමට දායක වෙයි.
- එදිනෙදා නිවසේ ප්‍රයෝජනයට ගත හැකි දෑ නිපදවා ගැනීමට දායක වෙයි.
- නිවසේ අලංකරණය සහ පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා යොදා ගත හැකි නිර්මාණ සිදු කරමින් වින්දනයක් ලබයි.
- නිවෙස් පරිසරය ඇසුරු කර ගත් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙමින් වින්දනයක් ලබයි.
- නිවෙස් පරිසරය ආශ්‍රිත ව ලබන අත්දැකීම් වින්දනාත්මක ව ප්‍රකාශ කරයි.


**ඉගෙනුම් පල** :

- පවුලේ සමීපතම නෑදෑයන්ට ඥාතිත්වයෙන් අමතයි.
- පවුල තුළ යහපත් සබඳතා පවත්වා ගෙන යාමට කටයුතු කරයි.
- දෙමව්පියන් හා නිවසේ සිටින අනෙකුත් සාමාජිකයන් තම යුතුකම්, වගකීම් ඉටු කිරීම සඳහා සිදු කරන කටයුතු විස්තර කරයි.
- නිවසේ කටයුතුවල දී තමාගේ දායකත්වය ලබා දෙයි.
- නිවසේ අලංකාරය හා පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්මාණ කරයි.
- නිවසේ පරිසරය ඇසුරු කර ගත් සුළු ක්‍රීඩාවල යෙදෙයි.
- පවුලේ සාමාජිකයන්ගේ භූමිකා නිරූපණය වන ආකාරයේ රංගන ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය


**ක්‍රියාකාරකම** 1 :

- පවුලේ සමීපතම නෑදයන් පිළිබඳ ව හඳුනා ගැනීම සඳහා එක් එක් සිසුවා සමග තම පවුල්වල සිටින ඥාතීන් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- එහි දී පවුල්වල සිටින ඥාතීන් කවුරුන් ද ඔවුන් අමතන්නේ කෙසේ ද වැනි තොරතුරු සාකච්ඡාවක් ඇසුරෙන් මතු කර දක්වන්න.
- අනතුරු ව පහත සඳහන් ක්‍රියාකාරකමේ සිසුන් යොදවන්න.
- පහත දැක්වෙන ආකාරයට පවුලේ සමීපතම ඥාතීන්ගේ නම් කාඩ්පත්වල සටහන් කර ඒවා මාල ආකාරයෙන් සකස් කර ගන්න.




- මෙම ඥාතිත්වයන්ට ගැළපෙන සුදුසු ආකාරයේ ඇඳුම් ද සපයා ගන්න.
- පාසල් වත්තේ ඉඩකඩ ඇති ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- ඉහත චරිත නිරූපණය සඳහා සිසුන් කිහිප දෙනෙකු තෝරා ගන්න.

- ඒ අයට සුදුසු ඇඳුම් ලබා දෙන්න. අදාළ මාල පලඳන්න.
- මව සහ පියා යන චරිත හැර අනෙක් චරිත නිරූපණය කරන සිසුන් ස්ථාන කිහිපයක රඳවන්න.
- ගුරුතුමිය විසින් මව සහ පියා යන චරිත ද සමඟින් එක් එක් ස්ථානවල රැඳවූ ඥාතීන් මුණගැසීමට අනෙක් සිසුන් සමඟ චාරිකාවක යෙදෙන්න.



- එහි දී හමු වන ඥාතීන් ඥාතිත්වයෙන් අමතා කෙටි පිළිසඳරේ යෙදෙන්න.
- එම ඥාතිත්වය දරුවන්ට කෙසේ සම්බන්ධ වන්නේ ද, දරුවන් ඔවුන් කෙසේ ඇමතිය යුතු ද යන කරුණු ද මතු කර දක්වන්න.
- හඳුනාගන්නා එක් එක් ඥාතීන් ද කැටුව අනෙක් ඥාතීන් හමුවීමට යන්න.

**ක්‍රියාකාරකම 2 :**

- කතාවක්/සිද්ධියක්/ගීතයක් හෝ සත්ව ලෝකය හා සම්බන්ධ අත්දැකීමක් තෝරා ගනිමින් යහපත් පවුලක ස්වභාවය පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- පසුව යහපත් පවුලක තිබිය යුතු ලක්ෂණ සිසුන් සමඟ කතා බහ කරන්න.

  *උදා :* * පවුලේ සියලු සමාජිකයන් සමඟ සමඟියෙන් කටයුතු කිරීම
  * ලැබෙන දේ සැම දෙනා අතර බෙදා හදා ගැනීම
  * යහපත් ලෙස සිදු කරනු ලබන ආමන්ත්‍රණ/කතාබහ
  * පවුලට ළැදිබව
  * ආරක්ෂා කිරීම
  * එකිනෙකාට උදවු කර ගැනීම
- මෙවැනි ලක්ෂණ පවත්වා ගැනීම මගින් පවුල තුළ තමන්ට හා පවුලට අත්විඳිය හැකි දේ පිළිබඳ ව කතාබහ කරන්න.
  * නිවස ප්‍රියජනක ස්ථානයක් වීම
  * සමාජයේ එම පවුල පිළිබඳ ව යහපත් ආකල්පයක් ඇතිවීම . . . වැනි කරුණු
- ඒ අනුව අපේ පවුල තුළ ද මෙවැනි තත්ත්වයක් ඇති කර ගැනීම සඳහා අපගේ හැසිරීම් කෙසේ පවත්වා ගත යුතු ද යන්න පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කරන්න.


**ක්‍රියාකාරකම 3 :**

- පවුලක යහපත් පැවැත්ම සඳහා සාමාජිකයන් විසින් කළ යුතු දේ පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීමට පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.
- පවුලක යහපත් පැවැත්ම සඳහා සාමාජිකයන් සිදු කරන විවිධ කටයුතු එක් කාඩ්පතක එක බැගින් වන සේ ලියා කාඩ්පත් කිහිපයක් සකස් කර ගන්න.

*උදා :*

| | | |
|---|---|---|
| ගේ අතුගෑම | ආහාර පිසීම | රෙදි සේදීම |
| මිදුල අතුගෑම | මුදල් ඉපයීම | වත්ත පිරිසිදු කිරීම |
| මල් පැළවලට වතුර දැමීම | කඩයට ගොස් බඩු ගෙන ඒම | පොල් ගෑම |

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සකස් කරගත් කාඩ්පත් කිහිපයක් එම කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු කාඩ්පත්වල සඳහන් වන දේ කණ්ඩායමේ සියලු සාමාජිකයන්ට නිරීක්ෂණයට යොමු කරන්න.
- අනතුරු ව එම කාඩ්පත්වල සඳහන් කාර්යයන් තම තමන්ගේ පවුල්වල කවුරුන් විසින් ඉටු කරන්නේ දැයි යන්න පිළිබඳ ව එක් එක් සිසුවාගෙන් විමසීමක් කරන්න.
- මේ අයුරින් සියලු කණ්ඩායම්වල අදහස් විමසමින් පවුලක කාර්යයන් ඉටු කර ගැනීම සඳහා සෑම සාමාජිකයකුගේ ම සහය ලැබෙන බව පැහැදිලි කරන්න.
- බ්‍රිස්ල් බෝඩ් හෝ ඩිමයි කොළයක් හෝ ගෙන පහත රූපයේ දැක්වෙන ආකාරයට සටහනක් ඇඳ ගන්න.




- පසු ව එහි මැද රවුම තුළ සිසුන් අතැති කාඩ්පත් ඇලවීමට යොමු කරන්න.
- මේ ඇසුරෙන් පවුලක එදිනෙදා කටයුතු සියල්ලන් එක් ව ඉටු කළ යුතු බව තවදුරටත් තහවුරු කරන්න.

**ක්‍රියාකාරකම 4 :**


- තම පවුල වෙනුවෙන් තමා විසින් සිදු කරන කාර්යයක් බැගින් සටහන් කිරීම සඳහා සැම සිසුවකුට ම කුඩා ප්‍රමාණයේ කාඩ්පත බැගින් ලබා දෙන්න.
- එම කාඩ් පත්‍රයේ නිවස වෙනුවෙන් සිදු කරන එක් කාර්යක් ලිවීමට යොමු කරන්න.
- කාඩ්පතේ අනෙක් පස සිසුවාගේ නම ලියන ලෙස උපදෙස් ලබා දෙන්න.
- සියලු කාඩ්පත් එකතු කර කුඩා පෙට්ටියකට දමන්න.
- පසු ව සිසුන් එළිමහනේ ඉඩකඩ සහිත ස්ථානයකට කැඳවාගෙන ගොස් රවුමක් ආකාරයට සිටගෙන සිටීමට සලස්වන්න.
- තමා කාඩ්පතේ සඳහන් කළ දේ රවුම ඉදිරියට විත් අනුකරණයක් ආශ්‍රයයෙන් ඉදිරිපත් කළ යුතු බව සිසුන්ට පවසන්න.
- පසුව ගුරුතුමිය විසින් පෙට්ටිය තුළින් එක් කාඩ්පතක් ගෙන එහි නම සඳහන් සිසුවා රවුම මැදට කැඳවා තමා කාඩ්පතේ සඳහන් කළ දේ අනුකරණය කර දක්වන ලෙස පවසන්න. (කාඩ්පතේ සඳහන් දේ අනෙක් සිසුන්ට නොපෙනෙන ලෙස තබා ගත යුතුයි.)
- අනතුරුව අනෙක් සිසුන් අදාළ සිසුවා ඉදිරිපත් කළ අනුකරණය කුමක් දැයි යන්න අනුමාන කළ යුතු වේ.
- ලබා දුන් පිළිතුරුවල නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා අවසානයේ දී කාඩ්පත ප්‍රදර්ශනය කරන්න.
- මේ ආකාරයට සැම සිසුවකුට ම අවස්ථාව ලැබෙන පරිදි ක්‍රියාකාරකම දිගටම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**


- නිවසේ පවිත්‍රතාව රැකගැනීම සඳහා උපකාරීවන දූවිලි පිස්නක් සකස් කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒමට සිසුන් යොමු කරන්න.
    * නොදිරූ පරණ සෙ.මී. 30 දිග, සෙ.මී. 20 පළල රෙදි කැබැල්ලක්,
    * සෙ.මී. 30ක් පමණ දිග කොසු මිටක් වැනි නිමාවකින් යුතු කෝටුවක්,
    * කෝඩ් නූලක් (මීටර් 2ක පමණ)
- රෙදි කැබැල්ලේ සෙ.මී. 5ක් පමණ ඉතිරි කර ඉතිරි කොටස සෙ.මී. 1 ප්‍රමාණයේ තීරු (රූපයේ දැක්වෙන පරිදි) කපාගන්න.



1 වන රූපය



3 වන රූපය




2 වන රූපය

- නොකැපූ කොටසේ ඉතා හොඳින් සුදුසු ගම් වර්ගයක් තවරාගන්න.
- ඉන් පසු කෝටුවේ අග හොඳින් අලවා ගන්න.
- පසු ව කෝඩ් නූල ගෙන බයින්ඩර් ගම් ගාමින් එක ළඟ ඔතා අලංකාර දූවිලි පිස්නාවක් සකස් කර ගන්න.

**ක්‍රියාකාරකම 6 : කට්ටි පැනීමේ ක්‍රීඩාව**

- සිසුන් එළිමහනේ සුදුසු ස්ථානයකට කැටුව යන්න.
- හය දෙනා බැගින් වන සේ සිසුන් කණ්ඩායම් කරන්න.
- රූප සටහනේ දැක්වෙන ආකාරයට රවුම් ඇඳගන්න. (සෑම රවුමක් අතර ම ඇති දුර ප්‍රමාණය සමාන විය යුතු වෙයි.)




- රවුමක එක් සිසුවකු බැගින් වන සේ එක් කණ්ඩායමක සිසුන් එම රවුම්වල සිටුවන්න.
- ගුරුතුමිය ලබා දෙන සංඥාවකට අනුව සිසුන් රවුම් අතර මාරු විය යුතු බව පැහැදිළි කරන්න.
- මෙසේ මාරු වීමේ දී මැද රවුමේ සිටින සිසුවා විසින් පිටත රවුමේ ස්ථානයක් හිමි කර ගැනීමට උත්සාහ කළ යුතු බව ද පවසන්න.
- තරගය ආරම්භ කිරීමෙන් පසු සියලු ම සිසුන් එහා මෙහා දුව පනිමින් තමන්ගේ ස්ථාන මාරු කරගත යුතු අතර, කිසිවකු තම ස්ථානය රැක ගනිමින් නිසොල්මන් ව නොසිටිය යුතු බව ද පැහැදිලි කරන්න.
- මෙහි දී පිටත රවුමේ, රවුමක් අහිමි වන සිසුවා නැවත මැද රවුමට පැමිණ තරගය නැවත ආරම්භ කළ යුතු යි.
- මේ අයුරින් සිසුන් සියලු දෙනාම මෙම ක්‍රීඩාවේ යෙදීමට අවස්ථාව සලසන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''හැමෝම වටිනවා'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 3. තේමාව : වත්තට එන සත්තු

**නිපුණතා** :
- අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.
- සතුන් ද පරිසරයේ ම කොටසක් සේ සලකා සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- අප අවට ඇති සතුන්ගේ චර්යා පිළිබඳ අවධානයෙන් යුතු ව චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- සතුන්ගේ විවිධ ලක්ෂණ හා හැසිරීම් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ත්ව වාසස්ථාන නිර්මාණ කරයි.

**ඉගෙනුම් පල** :
- අවට පරිසරයේ දකින සතුන් බාහිර ස්වරූපය අනුව සරල ව වෙන් කර දක්වයි.
- අවට පරිසරයේ ගැවසෙන සතුන් නිරීක්ෂණය කර, එම සතුන්ගේ චර්යාවන් වාර්තා කරයි.
- අවට පරිසරයේ ගැවසෙන සතුන් මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාර ඉදිරිපත් කරයි.
- සතුන් ද පරිසරයේ කොටසක් ලෙස සලකමින් සතුන්ගේ පැවැත්ම උදෙසා දායක වෙයි.
- සත්ත්ව චර්යා පාදක කරගත් නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදෙයි.
- සතුන්ගේ චර්යා සම්බන්ධ නිර්මාණාත්මක රංගනවල යෙදෙයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති හා චිත්‍ර නිර්මාණය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- අවට පරිසරයේ සිටින සතුන්ගේ දැකිය හැකි බාහිර ස්වරූප පිළිබඳ කියවෙන ගීතයක් හෝ කවියක් සිසුන් සමඟ ගායනා කරන්න.

*උදා :* *

දවල් තිස්සෙ පඳුරු අස්සෙ
හැංගෙන පොඩි හාවා
පාට දුඹුරු ඇස් වටකුරු
ලෝම තිබෙන හාවා

කට දෙපැත්තෙ කෙඳි බුරුත්ත
දිගට ඇඳුණු හාවා
ඊයේ රෑ බතල කන්න
අපෙ කොටුවට ආවා

*

හොට වකුටුයි රතු ම රතුයි
ගෙල වට මාලයක් පෙනෙයි
කොළ පිහාටු ඇඳුම හැඩයි
ගිරවාගේ පෙඳය දිගයි

පද රචනය - එස්. මහින්ද හිමි

- කවි, ගීතවලින් කියැවුණු සතුන්ගේ ශරීර ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ඇස්, පාද, ශරීරයේ වර්ණයේ ඇති විවිධත්වය පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- සිසුන් සමඟ ගායනා කළ ගීතයේ කියවුණු සතුන්ගේ ලක්ෂණ සහිත ව චිත්‍ර නිර්මාණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණ අගයන්න.

**ක්‍රියාකාරකම 2**

- අවට පරිසරයේ සිටින සතුන් නිරීක්ෂණය සඳහා චාරිකාවක් සැලසුම් කර ගන්න.
- චාරිකාවේ දී ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැස් කර ගන්න.
  *උදා :* අත්කාච හා වෙන යම් අවශ්‍ය උපකරණ
- සතුන් නිරීක්ෂණයේ දී සතුන්ගේ ශරීරයේ බාහිරින් දක්නට ලැබෙන විවිධ ලක්ෂණ අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කළ යුතු බව පෙන්වා දෙන්න.
- සතුන් නිරීක්ෂණයට යාමට පෙර පහත දැක්වෙන ආකාරයට සකස් කරගත් වගුවක් සැම සිසුවකුට ම ලබා දෙන්න.
- ඊට අනුකූල ව තොරතුරු සටහන් කිරීමට අවශ්‍ය උපදෙස් ද ලබා දෙන්න.

*උදා :*

| දුටු සතා | පාද ගණන | පිහාටු | | ලොම් | | පාට |
|---|---|---|---|---|---|---|
| | | ඇත | නැත | ඇත | නැත | |
| බල්ලා | 4 | | √ | √ | | දුඹුරු |
| කුඹියා | | | | | | |
| පරෙවියා | | | | | | |
| | | | | | | |
| | | | | | | |

- සතුන් නිරීක්ෂණය සඳහා රැස්කර ගත් උපකරණ අවශ්‍ය පරිදි යොදා ගැනීමට සිසුන් යොමු කරන්න.
- චාරිකාවෙන් අනතුරු ව සිසුන් විසින් නිරීක්ෂණය කරන ලද තොරතුරු පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම තොරතුරු ඇසුරින් සතුන් වර්ග කරන්න.
  *උදා :* * පාද සංඛ්‍යාව අනුව,
  * පියාපත් ඇති/නැති බව අනුව
  * ලොම් ඇති/නැති බව අනුව
- ලොකුම සතාගේ සිට කුඩාම සතා තෙක් සතුන් වෙන් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ අනුව සැම සතකු ම යම් යම් සුවිශේෂතා නිසා එකිනෙකාට වෙනස් වන බව ද එසේ එකිනෙකා වෙනස් වීම හේතුවෙන් අප අවට පරිසරය වඩාත් සුන්දර වන බව ද සාකච්ඡාවක් ඇසුරින් මතු කර දක්වන්න.

**ක්‍රියාකාරකම 3 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- නිරීක්ෂණය සඳහා කණ්ඩායමකට සතකුගේ නමක් බැගින් ලබා දෙන්න.
  *උදා :* දිමියා, කපුටා, කුඹියා, ලේනා, සමනලයා, . . . වැනි (මේ සඳහා අවට පරිසරයේ සුලභ ව ගැවසෙන සතුන් තෝරාගන්න.)
- පහත සඳහන් කරුණු ඔස්සේ එම සතුන්ගේ චර්යාවන් නිරීක්ෂණයට අවස්ථාව දෙන්න. (මෙහි දී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ව ද සැලකිලිමත් වන්න.)
  *උදා :* * තනි ව වාසය කරනවා ද ? රංචු වශයෙන් වාසය කරනවා ද ?
  * ගමන් කරන අයුරු
  * ශබ්ද කරන අයුරු හා ශබ්ද කරන අවස්ථා
  * ආහාර ගන්නා ආකාර කෙබඳු ද ? (*උදා :* ගවයා, ලේනා, . . . වැනි)

- සිසුන් රැස් කර ගන්නා මෙවැනි තොරතුරු පන්තියට වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් වාර්තා කරන කරුණු අනුව එක් එක් සතුන්ගේ චර්යා එම සතාගෙන් සතාට වෙනස් වන බව මතු කර දක්වමින් එම දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න. සතුන්ගේ චර්යා නිරූපණය කරන වීඩියෝ පට යොදා ගනිමින් සිසු අත්දැකීම් තහවුරු කරන්න.
- සතුන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතුව කටයුතු කළ යුතු බව මතු කර දැක්වෙන ආකාරයේ කතාබහක සිසුන් සමඟ නිරත වන්න.
- වීඩියෝ දර්ශන මඟින් තමා දුටු හෝ නිරීක්ෂණවල දී හමු වූ තමා කැමති සතුන් චිත්‍ර මගින් නිරූපණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු උත්සාහයන් අගය කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- සතුන්ගේ විවිධ චර්යා පිළිබඳ කියවෙන නිර්මාණය කරගත් කවි, ගී සිසුන් සමඟ ගායනා කරන්න.

  *උදා :* වැස්ස වහින බව කියන්න
  වැහි ළිහිණින් ඉගිළෙනවා
  උදේ පාන්දර වෙනකොට
  කුකුළු හාමි හඬලනවා

  නාඳුනනා අය ආවොත්
  බලු පැටියා මොර දෙනවා
  නපුරු සතකු හෙම දැක්කොත්
  කුකුළු පැටවු නද දෙනවා


- කවිවලින් කියවෙන සතුන්ගේ චර්යා පිළිබඳ ව සාකච්ඡා කරන්න. සතුන්ගේ එවැනි වෙනත් චර්යා පිළිබඳ ව ද සිසු අත්දැකීම් ඇසුරෙන් කථා කරන්න.
- පසුව එම චර්යා මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාර පිළිබඳ ව ද සිසුන් සමඟ කතා බහ කරන්න.

*උදා :*

| <u>සත්ව චර්යාව</u> | <u>ප්‍රයෝජනවත් වන ආකාරය</u> |
|---|---|
| * නාඳුනන පුද්ගලයකු පැමිණි විට බල්ලන් බිරීම | යම් සතෙකු/යම් අයෙක් නිවසට |
| * විසකුරු සර්පයකු පැමිණි විට ලේනුන්/ කුරුල්ලන් වැනි සතුන් කෑ ගැසීම | පැමිණි බව දැනුම් දීම |
| * හිරු උදාවීමත් සමඟ කුකුළා හැඬලීම | කාලය පිළිබඳ පණිවිඩ ලබා දීම |
| * වැස්සක් ළඟ එන විට වැහිළිහිණියන් පියාඹීම, මෙරුන් ඉගිළීම | කාලගුණයේ වෙනස්වීම් පිළිබඳ පණිවිඩ ලැබීම |

- පන්තියේ සිසුන් රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වන්න. පහත දැක්වෙන ආකාරයට සකස් කරගත් සතකුගේ රූපය සහිත කාඩ්පතක් සෑම සිසුවකුගේ ම ගෙල පලඳන්න. සතුන්ගේ රූප යෙදීමේ දී මිනිසාට ප්‍රයෝජනවත් වන චර්යා රටා සහිත සතුන් යොදාගන්න.

*උදා :*



- එක් එක් සත්ත්ව වර්ගයකට අයත් රූප හතරක්/පහක් සකසා ගන්න.
- ගුරුතුමිය රවුම මැද සිටගන්න. ගුරුතුමිය විසින් යම් සතකුගේ නමක් පැවසූ විට එම සතාගේ රූප පැලඳි සිසුන් රවුම මැදට පැමිණ එම සත්ත්වයාගේ චර්යා රටා අනුකරණය කර දක්වීමට සිසුන් යොමු කරන්න.

- අනතුරු ව ගුරුවරයා සිසුන් විසින් නම් කරන වෙනත් සතකුගේ රූප සහිත සිසුන් ඉදිරියට පැමිණ ඉහත අයුරින් එම සත්ත්වයාගේ චර්යා රටා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ අයුරින් සිසුන් සියලු දෙනාට ම අවස්ථාව ලැබෙන පරිදි ඉහත ක්‍රියාකාරකම සිදු කරන්න.
- සතුන්ට ද අපට මෙන් ම අවට පරිසරයේ නිදහසේ හැසිරීමට අවස්ථා සැලසීම අප විසින් පවත්වා ගත යුතු හොඳ පුරුද්දක් බව මෙම ක්‍රියාකාරකම ඇසුරින් මතු කර දක්වන්න.

**ක්‍රියාකාරකම 5 :**

- 'සතුන් නැති වුණොත් ලෝකය කොයි වගේ වෙයි ද ?' යන්න සිසුන්ගෙන් විමසන්න. සිසුන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. මෙම කතාබහේ දී පහත දැක්වෙන ආකාරයේ කරුණු මතු කර දක්වන්න.

  *උදා :* * පරිසරයේ සුන්දර බව නැති වී යාම.

  * ආහාර හිඟ වීම . . . වැනි
- නිවසේ හදා වඩා ගන්නා සතුන් පිළිබඳ ව ද පහත දක්වා ඇති ආකාරයේ කරුණු ඉදිරිපත් කරමින් සිසු අවධානය යොමු කරන්න.
  * එම සතුන් ද අප සමඟ ම ජීවත් වන කොටසක් බව
  * සමහර සතුන් අපට උදවු කරන බව
  * සුරතලයට ඇති කරන සතුන් නිසා අපට මානසික තෘප්තියක් අත්වන බව
  * ඔවුනට කලට වේලාවට ආහාර ලබා දිය යුතු බව
  * පිරිසිදු භාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
  * නියමිත පරිදි එන්නත් ලබා දිය යුතු බව
- අප මෙන් ම සතුන් ද නිදහසේ සිටීමට කැමැත්තක් දක්වන බව සිසුන්ට පැහැදිලි කරන්න. මේ සඳහා කතන්දර/සත්‍ය සිද්ධි, පින්තූර ආදිය උපයෝගී කරගන්න.


  *උදා :* ගස් කපා දැමීම නිසා කුරුලු කූඩුවලට හානි සිදුවී ඇති ආකාර දැක්වෙන ඡායාරූප, . . . වැනි
- මහා මාර්ගයේ හෝ පොදු ස්ථානවල හෝ සතුන් අතහැර දැමීම සුදුසු ක්‍රියාවක් නොවන බව ද මෙම සාකච්ඡාවේ දී අවධාරණය කරන්න.
- හදා වඩා ගන්නා සතුන්ට මෙන් ම අවට පරිසරයේ සිටින සතුන්ට ද හානියක් නොවන පරිදි අපගේ හැසිරීම් පවත්වා ගැනීමේ වැදගත්කම සිසුන්ට පෙන්වා දෙන්න.
- සිසු අදහස් ඇසුරින් අප මෙන් ම සතුන් ද පරිසරයේ වාසය කිරීමේ වැදගත්කම හා ඉන් පරිසරයේ සුන්දරත්වය පවත්වා ගත හැකි බව මතු කර දක්වන්න.
- කුරුල්ලන්ට කෑම දී තිබෙන ස්ථානයක කුරුල්ලන් කෑම කන අයුරු චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.


**ක්‍රියාකාරකම 6**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- අවට පරිසරයේ ගැවසෙන සතුන් තුන් දෙනෙකුගේ හෝ හතර දෙනෙකුගේ හෝ නම් තෝරා ගන්න. *උදා :* ගෙම්බා, වඳුරා, ලේනා
- අන් සිසුන්ට නෑසෙන සේ රහසින් සෑම සිසුවකුට ම සතෙකුගේ නමක් බැගින් ලබා දෙන්න. (තෝරාගත් සෑම සත්ව වර්ගයකගේ නම් සමානව සිසුන් අතර බෙදෙන පරිදි ලබා දිය යුතු ය.)
- තමන්ට ලැබුණු සතාගේ නම ඇති තවත් අය පන්තියේ සිටින බව ගුරුවරයා විසින් සිසුන්ට පවසන්න. තමාට ලැබුණු සතාගේ නම පැවසීමෙන් තොර ව එම සත්ත්වයාගේ චර්යා අනුකරණය කරමින් 'තම වර්ගයේ යහළුවන්' සොයා ගැනීමට සිසුන් යොමු කරන්න.
- සොයාගත් යහළුවන් සමඟ එකට වාඩි වන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- මේ අයුරින් සෑම සතෙකුගේ ම චර්යාවන් නිරූපණයට සියලු සිසුන්ට අවස්ථා සලසන්න.

**ක්‍රියාකාරකම 7 :**

- භාවිතයෙන් ඉවත ලන දෑ ඇතුළු පහසුවෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය එකතුවක් සපයා ගන්න.
  *උදා :* වර්ණවත් කඩදාසි, යෝගට් කෝප්ප, නූල් කැබලි, ලණු කැබලි, බොත්තම්, බෝතල් මූඩි, පොල්කටු ආදිය
- එම ද්‍රව්‍ය හා ක්ලේ/මැටි ආදි විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති සැකසීමට සිසුන් යොමු කරන්න.
- අභිමත ආකාරයකට ද්‍රව්‍ය යොදා ගනිමින් තමන් කැමති සත්ත්වයකුගේ ආකෘති නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ අතරින් වඩාත් සැහැල්ලු අමුද්‍රව්‍ය (කඩදාසි, නූල් වැනි) යොදා ගනිමින් නිර්මාණය කරගත් සත්ව ආකෘතියේ යටපැත්තට අල්පෙනෙත්තක්/කඩදාසි ඇමුණුම් කටුවක් (Paper cilp) සවි කර එම ආකෘතිය කඩදාසියක් මත තබන්න.
- කඩදාසියට යටින් කාන්දමක් චලනය කිරීම මඟින් සත්ත්ව ආකෘති චලනය කරමින් වින්දනයක් ලැබීමට සිසුන්ට අවස්ථා සලස්වන්න.
- මෙසේ චලනය වන්නේ ඇයි දැයි සිසු අදහස් විමසන්න.
- ඇල්පෙනෙත්ත වෙනුවට වෙනත් ආදේශක යොදා ගනිමින් අත්හදා බැලීම් සිදු කිරීමට සිසුන් යොමු කරන්න.




- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''කුඹින්ගෙ වැඩ'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

# 4. තේමාව : ජලය සමඟ සෙල්ලම්

**නිපුණතා** :
- ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ලෙස භාවිත කරයි.
- නීරෝග දිවි පැවැත්ම සඳහා ජලයේ වැදගත්කම අගයමින් නිසි පරිදි භාවිත කරයි.
- ජලයේ ස්වභාවය හා ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- ජලය විවිධ අයුරින් භාවිත කරමින් නිර්මාණ කරයි.
- ජලය උපයෝගී කර ගනිමින් නිර්මාණාත්මක චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ජලය තේමා කොට ගත් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**ඉගෙනුම් පල** :
- ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ව භාවිත කිරීමට කටයුතු කරයි.
- ජලය තැනකින් තැනකට ගෙන යා හැකි ක්‍රම අත්හදා බලයි.
- නිරෝගී දිවි පැවැත්මක් සඳහා පිරිසිදු ජලය දිනකට ප්‍රමාණවත් පරිදි පානය කරයි.
- දෛනික පවිත්‍රතාව නිසි පරිදි පවත්වා ගැනීම සඳහා ජලය භාවිතයට ගනියි.
- විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියා කරන අයුරු පරීක්ෂා කර බලයි.
- ජලයේ පා කර හැරිය හැකි දෑ නිර්මාණය කරයි.
- ජලය යොදා ගනිමින් නිර්මාණාත්මක සාමූහික ක්‍රීඩා කරයි.
- විවිධ නාද නිපදවීම සඳහා ජලය යොදාගත හැකි ආකාර අත්හදා බලා අත්දැකීම් ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- අප එදිනෙදා සිදු කරන බොහෝ කාර්යයන් සඳහා ජලය අවශ්‍ය වන ආකාර පිළිබඳ නිදහස් චිත්‍ර ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
  *උදා :* බීමට, ආහාර පිසීමට, නෑමට, රෙදි සේදීමට, වගා කිරීමට, ශාකවල වැඩීමට, . . . වැනි
- එසේ අඳින ලද චිත්‍ර ඇසුරෙන් ජලයේ ඇති වැදගත්කම අවධාරණය කරන්න.
- තමාගේ නිවසට ජලය ලබා ගන්නා ආකාර පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- අපට ජලය ලබා ගත හැකි වෙනත් ආකාර මොනවා දැයි යන්න ද සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව ඇල, දොළ, ගංගා, . . . ආදියෙන් අපට ජලය ලබාගත හැකි මුත් අපට එදිනෙදා භාවිතයට සුදුසු ජලය ඉතා සීමිත බව ද පෙන්වා දෙන්න.
- ජලය නොමැති වුවහොත් ඇති විය හැකි තත්ත්ව පිළිබඳ ව ද සිසුන් සමඟ කතා කරන්න.
  *උදා :* නියගය ඇති වීම, ගස්වැල් වියළී යාම, පොළොව ඉරි තැළීම, ජල උල්පත් සිඳී යාම, . . . වැනි
- එහෙයින් ජලය වටිනා සම්පතක් ලෙස සලකා එය රැකගත යුතු බවත් සිසුන්ට අවධාරණය කරන්න.
- මිනිසුන් විසින් සිදු කරනු ලබන විවිධ දේ නිසා ජලය අපවිත්‍ර වන බව ද, එසේ නොකිරීමට වගබලා ගැනීමට අප කුඩා කල සිට හුරු විය යුතු බව ද, එසේ ජලය ආරක්ෂා කිරීම අපේ වගකීමක් වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- බතල හෝ කංකුං, කුඩලු වැනි සමාන වර්ගයේ පැළැටි හෝ දෙකක් ගෙන ඉන් එකක් ජලය සහිත භාජනයකත්, අනෙක ජලය රහිත භාජනයකත් දමන්න.
- වරින් වර සිදුවන දේ නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- පැළැටිවලට සිදුවී ඇති දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව පැළැටි වැවීමට හා ඒවායේ මනා පැවැත්මට ජලය අත්‍යවශ්‍ය වන බව පෙන්වා දෙන්න.
- එසේම අපගේ ශරීර සෞඛ්‍යය මනා ව පවත්වා ගැනීමට ද ජලය ප්‍රමාණවත් ව පානය කළ යුතු බවත් මෙහි දී අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 2**

- ජලය හිඟ ප්‍රදේශවල මිනිසුන් ජලය ලබා ගැනීමට වෙහෙසෙන ආකාරය දක්වෙන චිත්‍ර/රූප/වීඩියෝ දර්ශන සපයා ගන්න.
- ඒවා යොදා ගනිමින් ජලය රැක ගැනීමේ වැදගත්කම සිසුන්ට පෙන්වා දෙන්න.
- ජලය වටිනා සම්පතක් වන හෙයින් එය රැක ගැනීමට අපට කළ හැකි දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * ජල බඳුන්වල ජලය අපිරිසිදු වීම වැළකෙන ආකාරයෙන් වසා තැබීම
  * සතුන් විසින් අපද්‍රව්‍ය හෙළම නිසා ළිං ජලය අපිරිසිදු වීම
  * ජලය ඇති ස්ථානවලට අපද්‍රව්‍ය හෙළීමෙන් වැළකීම, . . . වැනි
- අප විසින් යෙදෙන විවිධ චාරිකාවල දී ජලාශවලට හා ඒ ආසන්නයට කුණු කසළ නොදැමීමට වගබලා ගැනීම පිළිබඳ ව ද සිසුන්ට අවධාරණය කරන්න.
- ජලය බින්දුව, බින්දුව කාන්දු වන ස්ථානයක භාජනයක් තබන්න. නොඑසේ නම් ජල බින්දුවක් වැස්සෙන සේ කරාමය විවෘත කර තබන්න.
- එය මිනිත්තු 5ක්, 10ක්, 15ක් වැනි කාලසීමාවක් තුළ හා පැය කිහිපයකට පසු නිරීක්ෂණය කරවන්න.
- බින්දුව, බින්දුව ජලය කාන්දු වුවත් කාලය වැඩිවීමත් සමඟ කාන්දු වන ජල ප්‍රමාණය වැඩි බව මේ ක්‍රියාකාරකම ඇසුරින් සිසුන්ට පහදා දෙන්න.
- ඒ අනුව ජලය කාන්දු වන කරාමයක් දුටු ඕනෑ ම තැනක දී එය වසා දැමීම ඉතා හොඳ පුරුද්දක් බව ද මතු කර දක්වන්න.
- ජල කරාමයක් විවෘත කර ජලය ලබාගත් පසු එය හොඳින් වසා තැබීමටත්, අප එදිනෙදා සිදුකරන විවිධ කාර්යවල දී ජල කරාමය දිගට ම විවෘත ව පවත්වා නොගෙන අවශ්‍ය වේලාවට පමණක් විවෘත කිරීම කළ යුතු බව ද පැහැදිලි කරන්න.

  *උදා :* * අත් පිරිසිදු කිරීමේ දී,
  * මුහුණ සේදීමේ දී,
  * දත් මැදීමේ දී, . . . වැනි

**ක්‍රියාකාරකම 3**

- කෙසෙල් කඳකින් වෙන් කර ගන්නා කෙසෙල් පතුරු වැනි වතුර පහසුවෙන් ගලා යැවිය හැකි දෙයක් හෝ වැහි පීලි, ප්ලාස්ටික් බට හෝ වැනි දෙයකුත්, තරමක් ලොකු වතුර බඳුන් කිහිපයක් හා හිස් බඳුන් කිහිපයක් සපයා ගන්න.
- මෙම ද්‍රව්‍ය ද සමඟ සිසුන් ඉඩ ඇති ස්ථානයකට කැටුව යන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- එම කණ්ඩායම්වලට පීලි/බට වතුර හා හිස් බඳුන් ද ලබා දෙන්න.
- පීලිවලට වතුර දමා පීලි දිගේ ගලා එන ජලය හිස් බඳුනට රැස්කර ගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.
- පීලිවලට වතුර දැමූ විට සිදු වන දේ නිරීක්ෂණය කර වාර්තා කිරීමට සලස්වන්න.
- පීල්ලේ එක කෙළවරකින් මඳක් ඔසවා සිදුවන දේ නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- මේ අයුරින් ආනතීන් වෙනස් කරමින් සිදුවන දේ නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- උස් තැනක සිට පහත් තැනකට ජලය ගලා යන බව නිරීක්ෂණය කර ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පීල්ල තුළට යම් යම් ද්‍රව්‍ය (කඩදාසි ගුළි/රිජිෆෝම් කෑලි)වැනි දෑ දමා ජලය වත්කළ විට සිදුවන දේ නිරීක්ෂණයට යොමු කරන්න.

- එහි දී ජලය ගලා යන මඟ තිබෙන දේවලට සිදුවන දේ කෙරෙහි ද අවධානය යොමු කරන්න.
- මේ ආකාරයට ගලා යන ජල පහරකට විවිධ දේවල් දැමීම නිසා ජලයේ හැසිරීම වෙනස්වන ආකාර නිරීක්ෂණය කර වාර්තා කිරීමට ද සලස්වන්න.

**ක්‍රියාකාරකම 4 :**

- සුදු කඩදාසියකට පාට කළ ජල බින්දු දෙකක් එකිනෙකට ඈතින් දැමීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ඉන් එක් බිඳුවකට කටින් පිඹ විවිධ රටා නිර්මාණයට සිසුන් යොමු කරන්න.
  - * විසුරුණු ජලයට සිදු වූයේ කුමක් ද ?
  - * විසිරුණු නැති ජලයට කුමක් සිදු වේ ද ? යන්න සොයා බැලීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ජලය ගලායාම, පැතිරී යාම සහ සුළඟේ බලපෑම නිසා ජලය ඉවත් වීම ඉක්මන් වූ ආකාරය හා වේළීම ප්‍රමාද වීමට හේතු කතාබහ කරන්න.
- රෙදි කැබැල්ලක් විවිධ ආකාරයට භාවිත කරමින් කිසියම් තැනක රැඳුණු ජලය ඉවත් කිරීමට යොමු කරන්න. (රෙදි කැබැල්ලෙන් පිස දැමීම, වතුර පොඟවා ඉවතට මිරිකීම, ජලය විසිරුණු තැන රෙදි කැබැල්ල දිගහැර එලා ඇදගෙන යාම, . . . වැනි විවිධ ක්‍රම)
- සුළඟින් ජලය ඉවත් කිරීමේ ඍජු ක්‍රියාකාරකම් හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා අත්දැකීම් පිළිබඳ ව කතාබහ කරන්න.
  - * තෙත පා සටහන් පවන් සලා වේළා ගැනීම.
  - * තෙත සායම් චිත්‍රයක් ඉක්මනින් වේළා ගැනීමට පවනේ එහා මෙහා වැනීම
  - * ලේන්සුවක් සෝදා, පන්ති කාමරයේ එල්ලා තබා සුළඟේ වේළීම, . . . වැනි

**ක්‍රියාකාරකම 5 :**

- සුදුපාට රෙදි කැබැල්ලක් නැතහොත් ටිෂු කඩදාසියක් හා සමාන ප්‍රමාණයේ වීදුරු බඳුන් දෙකක් සපයා ගන්න.
- එක් බඳුනකට වර්ණවත් ජලය වත් කොට එයට රෙදි කැබැල්ලේ/ටිෂු කඩදාසියේ එක් කොනක් දමා, අනෙක් කොන ඊට සමීපයෙන් තැබූ වීදුරු බඳුනට ද දමන්න.
- සිදුවන දේ නිරීක්ෂණයට හා නිරීක්ෂණ වාර්තා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිදුවිය හැකි දේ පිළිබඳ අනුමාන ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තමා සිතූ දේ වී ඇත් ද, නැත් ද යන්න පිළිබඳ ව සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
- ඒ අනුව තැනකින් තැනකට ජලය ගෙන යාහැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.
- මේ සම්බන්ධ වෙනත් උපක්‍රම පිළිබඳ සොයා බැලීමට ද සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- ද්‍රව්‍ය ජලයේ දිය වීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන ආකාරයේ ද්‍රව්‍ය කීපයක් සපයා ගන්න.


  *උදා* : හුනු, නිල්, විවිධ තීන්ත වර්ග, පිටි, පොල් තෙල්, තේකොළ, භූමිතෙල්, සබන්, ---------
- විනිවිද පෙනෙන බඳුන් හෝ හිස් බෝතල් හෝ කිහිපයකට වතුර දමා ඉහත ද්‍රව්‍ය එක් එක් බඳුනට වෙන වෙන ම දමන්න.
- සිදු වන දේ නිරීක්ෂණය කර වාර්තා කිරීමට සිසුන්ට අවස්ථාව සලස්වන්න.
- බඳුන් මඳ වේලාවක් නිශ්චල ව තබා වරින් වර දකින දේ වාර්තා කිරීමට ද සිසුන් යොමු කරන්න. මේ ආකාරයට ම පැය කිහිපයකට පසු දකින දේ කුමක් දැයි වාර්තා කිරීමට ද සිසුනට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 7 :**

- ජලයේ දියවන දේ අපට ප්‍රයෝජනවත් වන අවස්ථා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  *උදා :* පිරිසිදු කිරීම් සඳහා, චිත්‍ර ඇඳීම සඳහා, බිත්ති වර්ණ ගැන්වීම සඳහා, . . .
- වර්ණ ජලබිඳු කඩදාසියක් මතට දමා පිඹීම මඟින් විවිධ රටා නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- චිත්‍ර වර්ණ කිරීම සඳහා විවිධ වර්ණ නිර්මාණය කර ගැනීමට යොමු කරන්න.
- පාට දෙකක් හෝ කිහිපයක් මිශ්‍ර කර, වෙනත් පාටක් සාදා ගැනීමට හැකිදැයි සොයා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  - * රතු + කළු → දුඹුරු
  - * කහ + නිල් → කොළ
  - * රතු + නිල් → දම්
  - * තද වර්ණ + සුදු → ළා වර්ණ
- නිර්මාණය කරගත් වර්ණ බිඳු කිහිපයක් දෙකට නැමූ කඩදාසියක නැමුම් දාරයට දමා නැවත දෙකට නැමීම මඟින් විවිධ නිර්මාණ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එසේ සිදු කළ නිර්මාණවලින් මතු වී ඇති රටා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  *උදා :* සමනළයා, ගසක්, මී මැස්සා, . . . වැනි
- එම නිර්මාණ පන්තියේ සුදුසු ස්ථානයක ප්‍රදර්ශනය කරන්න.

**ක්‍රියාකාරකම 8 :**

- අනුක්‍රමයෙන් අඩු වන හෝ වැඩි වන හෝ ලෙසට වතුර දමන ලද සමාන වීදුරු කිහිපයකට ලී කෝටුවකින් තට්ටු කරමින් එකිනෙකට වෙනස් නාද ඇති වීම සිසුන්ට ආදර්ශනය කර පෙන්වන්න.
- වීදුරුවල විවිධ ස්ථානවලට තට්ටු කරමින් (*උදා :* කට, බඳෙහි වතුර ඇති/නැති කොටස්, . . .) නාදය වෙනස් වන අයුරු හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.



- සිසුන් කණ්ඩායම් කරන්න.
- අනුක්‍රමයෙන් අඩු/වැඩි ජල ප්‍රමාණවලින් යුත් සමාන වීදුරු තුනක් හෝ වැඩි ගණනක් හෝ ගෙන ඒවායේ විවිධ ස්ථානවලට ලී කෝටුවකින් තට්ටු කර නැඟෙන ශබ්ද හා නාද නිරීක්ෂණයට යොමු කරන්න.
  - * ලී කෝටුවක් වෙනුවට වෙනත් දෙයකින් (ලෝහ හැන්දකින්, ප්ලාස්ටික් පටියකින්) තට්ටු කිරීමට සලස්වා වෙනස්කම් හඳුනා ගැනීමට සලස්වන්න.
  - * අඩු වේගයක සිට වැඩි වේගයකටත්, වැඩි වේගයක සිට අඩු වේගයකටත් තාලයට තට්ටු කිරීමට යොමු කරන්න.
- කණ්ඩායමක් ලෙස නිදහසේ වාදන ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වීදුරු වෙනුවට සමාන බෝතල් කිහිපයක් භාවිත කර, මෙම ක්‍රියාකාරකම නැවත කිරීමට සිසුන් යොමු කරන්න.
- කට කුඩා බෝතලයකට විවිධ මට්ටමින් ජලය පුරවා, කටට කිට්ටු කර පිඹීමෙන් විවිධ ශබ්ද නිර්මාණය කිරීමට යොමු කරන්න. ඒවා තාලයකට පිඹිමින් වින්දනයක් ලැබීමට සලස්වන්න.
- හැඩය, උස යනාදිය වෙනස් බෝතල්වලට විවිධ උසට ජලය පුරවා, පිඹීමට සිසුන්ට අවස්ථාව දෙන්න. එවිට නිකුත් වන නාදවල වෙනස්කම් හඳුනා ගැනීමට යොමු කරන්න.
- පැන් බටයක්/බීම බටයක් වැනි දෙයක් ගෙන වතුර භාජනයකට ඔබා, කටින් පිඹීමට සලස්වන්න. බුබුළු නැඟීම නිරීක්ෂණය කිරීමටත්, ඉන් නැඟෙන ශබ්දවලට සවන් දීමටත් යොමු කරන්න.


**ක්‍රියාකාරකම 9**

පහත සඳහන් ක්‍රීඩාවේ සිසුන් නිරතවීමට සලස්වන්න. මේ සඳහා,

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ජලය පිරවූ (එක ම ප්‍රමාණයේ) කට තරමක් විශාල බෝතලය බැගින් ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට කුඩා බේසමක්/භාජනයක් ද, පුනීලයක් හා කුඩා කෝප්පයක් ද ලබා දී බෝතලයේ ජලය එයට දැමීමට කියන්න.
- කණ්ඩායම් කරන ලද සිසුන් පේළි වශයෙන් සිටීමට සලස්වන්න.
- එක් එක් පේළියට ඉදිරියෙන් ජලය සහිත බේසමක්, කුඩා කෝප්පයක්, බෝතලය හා පුනීලය බැගින් තබන්න.
- වරකට එක් සිසුවකු බැගින් දුව විත් තමාගේ කණ්ඩායමට අදාළ ජල බේසමෙන් කුඩා කෝප්පයට ජලය ගෙන බෝතලය පිරවීමට යොමු කරන්න.
- මෙහි දී කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්ට අවස්ථාව ලබා දෙන්න.
- බේසමේ ඇති ජලයෙන් බෝතලය සම්පූර්ණයෙන් පිරවිය හැකි බැවින් ජලය අපතේ නොයන ආකාරයට ක්‍රීඩාවෙහි යෙදීමට උපදෙස් දෙන්න.
- බෝතලය වැඩි ම ජල මට්ටමකින් පිරවීමට හැකි වූ කණ්ඩායම් ජයග්‍රහණය කරන ලද කණ්ඩායම වේ.

**ක්‍රියාකාරකම 10**

- ජලයේ විවිධ දේ පා කර හරිමින් වින්දනයක් ලැබීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා කඩදාසියකින් කපාගත් පහත දැක්වෙන ආකාරයේ තරු කීපයක් හා ජල බඳුන් කිහිපයක් සපයා ගන්න.




- රූපයෙහි දක්වා ඇති ආකාරයට A, B, C, D, E, F යන කෙළවරවල් තරුවේ මැද ඇති G අක්ෂරයෙන් දක්වා ඇති කේන්ද්‍රය දක්වා නැවිය යුතු ය. පසුව එය ගුරුතුමිය ජල බඳුනට දැමීමට සූදානම් වන බව පවසන්න.
- ජල බඳුනට තරුව දැමීමට පෙර එයට ජල බඳුනේ දී කුමක් සිදුවේවි දැයි සිසුන්ගෙන් විමසන්න.
  *උදා* : පාවේවි ද?, ගිලේවි ද, දිග හැරේවි ද ?, දිග නොහැරේවි ද ?, . . . ආදි වශයෙන්
- තරුවේ නැමූ පෙති උඩු අතට සිටින ආකාරයට ජල බඳුනට දමා සිදු වන දේ නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- සිසු නිරීක්ෂණ වාර්තා කිරීමට යොමු කරන්න.
- පසු ව සිසු කණ්ඩායම්වලට ජල බඳුනක් හා තරු ලබා දී කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකමේ නියැළීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ අයුරින් විවිධ ප්‍රමාණයේ හා විවිධ ඝනකමින් යුතු කඩදාසි යොදා ගනිමින් මෙම ක්‍රියාකාරකම සිදුකර සිදුවන දේ නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 11**

- පාසලේ දිවා ආහාරයෙන් පසු (විවේක කාලයේ) හෝ වෙනත් සුදුසු අවස්ථාවක එකිනෙකාගේ ජල බෝතල්වල මට්ටම නිරීක්ෂණයට අවස්ථා සලස්වන්න. සමහර සිසුන් ජලය ප්‍රමාණවත් ව පානය කර ඇති අතර, සමහර අය අඩුවෙන් පානය කර ඇති බව ඒ ඇසුරෙන් පෙන්වා දෙන්න.
- අපගේ සෞඛ්‍යය යහපත් ව පවත්වා ගැනීම සඳහා දිනකට ප්‍රමාණවත් තරම් ජලය පානය කිරීමේ අවශ්‍යතාව සිසුන්ට පැහැදිලි කරන්න.
- එසේ නොවූ විට ඇතිවිය හැකි තත්ත්ව පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා :* * දහදිය දැඩි දුගඳකින් යුතු වීම
  
  * නිසි පරිදි මූත්‍රා පහ නොවීම නිසා ඇතිවිය හැකි රෝග
  
  * නිසි පරිදි මල පහ නොවීම නිසා ඇතිවිය හැකි රෝග, . . . වැනි
- ඒ අනුව දවස පුරා ජලය පානය කිරීම වැදගත් වන බව ද පෙන්වා දෙන්න.
- ජලය පානය කරන විට ඒ සඳහා මනා පිරිසිදු බවකින් යුතු ජලය භාවිත කළ යුතු බව ද මතුකර දක්වන්න.
- පානය සඳහා වඩාත් සුදුසු වන්නේ උණුකර නිවා පෙරාගත් ජලය බව මෙහි දී සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 12**

- සෑම සිසුවකුට ම සුදු පාට ටිෂූ කඩදාසි හෝ සුදු පාට රෙදි කැබැල්ල බැගින් හෝ සපයා ගන්න.
- පාසලේ විවේක කාලය අවසන් වී පන්තියට පැමිණි පසු එම රෙදි කැබැල්ල/ටිෂූ කැබැල්ල සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- එය භාවිත කර තම දෙඅත් හා වැලමිටෙන් පහළ කොටස හොඳින් පිස දමන ලෙස පවසන්න.
- ටිෂූ කඩදාසියට හෝ සුදු රෙදි කැබැල්ලට හෝ සිදු වී ඇති දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව දෙඅත්, වැලමිටෙන් පහළ කොටස් අපවිත්‍ර වී ඇති නිසා රෙදිකඩ/ටිෂූ කඩදාසිය දුර්වර්ණ වී ඇති බව පෙන්වා දෙන්න.
- සබන් යොදා හොඳින් අත් සේදිය යුතු ආකාරය සිසුන්ට ආදර්ශනය කර පෙන්වන්න.
- ඒ අනුව සිසුන්ට ද දෑත් සේදීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට අප එදිනෙදා සිදු කරනු ලබන බොහෝ ක්‍රියාකාරකම්වල දී අපගේ ශරීරය අපවිත්‍ර වන බවත් එහෙයින් අපගේ දෛනික පවිත්‍රතාව පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

## 5. තේමාව : අවුරුදු කාලය

**නිපුණතා** :
- අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම් ගවේෂණය කර වාර්තා කරයි.
- අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීමේ වැදගත්කම අගය කරමින් කටයුතු කරයි.
- අවුරුදු කාලයේ සිදු කරන කටයුතුවලින් සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව විමසිලිමත් වෙමින් ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.
- අවුරුදු සිරිය මතු වන විවිධ නිර්මාණවල යෙදෙමින් වින්දනය ලබයි.
- විවිධ ජන කොටස්වල අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ගරු කරයි.
- අවුරුදු උත්සව සමය හා සම්බන්ධ ක්‍රීඩාවල නිරත වෙමින් වින්දනයක් ලබයි.
- අවුරුදු කාලයට සුවිශේෂ වූ විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**ඉගෙනුම් පල** :
- අවුරුදු කාලය සඳහා ප්‍රදේශය අවට පිරිස් සූදානම් වන අයුරු විස්තර කරයි.
- අවුරුදු චාරිත්‍රවල නියැළීමෙන් තමන්ට හා සමාජයට සිදු වන ප්‍රයෝජන විස්තර කරයි.
- විවිධ ජන කොටස්වලට සුවිශේෂ වූ චාරිත්‍ර වාරිත්‍ර සිදු කරන අයුරු ප්‍රකාශ කරයි.
- අවුරුදු කාලයේ දී සිදුවන අනතුරුවලින් ආරක්ෂා වීමට කටයුතු කරයි.
- සිංහල දෙමළ අවුරුද්ද හා සම්බන්ධ ආහාර වර්ගවල ආකෘති නිර්මාණය කරයි.
- අවුරුදු කාලයට ම සුවිශේෂ වූ ජන ක්‍රීඩාවල යෙදෙයි.
- අවුරුදු කාලයට සුවිශේෂ වූ ජන ගී, ජන කවි, රබන් පද ගායනය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- අවුරුදු කාලයේ දී වටපිටාවේ ගස් වැල්වල සිදු වන වෙනස්කම් නිරීක්ෂණය සඳහා සිසුන් යොමු කරන්න.
- මේ සඳහා දරුවන් එළිමහනේ ගවේෂණාත්මක චාරිකාවක් සඳහා රැගෙන යන්න.
- කොහා නාද කිරීම, එරබදු මල් පිපී තිබීම, අඹ, රඹුටන්, ජම්බු ආදී පලවලින් ගස්වැල් පලබර වීම, ගස්වැල්වල කොළ හැලී අලුත් දළු කොළවලින් සැරසී තිබීම ආදී කරුණු පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරමින් අවට පරිසරයේ සුන්දරත්වය අත්විඳීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අවුරුදු සමයේ දී පරිසරයේ දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ ව කියවෙන පහත දැක්වෙන ආකාරයේ කවි, ගී සොයා ගන්න. නොඑසේ නම් ඒවා නිර්මාණය කරගෙන සිසුන් සමඟ ගායනා කරන්න.

  *උදා :* * එරබදු මල් පොකුරු පොකුරු රතට පිපෙනවා
  අඹ දඹ කජු වැළ වරකා පල බර වෙනවා
  කොහෝ කොහෝ කොහා ඇවිත් නාද කරනවා
  අලුත් දළුවලින් ගස්වැල් ඇඳුම් අඳිනවා
  ගස් ලස්සණ වෙනවා

- අවුරුදු සමයේ දී පරිසරයේ මෙන් ම මිනිසුන්ගේ දක්නට ලැබෙන හැසිරීම්වල වෙනස්කම් පිළිබඳ ව ද සිසුන් සමඟ කතාබහ කරන්න.

- අවුරුදු සමයේ ගෙදරදොර සිදුවන සිදුවීම් අළලා අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථා සලසන්න. පහත කරුණු මතු වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.

  *උදා :* * නිවෙස් පිරිසිදු කිරීම, අලුත්වැඩියා කිරීම, අලංකාර කිරීම
  * අලුතින් ගෘහ භාණ්ඩ මිල දී ගැනීම
  * ආහාර රැස් කිරීම
  * රස කැවිලි පිසීම
  * අලුත් ඇඳුම් මැසීම
  * පිට පළාත්වල රැකියාවල යෙදෙන අය අවුරුදු සැමරීම සඳහා නිවසට පැමිණීම
  * ඥාතීන් නිවසට පැමිණීම හා ඥාති සබඳතා අලුත් වීම

- අවුරුදු කාලයේ පරිසරයේ සුන්දරත්වය/පරිසරය අලුත් අවුරුද්දට සූදානම් වන ආකාරය පිළිබඳ ව නිදහස් චිත්‍ර ඇඳීමට සිසුන් යොමු කරන්න.
- සිසු නිර්මාණ අගයන්න.

**ක්‍රියාකාරකම 2 :**

- අවුරුදු උත්සවය හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ තොරතුරු සොයාගෙන එන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් රැගෙන ආ තොරතුරු ද යොදා ගනිමින් අවුරුදු චාරිත්‍ර විධි සිදු කරන ආකාර පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- මේ සඳහා සුදුසු වැඩිහිටියකු පාසලට කැඳවා අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර හා සිංහල අවුරුද්දේ වැදගත්කම පිළිබඳ ව පහත දැක්වෙන කරුණු ද මතු කර දක්වමින් සිසුන් සමඟ කතාබහ කරන්න.
  * අලුත් ඇඳුම් ඇඳීම
  * පුණ්‍ය කාලයේ ආගමික සිරිත් විරිත්
  * ලිපි ගිනි මෙළැවීම.
  * ගනුදෙනු කිරීම හා වැඩ ඇල්ලීම
  * ආහාර අනුභවය
  * වැඩිහිටියන්ට බුලත් දී වැඳීම.
  * හිස තෙල් ගෑම
  * විශේෂ අවුරුදු කෑම බීම
  * නැගම් යෑම
- මෙවැනි චාරිත්‍රවාරිත්‍රවල නියැළීමෙන් තමාට මෙන් ම සමාජයට අත්වන ප්‍රයෝජන පිළිබඳව ද සිසුන්ට අවධාරණය වන ආකාරයෙන් පහත කරුණු ද මතු කර දක්වමින් මෙම කතාබහ තවදුරටත් සිදු කරන්න.

  *උදා :* එකමුතු ව ජීවත් වීම, බෙදාහදා ගැනීමේ පුරුදු , වැඩිහිටියන්ට ගරු කිරීමේ පුරුදු, වේලාවට වැඩ කිරීමේ පුරුදු, ඉවසීමට හුරු වීම.
- මෙවැනි ගුණාංග කුමන අවුරුදු චාරිත්‍රවලින් ඉටු කරගත හැකි ද යන්න පිළිබඳ ව මතු කර දක්වන්න.
- කතාබහ අවසානයේ දී සිංහල අවුරුද්ද ඉතා වැදගත් ජාතික උත්සවයක් බව සිසුන්ට අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- දෙමාපිය සහය ද ඇති ව සෙල්ලම් ගෙවල් කිහිපයක් සකස් කර ඒවා අවුරුදු සිරිය ඉස්මතු වන ආකාරයෙන් සූදානම් කරගන්න.
- මෙම ගෙවල් අතරින් එක් ගෙයක් හෝ දමිළ සංස්කෘතිය නියෝජනය වන ආකාරයෙන් සූදානම් කරගන්න.
- සෙල්ලම් ගෙවල්වලට පන්තියේ සිටින සිසුන් වෙන් කර සිංහල දමිළ අවුරුදු උත්සවයක් පවත්වන්න.

- සිංහල හා දමිළ සංස්කෘතික චාරිත්‍ර මතු කර දැක්වෙන අයුරින් මෙම උත්සවය පවත්වන්න.
- ඒ සඳහා අවුරුදු චාරිත්‍ර සහිත නැකැත් පත්‍රයක් ද සාදා ගන්න.
- චාරිත්‍ර සිදුකිරීමෙන් අනතුරු ව අවුරුදු උත්සවය යනු සිංහල ජනතාව පමණක් නොව දමිළ ජනතාව විසින් ද සමරන උත්සවයක් බව ද ඔවුන් එම චාරිත්‍ර වාරිත්‍ර සිදු කරන ආකාරයේ සුවිශේෂතා පිළිබඳ ව ද සිසුන් සමඟ කතාබහ කරන්න.

**ක්‍රියාකාරකම 4**

- උත්සවය වඩාත් සෞන්දර්යාත්මක ව කරගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- අවුරුදු කාලයට කියවෙන ජන කවි, රබන් පද කිහිපයක් රැස් කරගන්න.
- ඒවා සිසුන් සමඟ ගායනා කරන්න.
- දෙමාපියන්ගේ සහය ඇති ව රබානක් සූදානම් කර ගන්න.
- සරල රබන් පද වාදනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

*උදා* : * පුංචි කිකිළි දත් මැදගෙන
දිසි දෙකට බත් අරගෙන . . .

* ලන්දේ ගෙදර බංකු කකුල
මන් යනකොට මේස කකුල

* රන් රඹුටන් ගස් දෙකයි
වළිකුකුළන් පස් දෙනයි . . .

* තාක්ක දොං දොං
තාක්ක දොං දොං
තේක්ක මල් පිපිලා . . .

- මෙවැනි වෙනත් රබන් පද වාදනයට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 5 :**

- අවුරුදු සමයේ සිදු වන අනතුරු පිළිබඳ පින්තූර/වීඩියෝ දර්ශන/පුවත් පත් තොරතුරු රැස් කර ගන්න.
- ඒ අනුව අවුරුදු සමයේ අනතුරු සිදුවිය හැකි අවස්ථා හා ආකාර, අනතුරු නිසා සිදුවිය හැකි හානි පිළිබඳ ව සිසුන්ට පෙන්වා දෙන්න.
- ආරක්ෂාකාරී ව කටයුතු කළ යුතු ආකාර පිළිබඳ පහත අවස්ථා මතු කර දක්වමින් සිසුන්ට පැහැදිලි කර දෙන්න.
  * රතිඤ්ඤා, නිලා, අහස් කුරු වැනි ද දැල්වීමේ දී අනතුරු සිදුවිය හැකි ආකාර
  * ජන ක්‍රීඩා සිදු කිරීමේ දී අනතුරු සිදුවිය හැකි ආකාර
  * කැවිලි පිසීමේ දී අනතුරු සිදුවිය හැකි ආකාර . . .
- මෙවැනි අනතුරු නිසා ශාරීරික හානි ජීවිත හානි, දේපළ හානි විය හැකි බව පැහැදිලි කරන්න. එසේ ම අනතුරුවලින් වැළකෙමින් කටයුතු කළ යුතු බව ද පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 6**

- අවුරුදු කාලයේ දී සිදු කරනු ලබන ජන ක්‍රීඩා කිහිපයක් පිළිබඳ තොරතුරු රැස් කරගෙන ඒමට සිසුන් යොමු කරන්න.

  *උදා :* * කඹ ඇදීම
  
  * එළුවන් කෑම
  
  * ලිස්සන ගසේ යාම

- රැස් කරගෙන ආ ජන ක්‍රීඩා අතරින් සුදුසු ජන ක්‍රීඩා කිහිපයක් සිසුන් යොදා ගනිමින් සිදු කරන්න.
- ජන ක්‍රීඩා අතරින් එළුවන් කෑමේ ක්‍රීඩාවේ දී ගායනා කරනු ලබන කවි ගායනා කරමින් එම ක්‍රීඩාව සිදු කිරීම සඳහා සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- පදම් කළ මැටි/කිරි මැටි වැනි අමුද්‍රව්‍ය පන්ති කාමරයට සපයා ගන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සිංහල දමිළ අවුරුද්ද හා සම්බන්ධ ආහාර වර්ගවල ආකෘති නිර්මාණය සඳහා සපයා ගත් අමු ද්‍රව්‍ය සිසු කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- නිර්මාණය කරගත් ආකෘති හොඳින් වියළා ගන්න.
- වියළා ගත් ආකෘති වර්ණ ගන්වන්න.
- නිර්මාණය කරගත් විවිධ ආහාර වර්ග යොදා ගනිමින් අවුරුදු මේසයක් සැකසීම සඳහා සිසුන් යොමු කරන්න.
- සිසු නිර්මාණ අගයන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''ඉත්තෑ මඟුල් ගෙදර'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 6. තේමාව : අපට පෙනෙන අහස

**නිපුණතා** :
- අහස හා අවට පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.
- හිරු එළියෙන්, සුළඟින්, වර්ෂාවෙන් සිදුවන බලපෑම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහස හා පාරිසරික වෙනස්කම් විදහා දැක්වෙන නිර්මාණ කරයි
- අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.
- අහසේ සුන්දරත්වය ප්‍රකාශනාත්මක මාධ්‍ය ඇසුරෙන් ඉදිරිපත් කර වින්දනයක් ලබයි.

**ඉගෙනුම් පල** :
- දවසේ විවිධ අවස්ථාවල දී අහසේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි.
- අධික හිරු රැසින් ශරීරයට සිදුවන හානිවලින් ශරීරය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.
- හිරු එළියෙන් සිදුවන බලපෑම් පිළිබඳ අත්දැකීම් විස්තර කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් ආකාශ වස්තු නිර්මාණය කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් ඇස්වල ආරක්ෂාව සඳහා යොදා ගත හැකි නිර්මාණවල නියැළෙයි.
- සමබරතාව රැක ගනිමින් සිරස් හා තිරස් අවකාශය භාවිත කර සුළු ක්‍රීඩාවල නියැළෙයි.
- අහසේ සුන්දරත්වය පිළිබඳ කියවෙන සරල කවි, ගී ප්‍රකාශනාත්මක චලන සහිත ව ගායනා කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- දවසේ විවිධ අවස්ථාවල දී අහසේ දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ සොයා බැලීම සඳහා හොඳින් අහස නිරීක්ෂණය කළ හැකි ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- සිසුන්ට අහස නිරීක්ෂණයට අවස්ථාව ලබා දී දක්නට ලැබෙන දේ කුමක් දැයි යන්න පිළිබඳ ව සරල සාකච්ඡාවක යෙදෙන්න.
- පසු ව පහත සඳහන් දේ පිළිබඳ නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.

  වලාකුළුවල ස්වභාවය - හැඩය සමාන ද ? වෙනස් ද ?
  ඒවායේ වර්ණයේ වෙනසක් ඇත් ද ?
  සැම වලාකුළක් ම එක ම වේගයෙන් ගමන් කරනවා ද ? . . . වැනි

  අහසේ ස්වභාවය - අහස පැහැදිළි ව දක්නට ලැබේ ද ?
  පැහැදිලි නොමැති නම් ඒ ඇයි ?
  අහස පැහැදිළි වූ අවස්ථාවල දී පැහැය කෙබඳු ද ?
  සැම ස්ථානයක ම අහසේ පැහැය සමාන ද ?

- දවසේ අවස්ථා කිහිපයක දී ඉහත කරුණු පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරමින් අහස නිරීක්ෂණයට සලස්වා සිදුවන වෙනස්කම් පිළිබඳ ව සොයා බැලීම සඳහා ඔවුන් යොමු කරන්න.
- මේ අයුරින් අධික වැසි සහිත දිනයක සාමාන්‍ය වැස්සක් පවතින දිනයක අහසේ ස්වභාවය සොයා බැලීම සඳහා ද සිසුන් යොමු කරන්න.
- එම නිරීක්ෂණ ඇසුරින් දවසේ විවිධ අවස්ථාවල දී අහසේ දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ

සාකච්ඡාවක් මෙහෙයවන්න.

- එහිදී සිසු නිරීක්ෂණ ඇසුරෙන් ලත් අත්දැකීම් වාර්තා කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- අහසේ වෙනස්කම් පිළිබඳ සිසු අත්දැකීම් චිත්‍රයට නැඟීමට යොමු කරන්න.
- අහස පිළිබඳ කියවෙන ගීත කිහිපයක් සපයා ගෙන ඒවා ගායනයට හා ඊට අනුව ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- අධික හිරු රැසින් ශරීරයට සිදුවන හානි පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- හිරු රැස් දැඩි ව පවතින අවස්ථාවක එළිමහනේ සිටින විට දැඩි හිරු රැස් නිසා ශරීරයට දැනෙන අපහසුතා පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා :* දහඩිය දැමීම, පිපාසය, ක්ලාන්තය, අප්‍රාණික බව, වෙහෙස, ඇස්වලට අපහසුතාවක් දැනීම, හිසට අපහසුතාවක් දැනීම, . . . වැනි

- හිරු රැසින් අපට සිදු විය හැකි හානි පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.
- දිගු කාලයක් ශරීරයට දැඩි අවු රශ්මිය වැටීම හේතුවෙන් ශරීරයේ විවිධ රෝගාබාධ පවා ඇති විය හැකි බව පැහැදිලි කරන්න.

  *උදා :* ඇස්වල රෝග, සමේ රෝග, සම අවපැහැ ගැන්වීම

- මේ ආකාරයට ඇති විය හැකි ඇස් රෝග හේතුවෙන් ඇසේ පෙනීමට හානි විය හැකි බව ද පෙන්වා දෙන්න.
- මේවායින් ආරක්ෂා වීමට කටයුතු කළ යුතු අයුරු පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * අස් ආරක්ෂා කර ගැනීමට අවු කණ්ණාඩි පැලැඳීම
  * ශරීරය හොඳින් ආවරණය වන පරිදි ඇඳුම් ඇඳීම
  * හිස් වැසුම් පැලැඳීම
  * කුඩ භාවිත කිරීම

- හිරු එළිය නිසා ශරීරයට සිදුවිය හැකි ඉහත සඳහන් කළ හානි පිළිබඳ ව දැනුම්වත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමේ සිසුන් යොදවන්න.
- හිරු රැස් නිසා ශරීරයට සිදුවන හානිවල රූප හා ඒවා ලියන ලද කාඩ්පත් ද ඒවායින් ශරීරය ආරක්ෂා කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව අඳින ලද රූප හා ඒවා ලියන ලද කාඩ්පත් ද සකස් කර ගන්න.
- ඩිමයි කොළයක හිරුගේ රූපයක් අලවා 'හිරු රැසින් ශරීරයට සිදුවන හානි' හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් කාඩ්පත් පෙළ ගස්වා සිසු අත්දැකීම් තව දුරටත් තහවුරු කිරීමට අවස්ථාව ලබා දෙන්න.



| හිරු රැසින් ශරීරයට සිදු වන හානි | හිරු රැස්වලින් ආරක්ෂා වීමට ගත හැකි ක්‍රියා මාර්ග |
|---|---|
| * හම අවපැහැ ගැන්වීම | * ශරීරය වැසෙන ඇඳුම් ඇඳීම |
| * ක්ලාන්තය | * කුඩ භාවිතය |
| * ඇස්වලට අපහසුතාවක් දැනීම | * තොප්පි භාවිතය |
| ශාරීරික වෙහෙස | * අවු කණ්ණාඩි භාවිතය |

- ඒ අනුව හිරු රැස්වලින් නිරන්තර ව ශරීරය ආරක්ෂා කර ගැනීම සිදු විය යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 3**

- පන්තියේ සිසුන් එළිමහනේ ඉඩ ඇති ස්ථානයකට කැටුව යන්න.
- රූප සටහනේ සඳහන් පරිදි රේඛා පහක් සලකුණු කර ගන්න.
- දී ඇති රූපයට අනුකූල ව රේඛා අතර අවශ්‍ය ඉඩ ප්‍රමාණය තබන්න.

4 රේඛාව

3 රේඛාව

2 රේඛාව

1 රේඛාව

ආරම්භක රේඛාව

- සිසුන් ආරම්භක රේඛාවේ රඳවන්න.
- ගුරුවරියකගේ සංඥාවකට අනුව සිසුන් ආරම්භක රේඛාවේ සිට පළමු රේඛාව තෙක් දිව යා යුතු ය.
- පළමු රේඛාවට පැමිණි සිටින සිසුන් දෙවන රේඛාව තෙක් ගමන් කළ යුත්තේ ඉහළට ඉපිලෙමින් හා බිමට පතිත වෙමිනි ( පැන පැන යාම)
- අනතුරු ව දෙවන රේඛාව තෙක් පැමිණි සිසුන් තෙවන රේඛාව තෙක් යා යුත්තේ තනි පාදයෙන් පනිමිනි.
- තුන් වන රේඛාවේ සිට ජයග්‍රාහී රේඛාවට යා යුත්තේ වේගයෙන් ඇවිදිමිනි.
- පන්තියේ සිසු සංඛ්‍යාව අනුව ක්‍රියාකාරකම සිසුන් කණ්ඩායම් වශයෙන් වුව ද සංවිධානය කළ හැකි ය. සෑම සිසුවකු ම සහභාගි වන ලෙස ක්‍රියාකාරකම සැලසුම් කර ගන්න.


**ක්‍රියාකාරකම 4**

- හිරු එළියෙන් පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ සොයා බැලීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවීමට අවශ්‍ය දෑ සපයා ගන්න.
- පහත සඳහන් ද්‍රව්‍ය රැස් කරගන්න.
  - * සුදු පාට නොවන වර්ණයක් සහිත පීරිසියකට දැමූ ලුණු වතුර ස්වල්පයක්,
  - * පෙති කපා ගත් කරවිල,
  - * බිලිං
  - * තෙත ලේන්සුවක්
  - * වතුර මිශ්‍ර කර අනා තැටියකට දමා තලාගත් මැටි ටිකක්
- සිසුන් කණ්ඩායම් කර මෙම ද්‍රව්‍ය අතරින් එකක් හෝ කිහිපයක් හෝ බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- එම ද්‍රව්‍ය අව්වේ තබා සිදු වන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- සිසු නිරීක්ෂණ කණ්ඩායම් වශයෙන් වාර්තා කිරීමට සලස්වන්න.

  *උදා* : * ඒ අනුව මැටිවල ජලය සිඳී ගොස් ඇති බව
  - * පස් තට්ටුව පුපුරා ගොස් ඇති බව
  - * බිලිං/කරවිල වැනි දේ වේළී තෙතමනය සිඳී ගොස් ඇති බව
  - * ලේන්සුවේ ජලය ඉවත් වී ගොස් ඇති බව
  - * ලුණු ද්‍රාවණයේ ජලය ඉවත් වී ලුණු මිදී ඇති බව වැනි නිරීක්ෂණ මතු කර දක්වන්න.
- මේවා සිදු වූයේ කුමන හේතුවෙන් දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව හිරු එළියේ බලපෑම හේතුවෙන් මෙම වෙනස්කම් සිදු වී ඇති බව පෙන්වා දෙන්න.
- මේ ආකාරයට දැඩි වියළි කාළගුණයක් සහිත කාලවල දී ළිං වලට, මාළුන් සහිත දිය කඩිතිවලට, ජල උල්පත්වලට, වැව්වලට, ගස්කොළන්වලට සිදුවන දේ අනුමාන කිරීමට සලස්වන්න.
- සතුන් සහිත දිය කඩිත්තකට එසේ වීමෙන් අහිංසක සතුන් මිය යන බවත් එවැනි සතුන් බේරා ගැනීම යහපත් දරුවකුගේ ගුණාංගයක් බවත් පෙන්වා දෙන්න
- ඒ අනුව දැඩි හිරු රශ්මිය සතුන්ට හා පරිසරයට අහිතකර බව අවබෝධ වීමට සලස්වන්න.
- එහෙයින් නිවසේ ඇති කරන සතුන්ට පවා සෙවන සහිත ස්ථාන සලසා දීම අප විසින් කළ යුතු බව ද සිසුන්ට අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 5**

- හිරු එළියෙන් ඇස් ආරක්ෂා කරගැනීම සඳහා අවු කණ්ණාඩි යුගලයක් නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා තරමක ගනකමින් යුතු කාඩ්බෝඩ්, ඉලාස්ටික් නූල් සහ විනිවිද පෙනෙන වර්ණ කඩදාසි සපයා ගන්න. (සෙලෝපීන් කඩදාසි)
- ගුරුතුමිය විසින් දෙනු ලබන ආකෘතියකට අනුව කණ්ණාඩියේ පිටත රවුම සකස් කර ගැනීමට සිසුන් යොමු කරන්න.



- පසු ව සිසුන්ට රිසි පරිදි කණ්ණාඩියට වර්ණ කඩදාසි අලවා සකස් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කණ්ණාඩි යුවළ නොවැටී රඳවා ගැනීම සඳහා අවශ්‍ය නම් ඉලාස්ටික් නූල් යොදා ගන්න.
- සකස් කර ගත් කණ්ණාඩි පැලැඳ වින්දනයක් ලැබීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 6**

- පදම් කළ මැටි, වර්ණ ගැන්වූ වැලි (කහ, තැඹිලි, රතු) සපයා ගන්න.
- පදම් කළ මැටි යොදා ගෙන ඉර, හඳ, තරු යන ආකාශ වස්තු නිර්මාණය කර ගන්න.
- ඒවා සුදුසු වර්ණ යොදා වර්ණ ගන්වන්න.
- එම වර්ණම යොදා ගනිමින් වර්ණ ගැන්වූ වැලි ඒ මත තවරා මඳ පවනේ වේළා ගන්න.
- එම ආකාශ වස්තූන් යොදා ගනිමින් අහසක ආකෘතියක් නිර්මාණය කරන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''වළාකුලේ හපන්කම්'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 7. තේමාව : අප කන බොන දේ

**නිපුණතා** :
- ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනාගනිමින් පරිභෝජනය කරයි.
- නීරෝග පැවැත්ම සඳහා නිවැරදි සෞඛ්‍ය පුරුදු පවත්වා ගනියි.
- ආහාර අපිරිසිදු වන අයුරු හඳුනා ගෙන ඒවායින් ආහාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.
- විවිධ මාධ්‍ය භාවිතයෙන් ආහාර හා සම්බන්ධ නිර්මාණවල යෙදෙයි.
- ශක්ති වර්ධනයට උපකාරී වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ආහාර ගැනීමේ දී පවත්වා ගත යුතු නිවැරදි පිළිවෙත් ප්‍රදර්ශනය වන නිර්මාණාත්මක රංගනවල යෙදේ.

**ඉගෙනුම් පල** :
- එදිනෙදා තම ආහාර වේල සඳහා ගන්නා පළා වර්ග රුචියෙන් පරිභෝජනය කරයි.
- පලතුරු සලාදයක් සකස් කිරීමට දායක වෙයි.
- එදිනෙදා පරිභෝජනය සඳහා පෝෂ්‍යදායී ආහාර එක් කර ගැනීමට ක්‍රියා කරයි.
- රෝගවලින් ආරක්ෂා වීම සඳහා යහපත් ආහාර පුරුදු පවත්වා ගනියි.
- ආහාර නාස්තිය වළක්වා ගැනීමට දායක වෙයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් ආහාර වර්ගවල ආකෘති නිර්මාණය කරයි.
- ශරීර ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වන චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ආහාර ගැන කියවෙන රබන් පද වාදනය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පළා වර්ග කීපයක් පන්ති කාමරයට සපයා ගන්න.
- ඒවායේ නම් වෙන් වෙන් ව ලියූ කාඩ්පත් කිහිපයක් සකසා ගන්න.
- පලා වර්ග වෙන් වෙන් ව බඳුන් කිහිපයකට දමන්න.
- මෙම බඳුන් සිසුන්ට හොඳින් ප්‍රදර්ශනය වන ආකාරයට තබන්න.
- පළා කොළ වර්ගවල නම් සහිත කාඩ්පත් අදාළ බඳුන ඉදිරියෙන් තබන්න.
- පසු ව පහත දැක්වෙන ආකාරයේ නිර්මාණය කරගත් කවි, සිසුන් සමග ගායනා කරන්න.

  කංකුං ගොටුකොළ කතුරු මුරුංගා
  සාරණ තම්පළා කොහිල ගෙනාවා
  නිවිති හීන් ගෙඳ සහ කොළ ගෝවා
  කීර පළා කොළ අරගෙන ආවා

- එම පළා වර්ගවල කොළ සහ කඳ හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න.
- පියෙවි ඇසින් මෙන් ම අත් කාච භාවිත කරමින් ද ඒවා නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- පෝච්චිවල ප්‍රදර්ශනය කර ඇති පළා වර්ග මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- නිරීක්ෂණයේ දී හඳුනාගත් පළා වර්ගවල දක්නට ලැබුණු මූලික වෙනස්කම් සාකච්ඡා කරන්න.
  *උදා :* පත්‍රවල, කඳේ ස්වභාවය ආදිය
- මෙවැනි පෝෂ්‍යදායී ආහාර වර්ග ආහාරයට නොගැනීම නිසා සිදුවන පෝෂණ ඌණතාවන් දැක්වීමට සුදුසු රූප සටහන්, චිත්‍ර, වීඩියෝ දර්ශන සපයා ගන්න.

- ඒවා භාවිත කරමින් පළා වර්ග ආහාරයට ගැනීම නිසා ඇතිවිය හැකි වාසිදායක තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කරන්න.

  *උදා :* * ඇස් පෙනීමට
  * සම පැහැපත් වීමට
  * නීරෝග හිසකෙස් ලැබීමට
  * මතක ශක්තිය වර්ධනය වීමට
  * ශරීරයට අත්‍යවශ්‍ය වෙනත් විටමින් වර්ග ලබා ගැනීමට

- මේ අනුව දිනපතා ගන්නා ආහාර වේල් සඳහා පළා වර්ග ආහාරයට ගැනීමේ අවශ්‍යතාව මතු කර දක්වන්න.

**ක්‍රියාකාරකම 2 :**

- පළා වට්ටියක් නිර්මාණශීලී ව සකස් කිරීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර සෑම කණ්ඩායමකට ම බ්‍රිස්ල් බෝඩ් එකක් බැගින් ලබා දෙන්න.
- සපයා ගත් පළා වර්ග සෑම එකකින් ම දඬු කිහිපය බැගින් සෑම කණ්ඩායමකට ම බෙදා දෙන්න.
- බ්‍රිස්ල් බෝඩය මත වට්ටියක රූපයක් ඇඳ ලබා දුන් පළා වර්ගවල දඬු සෙලෝටේප් හෝ ගම් හෝ වෙනත් ඇලවීමට යොදා ගන්නා ද්‍රව්‍යයක් යොදා ගනිමින් ඇලවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- දිවා ආහාරය සඳහා බත් රැගෙන එන ලෙස පෙර දිනයේ දී සිසුන්ට දැනුම් දෙන්න.
- ආහාරයට ගන්නා පළා වර්ග අතරින් තමා වඩාත් කැමති පළා වර්ගය කුමක් දැයි එක් එක් සිසුවාගෙන් විමසන්න.
- සිසුන්ගේ කැමැත්ත අනුව පළා වර්ගයක් තීරණය කර පාසලේ දී පළා මැල්ලුමක්/පලා සලාදයක් දෙමාපියන්ගේ සහය ඇති ව පිළියෙළ කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරගන්න.
- සිසුන්ගේ ද සහය ඇති ව පළා වර්ග කඩා, පිරිසිදු කරගන්න.
- පලා වර්ග හොඳින් කිහිප වරක් සේදිය යුතු බවත්, එසේ සේදීමේ දී ජලයට ලුණු ස්වල්පයක් එක් කිරීමෙන් ඒවායේ රැඳී තිබිය හැකි අපේ ශරීරයට හානිකර දේ බොහෝ දුරට ඉවත්කර ගත හැකි බව ද සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන්ගේ සහය ඇති ව සලාදය/මැල්ලුම සකස් කර ගන්න. (ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වන්න.)
- සලාදය හෝ මැල්ලුම හෝ නිර්මාණශීලී ලෙස පිළිගැන්වීම කෙරෙහි ද සැලකිලිමත් වන්න.
- නිවසේ දී සකස් කරගෙන ආ ආහාර වේල සමඟ පළා මැල්ලුම හෝ සලාදය හෝ සිසුන්ට භුක්ති විඳීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් දිවා ආහාරයට 'බත්' සහ පළා වර්ග ගෙන ආ දිනවල දී පළා වර්ග ආහාරයට එක්කර ගනී දැයි යන්න පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- පාසලේ දිවා ආහාරය සඳහා පළා වර්ග එක් කරගෙන තිබෙන සිසුන් තව දුරටත් දිරිමත් කිරීමට හා අනෙකුත් සිසුන් තුළ ඒ සඳහා උනන්දුවක් ඇති කරලීමට තරු/සිනහ මුහුණ වැනි දෑ ලබාදෙන සටහනක් සකස් කරගන්න.
- මාසය අවසානයේ එම රූප වැඩි ප්‍රමාණයක් රැස් කර ගත් සිසුන් අගය කරන්න.

**ක්‍රියාකාරකම 4 :**


- අවට පරිසරයෙන් සපයා ගත හැකි දේශීය පලතුරු වර්ග රැගෙන එන ලෙස පෙර දිනයක දී දරුවන්ට උපදෙස් ලබා දෙන්න.
  *උදා :* වෙරළු, වරකා, ලොවි, උගුරැස්ස, ඇඹරැල්ල, දං, කාමරංගා, කිරල, අනෝදා, . . . වැනි
- එම පලතුරු හොඳින් සෝදා පිරිසිදු කරගන්න.
- ඒවා වෙන් වෙන් ව භාජනවලට දමා පලතුරුවල නම් කාඩ්පත්වල ලියා අදාළ භාජනයේ ඉදිරියෙන් සිසු නිරීක්ෂණයට තබන්න.
- මෙවැනි පලතුරු ආහාරයට ගැනීමේ වැදගත්කම පිළිබඳ ව කතා බහ කරන්න.
  *උදා :* * නීරෝග පැවැත්ම සඳහා
  * ශරීර ශක්තිය වර්ධනය සඳහා . . . වැනි
- එදිනෙදා අප ගන්නා සැම ආහාර වේලක් සඳහා ම පලතුරු එක් කරගැනීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ට අවධාරණය කරන්න.
- තව ද අප නිරන්තරයෙන් ආහාරයට ගන්නා පලතුරු වර්ග වෙනුවට අවට පරිසරයෙන් සපයාගත හැකි පිරිසිදු, රසවත්, ගුණදායක පලතුරු වර්ග බොහෝ ඇති බවත් ඒවා ආහාරයට ගැනීම ඉතා සුදුසු බවත් සිසුන්ට පෙන්වා දෙන්න.
- රැස් කර ගත් පලතුරු සිසුන්ට ආහාරය සඳහා ලබා දෙන්න.
- අවට පරිසරයෙන් සපයා ගත හැකි පලතුරු යොදාගෙන පලතුරු සලාදයක්/පලතුරු බීමක් වැඩිහිටි සහභාගිත්වය ද ඇති ව සකස් කරගන්න.
- සකස් කරගත් පලතුරු සලාදය/පලතුරු බීම රස විඳීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 5 :**

- ආහාර නාස්තිවන ආකාර පිළිබඳ සිසු අත්දැකීම් ඔස්සේ කතාබහ කරන්න.
  *උදා :* * එදිනෙදා නිවසේ දී ආහාර නාස්ති වන අයුරු
  * දානමය කටයුතුවල දී ආහාර නාස්ති වන අයුරු
  * විවිධ උත්සව අවස්ථාවල දී ආහාර නාස්ති වන අයුරු
- පන්ති කාමරයේ දී ආහාර ලබා ගැනීමෙන් පසු ව සිසුන් ඉතිරි කරන ආහාර ප්‍රමාණය එක් භාජනයකට දමා එම ප්‍රමාණය කොතෙක් ද යන්න සිසුන්ට පෙන්වන්න.
- ඒ තුළින් ආහාර අපතේ නොයැවීම පිළිබඳ ව සිසු අවධානය තවදුරටත් යොමු කරන්න.
- විවිධ ආහාර වගා කිරීම සඳහා මිනිසුන් වෙහෙස වන ආකාරය පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න. *උදා :* වී ගොවිතැන සඳහා
- මෙහිදී බිම සකස් කිරීමේ සිට අස්වනු නෙළීම තෙක් විවිධ වූ කටයුතු සඳහා වෙහෙස වන අයුරු පැහැදිලි කරන්න.
- ආහාර නිපදවීම සඳහා එම කටයුතුවල නියැළෙන්නන් බොහෝ වෙහෙස වන බවත් ඒ සඳහා විශාල මුදලක් වැය වන බවත් පෙන්වා දෙමින් අප හැකි තරම් ආහාර නාස්ති කිරීමකින් තොර ව පරිභෝජනය කළ යුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.
- හැකි නම් සුදුසු රූප, චිත්‍ර, වීඩියෝ දර්ශන ආදිය ඒ සඳහා යොදා ගන්න.
- ආහාර නොමැති වීම නිසා මිනිසුන් පීඩාවට පත් වී ඇති ආකාර නිරූපණය වන ඡායාරූප, වීඩියෝ දර්ශන සිසුන්ට පෙන්වා ඔවුන් කෙරෙහි සිසුන් තුළ සංවේදී බවක් මතු වන සේ කතාබහක නිරත වන්න.
- මේ අනුව ආහාර ගැනීමේ දී ආහාර නාස්ති වන අයුරින් කටයුතු නොකළ යුතු ආකාර ද පැහැදිලි කරන්න.
  *උදා :* * ආහාර බෙදා ගැනීමේ දි අවශ්‍ය ප්‍රමාණයට පමණක් බෙදා ගැනීම
  * සතුන්ගෙන් හානි නොවන ආකාරයට ආහාර තැබීම

**ක්‍රියාකාරකම 6:**

- පෝෂ්‍යදායී ආහාර පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සෑම කණ්ඩායමකට ම බ්‍රිස්ල් බෝඩයක අඳින ලද පිඟානක රූපයක් බැගින් ලබා දෙන්න.
- රූපයේ දැක්වෙන පරිදි එම පිඟානේ එක් එක් ස්ථානවල පහත සඳහන් ආහාර වර්ගවල නම් සටහන් කරන්න.



- මෙම ක්‍රියාකාරකමෙහි යෙදවීම සඳහා කණ්ඩායමකට එක බැගින් වන සේ පහත සඳහන් ආහාර වර්ගවල රූප ඇතුළත් කාඩ්පත් සකස් කර ගන්න.

  *උදා :* * මාළු/ බිත්තර රූපය
  * පළා වර්ගයක් සහිත රූපය
  * ධාන්‍ය වර්ගයක් සහිත රූපය
  * බත් සහිත රූපය
  * එළවුළු වර්ගයක් සහිත රූපය
- මේ සියලු රූප එක් බඳුනක දමා පන්තියේ මැදින් තබන්න.
- දෙන ලද සංඥාවකට අනුව ඉහත දැක්වූ ආහාර ද්‍රව්‍ය එක බැගින් ගෙන ලබා දුන් පිඟානක් සහිත රූපයේ ඇලවීමට යොමු කරන්න.
- ඒ අනුව පෝෂ්‍යදායී ආහාර පිඟානක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
- නිවැරදි ව ක්‍රියාකාරකම නිම කරන කණ්ඩායම අගයන්න.
- පසු ව එක් එක් පිඟානේ තිබෙන ආහාර පිළිබඳ ව හා ඒවායේ පෝෂණීය අගය පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීම මඟින් අපට එදිනෙදා සිදු කරන කටයුතු සිදු කිරීමට ශක්තිය ලැබෙන බවත් ලෙඩ රෝගවලින් වැළකී ජීවත් වීමට හැකි බවත් තවදුරටත් අවධාරණය කරන්න.
- පෝෂ්‍යදායී ආහාර වේලක් නියමිත ප්‍රමාණයෙන් ලබාගන්නා සේ ම දිනපතා ආහාර වේලකට පසු පලතුරක් ආහාරයට ගැනීමත් වැදගත් වන බවත් අවධාරණය කරන්න.
- දිනපතා පිරිසිදු ජලය ප්‍රමාණවත් ව පානය කිරීමේ වැදගත්කම ගැන ද සිසුන්ට අවධාරණය කරන්න. ජලය ප්‍රමාණවත් ව නොගැනීම නිසා විවිධ රෝග ආබාධ ඇතිවිය හැකි බව ද පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 7**

- අපට ආහාර නිසා වැළඳිය හැකි රෝගවලින් ආරක්ෂා වීම සඳහා පවත්වා ගත යුතු ආහාර පුරුදු පිළිබඳ ව සිසුන්ට අවධාරණය කිරීම සඳහා පහත සඳහන් කරුණු ද අවධාරණය කරමින් සාකච්ඡාවක් කරන්න.

  *උදා :* * පැණිරස අධික ආහාර, අධික ලුණු සහිත ආහාර, අධික තෙල් සහිත ආහාර පරිභෝජනය සීමා කිරීම
  * පැණිරස ආහාරයක් පරිභෝජනය කළ පසු හොඳින් මුඛය පිරිසිදු කිරීම
  * බිම වැටුණු ආහාර හොඳින් සෝදා ආහාරයට ගැනීම
  * සතුන් කා දැමූ පලතුරු වැනි ආහාර භාවිත නොකිරීම
  * ක්ෂණික ආහාර ගැනීම හැකි තරම් සීමා කිරීම

- වැරදි ආහාර පුරුදු නිසා විවිධ රෝගබාධ මිනිසුන්ට වැලඳෙන බව සිසුන්ට පෙන්වා දෙන්න.

  *උදා :* * අධික තරබාරු බව (අධික මහත)
  * අධික කෙසඟ බව
  * මුඛය ආශ්‍රිත රෝග
  * ආමාශගත රෝග (බඩේ අමාරු )
  * දියවැඩියාව

- මෙවැනි රෝගබාධ නිසා අපගේ එදිනෙදා කටයුතු අඩාළවීම, ඉගෙනුම් කටයුතුවලට බාධා වීම වැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වන බව සිසුන්ට පෙන්වා දෙන්න.
- එහෙයින් අප විසින් ජීවිත කාලය තුළ ම යහපත් ආහාර පුරුදු පවත්වා ගත යුතු බවත්, හැකි සෑම අවස්ථාවක දී ම ඒවා පිළිපැදීම මඟින් අපට නීරෝග සිරුරක් පවත්වා ගත හැකි බවත් සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 8**

- තමා කැමති එළවුළු වර්ගයක් හෝ පලතුරු වර්ගයක් හෝ නිර්මාණය කිරීමට සුදුසු මැටි වර්ගයක් ගෙන එන ලෙස උපදෙස් ලබා දෙන්න.
- ඒවා යොදා ගනිමින් කැමති ආකාරයට එළවළු හෝ පලතුරු වර්ගවල ආකෘති නිර්මාණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පසු ව සකස් කරගත් නිර්මාණ මඳ පවනේ වේළෙන්නට හැර සායම් (non toxic) යොදාගෙන ඒවා වර්ණ ගැන්වීමට සිසුන් යොමු කරන්න.
- එම භාවිත කළ වර්ණ යොදා ගනිමින් හලාගත් සිහින් වැලි ද වර්ණ ගන්වා ඒවා කඩදාසියක් මත අතුරා සකස් කරගත් නිර්මාණය වටේට ගම් තවරා එම වැලි නිර්මාණය වටේට තවරන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- සිසු නිර්මාණ අගයන්න.
- නිර්මාණ සියල්ල එක්කර ප්‍රදර්ශනයක් පවත්වන්න.

**ක්‍රියාකාරකම 9**

- ආහාරවලින් ලැබෙන පෝෂණය හා යහපත් ආහාර පුරුදු පිළිබඳ කියවෙන රබන් පද/වෙනත් නිර්මාණය කර ගත් කවි එකතුවක් සකස් කරගන්න.

  *උදා :* * පාන් බනිස් වඩේ කොත්තු
  කරවයි අප ලෙඩට කිට්ටු
  කේක් පුඩිං තට්ටු තට්ටු
  දත් ටික අපෙ කරයි මට්ටු

  බත් එළවුළු පලතුරු
  ශක්තිය දෙයි නිරතුරු

  * උඩපල ගත්තත් වට්ටක්කා . . .

  * තුන්තුඹ ගෙඩි තුනයි තුනයි

  * රන් රඹුටන් ගස් දෙකයි . . .

- ඒවා සිසුන් සමඟ තාලයට ගායනා කර, වාදනය කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- රබානක් වෙනුවට ඒ සඳහා සුදුසු ආදේශක භාවිත කළ හැකි ය. (මේසයක්, ලොකු බිස්කට් ටින් එකක් නැතහොත් එක්රේ කාඩ් යොදා සකස් කරගත් ආදේශ භාණ්ඩයක් භාවිත කරන්න.)

**ක්‍රියාකාරකම 10**

- සෑම සිසුවකුට ම එකක් බැගින් වන සේ මීටර් 1ක් පමණ දිග ඉටි රෙද්දක්/පැදුරක් වැනි දෙයක් සපයා ගන්න.
- සිසුන් එළිමහනේ ඉඩකඩ ඇති ස්ථානයකට කැඳවා සිසුන් දෙදෙනා බැගින් මුහුණට මුහුණ ලා වාඩි වීමට යොමු කරන්න.
- දෙපා දෙපසට විහිදුවා එක් සිසුවකුගේ වම් පාදයේ යටි පතුල අනෙක් සිසුවාගේ දකුණු පාදයේ යටි පතුලත්, දකුණු පාදයේ යටි පතුල අනෙක් සිසුවාගේ වම් පාදයේ යටි පතුලත් මත තබා ගත යුතු ය.
- එසේ වාඩි වූ සිසුන් එකිනෙකාගේ දෑත් අල්ලා ගනිමින් දෙපසට පැද්දීමට යොමු කරන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපි විතරද'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

# 8. තේමාව : තොරතුරු ලැබෙන හැටි

**නිපුණතා** :
- සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍ය හඳුනාගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.
- සන්නිවේදනය හා බැඳුණු තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- සන්නිවේදනයේ දී ආචාරශීලී ව කටයුතු කරයි.
- තොරතුරු සන්නිවේදන සිදු කරන ආකාර හා සම්බන්ධ විවිධ නිර්මාණ කරයි.
- විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- විවිධ සන්නිවේදන විධි යොදා ගනිමින් ප්‍රකාශනාත්මක චලන සහිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**ඉගෙනුම් පල** :
- තොරතුරු නිවැරදි ව ලබාගැනීමේ හා ලබාදීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- කටහඬ, අංග චලන සුදුසු පරිදි භාවිත කරමින් අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කරයි.
- තොරතුරු ලබාගැනීමට හා ලබා දීමට යොදාගන්නා විවිධ තාක්ෂණික භාණ්ඩ නිවැරදි ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි.
- තොරතුරු ලබා ගැනීමේ හා ලබාදීමේ දී ආචාරශීලී ව කටයුතු කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් සන්නිවේදනය සිදු කළ හැකි භාණ්ඩවල ආකෘති නිර්මාණ කරයි.
- බිත්ති පුවත්පත් නිර්මාණය මඟින් විවිධ ප්‍රකාශන හැකියා ප්‍රදර්ශනය කරයි.
- සංඥාවලට අනුව ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- අභිරූපන මඟින් සිදු කරන භාව ප්‍රකාශන මනා ව සන්නිවේදනය කරමින් වින්දනයක් ලබයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- තොරතුරු නිවැරදි ව ලබා ගැනීමේ හා ලබා දීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම සඳහා සිසුන් පහත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- පේළියකට සිසුන් 10-12 පමණ වන සේ සිසුන් පෙළ ගස්වන්න.
- කිසියම් ප්‍රකාශයක් අන් සිසුන්ට නෑසෙන සේ පේළියේ සිටින අවසන් සිසුවාට පවසන්න.
  *උදා* : ඊයේ මම කඩේ ගිහිල්ලා නංගිට මාලයකුයි, මට බෝලයකුයි ගෙනාවා.
- ගුරුවරයා විසින් කරන ලද ප්‍රකාශය එම සිසුවා විසින් තමාට ඉදිරියෙන් සිටින සිසුවාට ද, එම සිසුවා විසින් තමා ඉදිරියේ සිටින අනෙක් සිසුවාට ද වශයෙන් පේළියේ පළමු ව සිටගෙන සිටින සිසුවා තෙක් සන්නිවේදනය කළ යුතු වේ.
- සිසුන් විසින් පණිවිඩය සන්නිවේදනය කිරීමේ දී එක් වතාවක් පමණක් එය ප්‍රකාශ කළ යුතු ය.
- මේ අයුරින් සුදුසු ප්‍රකාශ කිහිපයක් යොදා ගනිමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- ගුරුවරයා විසින් සිදු කරනු ලැබූ ප්‍රකාශය හා පේළියේ සිටින පළමු සිසුවා විසින් ලබා ගැනුණු පණිවිඩය සියලු ම සිසුන්ට ඇසෙන සේ ශබ්ද නඟා කියන්න. එම ප්‍රකාශ දෙක අතර යම් වෙනසක් සිදු වී ඇත්නම් ඒ කෙසේ ද යන්න පිළිබඳ ව කතාබහ කරන්න.
- යම් තොරතුරක් කිහිප දෙනෙකු විසින් සන්නිවේදනය කිරීමේ දී විවිධ වෙනස්කම් සිදුවිය හැකි බවත් හැකි සෑම විට ම නිවැරදි තොරතුරු ගැනීමටත්, ඒ තොරතුරු නිවැරදි ව ලබා දීමටත් කටයුතු කිරීම ඉතා වැදගත් බවත් අවධාරණය වන සේ සිසුන් සමඟ කතාබහක නියැළෙන්න.

**ක්‍රියාකාරකම 2**

- පන්තියේ සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට කැඳවාගෙන යන්න.
- සිසුන් දෙදෙනකු ඉදිරියට කැඳවා ඔවුන් දෙදෙනාගෙන් කෙනකු තරමක් ඈතින් සිටුවන්න.
- පසු ව කිසියම් කෙටි පණිවිඩයක් අනෙක් සිසුවාට පැවසීමට යොමු කරන්න.
  *උදා :* ''මෙහි එන්න.'' වැනි කෙටි පණිවිඩයක්
- පසු ව පහත සඳහන් අයුරින් ඈතින් සිටින සිසුවාට ඇමතීමට යොමු කරන්න.
  * කටහඬ භාවිත නොකර අංග චලනයෙන් පමණක් සංඥා කිරීම.
  * කටහඬේ ශබ්දය අඩු කරමින් අත වනා පැමිණෙන ලෙස සංඥා කිරීම.
  * කටහඬ උස් හඬින් භාවිත කරමින් අත වනා පැමිණෙන ලෙස සංඥා කිරීම.
- වඩා සාර්ථක කුමන අවස්ථාව දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව තෙවැනි අවස්ථාවේ ලබා දුන් පණිවිඩය වඩා හොඳින් අවබෝධ වීමට හේතු වන බව පෙන්වා දෙන්න.
- අංග චලනය සහ කටහඬ සන්නිවේදනයේ දී ඉතා වැදගත් වන බව මෙම ක්‍රියාකාරකම ඇසුරින් අවධාරණය කරන්න.
- සන්නිවේදනයේ දී මිනිසුන් විසින් විවිධ අංග චලන පවත්වා ගනු ලබන බව කතාබහ කරන්න.
- එසේ ප්‍රදර්ශනය කළ අංග චලන පිළිබඳ ව සිසුන්ට සුදුසු උදාහරණ යොදාගනිමින් පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- අපට එදිනෙදා තොරතුරු ලැබෙන විවිධ ආකාර මොනවාදැයි යන්න සිසුන්ගෙන් විමසන්න.
  *උදා :* පුවත්පත්, රූපවාහිනිය, ගුවන්විදුලිය, දුරකථනය, . . . වැනි
- මෙවැනි උපකරණ කිහිපයක් පන්තියට ගෙන්වා ගන්න. නොඑසේ නම් එවැනි උපකරණ ඇති ස්ථානයකට සිසුන් කැටුව යන්න.
- එම උපකරණ නිසි ලෙස භාවිත කරන ආකාරය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න
  *උදා :* * ජංගම දුරකථනයකින් ඇමතුමක් ලබා ගැනිමේ දී අනුගමනය කළ යුතු පියවර
  * ගුවන් විදුලි යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම, විසන්ධි කිරීම . . . වැනි
- අප විසින් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන භාණ්ඩ හැසිරවීමේ දී ඉතා සුපරික්ෂාකාරී විය යුතු බවත්, එසේ නොකිරීම හේතුවෙන් එම භාණ්ඩයේ ක්‍රියාකාරිත්වයට මෙන් ම තමන්ට ද හානි විය හැකි බවත් පෙන්වා දෙන්න.

  *උදා :* * අකුණු සහිත අවස්ථාවක දී දුරකථනයකින් කථා කිරීම නිසා ඇතිවිය හැකි හානි
  * අකුණු ගසන අවස්ථාවක දී රූපවාහිනිය විසන්ධි නොකිරීම නිසා සිදුවූ හානි
  * පරිගණකය වැනි උපකරණ භාවිතයේ දී නිසි පරිදි ඉරියවු පවත්වා නොගැනීම නිසා ශරීරයට ඇති විය හැකි ආබාධ
- මෙවැනි සිද්ධි සම්බන්ධ සිසු අත්දැකීම් විමසමින් ආරක්ෂාකාරී ව හා නිවැරදි ව ඉහත දැක්වූ තාක්ෂණික මෙවලම් භාවිත කළ යුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 4 :**

- පන්ති කාමරයේ බිත්ති පුවත්පතක් පවත්වා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් සකසා ගන්න.
- බිත්ති පුවත්පත සඳහා සිසුන් තුළ ඇති ප්‍රකාශන හැකියා මතු වන ආකාරයෙන් නිර්මාණ ඉදිරිපත් කිරීමට සෑම සිසුවකු ම යොමු කරන්න.
- එම බිත්ති පුවත්පතට පහත දැක්වෙන ආකාරයේ සිසු නිර්මාණ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

  *උදා :* * සරල ගීත, කවි
  * චිත්‍ර/ඡායාරූප
  * නිර්මාණාත්මක ක්‍රියාකාරකම් (කොලාජ්, ඔරිගාමි වැනි නිර්මාණ)
- මෙය සාර්ථක නිර්මාණශීලී එකතුවක් බවට පත් කිරීමට ගුරුවරයා නිරන්තර අධීක්ෂණයේ යෙදිය යුතු ය.
- බිත්ති පුවත්පත වර්ෂය පුරා පවත්වාගෙන යාමට හා එහි ඇතුළත් දේ පරිශීලනයට සිසුන් තව දුරටත් උනන්දු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- සන්නිවේදනයේ දී ආචාරශීලීව තොරතුරු ලබා ගැනීමේ හා ලබා දීමේ වැදගත්කම පැහැදිලි කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමේ සිසුන් යොදවන්න.
- ඒ සඳහා පහත දැක්වෙන ආකාරයේ සුදුසු ප්‍රකාශ කිහිපයක් තෝරා ගන්න.

  *උදා :* * පැන්සල දෙන්න.
  * එහෙට යන්න
  * වතුර ටිකක් දෙන්න.
- මෙවැනි ප්‍රකාශ වඩාත් ආචාරශීලී ව ඉදිරිපත් කළ හැකි ආකාරය හඳුනා ගන්න.

  උදා : * කරුණාකර පැන්සල දෙන්න.
  * කරුණාකර එහෙට යන්න
  * මට වතුර ටිකක් දෙන්න පුළුවන් ද ?
- ඒ අනුව සන්නිවේදනයේ දී ආචාරශීලී වචන භාවිතය, හඬ මෘදු ව භාවිත කිරීම තමා අන් අයට ප්‍රියමනාප වීමට හේතු වන බව පෙන්වා දෙන්න.
- දෙදෙනකු හමුවීමේ දී ආචාරශීලී ව කතාබහ කිරීමක් ආදර්ශනය සඳහා පන්තියේ සිසුන් දෙදෙනා බැගින් වෙන් කරන්න.
- පහත දැක්වෙන ආකාරයේ දෙබසක් පන්තියේ සිසුන්ට ඉදිරිපත් කරන්න.

  *උදා :* හිරුජ - මම හිරුජ. ඔයාගේ නම මොකක් ද ?

  සඳරු - මම සඳරු

  හිරුජ - සඳරු මගේ සපත්තුව ගැලවිලා. කරුණාකර ඔයාට පුළුවන් ද මේ පොත අල්ලා ගන්න මම සපත්තුව දමා ගන්නකන්. (පොත ලබා දෙමින්)

  සඳරු - දෙන්න. දෙන්න. මට පුළුවන්

  හිරුජ - ආ. හරි දැන් පොත දෙන්න. ඔයාට ගොඩක් ස්තුති යි.

  සඳරු - ඔයාට උදවු කරපු එක මට සතුටක්.
- ඉහත සඳහන් ආකාරයේ දෙබස් කිහිපයක් නිර්මාණය කර ඒවා සිසු යුගලයන් වෙත ලබා දී ආදර්ශනය කරවන්න.
- අවස්ථා මාරු කරමින් සෑම සිසුවකුට ම අත්දැකීම් ලබා දීම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- හිස් ගිනිපෙට්ටි, යෝගට් කෝප්ප, නූල්, නූල් කෝන් වැනි දේ උපයෝගී කර ගනිමින් සෙල්ලම් දූරකථනය නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- යම් අයකුට දුරකථන පණිවිඩයක් ලබා දීමේ දී/ලබා ගැනීමේ දී ආචාරශීලී ව එය කරන අයුරු පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- මෙහි දී ආචාරශීලී වචන භාවිතය සහ කටහඬ භාවිත කළ යුතු අයුරු පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- මේ පිළිබඳ ව හුරුවක් ලැබීම සඳහා පහත සඳහන් ආකාරයේ දූරකථන සංවාදයක සිසුන් නිරත කරවන්න. මේ සඳහා සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- සාදාගත් දූරකථන යොදා ගනිමින් ක්‍රියාකාරකම් සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* සචින් - හලෝ. මම සචින්. ඔය කවීන් ද කතා කරන්නේ ?

  කවීන් - ඔව් මම කවීන්

  සචින් - හෙට ඔයා ඉස්කෝලෙ එනවා ද ?

  කවීන් - ඔව් මම ඉස්කෝලෙ එනවා.

  සචින් - එහෙනම් කරුණාකරලා ඔයාට පුළුවන් ද මට ඔයාගේ ජනකවි පොත ගෙනත් දෙන්න.

  කවීන් - හොඳයි මම ගේන්නම්.

  සචින් - බොහොම ස්තුතියි කවීන්

- සිසුන්ට සමීප අවස්ථා හඳුනා ගනිමින් මෙවැනි සංවාද කිහිපයක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම 7**

- සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට ගෙනගොස් රවුමක ආකාරයට සිටුවන්න.
- තොප්පියක්/බෝලයක්/බෝනික්කකු වැනි එක් දෙයක් සපයා ගන්න.
- කැසට් යන්ත්‍රයක් ආධාරයෙන් ළමා ගීතයක් වාදනය වීමට සලස්වන්න. එම වාදනය ආරම්භ වූ සැණින් තෝරාගත් උපකරණය (බෝලය) අතින් අත යැවීම ආරම්භ කළ යුතු වේ.
- ගුරුතුමිය ක්ෂණික ව ගීතය/වාදනය නතර කරන අවස්ථාවේ දී බෝලය අතැති සිසුවා තරගයෙන් ඉවත් වේ.
- නැවත පෙර පරිදි ම වාදනය ආරම්භ කර තරගය ක්‍රියාත්මක කරන්න.
- මෙසේ වරින් වර ගීතය වාදනය වීමට සලස්වමින් හා නතර කරමින් අවසන් සිසුවා තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 8**

- ගෘහස්ථ/ජංගම දූරකථනයක් නිර්මාණය සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා පහත සඳහන් ද්‍රව්‍ය රැස් කරගන්න.
- මැටි, ක්ලේ, කාඩ්බෝඩ්, ගම්, කතුරු, වර්ණවත් කඩදාසි, දියර වර්ණ
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර කැමති මාධ්‍යයක් යොදා ගනිමින් ජංගම/ගෘහස්ථ දූරකථනයක් නිර්මාණයට යොමු කරන්න.

  *උදා :* * ක්ලේ යොදා ගනිමින් දූරකථනයක් නිර්මාණය

  * මැටි යොදා ගනිමින් දූරකථනයක් නිර්මාණය
- ඒවා වර්ණ ගන්වා/පාට කඩදාසි අලවා වර්ණවත් කර ගන්න.
- සිසු නිර්මාණ අගයන්න.

**ක්‍රියාකාරකම 9**

- අභිරූපණයක් සිදුකළ හැකි ආකාරය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න. ගුරුවරයා විසින් පහත සඳහන් අවස්ථාවලින් එකක් අභිරූපණයක් මගින් නිරූපණය කර පෙන්වන්න.
- දරුවන්ට කළ හැකි මට්ටමේ අභිරූපණ එක් එක් තුණ්ඩුවක එක බැගින් ලියා ගන්න

  *උදා :* * උදේ නැගිටලා, දත් මැදලා, මුහුණ සෝදනවා.

  * මල් කඩනවා
  * වාහනයක් එළවනවා
  * ඉඳිකටුවකට නූල් දමා ඇඳුමක් අතේ මහනවා
  * බයිසිකලයක් පදිනවා
  * දූරකථන ඇමතුමක් ගෙන කථා කරනවා.
  * පොල් ගානවා.
  * ගහක් උඩ තියෙන පලතුරක් කඩනවා
- මෙවැනි අවස්ථා කුඩා කඩදාසිවල ලියා, ලියූ කොළ රෝල් කර කුඩා භාජනයකට දමන්න.
- සැම සිසුවෙකුටම අවස්ථාවක් ලැබෙන පරිදි ඉදිරිපත් කිරීම සඳහා එක් තුණ්ඩුව බැගින් තෝරාගෙන පන්තියේ අනෙක් සිසුන් ඉදිරියේ ඒවා ඉදිරිපත් කිරීමට සිසුන් දිරිමත් කරන්න.
- සිසුන්ගේ සැම ඉදිරිපත් කිරීමක් ම අගයන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''කාට කාටත් පාඩමක්'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 9. තේමාව : වටපිටාවේ සිදුවන වෙනස්කම්

**නිපුණතා** :
- පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.
- ආසන්න පරිසරයේ අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගනියි.
- ස්වාභාවික පරිසරයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- වටපිටාවේ වෙනස්කම් සමඟ ක්‍රියා කරවිය හැකි නිර්මාණ කරයි.
- සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- අවකාශය භාවිත කරමින් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**ඉගෙනුම් පල** :
- වැස්ස, සුළඟ නිසා පරිසරයේ සිදු වන වෙනස්කම් කිහිපයක් නිරීක්ෂණය කර වාර්තා කරයි.
- වැස්ස හා සුළඟ නිසා ඇති වන අහිතකර වෙනස්කම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- වැස්ස, සුළඟ නිසා ආසන්න පරිසරයේ සිදු වන අහිතකර බලපෑම් අවම කර ගැනීමට දායක වෙයි.
- සුළඟ ආධාරයෙන් ක්‍රියා කරවිය හැකි උපකරණ නිර්මාණය කර භාවිත කරයි.
- සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් ශාරීරික නම්‍යතා වර්ධනයට උපකාරී වන චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- වටපිටාවේ සිදුවන වෙනස්කම් සම්බන්ධ කවි/ගී ගායනා කරමින් රංගනයේ යෙදෙයි.
- සුළඟේ ආධාරයෙන් නාද නිපදවිය හැකි උපකරණ නිර්මාණය කර භාවිත කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සුළඟේ වේගය අඩු වැඩි වශයෙන් පවත්නා අවස්ථා කීපයක දී පරිසරයේ ඇති වන වෙනස්කම් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* * ශාක පත්‍රවල සෙලවීම සිදු වන අයුරු,
  * ශාක පත්‍ර කඩදාසි කැබැලි සුළඟේ ගසාගෙන යන අයුරු, ශාක පත්‍ර, කඩදාසි සුළඟේ ගසාගෙන යන අයුරු
- සිසු නිරීක්ෂණ වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී සුළඟේ වේගය අනුව සිදුවන වෙනස්කම් ද විවිධ වන බව පෙන්වා දෙන්න.
- සුළඟ නිසා ගස්වැල්වල සිදුවන වෙනස්කම් හේතුවෙන් පරිසරයේ ඇතිවන සුන්දරත්වය විදහා දැක්වෙන ආකාරයේ චලන ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිරීක්ෂණ චිත්‍ර මඟින් ඉදිරිපත් කිරීමට ද යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සුළඟ නිසා ආසන්න පරිසරයේ සිදුවිය හැකි අයහපත් බලපෑම් මොනවා ද යන්න සිසුන් සමඟ කතාබහ කරන්න.
- මෙහි දී පහත සඳහන් කරුණු මතු කර දක්වන්න.
  * ගස්වැල්වල අතු කඩා වැටීම
  * වහලවලට යොදා ඇති තහඩු වැනි ආවරණ සුළඟේ ගසාගෙන යාම
- පාසල් වත්තේ සිදු කරනු ලබන නිරීක්ෂණ චාරිකාවක් මඟින් සුළඟ නිසා යම් අහිතකර බලපෑමක් ඇතිවිය හැකි ස්ථාන වේතොත් ඒවා හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උදා : * සුළඟ නිසා යම් අහිතකර බලපෑමක් සිදු වේ යැයි අනුමාන කළ හැකි ගසක්
* සුළඟ නිසා යම් අහිතකර බලපෑමක් සිදු වේ යැයි අනුමාන කළ හැකි ගොඩනැගිලි හා ඒවායේ දොරවල්, ජනේල

- මෙවැනි ස්ථානවල දී සිදුවිය හැකි බාධක හා අනතුරුවලින් ආරක්‍ෂා විය හැකි ආකාර සහ ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව සිසුන් සමග කතාබහ කරන්න.
- සිසුන්ගේ දායකත්වය සහිත ව යම් වෙනසක් කළ හැකි ස්ථානයක් වේ නම් එම ස්ථානය සුළඟින් බාධාවක්, හානියක්, අනතුරක් සිදු නොවන ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

**ක්‍රියාකාරකම 3**

- සුදුසු අවස්ථාවක සුළඟින් පරිසරයට සිදු වූ හෝ බලපෑම පිළිබඳ ව සොයා බැලීමට ඒ සඳහා සුදුසු අවස්ථාවක දී පරිසරය නිරීක්‍ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒ අනුව පරිසරයේ සිදු වී ඇති වෙනස්කම් හඳුනා ගන්න.


උදා : * කොළ වැටී තිබීම
* ගස්වල අතු කැඩී තිබීම
* වහලවලට හානි සිදුවී තිබීම
* ගස්වැල්, මල් පඳුරු ඉදිරී වැටීම
* ජනෙල් දොරවල් සුළඟට වැසීම නිසා හානි සිදුවී තිබීම

- සුළඟේ ස්වභාවය අනුව පරිසරයට සිදුවන බලපෑම් අඩු වැඩි විය හැකි බව ද පෙන්වා දෙන්න.
- ගස්වල කොළ ඇතින් සහ ළඟින් වැටී තිබෙන අයුරු පිරික්සන්න. එසේ වූයේ සුළඟ නිසා බව පැහැදිලි කරන්න.
- ඒ අනුව සුළඟේ බලපෑමෙන් පරිසරයට විවිධ මට්ටමේ හානි සිදුවන බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 4 :**

- ඉරටු/බීම බට සහ ක්ලේ/පදම් කළ මැටි යොදා ගනිමින් පහත රූපයේ සඳහන් පරිදි විවිධ හැඩ සහිත විවිධ උස ප්‍රමාණයෙන් යුතු කුලුනක ආකාරයේ ඇටවුම් කිහිපයක් සකස් කිරීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

උදා :



- මේ සඳහා සෑම සිසු කණ්ඩායමකට ම ඉරටු/බීම බට 20-25ක ප්‍රමාණයක් හා ක්ලේ/පදම් කළ මැටි අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා දෙන්න.
- සිසුන් නිර්මාණය කළ සෑම ඇටවුමක ම මුදුනේ කඩදාසිවලින්/සව්කොළවලින්/සෙලොෆේන් වැනි වර්ණවත් කඩදාසිවලින් විවිධ ප්‍රමාණයේ විවිධ හැඩ සහිත කොඩි එකක් හෝ කිහිපයක් හෝ සවි කරන්න.

- සුළං හමන ස්ථානයක හෝ විදුලි පංකාවක් ක්‍රියාත්මක කර ඇති ස්ථානයක හෝ එම ඇටවුම් තබා සුළඟින් නොවැටී දිගු වේලාවක් පවතින කුලුන තෝරන්න.
- ඒ අනුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමග කතාබහක නියැළෙන්න.

  *උදා* : * වැඩි වේලාවක් සුළඟ හේතුවෙන් නොවැටී තිබුණේ කුමන ඇටවුම ද ?
  * ඉක්මනින් වැටුණේ කොඩි කීයක් සහිත ඇටවුම ද ?
  * ඉක්මනින් වැටුණු ඇටවුමේ හැඩය සහ උස ප්‍රමාණය කෙබඳු ද ?
  * සුළඟ නිසා යම් ඇටවුමක් නොවැටී තිබුණේ නම් එසේ වීමට හේතු කුමක් විය හැකි ද?

**ක්‍රියාකාරකම 5 :**

- වර්ෂාවකින් පසු අවට පරිසරය නිරීක්ෂණය සඳහා ආරක්ෂාකාරී ව සිසුන් කැඳවාගෙන යන්න.
- වැස්ස නිසා පස සෝදාගෙන ගිය තැන්, වැසි වතුර රැඳුණු තැන්, දියසෙවල බැඳී ඇති තැන්, ගොඩනැඟිලිවල තෙමෙන තැන් ආදිය පෙන්වමින් චාරිකාවේ යෙදෙන්න.
- ගල් වැටි, තණකොළ සහිත ස්ථාන සහ පස නිරාවරණය වී පවතින ස්ථානවල පස සේදී යාම සන්සන්දනය කරමින් කතාබහ කරන්න.
- පොලිතීන් කවර, වෙනත් අපද්‍රව්‍ය ආදිය හේතුවෙන් කාණුවල ජලය බැසීම අවහිර වී ඇති අයුරු නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- පන්ති කාමරයට/නිවෙසට/ගෙවත්තට වැස්සෙන් වන බලපෑම අවම කර ගැනීමට සිදු කළ හැකි දෑ පිළිබඳ සාකච්ඡා කරන්න.
- සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් හැකි පමණින් එම ස්ථානවලට වැස්සෙන් වන බලපෑම අවම කරගත හැකි ආකාරයේ ක්‍රියාකාරකමකට සිසුන්ට දායක වීමට අවස්ථාව ලබා දෙන්න.

  *උදා* : * තණකොළ පිඩැලි, ගල්වැටි ආදිය බැඳීම

**ක්‍රියාකාරකම 6**

- වැස්ස, සුළඟ වැනි අවස්ථාවලට අදාළ ව නිදහසේ චිත්‍ර ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- වැස්ස හා සුළඟ නිසා සිදුවන හානි පිළිබඳ වත්, ඒවායෙන් ආරක්ෂා වීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ වත් සටහන් කර ඇති කාඩ්පත් කිහිපයක් සකස් කර ගන්න.

*උදා* :

| | |
|---|---|
| කුඩ භාවිතය | සුළඟ හමන දිශාවට ආනත ව ද්‍රව්‍ය තැබීම |
| වැහි කබාය පැළඳීම | පැළවලට ආධාරක යෙදීම |
| වහලවල තීන්ත ආලේපය | ගස්වල අනාරක්ෂිත අතු කපා දැමීම |
| ලීවල කළුතෙල් ගෑම | ජනෙල් දොරවල් සුළඟින් වැසීම වැළැක්වීමට අගුල් යෙදීම/බරක් තැබීම |
| වතුර බැසයන කාණු යෙදීම | |
| පිඩැලි ඇල්ලීම | |
| ගල්වැටි බැඳීම | |
| නිවෙස්වල වහල යෙදීම | |

* ඩිමයි කඩදාසියක පහත දැක්වෙන ආකාරයේ සටහනක් ගොඩනගා ගන්න.

| වැස්සෙන්/සුළඟින් වන හානි | වැස්සෙන්/සුළඟින් ආරක්ෂා වීමට කළ යුතු දේ |
|---|---|
| | |

* සකස් කරගන්නා ලද කාඩ් පත්‍රිකා එහි ඇලවීමට සිසුන් යොමු කරන්න.
* මේ අනුව වැස්සෙන් හා සුළඟෙන් සිදුවන බලපෑම් අවම කර ගැනීමට අපට විවිධ උපක්‍රම භාවිත කළ හැකි බව තව දුරටත් සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 7 :**


* අව්ව, වැස්ස, සුළඟ නිසා සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* * මඳ සුළං ඇති අවස්ථාවක ගස් සෙලවෙන ආකාරයට සෙලවීම
  * ක්‍රමයෙන් සුළඟ වැඩි වන විට ගස් සෙලවෙන ආකාරයට සෙලවීම්
  * පොද වැස්සක් වැටෙන ආකාරයට සෙමෙන් උඩ පැනීම
  * වැස්ස ක්‍රමයෙන් වැඩි වන ආකාරයට ක්‍රමයෙන් වේගය වැඩි කරමින් උඩ පැනීම
  * ඉර පායාගෙන එන විට මලක් පිපීගෙන එන ආකාරය,ඉර බැසගෙන යන විට මල ක්‍රමයෙන් පරවීගෙන යන ආකාරය පෙන්වීම
* සිසුන් වැස්ස හා සුළඟ ලෙස සිසුන් කණ්ඩායම් කර 'වැස්ස වහිනවා' ලෙස පැවසූ විට 'වැස්ස' කණ්ඩායමත්, 'සුළං හමනවා' යැයි පැවසූ විට 'සුළඟ' කණ්ඩායමත් ඊට අදාළ චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදීමට යොමු කරන්න.
* කණ්ඩායම් මාරු කරමින් ඉහත අවස්ථා නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 8 :**

* 'බැලුන් රොකට්ටුවක්' සාදා ගැනීම සඳහා යොදා ගත හැකි ද්‍රව්‍ය කිහිපයක් රැස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. *උදා :* බැලුන්, නූල්, බීම බට, සෙලෝටේප්
* සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන ගොස් පහත දැක්වෙන ආකාරයේ බැලූන් රොකට් සෑදීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.
* පිම්බූ බැලූනයකට බීම බටයක් අලවා, බීම බටය තුළින් නූලක් යවන්න.
* රූපයේ දැක්වෙන ආකාරයට නූලෙහි දෙකෙළවර ස්ථාන දෙකකට සවි කිරීමට සලස්වන්න.
* පහත අවස්ථාවල දී බැලූන් රොකට්ටුව ගමන් කරන දිශාව පරීක්ෂා කර බැලීමට යොමු කරන්න.

  *උදා :* * බැලූනය නූල මැදට ගෙන විවෘත කෙළවර නොලිහා
  * බැලූනය නූල මැදට ගෙන විවෘත කෙළවර මුදවා
* බැලූනයේ විවෘත කෙළවර එක වර ලිහා හෝ කපා හෝ සිදුවන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
* නූලෙහි දෙකෙළවර විවිධ ආනතිවලින් සවි කර වඩා වේගවත් බැලූනය යැවිය හැකි අවස්ථාව සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
* විවිධ ප්‍රමාණයේ බැලුම් යොදා ගනිමින් ද මෙම ක්‍රියාකාරකම සිදුකර වෙනස්කම් හඳුනා ගන්න.





**ක්‍රියාකාරකම 9 :**

- සුළඟේ ආධාරයෙන් නාද නිපදවිය හැකි උපකරණ නිර්මාණය සඳහා සිසුන් යොමු කරන්න.

  *උදා :* බැලූනයකට ඉවත ලන පෑන් බටයක් සවි කිරීමෙන් හඬ නිපදවිය හැකි නළාවක් නිර්මාණය කර ගන්නා ආකාරය :

  * බැලූනයක කට තුළට පෑන් බටයක අඟලක තරම් වන ප්‍රමාණයක් දමා එය හොඳින් සවි වන ආකාරයට ගැටගසා ගන්න.

  * පෑන් බටය ආධාරයෙන් බැලුමට සුළං පුරවා ගන්න.



- පුරවා ගත් සුළං නැවත පිටතට නිකුත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- නැවත බැලුමට සුළං පුරවා නිකුත් වූ හඬ වෙනස් කරමින් සුළං පිට කිරීමට කළ හැකි දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * සුළං නිකුත් වන විවරය ඇරීම, වැසීම මඟින්

  * සුළං නිකුත් වන විවරය අඩක් ඇරීම මඟින්

  * විවිධ ප්‍රමාණයේ පෑන් බට භාවිතය මඟින්
- සිසුන් විසින් කරනු ලබන යෝජනා අත්හදා බැලීමට අවස්ථාව ලබා දෙන්න.
- පොල් කොළයක්/ගොක් කොළයක් ආදිය මගින් නළාවක් සෑදීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- හඬ විවිධාකාරයට නිකුත් කිරීම පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීමට සිසුන්ව යොමු කරන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''වළාකුලේ හපන්කම' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 10. තේමාව : අපේ යහපැවැත්ම

**නිපුණතා** : • මනා සංවිධානයකින් යුතු ව කටයුතු කිරීමෙන් තම කාර්ය සාර්ථක ව සිදු කර ගනියි.

- යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වාගෙන යෑමට කටයුතු කරයි.
- වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.
- යහපැවැත්මට අදාළ නීතිරීති පිළිගනිමින් නීතිගරුක ව හැසිරෙයි.
- යහපුරුදු පවත්වා ගැනීම සඳහා ඉවහල් වන ආකාරයේ නිර්මාණ කරයි.
- ශාරීරික සහ මානසික යෝග්‍යතාව පවත්වා ගැනීමට ඉවහල් වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරමින් යහපත් චර්යා පිළිබිඹු කරයි.

**ඉගෙනුම් පල** : • පාසලේ දී තම එදිනෙදා කටයුතු පිළිවෙළට සහ ක්‍රමවත් ව පවත්වාගනියි

- පන්ති කාමරයේ/පාසලේ දී පැවරෙන කාර්යයන් සාමූහික ව ඉටු කිරීමට දායක වෙයි.
- පාසලේ කටයුතුවල දී යහපත් හැසිරීම් ප්‍රදර්ශනය කරයි.
- පන්ති කාමර ක්‍රියාකාරකම්වල නියැළීමේ දී තමාගේ වාරය ලැබෙන තෙක් සිටියි.
- පාසලේ පොදු නීතිරීතිවලට අනුගත ව ක්‍රියා කරයි.
- සාමූහිකත්වය ඉස්මතු වන ක්‍රීඩාවල යෙදෙයි.
- යහපුරුදු අවධාරණය කෙරෙන කවි, ගී රැස් කර ගායනා කරයි.
- යහපුරුදු ප්‍රදර්ශනය වන භූමිකා රංගන ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- තම එදිනෙදා කටයුතුවල දී පිළිවෙළට හා ක්‍රමවත් ව කටයුතු කිරීමේ අවශ්‍යතාව මතු කර දැක්වීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමේ සිසුන් යොදවන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සිසුන් එදිනෙදා භාවිත කරන පොත් කිහිපයක් කණ්ඩායමේ මේසය මතට දමා එම පොත් නිරීක්ෂණයට යොමු කරන්න.
- මේවා අතරින් වැඩිපුර ම අපවිත්‍ර වී ඇති, පොඩි වී ඇති පොත් තෝරා ගන්න.
- ඒවා අතරින් හොඳින් පරිහරණය කර ඇති පොත් ද තෝරා ගන්න.
- එය අගය කරමින් මෙසේ සමහර පොත් හොඳින් පැවතීමටත්, අනෙක් පොත් එසේ නොවීමටත් හේතු කුමක් විය හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * පොත් පොඩි වී තිබීම
  * අපවිත්‍ර වී තිබීම
  * පිටකවර නොමැති වීම
  * පොත් එහෙ මෙහෙ විසි කිරීම
  * මේසය මත ඇති දූවිලි/අත්වල කුණු පොත්වල ගෑවීම
  * තෙමීම
  * පෑන්-පැන්සල්වලින් කුරුටු ගා තිබීම . . . වැනි කරුණු

- මෙසේ සමහර පොත් අපිරිසිදු වීමට හේතු විය හැක්කේ කුමන කරුණු ද යන්න පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.
- පොත්පත් හොඳින් පවත්වාගෙන යන සිසුන් හඳුනා ගෙන පන්තියේ ඉදිරියට කැඳවා ඔවුන්ගේ පොත්පත් ප්‍රදර්ශනය කරමින් ඇගයීමට ලක් කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- පන්ති කාමරයේ ඉගෙනුම් කටයුතු සිදු කිරීමේ දී ද පිළිවෙළ හා ක්‍රමවත් බව පවත්වා ගැනීමේ අවශ්‍යතාව මතු කරන්න.
- මේ සඳහා පහත සඳහන් එක් එක් කරුණක් පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
  * තමාගේ පොත් බෑගය/වතුර බෝතලය තබා ඇති ස්ථානය සහ එය ක්‍රමවත් ව තබා තිබේ ද?
  * පන්ති කාමරයේ එදිනෙදා සිසුන් පරිහරණය කරන ලී බඩු හා උපකරණ පිළිවෙලකට තබා තිබේ ද ?
  * දෛනික ව භාවිත කරන ඉගෙනුම් උපකරණ තබා ඇති ස්ථාන හා ඒවා තබා ඇති අයුරු නිවැරදි ද ?
- මේවා පිළිවෙළට සහ ක්‍රමවත් ව පවත්වා ගෙන යන්නේ ද යන්න විමසා බලන්න.
- මෙවැනි ස්ථාන පිළිවෙළට හා ක්‍රමවත්ව පවත්වා ගැනීම හේතුවෙන් තම පන්ති කාමරය ප්‍රසන්න ස්ථානයක් වන බව ද අලංකාර වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- ඒ තුළින් ඉගෙනුමට ප්‍රිය පරිසරයක් ඇති වන බව ද පැහැදිලි කරන්න.
- තම පන්තිය දිනපතා පිළිවෙළට ක්‍රමවත් ව පවත්වාගෙන යාමට සිසුන් යොමු කරමින් එම කාර්යවල නියැළෙන සිසුන් නිරන්තර ඇගයීමට ලක් කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- පන්තියේ/පාසලේ කටයුතුවල දී සිසුන් දක්වන යහපත් හැසිරීම් පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා සිසුන්ව පහත සඳහන් ක්‍රියාකාරකමේ යොදවන්න. සිසුන්ට තමන් කැමැති යහළුවකු (එක් යහළුවකු පමණක්) තෝරාගෙන සිසු යුගල වශයෙන් වෙන් කරන්න.
- එසේ හඳුනා ගැනීමෙන් පසු ව එම යහළුවා තුළ ඇති යහපත් ගුණාංගයක් බැගින් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න.
- මේ අන්දමින් සියලු ම දෙනාගේ අදහස්වලට සවන් දෙන්න. ඒවා එකිනෙක ගුරුතුමිය විසින් කළු ලැල්ලේ සටහන් කරන්න

  *උදා :* * මගේ යහළුවා උදෙන් ම පාසල් එනවා.

  * එයා මට පාඩම් වැඩවල දී උදවු කරනවා.
- සිසුන්ගේ තෝරා ගැනීම්වලට අමතර ව සිසුන් විසින් පවත්වාගත යුතු යහපත් චර්යා ලෙස පහත සඳහන් කරුණු උදාහරණ ලෙස ගෙන හැර දක්වමින් තව දුරටත් පැහැදිලි කිරීම් කරන්න.
- මෙහි දී මතු කරන කරුණු අතරින්,
  * පන්තියේ දී පැවරෙන වැඩක් හොඳින් ඉටු කිරීම.
  * ගුරුවරුන්ට සහ පාසලේ සේවය කරන අනෙකුත් පිරිසට ගෞරවයෙන් යුතුව කටයුතු කිරීම.
  * යහළුවකු හෝ වෙනත් කෙනෙකු හෝ උදවුවක් ඉල්ලූ විට එය තමාට හැකි අයුරින් සහය වීම.
  * තවත් කෙනකු සමඟ කතාබහ කිරීමේ දී සංයමයෙන් යුතු ව කතා කිරීම.
- මෙවැනි ගුණාංගවලින් යුතු සිසුන් සිටින පන්ති කාමරයක්/පාසලක් වන බව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- යහපත් දරුවකු විසින් පවත්වා ගත යුතු හොඳ ගුණාංග මතුවන සරල කවි, ගී කිහිපයක් සපයා ගන්න.

  *උදා :* * සිරිමත් කවි
  * සිරිත් මල්දමේ කවි

- මේවා අතරින් කවි, ගී කිහිපයක් තෝරා ගෙන ඒවා ගායනා කරමින් ඒවායෙහි මතු කර දක්වෙන ගුණාංග පිළිබඳ ව කතා බහ කරන්න.
- පසු ව ඒවා සිසුන් සමඟ ගායනා කරන්න.
- සිසුන් ගීත, කවි ගායනා කරන අතර ඒවා පටිගත කර ගන්න. නැවත එම පටිගත කළ කවි, ගී සිසුන්ට ඇසීමට සලස්වන්න.
- තෝරා ගත් කවි අතරින් කිහිපයක් ප්‍රදර්ශනය කිරීමට සුදුසු පරිදි විශාල ප්‍රමාණයෙන් කාඩ්පත් කිහිපයක ලියා සකස් කර ගන්න.
- ඒවා පාසලේ සුදුසු ස්ථානවල සවි කර ප්‍රදර්ශනය කරන්න.
- මෙම කවිවලින් කියවෙන කිසියම් ගුණාංගයක් චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- මෙම කවි සුදුසු පරිදි තෝරා ගනිමින් දිනපතා එවැනි කවියක් හෝ ගීතයක් ගායනා කර පන්තියේ වැඩ කටයුතු ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- පාසලේ එදිනෙදා කටයුතුවලට සම්බන්ධ සිසුන් විසින් පවත්වා ගත යුතු සරල නීති රීති කිහිපයක් හඳුනා ගන්න.

  *උදා :* * නියමිත වේලාවට පාසලට පැමිණිය යුතු බව
  * නියමිත වේලාවට කලින් පාසලින් පිට නොවිය යුතු බව
  * අන් සතු දේ නොගැනීම
  * ගුරුවරුන්ගේ උපදෙස්වලට කීකරු විය යුතු බව
  * පාසලේ ඇති දේපළවලට/සම්පත්වලට හානි නොකිරීම වැනි කරුණු

- මෙවැනි නීති රීති පවත්වා ගැනීම මගින් අපට හා පාසලට අත්වන වාසිදායක තත්ත්ව පිළිබඳ ව කතාබහ කරන්න.

  *උදා :* * ප්‍රශංසා ලැබීම
  * පාසලට අන් අයගේ ප්‍රශංසා ලැබීම
  * සිසුන්ව අන් අය අගය කිරීම


- අනතුරු ව ඉහත නීති රීති ඇසුරින් පන්ති කාමරයේ/පාසලේ ප්‍රදර්ශනය සඳහා සුදුසු පත්‍රිකා කිහිපයක් සකස් කර ඒවා පාසලේ/පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

  *උදා :* * අන්සතු දේ නොගනිමු.
  * සීනුවට අවනත වෙමු.
  * පාසලට නියමිත වේලාවට පැමිණෙමු.
  * ගුරුවරුන්ට කීකරු වෙමු.

- මෙම ක්‍රියාකාරකම ආශ්‍රයෙන් යහපත් හැඟීම් පවත්වා ගැනීම සෑම සිසුවකුට ම පොදු විය යුතු බව තවදුරටත් මතු කර දක්වන්න.

**ක්‍රියාකාරකම 6 :**


- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න
- සිසුන් ඉඩ ඇති ස්ථානයකට කැඳවා රූප සටහනේ දැක්වෙන පරිදි පොළොවේ කලාප කිහිපයක් ඉරි ඇඳ වෙන් කර ගන්න.
- එම තීරු ඉදිරියෙන් රූප සටහනේ දැක්වෙන ආකාරයට සිසුන් පේළි ආකාරයට සිටුවන්න.
- පේළි ඉදිරියෙන් රැඳවීමට කොඩි කිහිපයක් ද සපයා ගන්න.




- සිසු කණ්ඩායම් රූපයේ දැක්වෙන ආකාරයට පේළියට සිටුවන්න.
- සිසුන් ඉදිරියේ ලකුණු කර ඇති ස්ථානයේ ලොකු බෝලයක් තබන්න.
- ගුරුවරයාගේ සංඥාවකට අනුව පේළිවල සිටින පළමු සිසුවා ඉදිරියට පැමිණ බෝලයට පයින් ගසමින් ඉදිරියේ සිටුවා ඇති කොඩිය දක්වා බෝලය ගෙන යා යුතු ය.
- මෙසේ යාමේ දී තම සීමාවෙන් පිටතට බෝලය යා නොදී එය රැක ගත යුතු අතර එසේ සීමාවෙන් පිටතට බෝලය ගියහොත් ඔහු/ඇය ක්‍රීඩාවෙන් ඉවත් විය යුතු ය.
- අනතුරු ව ඔහු/ඇය තම බෝලය ආරම්භක ස්ථානයේ තබා පෝලිමේ පිටුපසින් වාඩි විය යුතු වේ.
- මීළඟට පේළියේ දෙවන සිසුවා බෝලය ළඟට පැමිණ පෙර සිසුවා මෙන් පයින් ගසමින් කොඩිය වෙතට බෝලය ගෙන යා යුතු වේ.
- මේ අයුරින් සියලු සිසුන් ක්‍රීඩාවේ යෙදෙන පරිදි ක්‍රීඩාව පවත්වාගෙන යා යුතු අතර ඉක්මනින් තරගය අවසන් කරන කණ්ඩායම ජයග්‍රහණය ලබයි.

**ක්‍රියාකාරකම 7**

- සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන් කණ්ඩායම් 4කට වෙන් කරන්න.
- රූප සටහනේ දැක්වෙන පරිදි එක් එක් කණ්ඩායමකට කලාප වෙන් කර ඉරි ගසා ගන්න.




- කලාප මැද රවුමක් ඇඳ එය ජය කණුව ලෙස සිසුන්ට හඳුන්වා දෙන්න.
- එක් එක් කලාපයේ සිසුන් සිටිය යුතු ස්ථාන අම්බිලි රූප අඳිමින් සටහන් කර ගන්න.
- සෑම කණ්ඩායමකට පිටු පස කෙළවරේ සිටින සිසුවාට බෝලය බැගින් ලබා දෙන්න.
- ගුරුවරයාගේ සංඥාවකට අනුව දෙවන රූපයේ ඊතලවලින් දක්වා ඇති ආකාරයට අනුව බෝලය එකිනෙක සිසුවා වෙත ඉහළින් යොමු කළ යුතු ය.
- සිසුවකු අතින් බෝලය ගිලිහී ගියහොත් එම කණ්ඩායමේ ආරම්භක සිසුවා සිට තරගය නැවත ආරම්භ කළ යුතු වේ.
- බෝලය අවසන් වරට ලබා ගත් කලාපයේ ජය කණුව ආසන්නයේ ම සිටින සිසුවා එය ජය කණුව වෙත හැකි ඉක්මනින් ගෙන ආ යුතු ය.
- ඉක්මනින් ජය කණුව වෙත බෝලය ගෙන එන කලාපයේ කණ්ඩායම ජයග්‍රහණය ලබයි.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපේ කැලේ ඉස්කෝලේ, උඩ ගිය සරුංගලේ, තනි වූ කුරුලු පැටියා' කතා මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 11. තේමාව : අපට ඕනෑ දේ ලැබෙන හැටි

**නිපුණතා** :
- අවශ්‍ය අවස්ථාවල දී අපට උදවු ලබාදෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
- වෙළඳසැලක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.
- තමාට ලැබුණ දේ අන්‍යයන් සමඟ බෙදාහදා ගැනීමේ හැකියාව පවත්වා ගනියි.
- අපට අවශ්‍ය දේ අපට ම නිෂ්පාදනය කරගත හැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.
- එදිනෙදා අවශ්‍ය දෑ විවිධ ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරයි.
- ශාරීරික යෝග්‍යතා වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- අපට ඕනෑ දේ ලබාදෙන ස්ථානවලින් සිදු කරන කටයුතු වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- එදිනෙදා අපගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට උදවු ලබා දෙන අය කෙරෙහි යහපත් අයුරින් කටයුතු කරයි.
- වෙළෙඳ පොළක දී අප කටයුතු කළ යුතු අයුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- පන්ති කාමර කටයුතුවල දී ගත යුතු දේ අන් අය සමඟ බෙදාහදා ගැනීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි.
- එදිනෙදා අවශ්‍යවන සමහර දේ තමා විසින් ම සකස් කර ගනියි.
- මැහුම් සම්බන්ධ මූලික හුරුකම් ලබයි.
- විවිධ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් උලැඟිතා වර්ධනයට උපකාරීවන ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- වෙළෙඳ පොළකින් ඉටු කරන කාර්ය හා සම්බන්ධ භූමිකා රංගන ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- අපට එදිනෙදා ජීවත් වීමේ දී අවශ්‍ය වන විවිධ දේ පිළිබඳ ව සිසුන් සමග සාකච්ජාවක් සිදු කරන්න.
  *උදා :* ජලය, විදුලිය, ආහාර ද්‍රව්‍ය
- මෙම අවශ්‍යතා අපට ලැබෙන ආකාර පිළිබඳ ව සිසුන් සමග කතාබහ කරන්න.
  *උදා :* * නිවසෙන් ලබා ගත හැකි ඒවා
  * වෙළෙඳ පොලෙන් මිලට ගත හැකි ඒවා
  * වෙනත් ආයතන මඟින් ලබා ගත යුතු ඒවා
- නිවසේ නිෂ්පාදනය නොකරන එනමුදු බාහිරින් අපගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට උදවු ලබා දෙන පුද්ගලයන්/ආයතන හඳුනා ගන්න.
  *උදා :* * එදිනෙදා අවශ්‍යතා සපයා ගන්නා සමීප වෙළෙඳ සැල්
  * ජලය, විදුලිය වැනි සේවා සපයන ආයතනවලින් නිවසට පැමිණෙන අය
- මෙම අවශ්‍යතා නොමැති වුවහොත් ඇති වන තත්ත්ව පිළිබඳ මෙම කතා බහේ දී අවධානය යොමු කරන්න.
- ඒ අනුව ඔවුන් කෙරෙහි යහපත් හැඟීමෙන් යුතු ව කටයුතු කළ යුතු බව පෙන්වා දෙන්න.
  *උදා :* * සුහද ව කතාබහ කිරීම
  * ඉවසීමෙන් යුතු ව කටයුතු කිරීම (වෙළෙඳ සැලකින් බඩු මිල දී ගැනීමේ දී)
- මෙවැනි හැසිරීම් පවත්වා ගැනීමෙන් අපට උදවු කරන එම පිරිස් තුළ අප කෙරෙහි විශ්වාසයක් , පැහැදීමක් ඇතිවන බවත් එම නිසා එවැනි පුද්ගලයන් ඉතා කැමැත්තෙන් අපට උදවු කිරීමට පෙලඹෙන බවත් පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- බඩු ගැනීමට වෙළෙඳ පොළට ගොස් ඇති අය කවුරුන් දැයි සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් කිහිප දෙනෙකු සමඟ ඔවුන් ලද අත්දැකීම් කතාබහ කරන්න.
- බඩු මිලදී ගැනීමට වෙළෙඳ පොළට යන විට රැගෙන යන්නේ මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

*උදා :* * බඩු ලැයිස්තුව
* මුදල්
* බෑග්/මලු


- සමහර තැනැත්තන් බඩු මිලදී ගැනීම සඳහා වෙළෙඳ පොළට යාමේ දී බෑග් මලු රහිත ව යන බව පෙන්වා දෙන්න.
- එසේ සූදානමක් නොමැති ව යාමෙන් පරිසරයට අහිතකර ඉටි උර/සිලි බෑග් (Shopping bag) වැනි බොහෝ දේ නිවසට රැගෙන ඒමට සිදු වන බව අවධාරණය කරන්න.
- පොලිතින් භාවිතය නිසා පරිසරයට සිදු වන අයහපත් තත්ත්ව පිළිබඳ ව ද මෙහි දී කතාබහ කරන්න.

*උදා :* * පොලිතින් ඉක්මනින් දිරායන ද්‍රව්‍යයක් නොවීම.
* පසට වස විස එකතු වීම හා පස නිසරු වීම.
* පොලිතින් අනිසි ලෙස බැහැර කිරීම හේතුවෙන් කාණු වැනි ස්ථාන හිර වීම නිසා ගං වතුර තත්ත්ව ඇති වීම හා මදුරුවන් බෝවීම
* පරිසරය අවලස්සණ වීම . . . වැනි

- ඒ අනුව පොලිතින් භාවිතය අවම කිරීම කළ යුතු බවත් ඒවා නිසි අයුරින් බැහැර කිරීම කළ යුතු බවත් පෙන්වා දෙන්න.
- වෙළෙඳපොලේ දී හැසිරිය යුතු අයුරු පිළිබඳ ව පහත සඳහන් කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරමින් කතා බහ කරන්න.
  * තමාගේ වාරය එන තුරු සිටීම.
  * බඩු මිල දී ගන්නා අනෙක් අයට හිරිහැරයක් නොවන ආකාරයෙන් හැසිරීම.
  * තම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විම.
  * මිල දී ගන්නා භාණ්ඩ සහ තමා සතු මුදල්වල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විම.
- භාණ්ඩ මිල දී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව ද සිසුන් සමග කතා බහ කරන්න.
  * පිළිවෙළකට අසුරා ඇති භාණ්ඩ අවුල් නොකිරීම.
  * සංයමයෙන් යුතු ව භාණ්ඩ තෝරා ගැනීම.
  * භාණ්ඩ තේරීමේ දී ඒවාට හානි නොකිරීම.
  * මුදල් ලබා දීම සහ ඉතිරි මුදල් නිවැරදි ව ලබා ගැනීම.
- සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා පන්තියේ සිඟිති පොළක් පවත්වන්න.
- මෙහි දී ඉහත සාකච්ඡාවට ලක් කළ කරුණු පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරන්න.
- වෙළෙඳ පොළක් පිළිබඳ සිසු අත්දැකීම් චිත්‍රයට නැඟිමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. අගයන්න.


**ක්‍රියාකාරකම 3 :**

- තමා මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් මැහුම් පිළිබඳ මූලික හුරුකම් ලබා දීමට පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා සැම සිසුවකුට ම පහත සඳහන් ද්‍රව්‍ය සපයා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.
- නූල්, සෙ.මී. 15x 15 ප්‍රමාණයේ රෙදි කැබැල්ලක් (මුද්‍රිත නොවන) ටැපැස්ට්‍රි ඉඳිකටුවක් (මෙය තුඩ මොට ඉඳිකටුවකි. )
- රූප සටහනේ දැක්වෙන පරිදි රෙදි කැබැලිවල ඉරි කිහිපයක් සටහන් කරන්න.
- එම ඉරි මත නූල් දිවවීමට සිසුන් යොමු කරන්න.



**ක්‍රියාකාරකම 4 :**

- එදිනෙදා අවශ්‍යතා සඳහා විවිධ ප්‍රමාණයේ කවර සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය රැස් කර ගන්න.
  - * $A_4$ ප්‍රමාණයේ කඩදාසි (සැම සිසුවකුට ම 1 බැගින් වන සේ)
  - * ගම්
  - * කතුරු
  - * දියර වර්ණ
  - * සීල් මුද්‍රණය සඳහා සුදුසු ද්‍රව්‍ය
- සැම සිසුවෙකුට ම කඩදාසි කොළයක් බැගින් ලබා දෙන්න.
- එහි එක් පැත්තක දියර වර්ණ යොදා ගනිමින් සිසුන්ට රිසි පරිදි සීල් මුද්‍රණය කිරීමට යොමු කරන්න.
- සිසුන් නිර්මාණය කළ සීල් මුද්‍රණ සහිත කඩදාසි හොඳින් වියළා ගන්න.
- පහත රූපයේ දැක්වෙන පරිදි කවරයක් සකස් කිරීමට සුදුසු ආකෘතියක් (BLOCK) ගුරුතුමිය විසින් ඝනකම කඩදාසි ආශ්‍රයෙන් සකස් කර ගන්න.



- එම ආකෘතිය යොදා ගනිමින් එම හැඩයට තමා සීල් මුද්‍රණය කල කඩදාසි කපා ගැනීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පසුව කඩඉරිවලින් වෙන්කර පෙන්වා ඇති කොටස් නවා, අලවා කවරයක් ආකාරයෙන් සකස් කර ගන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- තමන් සතු දේ අන් අය සමඟ බෙදාහදා ගැනීම, අන් අයට උදවු උපකාර කළ අවස්ථා දැක්වෙන කතාවක් හෝ සිද්ධියක් හෝ සිසුන්ට ඉදිරිපත් කරන්න.


  *උදා :* * ජාතක කථා හෝ වෙනත් කථා හෝ සම්බන්ධ සිසු අත්දැකීම් ඉදිරිපත් කිරිමට අවස්ථාව සලසන්න.

  * කෑම ගෙනැවිත් නැති අයකුට කෑම දීම
  * පැන්සලක්/මකනයක් නැති මිතුරකුට තමා සතුව වැඩිපුර ඇති පැන්සලක්/මකනයක් ලබා දීම

- පසු ව මේ ආකාරයට අන්‍යයන් සමඟ තමා සතු දේ බෙදා හදා ගැනීමේ වැදගත්කම පිළිබඳ ව කතාබහ කරන්න.
- මෙහි දී පහත සඳහන් කරුණු ද මතුකර දක්වන්න.
  * සුහදතාව වර්ධනය වීම
  * අන්‍යයන්ට උදවු කිරීමෙන් සතුටක් ඇති වීම
  * ඇගයීමට ලක් වීම . . . වැනි
- 'මේ ගසේ බොහෝ - පැණි දොඩම් තිබේ' කවිය සිසුන්ට සිහිපත් කරවන්න. ඒ කවියේ අර්ථය ද මනා ව පහදා දෙන්න.
- මෙවැනි තවත් කවි ගී සොයා ගෙන ඒවායේ අර්ථය පහදා දෙමින් ඒවා ගායනා කරමින් සිසුන් තුළ එම ගුණය තව දුරටත් තහවුරු කර ගත යුතු බව පෙන්වා දෙන්න.
- එසේ හැසිරීමෙන් සුන්දර, සාමකාමී පරිසරයක් රටක ගොඩනැඟෙන බව ද පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- උලැඟිතා වර්ධනයට උපකාරි වන ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය රැස් කරගන්න.
  * පාට කරන ලද වතුර දැමූ සමාන ප්‍රමාණයෙන් ප්ලාස්ටික් බෝතල කිහිපයක්
  * තරමක් විශාල බෝල දෙකක්
- පන්තියේ සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන් සමාන කණ්ඩායම් දෙකකට වෙන් කර රූප සටහනේ පෙනෙන පරිදි සිටුවන්න.




- කණ්ඩායම් දෙකේ පළමු සිසුවාට බෝලය බැගින් ලබා දෙන්න.
- ගුරුවරිය ලබා දෙන සංඥාවකට අනුව කණ්ඩායම් දෙකේ පළමු සිසුවා තමා ඉදිරියේ ඇති බෝතල අතරින් ඊතලවලින් පෙන්නුම් කර ඇති ආකාරයට අක්වක් ලෙස දිව ගොස් නැවත තම පේළියේ දෙවන සිසුවාට බෝලය ලබා දිය යුතු ය.
- නැවත බෝලය ලබා ගත් පේළියේ දෙවන සිසුවා පළමු සිසුවා මෙන් ක්‍රියා කරමින් පේළියේ ඊළඟ සිසුවාට බෝලය ලබා දිය යුතු ය.
- මේ අයුරින් පේළියේ අවසන් සිසුවා තෙක් තරගය පවත්වන්න.
- ජයග්‍රාහී කණ්ඩායම අගයන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපි විතරද'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 12. තේමාව : ගමන් බිමන්

**නිපුණතා** :
- ගමන්බිමන්වල දී නිවැරදි ඉරියවු පවත්වා ගනියි.
- පොදු ගමනාගමන සේවා පිළිබඳ ව දැනුම්වත් වෙමින් ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කරයි.
- ගමන් බිමන් යාමේ දී විය හැකි බාධක හා අනතුරු පිළිබඳ විමසිලිමත් ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.
- ගමන් බිමන්වල දී අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ව කටයුතු කරයි.
- ගමනාගමන ක්‍රම විවිධ මාධ්‍ය මඟින් නිර්මාණය කරයි.
- ගමන් කිරීම හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- විවිධ ගමන් විලාස ඇසුරෙන් නිර්මාණාත්මක රංගන ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- ශාරීරික සමබරතාව පවත්වා ගනිමින් දෛනික කටයුතුවල යෙදෙයි.
- බර එසවීම හා සම්බන්ධ නිවැරදි ඉරියවු පවත්වා ගනියි.
- වාහනයක ගමන් කිරීමේ දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- වාහන සහ මාර්ග පොදු දේපළක් ලෙස ආරක්ෂා කිරීමට කටයුතු කරයි.
- ගමන් බිමන් යෑමේ දී ඇති විය හැකි බාධකවලින් හා අනතුරුවලින් ආරක්ෂා වීමට ක්‍රියා කරයි.
- විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් වාහනවල ආකෘති නිර්මාණය කරයි.
- චාලක ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ශරීරයේ සමබරතාව පවත්වා ගනියි.
- විවිධ ගමන් විලාසවල රිද්ම ඇසුරින් නිර්මාණාත්මක චලන ක්‍රියාකාරකම්වල යෙදෙයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- සිසුන් ඉඩ ඇති ස්ථානයකට ගෙන ගොස් සිසුන් එකිනෙකාගේ අතේ දුරින් සිට ගැනීමට යොමු කරන්න.
- අනතුරු ව තනි පාදයෙන් සිට ගනිමින් දෑත් විවිධ අයුරින් හසුරුවමින්, සමබරතාව රැක ගැනීමට යොමු කරන්න.
  *උදා :* දෑත් ඉදිරියට දිගු කර තනි පාදයෙන් මඳ වේලාවක් සිට ගැනීමට සැලැස්වීම
- මේ අයුරින් පාද මාරු කරමින් මෙම ක්‍රියාකාරකම තව දුරටත් සිදු කරන්න.
- මෙම ක්‍රියාකාරකම් සමඟ සමබරතාවේ වැදගත්කම කතාබහ කරන්න. සමබරතාව නොමැති වුවහොත් අපට කුමක් සිදුවේ ද යන්න අවධානයට යොමු කර, අදහස් ලබා ගන්න. මේ අනුව සමබරතාව නොමැති නම් එදිනෙදා ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි බව පැහැදිලි කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී පුද්ගලයෙකු සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ ව කතාබහ කරන්න.
  *උදා :* * ළිඳෙන් ජලය ඇදීම
  * පඩි පෙළක් නැඟීම
  * ගේ දොර අතුපතු ගෑම
- මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී තම ශරීරය විවිධ අයුරින් ඉරියවු වෙනස් කරන බව පැහැදිලි කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී සිදු කරන ක්‍රියාකාරකම් කිහිපයක් සිසුන්ට ආදර්ශනය කිරීමට සලස්වා ශරීරයේ ඉරියවු වෙනස් වන අයුරු හඳුනා ගැනීමට සලස්වන්න.

- වැරදි ඉරියව්වල යෙදීම නිසා ශරීරයට විවිධ ආබාධ හා අනතුරු විය හැකි බව පැහැදිලි කරන්න. එසේ විය හැකි ආබාධ අනතුරු මතු කරමින් ඒ පිළිබඳ ව කථා කරන්න.
- සිසුන් කිහිප දෙනෙකු වෛද්‍යවරුන් වශයෙන් ද, අනෙක් සිසුන් වැරදි ඉරියව්වල කටයුතු කිරීම නිසා රෝගී වූ අය වශයෙන් ද හැසිරෙමින් වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට පැමිණෙන ආකාරය පෙන්නුම් කරන අනුකරණ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- අවශ්‍ය නම් සම්පත් පුද්ගලයකුගේ සහය ලබා ගනිමින්, එදිනෙදා කටයුතුවල දී ශරීරය නිවැරදි ඉරියව්වලින් තබා ගන්නා අයුරු පිළිබඳ ආදර්ශනය කරමින් පැහැදිලි කරන්න.
- මේ අනුව එදිනෙදා කටයුතුවල දී නිවැරදි ඉරියව්වල පිහිටා සමබරතාව රැක ගනිමින් කටයුතු කළ යුතු බව සිසුන්ට තහවුරු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- එදිනෙදා කටයුතු කිරීමේ දී යම් යම් ද්‍රව්‍ය එසවීමට හා ඒවා රැගෙන යාමට සිදුවන බව කථා කරන්න. සාකච්ඡා කළ කරුණු හා සිසු අත්දැකීම් ඇසුරින් යම් යම් ද්‍රව්‍ය එසවීම හා ගෙන යෑම සම්බන්ධ භූමිකා නිරූපණයන් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* * උදැල්ලක් කර තබාගෙන යන අයුරු
  * යම් බරක් හිස මත/කර මත තබාගෙන යන අයුරු
  * යම් බරක් එල්ලාගෙන යන අයුරු
  * වතුර කළයක් ඉණෙහි තබාගෙන යන අයුරු
- බර එසවීමේ දී හා ගෙන යාම්වල දී ශරීරයේ හිස/කර/ඉණ/දෑත් ආදිය ප්‍රයෝජනයට ගන්නා අයුරු පැහැදිලි කරන්න.
- ඒ අනුව වැරදි එසවීම් හා ගෙන යෑම හේතුවෙන් ශරීරයට විය හැකි ආබාධ හඳුනා ගන්න.

  *උදා :* * වැරදි ඉරියව්වෙන් සිටිමින් බර එසවීම හේතුවෙන් ශරීරයේ කොන්ද ආබාධ සිදුවීම.
  * වැරදි ලෙස බර ගෙන යාම හේතුවෙන් පුද්ගලයකුගේ බෙල්ල ප්‍රදේශයට ආබාධ සිදුවීම.
- අනතුරුව නිවැරදි ඉරියව්වල සිටිමින් බර එසවීම හා බර ගෙනයෑම පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.
- අවශ්‍ය නම් සම්පත් පුද්ගලයකුගේ සහය ලබා ගනිමින් නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරන්න. සිසුන්ට ද ඒවා ආදර්ශනය කරවීමට සලස්වන්න.

**ක්‍රියාකාරකම 3**

- ගමනාගමනය හා සම්බන්ධ පොදු හා පොදු නොවන දේපළ හා සම්බන්ධ වාහනවල සෙල්ලම් බඩු පින්තූර කිහිපයක් පන්ති කාමරයට රැස්කර ගන්න.

  *උදා :* * බස්/ලොරි/කාර්/බයිසිකල්/දුම්රිය ආදිය
- පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් මෙම වාහන පොදු හා පෞද්ගලික දේපළ වශයෙන් වාහන වෙන් කර ගත හැකි දැයි හඳුනා ගන්න.
  * සෑම පුද්ගලයෙකුට ම නිදහසේ ගමන් බිමන් යා හැකි වාහන මොනවා ද?
  * පොදු වාහන මොනවා ද?
  * යම් කාල සටහනකට ධාවනය කරන වාහන තිබේ ද ? ඒවා මොනවා ද ?
  * ගාස්තුවක් අයකර මගීන් ගෙන යන වාහන මොනවා ද ?
  * වාහන නතර කර තබන ස්ථාන අනුව පොදු හා පෞද්ගලික වශයෙන් වාහන වෙන් කළ හැකි ද ?
- පෞද්ගලික මාර්ගයක් හා පොදු මාර්ගයක් නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- මෙම දෙක අතර ගමන් කිරීමට තිබෙන නිදහස/අයිතිය මේ මාර්ගවල පහසුකම් ආදි කරුණු යටතේ මාර්ග දෙකෙහි වෙනස්කම් තිබේ ද යන්න සොයා බලන්නට සිසුන් යොමු කරන්න.

- පොදු වාහන දුම්රිය/බස්රිය ආදිය හා පොදු මාර්ග නොමැති වුවහොත් අපට සිදුවිය හැකි දුෂ්කරතා පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.

  *උදා :* පොදු වාහන නොමැති වුවහොත්,

  * පයින් ගමන් කිරීමට සිදුවන බව,
  * ඒ අනුව අපගේ එදිනෙදා කටයුතු අඩපණ වන බව
  * පාසල් යාමට දුෂ්කරතා ඇති වන බව
  * අනතුරු ආදිය සිදුවීම/අනාරක්ෂිත වීම

  පොදු මාර්ග නොමැති වුවහොත් ,

  * ගමන් බිමන් යෑමේ දී දුෂ්කරතා වීම
  * අනතුරු හා අනාරක්ෂිත බව
  * වාහන ගමන් කිරීමට අවස්ථා නොමැති වීම

  වැනි කරුණු සාකච්ඡා කරන්න.

- මේ අනුව පොදු වාහන හා පොදු මාර්ග අපේ සම්පත් බවත්, ඒවා රැකගැනීම සිදු කළ යුතු බවත් පැහැදිලි කරන්න.

- පොදු මාර්ග හා වාහන හානියට පත්වන අවස්ථා පිළිබඳ ව සිසු අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කරන්න.

  *උදා :* * මාර්ගවල ගල් ගැලවීම
  * මාර්ගවල සෙල්ලම් කිරීම
  * පොදු වාහනවලට ගල් ගැසීම
  * බස් රථවල අසුන් ඉරා තිබීම

  වැනි කරුණු මතු කරමින් මිනිස් ක්‍රියා මගින් ඒවාට හානි වන අවස්ථා අවධාරණය කරන්න.

- පොදු දේපළ රැකගත හැකි අයුරු පිළිබඳ ව සිසු අවධානය යොමු කරවන්න.

- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන්කර පොදු වාහන හා පොදු මාර්ග රැක ගැනීම සඳහා සිදු කළ හැකි දේවල් පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට යොමු කරන්න.

  *උදා :* * පොදු මාර්ගවලට කසළ නොදැමීම
  * පොදු මාර්ගවල අනතුරුදායක අනාරක්ෂිත දේවල් ඇතොත් ඉවත් කිරීම
  * පොදු මාර්ගවල සෙල්ලම් නොකිරීම
  * තමා ඉවත ලන ද්‍රව්‍ය මාර්ගවලට බැහැර නොකිරීම
  * පොදු වාහනවල අපවිත්‍ර නොකිරීම

- පාසලේ පොදු මාර්ගය අපවිත්‍ර වී ඇති ස්ථානයක් හඳුනා ගන්න. එය පවිත්‍ර ව තබා ගැනීම සඳහා කළ හැකි දේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එම හඳුනා ගත් කරුණු ක්‍රියාවට යොමු කර පොදු දේපළ රැක ගැනීම පිළිබඳ ආකල්ප ජනනය කරවන්න.

**ක්‍රියාකාරකම 4**

- ගමන් බිමන් යෑමේ දී විය හැකි බාධක හා අනතුරු පිළිබඳ ව රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි මාධ්‍යවල ප්‍රවෘත්ති විකාශනවලට සවන් දී හෝ නිවසේ දී වැඩිහිටියන් සමඟ සාකච්ඡා කර හෝ අදාළ තොරතුරු කිහිපයක් පන්තියට රැගෙන ඒමට සිසුන් යොමු කරන්න.

- එම තොරතුරු ඇසුරින් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න. ඒ අනුව ගමන් බිමන් යෑමේ දී විය හැකි අනතුරු හා අපහසුතා හඳුනා ගන්න.

  *උදා :* * ගමන් බිමන් යෑමේ දී විය හැකි බාධක
  * බස් රථය අතරමග දී ක්‍රියා විරහිත වීම
  * බස් රථයක් නොමැති වීම හේතුවෙන් ගමන ප්‍රමාද වීම.
  * මාර්ගය ගංවතුරින් යට වී තිබීම.
  * මාර්ගයේ සතුන් (අලින්/හරකුන්/බල්ලන්) සිටීම.
  * බෝතල් කටුවකට පාදය කැපී යාම
  * බල්ලකු හපා කෑම

- බොහෝ ගමන් බිමන් අසාර්ථක වනුයේ, නිසි වේලාවට ගමන් බිමන් යා නොහැකි වන්නේ අපගේ නොසැලකිල්ල හේතුවෙන් බව පැහැදිලි කරන්න. එම බාධක හා අනතුරු වැළැක්වීමට ගත හැකි පියවර පිළිබඳව සාකච්ඡාවක් කරන්න.
- මීට අදාළ ක්‍රියාකාරකමක් සඳහා පෙට්ටි දෙකක් පන්තියේ ඉදිරියේ තබන්න. එම පෙට්ටි දෙකට ඉහත සඳහන් කළ බාධක හා අනතුරු පිළිබඳ කරුණු ද ඊට අදාළ පහත සඳහන් විසඳුම් ද පත්‍රිකාවල ලියා වෙන වෙන ම දමන්න.

  බාධකවලින් හා අනතුරුවලින් වැළකීමට ගත හැකි පියවර :

  *උදා :* * කල් වේලා ඇති ව ගමන පිටත් වීම
  * මාර්ගයේ ගමන් කරන විට වැඩිහිටියන් සමඟ ගමන් කිරීම.
  * පාරේ ගමන් කරන විට දකුණු පසින් ගමන් කිරීම
  * ආරක්ෂිත ව වාහනවල ගමන් කිරීම.
- පෙට්ටි අදකෙන් අදාළ කරුණු ඉළියට ගණිමින් බාධක අනතුරු වැළැක්වීමට ගත හැකි පියවරයන් හඳුනා ගැනීමට සලස්වන්න.
- පසු ව ඩිමයි කඩදාසියක් ගන්න. පෙට්ටිවලින් ලබා දෙන පත්‍රිකා ප්‍රයෝජනයට ගනිමින් එහි එක් කොටසක බාධක අනතුරු ද අනෙක් කොටසෙහි ඒවාට අදාළ විසඳුම් ද ගළපමින් අලවා ගන්න. මේ අනුව බාධාවලින් හා අනතුරුවලින් වැළකීමට අපට ම සිදු කළ හැකි බව පැහැදිලි කරන්න.
- බාධකවලින් හා අනතුරුවලින් මිදී ගමන් බිමන් සාර්ථක ව නිමා කිරීම සඳහා සිසු අවධානය යොමු කිරීමට කටයුතු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- වාහනයක ගමන් කිරීමේ දී නිවැරදි ඉරියවු පවත්වා ගනියි.
- මෙම ක්‍රියාකාරකම සඳහා වාහනවල ගමන් කිරීමේ දී දැකිය හැකි වැරදි ඉරියව් පිළිබඳ ව සිසු අවධානය යොමු කරවමින් සරල සාකච්ඡාවක් සිදු කරන්න.
- මේ සඳහා පහත සඳහන් පරිදි වැරදි හා නිවැරදි ඉරියව් සහිත පින්තූර/චිත්‍ර කිහිපයක් සකස් කර ගන්න.

  *උදා :* වැරදි ඉරියවු
  * පාපැදියක් එක අතකින් අල්ලා ගනිමින් පැද යන අයුරු
  * හිස/අත වැනි ශරීර අංග වාහනයකින් එළියට දමාගෙන ගමන් කරන අයුරු
  * වාහනයක නිදාගෙන ගමන් කරන අයුරු
  * ආරක්ෂිත ව යමක් අල්ලා නොගෙන වාඩි වී/සිටගෙන ගමන් කරන අයුරු
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර මේවා එකක් හෝ කිහිපයක් හෝ එම කණ්ඩායම්වලට ලබා දෙන්න. අනතුරුව මෙම අනාරක්ෂිත වැරදි ඉරියව් පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
  * පින්තූරයේ තිබෙන වැරදි ඉරියව්ව කුමක් ද යන වග
  * එම වැරදි ඉරියව්ව හේතුවෙන් ඇතිවිය හැකි අනතුරු
- මේවා පන්ති කාමරයට ඉදිරිපත් කරන්නට යොමු කරන්න. මෙහි දී භූමිකා රංගන වැනි දේ යොදාගත හැකි ය.
- මේ අනුව ගමන් බිමන් යෑමේ දී වෙනත් වැරදි ඉරියවු පිළිබඳ ව සිසු අත්දැකීම් කතාබහ කරන්න. ඒවා පන්තියට වාර්තා කිරීමට ද අවස්ථාව සලසන්න.
- ඉහත සඳහන් වැරදි ඉරියවු හේතුවෙන් විය හැකි ශාරීරික හානි පිළිබඳ ව ද සාකච්ඡා කරන්න.
- ඉහත සඳහන් ගමන් බිමන් හා සම්බන්ධ වැරදි ඉරියවුවලට ගැළපෙන නිවැරදි ඉරියවු පිළිබඳ ව සිසු අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථා සලසන්න.

- පුවත්පත්වල පළ වන පින්තූර, ඡායාරූප, රූපවාහිනී ප්‍රවෘත්ති වැනි තොරතුරු මඟින් එම හානි තව දුරටත් පැහැදිලි කිරීමට කටයුතු කරන්න.
- මෙවැනි තොරතුරු සහිත පින්තූර, ඡායාරූප, පුවත්පත්වල අනතුරු පිළිබඳ පළවන මාතෘකා ආදිය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- මේ අයුරින් ගමන් බිමන් යෑමේ දී සිදුවන වැරදි හා නිවැරදි ඉරියව් සිසුන් තුළ තහවුරු කරන්න. වර්ෂය පුරා ම විටින් විට මෙම අනතුරු හා ආරක්ෂිත ක්‍රම, නිවැරදි ඉරියව් පිළිබඳ මතක් කරමින් සිසුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- මිනිසුන් ගමන් බිමන් යන වාහන කිහිපයක් හඳුනා ගන්න.
  *උදා :* බස් රථය, ලොරිය, පාපැදිය, කරත්තය, කාරය, ලෑන්ඩ්මාස්ටරය
- මේවායේ ආකෘති නිර්මාණය කිරීම සඳහා සුදුසු මාධ්‍ය කිහිපයක් හඳුනා ගෙන එයට අවශ්‍ය ද්‍රව්‍ය පන්තියට රැස් කර ගන්න.
  *උදා :* මැටි/කාඩ්බෝඩ්/ක්ලේ/ලී කෝටු . . . ආදි වශයෙන්
- පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට සුදුසු වාහනයක් හා එහි ආකෘතියක් සෑදීම සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා දෙන්න.
- සිසුන් ලවා එකී ආකෘති සෑදීමට යොමු කරන්න.
- ඒවා සායම් යොදා අලංකාර කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 7**

- වාහන ලෙස හැසිරෙමින් ක්‍රීඩාවක නිරත වීම සඳහා පන්තියේ සිසුන් ඉඩකඩ ඇති ස්ථානයකට ගෙන යන්න.
- වාහන ලෙස හැසිරීම සඳහා සුදුසු සිසුන් කැමති වාහනයක් තෝරා ගන්නට යොමු කරන්න.
- සිසුන් සංඛ්‍යාවට ගැළපෙන පරිදි කොටුවක් පොළොවේ ඇඳ ගන්න.
- නොඑසේ නම් ලණුවක් හා කෝටු හතරක් යොදා ගනිමින් කොටුවක් ආකාරයට වට කර ගන්න.
- සිසුන් එම කොටුව තුළට යොමු කර ගුරුතුමිය විසින් දෙනු ලබන සංඥාවට අනුව ක්ෂණික ව තමන් කැමති වාහනයක් ලෙස හැසිරීමට යොමු කරන්න. එහිදී තවත් කෙනෙකුගේ ශරීරයේ ස්පර්ශ වන සිසුන් තරගයෙන් ඉවත් වන බව ද සඳහන් කරන්න.
- ක්‍රියාකාරකමේ යම් කාලයක් යෙදුණු පසු ගුරුතුමියගේ මීළඟ සංඥාවට සිසුන් ක්ෂණික ව සිටි ස්ථානයේ ම නතර විය යුතු ය. එහි දී යම් සිසුවෙක් අනෙක් සිසුවකු ස්පර්ශ කළේ නම් හෝ සිටි ස්ථානයේ නතර වීමට නොහැකි ව තව දුරටත් ගමන් කළේ නම් එම සිසුවා/සිසුන් තරගයෙන් ඉවත් විය යුතු ය.
- මේ අයුරින් කොටුව ක්‍රමයෙන් කුඩා කරමින් සෙල්ලම පවත්වන්න. අවසානයේ ඉතිරි වන කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම ලෙස සලකන්න.
- සියලු සිසුන් අගය කරන්න.

**ක්‍රියාකාරකම 8**

- පන්තියේ සිසුන් ඉඩ ඇති ස්ථානයකට ගෙන යන්න.
- සිසුන්ට ප්‍රමාණවත් අයුරින් පොළොවේ කොටු සලකුණක් ඇඳ ගන්න.
- එම කොටු සලකුණ තුළට සියලු සිසුන් යොමු කරන්න.
- සිසුන් අතරින් එක් අයකුට හෝ දෙදෙනකුට හෝ තනි පාදයෙන් පැන පැන යමින් (කුන්දෙන්) අනෙක් සිසුන්ට පහර දී ස්පර්ශ කිරීමට යොමු කරන්න.
- එසේ ස්පර්ශ කිරීමේ දී ස්පර්ශ කරනු ලැබූ සිසුවාට පෙර සිසුවා මෙන් තනි පාදයෙන් පැන පැන යමින් අනෙක් සිසුන්ට පහර දීමට සිදු වේ.  මේ අයුරින් සෙල්ලම යම් කාලයක් සිදු කරන්නට කටයුතු කරන්න.
- පහර නොකා දිගු වේලාවක් සිටි සිසුහු ජයග්‍රහණය ලබති.
- සියලු සිසුන් අගය කරන්න.

**ක්‍රියාකාරකම් 9**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- රූප සටහනේ පරිදි පොළොවේ අඳින ලද කුඩා කොටුවක රේඛා මත සිසුන් තබන්න.
- මෙම එක් එක් කණ්ඩායමට සුළං පුරවන ලද බැලුම් බෝලය බැගින් දෙන්න. ගුරුතුමියගේ සංඥාවට බැලුම් බෝලය බිම නොවැටෙන සේ රේඛාවෙන් ඇතුළට නොපැන පහර දිය යුතු ය.
- සිසුන් සිටින ස්ථානයේ සිට ම බැලුම් බෝලයට පහර දී බැලුම බිම නොවැටී කොටුව තුළ ම අහසේ තබා ගැනීමට හැකි කණ්ඩායම ජයග්‍රහණය කරයි.




- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපිම හඳුපු ගිලන් රථේ'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 13. තේමාව : එළිය (ආලෝකය) සමඟ සෙල්ලම්

**නිපුණතා** :
- ආලෝක ප්‍රභව, ආලෝකය හා ඇස අතර ඇති සබඳතාව අධ්‍යයනය කරයි.
- ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් දෛනික කටයුතුවල යෙදෙයි.
- ස්වාභාවික ව එළියඅ වෙනස් වීම් අනුව පරිසරයේ ඇති වන වෙනස්කම් සහ එළිය වෙනස් වීම් කළ හැකි අයුරු විමර්ශනය කර වාර්තා කරයි.
- අලංකරණය සඳහා ආලෝකය උපයෝගි කර ගනිමින් විවිධ නිර්මාණ කරයි.
- ස්වාභාවික ආලෝකයෙන් වන බලපෑම් පිළිබඳ විමසිලිමත් ව ඵලදායී අයුරින් ක්‍රීඩාවල යෙදෙයි.
- එළිය සමඟ සිදු කළ හැකි අභිනය මුල් කර ගත් වින්දනාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- අපට ආලෝකය ලැබෙන ආකාර ප්‍රකාශ කරයි.
- එදිනෙදා කටයුතුවල දී ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් ක්‍රියා කරයි.
- ස්වාභාවික ආලෝකයේ බලපෑම නිසා පරිසරයේ විවිධ දේවලට සිදුවන වෙනස්කම් සොයා බලයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආලෝකය විහිදීම වෙනස් කළ හැකි අයුරු හා පරාවර්තනය කළ හැකි අයුරු අත්හදා බලයි.
- සෙවණැලි යොදා ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- අලෝකය ඇසුරෙන් විවිධ රටා හා වර්ණ ගොඩනැගිම සඳහා යොදා ගත හැකි නිර්මාණ කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- යමක් දැකීම සඳහා ඇස්වල ඇති වැදගත්කම පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවාගෙන යන්න.
- සියලු ම සිසුන්ට රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වා එක් සිසුවකු රවුම මැදට කැඳවන්න.
- එම සිසුවාගේ දෑස රෙදි පටියකින් බැඳ යම් දෙයක් අතට ලබා දී එය හඳුනා ගැනීමට යොමු කරන්න.
- රවුම මැද සිටින සිසුවා සෙසු සිසුන්ගෙන් ප්‍රශ්න විමසමින් එම ද්‍රව්‍ය හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය.
- අතැති ද්‍රව්‍ය හඳුනා ගැනීමට නොහැකි වුවහොත් මඳ වේලාවකින් පසු සිසුවාගේ ඇස් නිරාවරණය කර අතැති ද්‍රව්‍ය බලා හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ ආකාරයට වෙනත් සිසුන් ද මැදට කැඳවා කිහිප වාරයක් ක්‍රියාකාරකම සිදු කරන්න.
- දෑස් බැඳි සිසුන්ගේ අතට ලබාදුන් ද්‍රව්‍ය හඳුනාගැනීමට අපහසු වූයේ ඇයි දැයි යන්න සිසුන්ගෙන් විමසන්න.
- ඒ අනුව ඇස් නොපෙනෙන විට ඇති වන තත්ත්වය පිළිබඳ ව කතාබහ කරන්න.


  *උදා* : * අවට පරිසරය දැකීමට නොහැකි බව
  * අන් අයගේ උදවු සහිත ව ජීවත් වීමට සිදු වන බව
  * ඉගෙනුම් කටයුතු අඩාළ වීම . . . වැනි

- එදිනෙදා කටයුතුවල දී ඇස්වලට හානි සිදුවිය හැකි අවස්ථා පිළිබඳව ද මෙහිදී අවධාරණය කරන්න.

  *උදා* : උල් සහිත ද්‍රව්‍යවලින්, ගින්දරවලින්, දීප්තිමත් එළියෙන්, අඳුරේ වැඩ කිරීමෙන්, විෂ සහිත දියර වර්ගවලින්
- එවැනි හානි සිදුවිය හැකි අවස්ථා/දේ වලින් ඇස් රැකගැනීමේ වැදගත්කම සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 2**

- ඉර එළිය නිසා පරිසරයේ සිදුවන වෙනස්කම් සොයා බැලීම සඳහා පහත ආකාරයේ ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න.
- සමාන ප්‍රමාණයේ මල් බඳුන් දෙකක් සපයාගෙන එම බඳුන් දෙකෙහි මුං ඇට බීජ පැළ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ජලය දමමින් මුං බීජ පැළ වන තෙක් සුදුසු ස්ථානයක තබන්න. මුං බීජ පැළ වූ පසු ඉන් එකක් හිරුඑළිය ඉහළින් ලැබෙන ස්ථානයක තබන්න.
- අනෙක් බඳුන පෙට්ටියක බහා හිරුඑළිය එක් පැත්තකින් පමණක් ලැබෙන සේ පෙට්ටියේ පැත්තකින් කවුළුවක් සකස් කර තබන්න.




- මෙම බීජවලට කුමක් විය හැකි දැයි සිසුන්ට අනුමාන කර අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දින කිහිපයකට පසු නිරීක්ෂණය කළහොත් මුං පැළවලට කුමක් සිදු වී තිබිය හැකි දැයි සිසුනට අනුමාන කර අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දින කිහිපයකට පසු එක් එක් ස්ථානයේ තැබූ මුං බීජවලට කුමක් වී දැයි නිරීක්ෂණයක් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දින කිහිපයකට පෙර අනුමාන වශයෙන් කී දේ සිදු වී ඇත් ද/නැත් ද යැයි සිතීමට සිසුන් යොමු කරන්න.
- ඉහත ආකාරයේ වෙනස්කම් හිරුඑළිය නිසා සිදු වන බව සිසුන්ට පෙන්වා දෙන්න.
- පසු ව සිසුන් සමඟ පාසල් වත්තේ චාරිකාවක යෙදෙන්න. එහිදී ශාක හිරු එළිය දිශාවට නැමී තිබේ දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න.


**ක්‍රියාකාරකම 3**

- සිසුන්ට ප්‍රමාණවත් සංඛ්‍යාවක් කුඩා තලදර්පන (කැඩපත්) ලබා දී පහත ආකාරයේ දේවල් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* * දර්පණයෙන් තමන් පෙනෙන අයුරු
  * පින්තූරයක් පෙනෙන අයුරු
  * කඩදාසියක ලියූ වචනයක් දර්පණයෙන් පෙනෙන අයුරු
- ඉහත අවස්ථා පෙනෙන අයුරු වාර්තා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- දර්පණ 2ක් සහ කුඩා ප්‍රමාණයේ වස්තුවක් රූපයේ දැක්වෙන පරිදි තබා දර්පණ දෙක අතර කෝණය වෙනස් කරමින් සිසුන්ට පෙනෙන දේ විස්තර කිරීමට අවස්ථාව දෙන්න.



- දර්පණ දෙක මුහුණට මුහුණ ලා සිටින සේ යම් දුරකින් තබා ඒ අතරින් කුඩා වස්තුවක් තබන්න.
- දර්පණවලින් පෙනෙන දේ නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- රූපයේ දැක්වෙන පරිදි සමාන ප්‍රමාණයේ දර්පණ හතරක් මුහුණත් ඇතුළු පැත්තට වන පරිදි තබා සෙලෝටේප් හෝ රෙදි පටි හෝ වෙනත් සුදුසු දෙයක් හෝ යොදා ගනිමින් සවි කර ගන්න.




- මෝස්තරයක් සහිත කඩදාසියක්/රෙදි කැබැල්ලක් බ්‍රිස්ල් බෝඩයක අලවා දර්පණ හතරෙන් සැදෙන සමචතුරස්‍රයේ ප්‍රමාණයට වඩා මඳක් විශාල ව කපා ගන්න.

- මෝස්තරය සහිත බ්‍රිස්ල් බෝඩය මේසයක් මතින් තබා දර්පණ හතර යොදා ගෙන සදා ගත් ඇටවුම සිරස් අතට තබන්න.
- දර්පණවලින් පෙනෙන දේ නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

**ක්‍රියාකාරකම 4**

- සුදු පැහැති ඝන කඩදාසියකින්/බ්‍රිස්ල් බෝඩයකින් තරමක වෘත්ත කිහිපයක් කපා (විෂ්කම්භය 10cm පමණ) එම වෘත්ත සමාන කොටස් 3කට හෝ 6කට හෝ බෙදා ගන්න.





- රූපයේ දැක්වෙන පරිදි රවුම තුළ වර්ණ ගැන්වීමට සිසුන් යොමු කරන්න.
- ඉන් පසු රවුම මැද සිදුරක් සාදා ඒ තුළින් පැන්සලක් ඇතුළු කර රවුම වේගයෙන් කරකැවූ විට දක්නට ලැබෙන දේ සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * රවුමේ තිබූ පාට ඒ ආකාරයෙන් ම පෙනෙනවා ද ? පෙනෙන්නේ වෙනස් ව ද ?

  * වෙනස් ව පෙනෙන්නේ නම් එසේ පෙනෙන පාට කුමක් ද ?

**ක්‍රියාකාරකම 5**

- විනිවිද පෙනෙන වර්ණ සෙලෝෆේන් කඩදාසිවලින් වර්ණ රාමු කිහිපයක් සාදාගන්න.




- වර්ණ රාමු පිටුපසින් විදුලි පන්දමක් අල්ලා, ඒවා එකිනෙකෙහි එළි දැකීමට අවස්ථාව ලබා දෙන්න. ඒවායින් ලැබෙන වර්ණ එළි ගැන කතාබහ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙවැනි වර්ණ රාමු දෙකක් හෝ තුනක් හෝ එක මත තබා ඇති වන වර්ණ ප්‍රභේද නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- කුඩා දර්පන කීපයක් සපයා ගන්න. එම දර්පණ සූර්යාලෝකයට යොමු කර, දර්පණවලින් පරාවර්තනය වන ආලෝකය වර්ණ රාමු වෙත යොමු කර මෙම ක්‍රියාකාරකමෙහි නිරතවීමට සිසුන්ට අවස්ථාව සලස්වන්න.

**ක්‍රියාකාරකම 6**


- එළිය විහිදීම අඩු වැඩි කිරීම පිළිබඳ අත්දැකීම් ලබාදීම සඳහා පහත ක්‍රියාකාරකමෙහි නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙවැනි ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විශාල කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ වෙනත් ආවරණයක් හෝ යොදා ගැනීමෙන් අඳුරු කළ ස්ථානයක් සකසා ගන්න.
- විදුලි පන්දමක් සපයා ගන්න.

- එම විදුලි පන්දම දල්වා එමගින් ආලෝකය විහිදෙන ආකාරය නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- විදුලි පන්දමේ හිස කොටස ගලවා බල්බය විවෘත වන සේ තබන්න. බල්බය දල්වා විහිදෙන එළිය නිරීක්ෂණය කිරීමට ද සිසුන් යොමු කරන්න.
- ගැලවූ හිස කොටස නැවත සවි කර එළිය ඈතට විහිදෙන ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- මේ අනුව ආවරණයක් යෙදීම තුළින් ආලෝකයේ විහිදීම අඩු/වැඩි කළ හැකි බව සිසුන්ට අවබෝධ වීමට සලස්වන්න.
- මේ පිළිබඳ ව තවදුරටත් අත්දැකීම් ලැබීම සඳහා සිසුන් පහත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
  * සමාන ප්‍රමාණයේ සමචතුරස්‍ර කඩදාසි කීපයක් සපයා ගන්න.
  * ඒ සැම එකකම මැද සිහින් සිදුරක් සකසා ගන්න.
  * එම කඩදාසිවලින් විවිධ ප්‍රමාණයේ ගොටු සකසා ගන්න.
  * රූපයේ දැක්වෙන ආකාරයට එම එක් එක් ප්‍රමාණයේ ගොටු තුළට විදුලි පන්දම ඇතුළු කරමින් ඒවාට අනුව ආලෝකය විහිදීම වෙනස් වන බව අත්විඳීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.



**ක්‍රියාකාරකම 7**

- රූප සටහනේ පරිදි වීදුරු පටි තුනක් එකිනෙකට ආනත ව බැඳ, කළු කඩදාසියකින් ආවරණය කරන්න. එක් කෙළවරකට ටිෂු කොළයක් තබා අලවා ගන්න.





- විවර වූ කෙළවරින් වර්ණවත් කඩදාසි කැබලි, කුඩා මල්පෙති ආදිය දමා ඇති වන රටා බලමින් වින්දනයක් ලැබීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**ක්‍රියාකාරකම 8**


- සිසුන් ඉඩ ඇති ස්ථානයකට කැඳවා ගන්න.
- සෙවණැලි පැගීම ආශ්‍රිත ව නිර්මාණාත්මක ක්‍රීඩාවක නිරත කරවීම සඳහා සිසුන් කණ්ඩායම් කීපයකට වෙන් කරන්න.
- සැම සිසු කණ්ඩායමකට ම සරුංගලයක් බැගින් සකසා ගන්න.
- සරුංගලය අතැති සිසුවා එය රැගෙන ඒ මේ අත දිවීම කරන විට ඇති වන සෙවණැල්ල කණ්ඩායමේ අනෙක් සිසුවා විසින් පැගීමට උත්සාහ කළ යුතු වේ.
- ඒ ඒ කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකමෙහි නිරත විය යුතු භූමිය වෙන්කර දෙන්න.
- සැම සිසුවකුට ම සරුංගලය ගෙන යාමට අවස්ථාව ලැබෙන සේ සරුංගලය සිසුන් අතර මාරු කරමින් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 9**

- කඩදාසි යොදා ගනිමින් නිර්මාණය කළ හැකි සරල පහන් කූඩු නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
- එම කැබලි හතරෙහිම එක් පැත්තකින් පහත රූපයේ දැක්වෙන ආකාරයට කොටසක් නවා ගන්න.



- එම කඩදාසිවල මැදින් සුදුසු ආකාරයේ හැඩතලයක් කපා ඉවත් කර ගන්න.



- එම ඉවත් කරගත් කොටසේ ඇතුළු පැත්තේ සෙලෝපින් කඩදාසි අලවා ගන්න.
- කඩඉරිවලින් පෙන්නුම් කර ඇති කොටස් යොදා ගනිමින් පහන් කූඩුව අලවා සම්පූර්ණ කර ගන්න.
- පහන් කූඩුවේ උඩු පැත්තෙන් එය රැඳවීමට සුදුසු නූලක් එල්ලන්න. යට කොටසට රැලි කපා අලවා අලංකාර කර ගන්න.
- පහන් කූඩුව එළිය කළ විට කෙසේ පෙනේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- මෙවැනි පහන් කූඩු වඩාත් නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සිදු කළ හැකි දෑ පිළිබඳ ව තවදුරටත් සිසු අදහස් විමසන්න.
- සිසු අදහස් අත්හදා බලමින් එක් එක් අයට තමන් කැමති ආකාරයේ පහන් කූඩු නිර්මාණයට අවස්ථාව ලබා දෙන්න.
- ආගමික උත්සව හා වෙනත් උත්සව අවස්ථා සඳහා මෙවැනි නිර්මාණවලින් පන්තිය සැරසීමට සිසුන් උනන්දු කරන්න.
- විවිධ ඝනකම සහිත, විවිධ වර්ණ සහිත (පත්තර, සව් කඩදාසි වැනි) කඩදාසි යොදා ගනිමින් ද මෙවැනි පහන් කූඩු නිර්මාණය කර එළිය විහිදෙන ස්වභාවය අත්විඳීමට සලස්වන්න.

# 14. තේමාව : මිනිසුන් වැඩ කරන තැන්

**නිපුණතා** :
- සමීප හා ආසන්න පරිසරයේ පුද්ගලයන් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන සහ එම ස්ථානවල දී තම ආරක්ෂාව සලසා ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි.
- විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැලැඳුම් හා උපකරණ හඳුනා ගෙන වාර්තා කරයි.
- මිනිසුන් ජීවිකාව සඳහා සිදු කරන කාර්ය හා ඒවායින් සිදුවන සේවය අගය කරයි.
- මිනිසුන් වැඩ කරන ස්ථාන ආශ්‍රිත චලන අනුකරණය හා සමබරතාව පවත්වා ගත යුතු චාලක ක්‍රියාකාරකම්වල යෙදේ.
- වැඩ කරන ස්ථාන, භාවිත භාණ්ඩ හා උපකරණ සම්බන්ධ නිර්මාණය කරයි.
- මිනිසුන් වැඩ කරන තැන් හා සම්බන්ධ තොරතුරු වින්දනාත්මක ව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් පල** :
- ආසන්න පරිසරයේ මිනිසුන් වැඩ කරන ස්ථාන පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- මිනිසුන් වැඩ කරන ස්ථානවල දී තම ආරක්ෂාව සලසා ගන්නා ක්‍රම පිළිබඳ නිරීක්ෂණය කර වාර්තා කරයි.
- විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැලැඳුම් හා උපකරණ පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
- මිනිසුන් ජීවිකාව සඳහා සිදු කරන විවිධ කාර්යවලින් ඉටු වන සේවයේ අගය ප්‍රකාශ කරයි.
- වැඩ කරන අවස්ථාවල දී මිනිසුන් භාවිතයට ගන්නා භාණ්ඩවල හා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.
- සමබරතාව රැක ගනිමින් කාර්ය කිරීම සඳහා උපකාරී වන ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- මිනිසුන් වැඩකරන ස්ථානවල දී යොදා ගන්නා විවිධ ජන කවි ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි.
- වැඩ කරන ස්ථානවල මිනිසුන්ගේ හැසිරීම් ප්‍රකාශනාත්මක චලන මඟින් ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- ජීවත් වීමේ දී අපට අවශ්‍ය එදිනෙදා කටයුතු සාර්ථක ව පහසුවෙන් කරගෙන යාම සඳහා විවිධ වෘත්තිවල නියැළෙන අයගේ උදවු අවශ්‍ය වන බව කතාබහක් මඟින් මතු කර දක්වන්න

  *උදා :*
  * පළා, එළවුළු, පලතුරු ආදි දෑ විකුණන වෙළෙන්දෝ
  * ඇඳුම් පිරිසිදු කරන්නෝ
  * වාහන නඩත්තු කරන්නෝ
  * විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නෝ
  * සපත්තු, කුඩ, බෑග් මසන්නෝ
  * කුණු ගෙන යන්නෝ
  * පොල් කඩන්නන්
  * ගස්වල අතු කපන්නෝ
  * කතුරු, පිහි මුවහත් කරන්නෝ
  * පරණ බඩු එකතු කරන්නෝ (යකඩ, ප්ලාස්ටික්, බෝතල්, පත්තට, රෙදි)
  * පිරිසිදු කිරීම් කරන්නෝ
  * ලියුම් බෙදන්නෝ, . . .

- පහත සඳහන් කරුණු ඔස්සේ මෙවැනි වෘත්තිවල නියැළෙන අයගේ සේවය පිළිබඳ කතාබහ කරන්න.
  * මොවුන් කාර්ය සිදු කරන අයුරු
  * එම කාර්ය කිරීම සඳහා ගන්නා වෙහෙස
  * එම කාර්යයන් නිසා සිදුවන සේවය . . . වැනි
  * භාවිත කරන උපකරණ
  * එම කාර්යවල අනතුරුදායක බව

- මෙවැනි කාර්යවල නිරත වන්නන්ගේ සේවය නිසි ලෙස සිදු නොවූ විට හෝ නොලැබී ගිය විට හෝ ඇති විය හැකි තත්ත්වයන් හා එයින් අපගේ එදිනෙදා කටයුතු කරගෙන යාමට සිදුවිය හැකි ගැටලු/බාධා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * පළා, එළවුළු, පලතුරු විකුණන්නන් නොමැති විට - නැවුම් ආහාර වර්ග ලබා ගැනීමට නොහැකි වීම

  * පරණ බඩු එකතු කරන්නන් නොමැති විට - අනවශ්‍ය බඩු බාහිරාදියෙන් නිවස අපිරිසිදු වීම, අපිළිවෙළ වීම, සතුන් බෝවීම (මීයන්, කැරපොත්තන් වැනි)

  * ගස් කපන්නන් නොමැති විට - ගස්වලින් සිදුවිය හැකි අනතුරු බහුල වීම, . . . ආදි කරුණු මතු කර දක්වමින් එම පුද්ගලයන්ගේ සේවාවල වැදගත්කම පිළිබඳ කතාබහක නියැළෙන්න.

- අප විසින් මෙවැනි වෘත්තිවල නියැළෙන්නන්ගේ සේවය ලබා ගැනීමේ දී ඔවුන්ට අගෞරව නොවන පරිදි කාරුණික ව එම කාර්ය ඉටු කරගත යුතු බව ද සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- පාසල සමීපයේ පිහිටි සේවා ස්ථානයක් (විශාල කර්මාන්ත ශාලාවක් නොවිය යුතු ය) තෝරා ගන්න. එය නැරඹීම සඳහා චාරිකාවක් සැලසුම් කරගන්න.

  *උදා :* * වාහන අළුත්වැඩියා කරන තැනක් * ගඩොල් කපන වැඩ බිමක්

  * කෘෂි කාර්මික වැඩ බිමක්

- එම ස්ථානයට ගොස්, යොමු කළ යුතු ඉගෙනුම් කරුණු නිරීක්ෂණය කරන ස්ථාන සහ සිසුන් මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳ සැලසුම් සටහනක් සකස් කර ගන්න.

- සිසුන් සමඟ වැඩ බිම නැරඹීමට ගොස් පහත සඳහන් කරුණු ඔස්සේ තොරතුරු රැස් කර ගැනීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* * වැඩකරන්නෝ පිරිමි ද කාන්තාවෝ ද * නැරඹූ ස්ථාන සකස් කර ඇති ආකාරය

  * ඇඳ සිටි ඇඳුම් පැළැඳුම් * භාවිත කළ භාණ්ඩ හා උපකරණ

  * සිදු කරන නිෂ්පාදන

  * ආරක්ෂාව සලසා ගැනීමට යොදා ගෙන ඇති ක්‍රියාමාර්ග

- චාරිකාව නිම කර පැමිණි පසු පහත දැක්වෙන කරුණු මතු කර දක්වමින් සිසුන් සමඟ සාකච්ජාවක නිරත වන්න.

  *උදා :* * නිෂ්පාදනය කළේ මොනවා ද ? * කෙබඳු අමුද්‍රව්‍ය භාවිත කළේ ද?

  * එය සිදු කළේ කෙසේ ද? * එක් එක් අය සිදු කළ කාර්යයන් මොනවා ද ?

  * යොදා ගෙන තිබූ යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය කෙසේ ද? . . . වැනි

- ඉහත කරුණු පිළිබඳ ව සාකච්ජා කරමින් මෙවැනි නිෂ්පාදන අප අතට පත් වන්නේ මිනිසුන්ගේ මහන්සියේ ප්‍රතිපලයක් වශයෙන් බව, එම නිෂ්පාදන පරිභෝජනයේ දී අරපිරිමැස්මෙන් යුතු ව

- පහත සඳහන් කරුණු ඔස්සේ මෙවැනි වෘත්තීන්වල නියැලෙන අයගේ සේවය පිළිබඳ කතාබහ කරන්න.

  * මොවුන් කාර්යයන් සිදු කරන අයුරු * භාවිත කරන උපකරණ

  * එම කාර්යය කිරීම සඳහා ගන්නා වෙහෙස * එම කාර්යයන්වල අනතුරුදායක බව

- මෙවැනි කාර්යයන්වල නිරතවන්නන්ගේ සේවය නිසි ලෙස සිදු නොවූ විට හෝ නොලැබී ගියහොත් ඇති විය හැකි තත්ත්වයන් හා ඒ හේතුවෙන් අපගේ එදිනෙදා කටයුතු කරගෙන යාමට සිදුවිය හැකි ගැටලු/බාධා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

*උදා :* * පළා, එලවළු, පලතුරු විකුණන්නන් නොමැති විට - නැවුම් ආහාර වර්ග ලබා ගැනීමට නොහැකි වීම

* පරණ බඩු එකතු කරන්නන් නොමැති විට - අනවශ්‍ය බඩු බාහිරාදියෙන් නිවස අපිරිසිදු වීම, අපිළිවෙළ වීම, සතුන් බෝවීම (මීයන්, කැරපොත්තන් වැනි)

* ගස් කපන්නන් නොමැති විට - ගස්වලින් සිදුවිය හැකි අනතුරු බහුල වීම, . . . ආදි කරුණු මතුකර දක්වමින් එම පුද්ගලයින්ගේ සේවාවන්වල වැදගත්කම පිළිබඳ කතාබහක නියැලෙන්න.

- අප විසින් මෙවැනි වෘත්තීන්වල නියැලෙන්නන්ගේ සේවය ලබා ගැනීමේ දී ඔවුන්ට අගෞරව නොවන පරිදි කාරුණික ව එම කාර්යයන් ඉටු කරගත යුතු බව ද සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- පාසල සමීපයේ පිහිටි මිනිසුන්ට සේවයක් සලසන ශ්‍රමය මූලික කර ගත් සේවා ස්ථානයක් (විශාල කර්මාන්ත ශාලාවක් නොවිය යුතු ය) තෝරා ගන්න. එය නැරඹීම සඳහා චාරිකාවක් සැලසුම් කරගන්න.
- මේ සඳහා ඔබ එම ස්ථානයට කලින් ගොස්, යොමු කළ යුතු ඉගෙනුම් කරුණු, ස්ථාන සහ සිසුන් මෙහෙය විය යුතු ආකාරය පිළිබඳ සැලසුම් සටහනක් සකස් කර ගන්න.
- වැඩ බිම නැරඹීමට යාමට යොමු කර පහත සඳහන් කරුණු ඔස්සේ තොරතුරු රැස්කර ගැනීමට සිසුන් යොමු කරන්න.

*උදා :* * ඇඳ සිටි ඇඳුම් පැළඳුම්
* සිදුකරන නිෂ්පාදන
* ආරක්ෂාව සලසා ගැනීමට යොදා ගෙන ඇති ක්‍රියාමාර්ග
* භාවිත කළ භාණ්ඩ හා උපකරණ
* වැඩ කරන්නේ මිනිසුන් ද කාන්තාවන් ද
* නැරඹූ ස්ථාන සකස් කර ඇති ආකාරය

- චාරිකාව නිම කර පැමිණි පසු පහත දැක්වෙන කරුණු මතුකර දක්වමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.

*උදා :* * නිෂ්පාදනය කළේ මොනවා ද ?
* අදාළ ස්ථානයෙන් ඉටුවන සේවය කුමක් ද ?
* එය සිදු කළේ කෙසේ ද ?
* කෙබඳු අමුද්‍රව්‍ය භාවිත කළේ ද ?
* එක් එක් අය සිදු කළ කාර්යයන් මොනවා ද ?
* යොදා ගෙන තිබූ යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය කෙසේ ද ? . . . වැනි

- ඉහත කරුණු පිළිබඳ සාකච්ඡා කරමින් මෙවැනි නිෂ්පාදන අප අතට පත්වන්නේ මිනිසුන්ගේ මහන්සියේ ප්‍රතිපලයක් වශයෙන් බව, එම නිෂ්පාදන පරිභෝජනයේ දී අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කළ යුතු බව හා එම මිනිසුන් සිදුකරන සේවය අගය කළ යුතු බවත් පහදා දෙන්න.
- නැරඹූ ස්ථානයේ සිත් ගත් අවස්ථාවක් භූමිකා රංගන මඟින් නිරූපණය කිරීමට සිසුන් කුඩා කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- වැඩ කිරීමේ දී දැනෙන වෙහෙස නිවා ගැනීම සඳහා වැඩබිම්වල දී විවිධ කවි ගී ගායනා කරන බව සිසුන්ට පැහැදිලි කරන්න.
- එවැනි කවි, ගී, රංගන සහිත ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

*උදා :* 1. **මා දැල් ඇදීම**

1. ඕඩි හෙලෙයි හෙලෙයියා
   අදිමුකො දැල හෝයියා

2. තෝරු බලයො අංජිලාවො
   මෝරු පරව් කුම්බලාවො
   මේවා මූදු මාළු
   අදිමුකො දැල යාළු

3. පොකිරිස්සො ද හාල් මැස්සො
   කුනිස්සො ද පියාමැස්සො
   මේවා මූදු මාළු
   අදිමුකො දැල යාළු

4. කෙළවල්ලෝ කාරල්ලෝ
   අංගුලුවෝ සහ දැල්ලෝ
   මේවා මූදු මාළු
   අදිමුකො දැල යාළු
   ඕඩි හෙලෙයි හෙලෙයියා
   අදිමුකො දැල හෝයියා

(ගී සීපද) එච්. ඩී. ජයතිලක

2. **වැඩ කරමු**

1. ටාං ටීං කම්මලේ
   යකඩ තළනවා
   තළන යකඩ දමාලා
   උදලු හදනවා

2. ගල්වලේ ගල් කඩා
   පාර හදනවා
   පාරෙ තාර දමාලා
   ට්‍රැක්ටර් යනවා

3. වැව් කපා ඇළ හදා
   වතුර එවනවා
   කුඹුරේ වතුර පිරීලා
   ගොයම් හැදෙනවා

4. සේරම අපි එක් වෙලා
   වැඩෙහි යෙදෙනවා
   ඒ හින්දා අපේ රටට
   කිරි ඉතිරෙනවා (ගී සීපද)

**ක්‍රියාකාරකම 4 :**

- විවිධ කාර්යවල නියැළෙන්නන් විසින් එම කාර්ය කිරීමේ දී තම ආරක්ෂාව සලසා ගන්නා අයුරු පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- සිසු අත්දැකීම් අනුව වෘත්තියක හෝ කිහිපයක අනතුරුදායක/අනාරක්ෂිත අවස්ථා හඳුනා ගන්න.
  *උදා :* * ගඩොල් කපන වැඩ බිමක අධික අව් රශ්මියෙන් විය හැකි හානි
  * කළුගල් කඩන වැඩ බිමක භාවිත කරන ආයුධ නිසා විය හැකි හානි
  * වී කොටන මෝලක යන්ත්‍ර නිසා විය හැකි හානි
- මෙවැනි අවස්ථාවලින් ආරක්ෂා වීම සඳහා ඒවායේ වැඩ කරන මිනිසුන් සිදු කර ඇති දේ පිළිබඳ ව විමසන්න.

  *උදා :* * ඇඳුම් ඇඳීම * හිසට ආවරණ පැළඳීම * සෙරෙප්පු පැළඳීම
- එදිනෙදා නිවසේ දී, පාසලේ දී කාර්යයන් කිරීමේ දී අප විසින් ද අනතුරුවලින් ආරක්ෂා වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව මේ අනුව අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- 'මිනිසුන් වැඩබිම්වල දී ආරක්‍ෂාව සඳහා අඳින පලඳින දේවල' රූප/ඡායාරූප/වීඩියෝ පට සපයා ගන්න.
- ඒවා යොදා ගනිමින් වැඩබිම්වල දී භාවිත කරන ඇඳුම් පැලඳුම් පිළිබඳ ව ඒවා යොදා ගන්නා අයුරු පිළිබඳ ව හා ඒවා භාවිතයට හේතූන් පිළිබඳවත් සිසු අත්දැකීම් තවදුරටත් තහවුරු කරන්න.

  *උදා :* * ගොවිතැන් කටයුතුවල දී හිස්වැසුම් පැලඳීම.
  * ඉදි කිරීම් කටයුතු සිදු කරන ස්ථානවල සිමෙන්ති පෑගීම නිසා දෑතේ දෙපයේ ඇති විය හැකි තුවාල ආදියෙන් මිදීමට පාවහන් පැලඳීම, අත්වැසුම් පැලඳීම
  * එවැනි ස්ථානවල දී හිසට විය හැකි අනතුරුවලින් වැලකීම සඳහා හිස්වැසුම් පාවිච්චිය
  * මාර්ග නඩත්තු කරන ස්ථානවල අය බූට් පැලඳීම
  * තද අවු රශ්මියෙන් මිදීමට හිස් වැසුම් පැලඳීම, අත් දිග කමිස, කලිසම් ඇඳීම.
  * විදුලි කම්බි නඩත්තු කරන්නන් ඉහළ ස්ථානවල නඩත්තු කටයුතු කිරීමේ දී ඉණට සම්බන්ධ කළ කම්බියක් ආධාරකයක් වශයෙන් භාවිත කිරීම.
  * පෑස්සුම් කටයුතුවල (වෑල්ඩින්) නියැළෙන්නන් මුහුණු ආවරණ පැලඳීම, . . .
  * දූහුවිලිවලින්, විෂබීජවලින්, කෘෂිකර්මාන්තයේ දී ආරක්‍ෂා වීමට මුඛ ආවරණ පැලඳීම
- ඒ අනුව වැඩබිම්වල විවිධ ආකාරයේ ඇඳුම් පැලැඳුම් භාවිත කරන බවත් ඒවා මගින් ආරක්ෂාව සලසා ගත හැකි බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- සිසුන් විසින් නැරඹූ වැඩබිමේ/වැඩබිම්වල කාර්ය පහසුවෙන් සිදු කර ගැනීම සඳහා භාවිත කළ ඇඳුම් පැලැඳුවලම් හා උපකරණවල ආකෘති විවිධ මාධ්‍ය යොදා ගනිමින් නිර්මාණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* * ඉණිමඟක ආකෘතියක් * මුකවාඩමක්
  * හිස්වැසුමක් * උදළුලක් . . . වැනි
- සිසු නිර්මාණ පන්තියේ සියලු සිසුන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණ අගයන්න.

**ක්‍රියාකාරකම 7 :**

- සිසු අත්දැකීම් අනුව මිනිසුන් විසින් සිදු කරනු ලබන විවිධ කාර්යයන් එක බැගින් තුණ්ඩුවල ලියා ඒවා හිස් පෙට්ටියකට දමන්න.
- එළිමහන් ස්ථානයකට ගෙන යන්න.
- සංගීත නාදයකට අනුව තුණ්ඩු දමා ඇති පෙට්ටිය සිසුන් අතින් අත යවන්න.
- සංගීත නාදය නවතින අවස්ථාවක පෙට්ටිය අත ඇති සිසුවා ඉන් තුණ්ඩුවක් ගෙන එහි දක්වා ඇති දේ අභිරූපණයක් සේ ඉදිරිපත් කළ යුතුයි.

  *උදා :* * බයිසිකලයෙන් ගොස් ලියුම් බෙදීම/ පත්තර බෙදීම * ලී ඉරීම, යතු ගෑම
  * කුඹුරු කෙටීම, ගොයම් කැපීම
  * ඇඳුම් මැදීම * තීන්ත ආලේප කිරීම, . . . වැනි
- අනෙක් සිසුන් විසින් තුණ්ඩුව ලබා ගත් සිසුවා ඉදිරිපත් කරන දේ හඳුනා ගැනීමට උත්සාහ කළ යුතු වේ.
- මේ ආකාරයට සෑම සිසුවකුට ම අවස්ථාවක් ලැබෙන පරිදි ක්‍රියාකාරකම සිදු කරන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''කුඹින්ගේ වැඩ'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 15. තේමාව : වටපිටාවේ වෙනස් තැන්

**නිපුණතා** :
- පරිසරයේ විවිධ ස්ථානවල මිනිසා විසින් සිදු කරන අයහපත් වෙනස්කම් හඳුනා ගනිමින් එම ස්ථාන යහපත් ස්ථාන බවට පත් කර ගැනීමට කටයුතු කරයි.
- ස්වාභාවික ව හා මිනිස් ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන බලපෑම් හා එම බලපෑම්වලින් පස රැක ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විමර්ශනය කරයි.
- පරිසරයේ විවිධත්වයට ගැළපෙන නිර්මාණ කරමින් පරිසරයේ සුන්දරත්වය රැකගනියි.
- පාසල් පරිසරයේ වෙනස් වූ තැන් අනුව මූලික ශාරීරික යෝග්‍යතා වර්ධනය වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- වටපිටාවේ වෙනස් තැන්වල ඇති විවිධත්වය පිළිබිඹු කරන රිද්මානුකූල චලන වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- තම ප්‍රයෝජනය පිණිස මිනිසා විසින් පරිසරයේ සිදු කර ඇති වෙනස්කම් ප්‍රකාශ කරයි.
- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදු වී ඇති බලපෑම් ගවේෂණය කර වාර්තා කරයි.
- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයේ සිදු වී ඇති අයහපත් වෙනස්කම් සහිත ස්ථාන යහපත් ස්ථාන බවට පත් කර ගැනීමට කටයුතු කරයි.
- අවට පරිසරයේ ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා පසට සිදු වී ඇති හානි වළක්වා ගැනීමට කටයුතු කරයි.
- විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් පාසල් භූමියේ තෝරාගත් ස්ථානයක ආකෘතියක් ගොඩනගයි.
- නිර්මාණය කරගත් බාධක සහිත පරිසරයක විශාල හා කුඩා පේශි සමායෝජන වන ආකාරයේ ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- විවිධ ආදේශ භාණ්ඩ ඇසුරෙන් පරිසරයේ ඇසෙන නාද හා ශබ්ද අනුකරණය කර දක්වයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- මිනිසා පරිසරයේ සිදුකර ඇති වෙනස්කම් පිළිබඳ සොයා බැලීම සඳහා සිසුන් සමඟ පාසල් වත්තේ චාරිකාවක යෙදෙන්න.
- එහිදී පහත සඳහන් ස්ථාන නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.

  *උදා :*
  * ක්‍රීඩා පිට්ටනිය
  * ගොඩනැගිලි
  * සෙල්ලම් මිදුල
  * ගෙවත්ත
  * මල් පෝච්චි
  * වතුර කරාම තිබෙන ස්ථානය
  * පඩිපෙළ
  * වැසිකිළි
  * වැඩ බංකුව
  * මල් පාත්තිය
  * ආපණ ශාලාව

- මෙම ස්ථාන මෙසේ වෙනස් වීමට පෙරාතු ව භූමිය කෙසේ තිබෙන්නට ඇත් දැයි අනුමාන කිරීමට සිසුන් යොමු කරන්න.
- භූමියේ සිදු කර ඇති වෙනස්කම් සමඟ ගළපමින් ඒවා තව දුරටත් තහවුරු කරන්න.

  *උදා :* * ක්‍රීඩා පිටිය/ගොඩනැගිල්ලක් සෑදීම සඳහා පොළොව සමතලා කිරීමට කටයුතු කර තිබීම

- ඒ අනුව විවිධ අවශ්‍යතා සඳහා වටපිටාවේ විවිධ ස්ථාන සිදු කරන කාර්යයට අනුකූල වන පරිදි සකස් කර ගන්නා බව තවදුරටත් පැහැදිලි කරන්න.

  *උදා :* * විවිධ වගා සඳහා විවිධාකාරයෙන් බිම් සැකසීම
  * ගොඩනැගිලි නිර්මාණය සඳහා අවශ්‍ය පරිදි බිම් සැකසීම

**ක්‍රියාකාරකම 2**

- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදු වී ඇති හානි සහිත ස්ථාන සිසු අත්දැකීම් ඇසුරෙන් හඳුනා ගන්න.

  *උදා :* * ජලය හොඳින් ගලා යාම අවහිර වී ඇති ස්ථානයක්
  * පරිසරය දුගඳ සහිත ස්ථානයක්
  * නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් අවලස්සණ වී ඇති ස්ථානයක්

- මෙවැනි ස්ථාන හේතුවෙන් අපට සිදුවිය හැකි අයහපත් තත්ත්වයන් පිළිබඳව ද සිසු අවධානය යොමු කරන්න.
- මෙවැනි ස්ථානයක් හෝ කිහිපයක් හෝ තෝරා ගනිමින් එම ස්ථාන යහපත් ස්ථාන බවට පත් කිරීමට කළ හැකි කාර්ය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් අවලස්සණ වී ඇති ස්ථානයක්

  සිදු කළ හැකි දේ - අතුගෑම
  කුණු කසළ නිසි ස්ථානයකට දැමීම
  වල් පැළ ඉවත් කිරීම
  අනවශ්‍ය ලෙස වැඩී ඇති ගස්වල අතු ඉවත් කිරීම
  දිය සෙවල බැඳී ඇත් නම් ඒවා ඉවත් කිරීම

- මෙම කාර්ය සිදුකිරීම මඟින් එවැනි ස්ථාන සුන්දර ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ගන්න.
- මෙවැනි ස්ථාන අපිරිසිදු වීම වැළැක්වීම සඳහා අප විසින් පවත්වා ගත යුතු යහපත් සිරිත් පිළිබඳ ව ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * කඩදාසි තැන් තැන්වල නොදැමීම
  * ඉතිරි වන කෑම තැන් තැන්වල නොදැමීම
  * පොලිතීන් බෑග් නියමිත ආකාරයෙන් බැහැර කිරීම

- නිවැරදි ව කුණු කසළ ඉවත් කිරීම සඳහා වෙන් වශයෙන් බඳුන් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව ද සිසුන්ට අවධාරණය කරන්න.
- ඒ අනුව අප බැහැර කරන කුණු කසළවල දිරායන ද්‍රව්‍ය, දිරා නොයන ද්‍රව්‍ය ඇති බවත්, ඒවා වෙන් වශයෙන් බඳුන්වලට එකතු කර නිසි ලෙස බැහැර කළ යුතු බවත් සිසුන්ට පැහැදිලි කරන්න.
- දිරන සහ දිරා නොයන ද්‍රව්‍ය වෙන් වශයෙන් බැහැර කිරීම සඳහා පාසලේ/පන්තියේ වෙන වෙනම බඳුන් පවත්වාගෙන යාමට කටයුතු කරන්න.
- ඒ සඳහා සිසුන් දිරිමත් කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- මිනිස් ක්‍රියාකාරකම් නිසා පසට සිදුවී ඇති හානි පිරික්සීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.
- ඒ සඳහා පොළොවේ බෑවුමක් ඇති ස්ථානයක් තෝරා ගන්න.
- ජල බඳුනක් ගෙන එම බෑවුමේ කිසියම් ස්ථානයක සිට ජලය වත් කර, පසට සිදුවන දේ නිරීක්ෂණය කරන්න.
- ජෝගුවක්, කේතලයක් වැනි බඳුනකට ජලය ගෙන මේ ආකාරයට ම සමතලා පොළොවක් මතට වත් කර සිදු වන දේ නිරීක්ෂණය කරන්න.

- ජලය නිසා පස සෝදාගෙන යන අයුරු, ජලය ඉහළ සිට වැටීම නිසා පොළොවේ ස්වභාවය වෙනස් වන අයුරු (වළවල් සෑදීම) හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ අනුව ජලය වැටීම හේතුවෙන් පස සෝදා පාළුවට ලක්වන බව පෙන්වා දෙන්න.
- මෙසේ සෝදාපාළුවට ලක් වූ ස්ථානවල පස නිසරු බව පෙන්වීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමේ සිසුන් නිරත කරවන්න.
- මතුපිට පස් තට්ටුව සෝදාගිය ස්ථානයකින් හා මතුපිට පස් තට්ටුව සෝදා නොගිය පොහොර සහිත ස්ථානයකින් පස් ස්වල්පයක් බැගින් වෙන් වෙන් වශයෙන් සපයා ගන්න.
- මෙම පස් වර්ග දෙක විනිවිද පෙනෙන වීදුරු බඳුන් දෙකකට දමා ඒවාට ජලය සමාන ප්‍රමාණවලින් යොදා හොඳින් කලතන්න.
- මඳ වේලාවකින් පසු බඳුන් දෙක නිරීක්ෂණයට ලක් කරන්න.
- මේ අනුව සේදී නොගිය ස්ථානයෙන් ලබාගත් පස්වල මතුපිට කළුපැහැයට හුරු කාබනික පොහොර සහිත තට්ටුවක් රැඳී ඇති ආකාරය හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- පස සේදී නොගිය ස්ථානයක උදැල්ලකින් පස් පිඩක් ඉවත් කර එය නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න. එහි මතුපිට කළු වර්ණයට හුරු කාබනික පොහොරවලින් යුතු මෘදු පස් තට්ටුවක් ඇති අතර, ඊට යටින් මඳක් තද ස්වභාවයක් ගන්නා පස් තට්ටුවක් ඇති බව පෙන්වා දෙන්න.
- මේ අනුව පස සේදී යාම නිසා පොළොවේ මතුපිට බුරුල් සහිත පස ඉක්මනින් සෝදාගෙන යන බවත්, පොහොර සහිත පස් ද සේදී ගොස් පොළොව නිසරු වන බවත් පැහැදිලි කරන්න.
- මේ ආකාරයට පසට සිදුවන හානි වැළැක්වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

  *උදා* : * මතුපිට පස් සේදී ගිය ස්ථාන හඳුනාගෙන ඒවාට ගල්වැටි බැඳීම
  - * පොල්ලෙලි තැබීම
  - * උණ බට වැනි දෑ යොදාගෙන එවැනි ස්ථාන හරස් කර බැඳීම
  - * පිඩලි ඇල්ලීම, පාත්තිවල පස සේදීම වැළැක්වීමට මතුපිටට පිදුරු, කොළ අතු වැනි දෑ වලින් ආවරණ යෙදීම
  - * කාණු යෙදීම
  - * ගස් සිටුවීම සහ සිටුවා ඇති ගස් ආරක්ෂා කිරීම

- මෙවැනි දේ පස සෝදායාම වළකින අයුරු සිසුන්ට පැහැදිලි කරන්න. එවැනි ක්‍රියාකාරකම්වල සිසුන්ව සුදුසු පරිදි යොදවන්න.

**ක්‍රියාකාරකම 4 :**

- කලින් දිනයේ පදම් කළ මැටි, ලී කෝටු, වේළුණු පත්‍ර, ඉරටු, සෙ.මී.40 දිග, සෙ.මී.30 පළල ලෑලි කෑලි කිහිපයක් සිසුන් ලවා ගෙන්වා ගන්න.
- සිසුන් පාසල අවට චාරිකාවක නිරත කරවන්න.
- එහිදී, * භූමියේ ස්වභාවය වෙනස් තැන් (ගල්, බොරලු වැනි)
  - * එක් එක් තැන්වල වැල් පිහිටා ඇති අයුරු
  - * කළුපාට/දුඹුරු පස් සහිත ස්ථාන
  - * ගොඩනැගිලි පිහිටා ඇති අයුරු
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර ගන්න.
- නිරීක්ෂණ චාරිකාවේ දී දුටු ස්ථානයක් පිළිබඳ ආකෘති නිර්මාණයට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.
- අවශ්‍ය තැන්වල දී උපදෙස් ලබා දෙන්න. සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට රැගෙන යන්න.
- එම ස්ථානයේ ක්‍රියාකාරකමෙහි යෙදීමට සීමාවක් ලකුණු කරගන්න.
- එම සීමාවේ තෝරාගත් ස්ථාන කිහිපයක අම්බිලියන් ඇඳ එම ස්ථානවල කටු සහිත ස්ථානයක්, මඩ සහිත ස්ථානයක්, වලක්, ඇලක් ආදි වශයෙන් පුවරු සවි කරන්න. මේවා බාධක වශයෙන් සලකන්න.
- ගුරුවරියගේ සංඥාවකට අනුව එක් එක් සිසුවා මෙම සියලු බාධක මඟ හරිමින් දුවගෙන ගොස් නැවත ආරම්භක ස්ථානයට පැමිණිය යුතු බව දන්වන්න.
- සියලු සිසුන්ට මෙම ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථා සලසන්න.

**ක්‍රියාකාරකම 6 :**

- සිසුන්ට වාදනය කිරීමට පහසු වන ආකාරයේ ආදේශ භාණ්ඩ කිහිපයක් සකස් කර ගන්න. (දෙමාපිය සහය ඇති ව නිවසේ දී හෝ පන්ති කාමරයේ දී ම හෝ මේවා සකස් කර ගැනීමට හැකි ය.)
  - * ටොනික් පියන් මූඩි හොඳින් තළා මැදින් හිල් කර කම්බියක දමා සකසා ගත් වළල්ලක හැඩයකින් යුතු භාණ්ඩයක්
  - * X-ray card එකක් ලී රාමුවකට සවි කර තනාගන්නා බෙරය හා එය වාදනය කිරීමට කෝටුවක්
  - * ටින් දෙකක් එකට එක්කර සකස් කර සාදා ගත් ආදේශ තම්මැට්ටමක්
  - * හොඳින් පිරිසිදු කරගත් එක සමාන ප්‍රමාණයේ පොල්කටු 2ක්
  - * හැඳි දෙකක් (ඇලුමිනියම් හෝ රිදී)
  - * රබර් ඇට/ඔළිඳ ඇට/මුං ඇට/කඩල ඇට/පරිප්පු ඇට/මදටිය ඇට (මින් එක ඇට වර්ගයක්) දැමූ ටින් එකක්
  - * පොල්කටුවක් මදය ඉවත් කර එක හිලක් සාදා එය තුළට ඇට වර්ග දමා හිල මතට කෝටුවක් සවිකර සාදා ගත් උපකරණයක්
  - * එක සමාන ලී පොලු දෙකක් ගැටීමෙන්
- මේ ආකාරයට සකසා ගත් ආදේශ භාණ්ඩ මගින් නාදය නිපදවන ආකාර සිසුන්ට පෙන්වන්න.
- පරිසරයේ ඇසෙන ශබ්දවලට සවන් දී එම ශබ්ද මෙවැනි භාණ්ඩ ඇසුරින් නැවත නිපදවිය හැකි දැයි අත්හදා බැලීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* වැස්සක හඬ
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් අගය කරන්න.

- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''වලස් පවුලේ විනෝද ගමන'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

## 16. තේමාව : අපේ උදව් ඕනෑ අය

**නිපුණතා** :
- සමාජයේ උදවු අවශ්‍ය අය හඳුනා ගෙන උදවු කිරීමට කටයුතු කරයි.
- සාර්ථකත්වය සඳහා සහයෝගයෙන් යුතු ව කටයුතු කරයි.
- උදවු අවශ්‍ය කෙනෙකුට උපකාරී වන ආකාරයේ නිර්මාණ කරයි.
- අන්‍යොන්‍ය සහයෝගය වර්ධනය සඳහා චාලක ක්‍රියාකාරකම්වල යෙදේ.
- සමාජයේ විවිධ අය පිළිබඳ සංවේදීතාව මතු කර දක්වන භූමිකා රංගනවල නිරත වෙයි.

**ඉගෙනුම් පල** :
- උදවු අවශ්‍ය අය සඳහා උදවු කිරීමට ඉදිරිපත් වෙයි.
- එදිනෙදා අවශ්‍ය අවස්ථාවල දී අන් අයගේ ද උදවු ලබා ගැනීමේ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- කාර්ය කිරීමේ දී වැඩි ඵලයක් ලබා ගැනීම සඳහා සාමූහික ව වැඩ කිරීමට උනන්දුවක් දක්වයි.
- යම් අයකුට ආයතනයකට උදවුවක් වන ආකාරයේ කාර්යයන්වල යෙදෙයි.
- අන්‍යයන් සමඟ සහයෝගීව ක්‍රියා කරමින් චාලක සමායෝජන සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- අන් අයට උදවු විය හැකි අයුරු මතු කර දක්වන භූමිකා රංගනවල නියැළෙයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- තවත් අයකුට උදවු කළ අවස්ථාවක් පිළිබඳ සිද්ධි ඇතුළත් කතා සිසුන්ට ඉදිරිපත් කරන්න. එවැනි කතා ඇසුරෙන් එකිනෙකාට උදවු කිරීමේ වැදගත්කම මතු කර දක්වන්න.
- තමා විසින් හෝ පවුලේ සාමාජිකයකු විසින් හෝ අන් අයකුට උදවු කළ අවස්ථාවක් පිළිබඳ ප්‍රකාශ කිරීමට සිසුන්ට ද අවස්ථාව ලබා දෙන්න.
- උදවු උපකාර ලබාදෙන අවස්ථා හා සම්බන්ධ පින්තූර ඡායාරූප රැස් කරගෙන ඒවා ද උදවු උපකාර කිරීමේ වැදගත්කම තහවුරු කිරීම සඳහා යොදා ගන්න.
- මේ ආකාරයට පන්තියේ සිසුන් කිහිප දෙනෙකුට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථා ලබා දී එම උදවු ලබා දීම තුළින් උදවු ලබාගත් අයට විශාල යහපතක් වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- එසේ උදවු කිරීම මගින් හැඟුණු, දැනුණු දේ පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම කතා බහ මඟින් අන් අයට උදවු කිරීමේ වැදගත්කම සිසුන්ට තහවුරු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සාමූහික ව වැඩ කරන ආකාර සහිත පින්තූර/චිත්‍ර/වීඩියෝ දර්ශන/ කතන්දර සිසුන්ට ඉදිරිපත් කරන්න.

  *උදා* : * කුඹී රැලක් කෑමක් ඔසවාගෙන යන අයුරු
  * මී වදයක් බඳින අයුරු
  * පාර හදන තැනක මිනිසුන් වැඩ කරන අයුරු
  * අතීතයේ වැව්, දාගැබ් නිර්මාණය කළ අයුරු

- මෙවැනි උදාහරණ යොදා ගනිමින් සාමූහික ව වැඩ කිරීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කරන්න.

- මෙසේ වැඩ කිරීම තුළින් අපට අත් වන දේ පිළිබඳව කතාබහ කරන්න.
  - * කාර්යය පහසු වන බව
  - * සාමූහිකත්වය ගොඩනැඟීම
  - * කාලය ඉතිරි වන බව
  - * වෙහෙස අඩු බව
- ඒ අනුව එදිනෙදා කටයුතුවල දී කණ්ඩායමක් ලෙස සාමකාමී ව එකමුතු ව කටයුතු කිරීම අවශ්‍ය බව පැහැදිලි කරන්න. එය අපේ දියුණුවට හේතුවන බව ද පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- තවත් කෙනකු වෙනුවෙන් අපට කළ හැකි උදවු සහ එසේ කිරීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- අන් අය වෙනුවෙන් අපට කළහැකි උදවු පිළිබඳ සිසුන් සමඟ කතාබහ කරන්න.
- ඉහත කතාබහේ දී හඳුනා ගන්නා ලද එක් කාර්යයක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සැලසුම් කර ගන්න.

  *උදා :* * පරිත්‍යාගශීලීන්ගෙන් පොත් ලබා ගැනීම (ගමේ/නගරයේ සුවිශේෂ පුද්ගලයන්ගෙන්, පාසලේ ගුරුභවතුන්ගෙන් හෝ පාසලේ සිසුන්ගෙන් හෝ)

  * එම රැස් කළ පොත් අදාළ පාසල වෙත/සිසුන් වෙත ලබාදීම.
- මෙහි දී අවශ්‍ය නම් දෙමාපියන්ගේ හෝ සමාන්තර පන්ති ගුරුවරයන්ගේ හෝ සහය ලබා ගන්න.
- තෝරා ගන්නා ලද කාර්ය කිරීමේ දී එක් එක් වැඩ කොටස් බෙදා ගැනීම හා එහි වගකීම බෙදා ගැනීම කෙරෙහි ද විශේෂයෙන් අවධානය යොමු කරන්න.

- මෙම කාර්යය සාර්ථක ව නිම කිරීමෙන් පසු ඒ සඳහා සහය දුන් සැමට ම ගුරුවරිය විසින් ස්තුති කිරීම හා අගය කිරීම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 4**

- අප විසින් උදවු ලබාදිය යුතු අය අප සමාජයේ විවිධ අවස්ථාවල දී/විවිධ ස්ථානවල දී අපට මුණගැසිය හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.

  *උදා :* * පාසලේ දී,

  * ආගමික ස්ථානවල දී,

  * රෝහල්වල දී,

  * මහමඟ යන විට

  * බසයේ දී ආදි වශයෙන්
- එසේම එදිනෙදා විවිධ කාර්යවල දී අවශ්‍යතාව අනුව අපට ද එකිනෙකාගේ සහයෝගය ලබා ගැනීම හා එකිනෙකාට සහයෝගය ලබාදීම අවශ්‍ය වන බව සිසුන්ට පෙන්වා දෙන්න.

  *උදා :* * තම යහළුවා නොදන්නා දෙයක් තමාට හැකි ආකාරයෙන් කියා දීම

  * තමා සතු දෙයක් තවත් කෙනෙකුට අවශ්‍ය වේ නම්, තමන්ට හැකි පමණින් උදවු කිරීම. (තම මිතුරකුට පැන්සලක්/මකන කැබැල්ල අවශ්‍ය අවස්ථාවක දී ඒවා ලබාදීමට ඉදිරිපත් වීම)

  * හදිසි අවස්ථාවල දී තමාට කළ හැකි උදවු තිබේ නම් ඒවා නොපැකිළ ව කිරීමට ඉදිරිපත් වීම. (පන්තියේ/පාසලේ මිතුරකු ලිස්සා වැටීම)
- උදවු කළ අයට ප්‍රශංසා කිරීමට හුරු වීම හොඳ පුරුද්දක් බව ද මෙහි දී සිසුන්ට මතක් කර දෙන්න. උදවු ලබා ගැනිමේ දී, ලබා දිමේ දී හැසිරිය යුතු ආකාර පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

- මෙම කතා බහේ දී පහත සඳහන් කරුණු මතු කර දක්වන්න.
  - * ඉල්ලීම් සඳහා කාරුණික වචන භාවිතය.
  - * යහපත් හැසිරීම්
  - * ලබා දුන් උදවු අගය කිරීම/ස්තුති කිරීම . . . වැනි
- උදවු අවශ්‍ය අයකුට උදවු කළ අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් සිසුන් නිර්මාණය කර ඇති චිත්‍රයේ දක්වෙන අදහස් පිළිබඳ ඇගයීමකින් යුතු ව කතාබහ කරන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
- කෙනෙකුට උදවු කිරීම ශ්‍රේෂ්ඨ ගුණාංගයක් බව තහවුරු වන ජාතක කථාවක් හෝ (*උදා :* මහා කපි ජාතකය)/ජන කථාවක් හෝ නිර්මාණ කරන ලද කථාවක් හෝ සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි අවස්ථා නිරූපණය වන භූමිකා රංගනයක යෙදීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

*උදා :* අසරණ වූ තැනැත්තෙක් - දවස් හතක් බඩගින්නේ
කන්න මුකුත් නෑ ලැබුණේ
තොල කට වේළිලා මගේ
වතුර පොදක් වත් දෙන්නේ

ළමයා - අනේ අම්මේ අර සීයා
දවස් හතක් හාමතේ ලු
කන්න මොනව හරි දීලා
කුසගිනි අපි නිවා දමමු


අම්මා - එක හරි ම හොඳ දෙයක්
ලැබෙයි ඔබට ලොකු පිනක්
මේ බත් කන්නට දීලා
උදවු කරන එක හොඳක්

ළමයා - මෙන්න සීයෙ බත් ටිකක්
කාලා ඉන්නකො ටිකක්

අසරණ වූ තැනැත්තා - අනේ, දරුවො පින් සිදුවෙයි
කුස ගින්දර මෙයින් නිවෙයි
ලැබෙයි ඔබට ලොකු පිනක්
මේ බත් කන්නට දීලා


**ක්‍රියාකාරකම 5 :**

- සහයෝගය වර්ධනය කිරීමට උදවු වන පහත දැක්වෙන ක්‍රීඩාවේ නිරතවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා පහත රූපයේ දැක්වෙන පරිදි සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.




- කණ්ඩායම් දෙක සඳහා කැමති නම් දෙකක් යෝජනා කරගන්න.
- කණ්ඩායම් දෙකට ම තරමක ලොකු බෝලය බැගින් ලබා දෙන්න.
- ගුරුවරයාගේ සංඥාවකට අනුව කණ්ඩායමේ පළමු පෙළේ පළමු සිසුවා විසින් බෝලය තම කණ්ඩායමේ ඉදිරි පේළියේ තමා ඉදිරියෙන් සිටින පළමු සිසුවාට දෑතින් යොමු කළ යුතු ය. මීළඟට එම සිසුවා විසින් ම තම ඉදිරි පෙළේ තමාට ඉදිරියෙන් සිටින සිසුවාට බෝලය යොමු කළ යුතු ය. කණ්ඩායම අවසානයේ සිටින සිසුවා තෙක් බෝලය බිම වැටීමට නොදෙමින් ඉක්මණින් යොමු කිරීම කළ යුතු ය.
- යම් අවස්ථාවක බෝලය බිම වැටුණහොත් නැවත බෝලය ආරම්භක සිසුවාගේ සිට යොමු කරමින් ඉදිරියට ගෙන යා යුතු ය.
- බෝලය ඉක්මනින් කණ්ඩායමේ අවසානය තෙක් යොමු කරනු ලබන සිසු කණ්ඩායමට ජය හිමි වේ.

  බෝලය යොමු කළ යුතු ආකාරය :



- **සමාජ ඒකාබද්ධතාව සංකල්පය සහිත ව රචිත ළමා කතා සංග්‍රහයෙහි ''අපිම හදපු ගිලන් රථේ, වළාකුලේ හපන්කම'' කතාව මෙම තේමාව සඳහා යොදා ගන්න.**

# 3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## හැඳින්වීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමු වන ශ්‍රේණියේ සිට ම සන්නිවේදනය හා අවබෝධය සඳහා ඉංග්‍රීසි භාවිත කිරීමට දිවයිනේ සියලු ම සිසුන්ට සම අවස්ථා ලබා දීම සඳහා කටයුතු සලසා ඇත. තුන් වන ශ්‍රේණියේ දී විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීම ආරම්භ කිරීමට ප්‍රථම හඳුන්වා දෙන මෙම අංගය "**ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි**" ලෙස හැඳින්වේ. මෙම නාමයෙන් පිළිබිඹු වන පරිදි ම මෙහි දී අවධානය යොමු වනුයේ සිසුන් ක්‍රියාකාරකම් හෝ සෙල්ලම්වල හෝ යෙදී සිටින අවස්ථාවල දී කතාබහ සඳහා ඉංග්‍රීසි භාවිතය යි. විශේෂඥ ගුරුවරයකු යොදා විධිමත් ආකාරයට ඉංග්‍රීසි ඉගැන්වීමක් මෙහි දී අපේක්ෂා නොකෙරේ.

මෙම විෂය නිර්දේශය විශේෂයෙන් ම පළමු වන ශ්‍රේණියේ උගන්වන ගුරුවරයා විසින් ඉගැන්විය හැකි ආකාරයෙන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය යන විෂය උගන්වන අවස්ථාවල දී ඒ හා සමඟ කළ හැකි ආකාරයට සකස් කර ඇත. මෙම වැඩ සටහන මඟින් ශ්‍රවණය හා කථනය සඳහා පමණක් අවධානයක් යොමු කර ඇති අතර මෙය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සඳහා මෙන් ම ගණිත විෂයය සඳහා ද භාවිත කිරීමට ඉඩ සලසා ඇත.

පහත සඳහන් ප්‍රධාන අරමුණු මෙම වැඩ සටහන මඟින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සරල ඉංග්‍රීසි වචන කිහිපයක් නිතර නිතර අසන්නට හා කියන්නට සලස්වා කුඩා වයසේ සිට ම දරුවන් ඉංග්‍රීසි වචනවලට හුරු කිරීම.
- සන්නිවේදනය හා අවබෝධය සඳහා සරල ඉංග්‍රීසි භාවිත වන ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය හා ඉන් පිටත ඇති කිරීම.
- ඉංග්‍රීසි භාවිතයට සිසුන් තුළ ඇති පසුබටට බව මඟ හැරවීම.
- තුන් වන ශ්‍රේණියේ සිට විධිමත් ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට ආසාවක් සිසුන් තුළ ඇති වන පරිදි පසුබිම සකස් කිරීම.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

- සිසුන්ට කතාබහ සඳහා සරල ඉංග්‍රීසි භාවිතය හඳුන්වා දිය යුත්තේ පන්ති භාර ගුරුවරයා විසිනි.
- මේ සඳහා විශේෂ කාල පරිච්ඡේද වෙන් කිරීම ද අවශ්‍ය නොවේ.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රිසි සඳහා අවස්ථා මතු කර ගත යුත්තේ සිසුන් "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය" යන විෂයවලට සම්බන්ධ ක්‍රියාකාරකම්වල හා විනෝදජනක වැඩවල යෙදී සිටින අවස්ථාවල දී ය.
- ක්‍රියාකාරකම්වල යෙදෙමින්, තම මවුබසෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවල දී සිසුනට නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය සඳහා යෙදෙන ඉංග්‍රීසි පද සහ සරල ඉංග්‍රීසි ක්‍රියා පද, විධාන යනාදිය හඳුන්වා දීමටත් හැකි අවස්ථා ආයාසයකින් තොර ව මතු කර ගැනීමට උත්සාහ කළ යුතු ය.
- සිසුන් සමඟ නිදහසේ හැසිරෙන විට දී ඔවුනට ඉංග්‍රීසි භාෂාවෙන් ආමන්ත්‍රණය කිරීම, සුබ පැතීම, ආශීර්වාද කිරීම වැනි දේ සිදු කිරීමට අවස්ථා ද මතු වේ. මෙවැනි අවස්ථා සරල වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම සඳහා උපයෝගී කර ගත හැකි ය.
- ගුරුවරයාගෙන් විශේෂයෙන් බලාපොරොත්තු වනුයේ, දරුවා ජීවත් වන වටපිටාවේ සමීප ව නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය, ක්‍රියා පද, ආමන්ත්‍රණ, විධාන, ආශීර්වාද යනාදිය ඇතුළත් සරල ඉංග්‍රීසි වාංමාලාවක් තෝරා ගෙන එම වංමාලාව ගුරුවරයාටත් දරුවනටත් අමතර බරක් නොවන පරිදි ප්‍රියජනක ලෙස ඔවුනොවුන් අතර සන්නිවේදන අවස්ථා ගොඩ නැගීමට උචිත පරිදි යොදා ගැනීම යි.

- උදාහරණයක් වශයෙන් සැලකිය හැකි සරල ඉංග්‍රීසි වාංමාලාවක් මෙහි අවසානයේ ඇතුළත් කර ඇත. එහි, එදිනෙදා ජීවිතයේ දී සිසුන්ට නිතර හමුවන ද්‍රව්‍යවල ඉංග්‍රීසි යෙදුම් ද විවිධ අවස්ථා සඳහා උචිත සරල ක්‍රියා පද, ආමන්ත්‍රණ, විධාන ආදිය ද ඇතුළත් වේ. සිසුන්ට සමීප පරිසරය අනුව මෙම වාංමාලාව, වචන අලුතෙන් එකතු කිරීමෙන් හෝ අඩු කිරීමෙන් හෝ සුදුසු පරිදි වෙනස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. මෙහි ඉදිරිපත් කර ඇති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය විෂයවලට අදාළ හඳුන්වා දී ඇති වචන සියල්ල ම භාවිත කිරීම අනිවාර්ය නොවේ. එමෙන් ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවලට අදාළ ව ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරකම් මෙන් ම ඉංග්‍රීසි ගීත ද ගුරුවරයාගේ අභිමතය පරිදි වෙනස් කර ගැනීමට නිදහස ඇති බව කිව යුතු ය.

- මීට අමතර ව ගණිත විෂයයට අදාළ ව ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා වන වාංමාලාවක් ද ඉදිරිපත් කර ඇත. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය මෙන් ම ගණිතය විෂයය ඉගැන්වීමේ දී ද උචිත අවස්ථාවල දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීමට අවස්ථාව සැලැස්වීම ගුරුවරයාගේ වගකීම යි.

- පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවලට අනුව කාණ්ඩ කර ඇති වාංමාලාවක් ද අදාළ වචන හුරු කරවීම සඳහා සකස් කර ඇති ගීත ද ගුරුවරයාට එදිනෙදා භාවිත කළ හැකි පන්ති කාමර යෙදුම් ද මෙහි ඇතුළත් කර ඇත.

- 2009 වසරේ ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගුරු අත්පොත (ABOE - Teacher's HandBook - Grade 2) ගුරුවරයාගේ කාර්යභාරය පහසු කිරීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- නිවැරදි ව ඉංග්‍රීසි වචන උච්චාරණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන්න. අවශ්‍ය වේ නම් මේ සඳහා පාසලේ ඉංග්‍රිසි උගන්වන ගුරුවරුන්ගේ සහ ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන්ගේ උපදෙස් ලබා ගත හැකි ය. එමෙන් ම, ප්‍රදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල (Regional English Suppport Centres) සේවය ද ලබා ගෙන ගුරුවරයාගේ ඉංග්‍රීසි දැනුම වර්ධනයට ද මේ මඟින් අවස්ථා සලසා ගැනීමට අපේක්ෂා කෙරේ.

**විශේෂයෙන් සැලකිය යුතු කරුණු කිහිපයක්**

වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය යටතේ

* විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම භාවිතය අපේක්ෂා නොකෙරේ.
* ඉංග්‍රීසි හෝඩියේ අකුරු ඉගැන්වීමට, ඉංග්‍රීසි වචන ලිවීමට ඉගැන්වීම හෝ කියවීම හෝ අපේක්ෂා නොකෙරේ.
* විශේෂ පොත්පත් භාවිතය අවශ්‍ය නොවේ.
* සිසුන්ගේ ඉංග්‍රිසි දැනුම මැන බැලීම සඳහා 1 සහ 2 ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණයක් අවශ්‍ය නොවේ.
* සිසුවන්ගේ ඉංග්‍රිසි දැනුම මැන බැලීම සඳහා තේමාවක් අවසානයේ දී ඔවුන්ගෙන් වාචික ව ප්‍රශ්න කිරීම, පින්තූරයක් පෙන්වා එය කුමක් දැයි විමසීම, වචනයක් පවසා එයට අදාළ පින්තූරය පෙන්වීමට අවස්ථාව සැලසීම වැනි සරල ක්‍රියාකාරකම් මේ සඳහා යොදා ගත හැකි ය. (What is this ?/What is this colour ? Show me . . .)
* සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම මැන බැලිම සඳහා :

  *උදා :* Draw a cat/colour it in black යන ආදි වශයෙන් ද මෙම ඇගයීම සුදුසු පරිදි පන්තිභාර ගුරුවරයා විසින් සිදු කළ හැකි ය.

* මෙම ඇගයීම් ක්‍රියාවලිය පන්ති භාර ගුරුවරයා විසින් දරුවාට බරක් නොවන ආකාරයෙන් සිදු කළ යුතු ය. ක්‍රියාකාරකම්වල දී හඳුන්වා දුන් වචන සහ වැකි පමණක් භාවිතයෙන් මෙම ඇගයීම කළ යුතු ය.

* දරුවකු තම මව්බස ආශ්‍රයයෙන් සවන් දීමට සහ කථනයට යොමු වූ අයුරින් ම වාචික ඉංග්‍රීසි භාවිතය සඳහා ද දරුවා හුරු කළ යුතු ය. මෙහි දී පන්ති කාමර ක්‍රියාකාරකම්වලට සවන් දීමට සහ කථනයට අදාළ ව මනා ලෙස සංවිධානය විය යුතු ය. එහි දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි උගන්වන ගුරුවරයා මෙම ක්‍රියාකාරකම්වල අරමුණ පිළිබඳ වටහා ගෙන ඒ අනුව ඊට අවශ්‍ය පරිසරය සකස් කරගැනීම වැදගත් ය.

* ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි අදාළ තේමාවල හඳුන්වාන්වා දීමේ දී එම තේමාවට අදාළ ව තම මවුබසින් උගත් වචන ඉංග්‍රීසි බසින් ද උගත් පසු එම උගත් වචනවලට අදාළ රූප ඇඳීම සහ පාට කිරීමට අවස්ථාව සලසා දීම උචිත ය. ඒ අනුව ඉංග්‍රීසි වචන වඩාත් පහසුවෙන් මතක තබා ගැනීමට මෙම ක්‍රමය උපකාර වනු ඇත. එහෙත් එම රූප වලට අදාළ ඉංග්‍රීසි වචන ලිවීම ගුරුවරයාගෙන් හෝ සිසුන්ගෙන් හෝ අපේක්ෂා නොකෙරේ.

* දරුවකු මවුබස, පරිසරයෙන් උකහා ගැනීමේ දී සවන් දීම, කථනය, කියවීම, ලිවීම අනුපිළිවෙළින් සිදු වන අතර වයස අවුරුදු 4-5 පමණ කාලය සවන් දීමට සහ කථනයට පමණක් සීමා වෙයි. පසුකාලීන ව එනම් වයස අවුරුදු 5න් පසු ව තම මවුබස විධිමත් ලෙස කියවීමට සහ ලිවීමට උගනියි. ඒ අයුරින් ම දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ද වසර දෙකක පමණ කාලයක් පරිසරය ආශ්‍රයයෙන් සවන් දීමට සහ කථනයට අවස්ථාව සලසා දීම වැදගත් වේ. එක සහ දෙක ශ්‍රේණිවල දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි මගින් මෙම අවස්ථාව සම්පාදනය කෙරෙයි.

# ACTIVITY BASED ORAL ENGLISH

## Listening & Speaking

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| **01. We and the School (DVD - 2)** | **Places in the school (5)***<br>1. shrine room<br>2. computer room/lab/IT lab<br>3. science lab/laboratory<br>4. staff room<br>5. sick room | Let's clean the classroom.<br><br>Let's clean the garden. | **Activity :**<br>Draw the objects in the classroom, colour and say<br><br>**Song:(3)**<br>Bits of paper//<br>Lying around//<br>Make the place untidy//<br>Pick them up// |
| | **Objects in the classroom (8)**<br>1. pencil<br>2. book<br>3. bag<br>4. eraser<br>5. bottle | I'm a pencil.<br><br>You are a book. | Books and pencils// (9)<br>Erasers, bags//<br>Bottles of water//<br>In the class//<br><br>This is the way we (6)<br>worship Buddha// (God)<br>This is the way we<br>worship Buddha<br>In the shrine room//<br><br>This is the way we<br>Work with computer//<br>This is the way we<br>work with computer<br>In the computer room.//<br><br>This is the way we<br>observe things//<br>This is the way we<br>observe things<br>in the laboratory//<br><br>This is the room<br>teachers rest//<br>This is the room<br>teachers rest<br>It's the staffroom//<br><br>This is the sickroom ///<br>This is the sickroom where we rest<br>When we feel sick// |

<table>
<tr><th>Theme</th><th>Vocabulary</th><th>Structures</th><th>Activities</th></tr>
<tr><td></td><td></td><td></td><td>Game:<br>Prepare some picture cards of introduced vocabulary according to the number of students in the classroom. Eg. 5 classroom objects, if there are 40 students, 8 cards from each picture.<br>Distribute those cards.<br>Teacher says the word ‘pencil’ & asks the students to show the picture of the pencil or stand up /do like musical chairs or create a suitable game to help them to learn those words etc.</td></tr>
<tr><td>02. Our Home (11)</td><td>house/home<br>Parts of a house<br>1. door<br>2. window<br>3. roof<br>4. room<br><br>Rooms of a house (14)<br>1. kitchen<br>2. living room<br>3. bathroom<br>4. bedroom<br>5. store room</td><td>This is my...<br>That is my...</td><td>Activity :<br>Draw a house, colour and say the parts<br><br>Song: (12)<br>This is my house//<br>That is the roof//<br><br>These are windows//<br>That is a door//<br><br>(Tune: where’s thumbkin?)<br><br>Kitchen//// where we cook.// (15)<br>Kitchen//// where we cook./<br><br>living room// where we rest//<br>bathroom// where we bathe//<br>bedroom// where we sleep//<br>store room// where we store//<br><br>Game: Create a suitable game to help them to learn those words as shown in theme 1</td></tr>
<tr><td>03. Animals around us (17)</td><td>1. horse<br>2. elephant<br>3. donkey<br>4. bull<br>5. goat<br>6. ant<br>7. caterpillar</td><td>What can you see?<br>I can see…</td><td>Activity :<br>Draw animals, colour and say</td></tr>
</table>

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| | | | **Song: (18)**<br>I see a big horse//<br>I see a bull//<br>I see an elephant//<br>Walk///<br>I see a donkey//<br>I see a goat//<br>I see a caterpillar//<br>And little ant//<br>(Tune: brotherJohn)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **04. Play with Water (20)** | 1. boat<br>2. float<br>3. row | | **Activity :**<br>Draw, colour and say<br><br>**Song: (21)**<br>Row /// your boat<br>Gently down the stream<br>Merrily ////<br>Life is but a dream<br><br>**Game: Guessing game : floating or sinking**<br>Teacher brings different kinds of materials. Eg. Buttons, coins, flowers, plastic balls, etc.<br>Teacher takes one thing out of them and asks whether it is sinking or floating<br>**'Guess, sinking or floating'**<br>**'See'**<br>**'Now I am going to drop this into water'**<br>If their guessing is right. Clap and appreciate them. |
| **05. Sinhala & Hindu New Year Period** | 1. oil lamp<br>2. betel<br>3. crackers<br>4. swing<br>5. oil cake | Happy New Year | **Activity :**<br>Draw oil lamp, betel, crackers, Swing, milk rice, and oil cakes, colour and say<br><br>**Song: (22)**<br>Milk rice oil cake//<br>On the plate//<br>Banana kokis//<br>I like to eat// |

| Theme | Vocabulary | Structures | Activities |
| --- | --- | --- | --- |
| | | | Lighting crackers//<br>Play raban//<br>I like swinging//<br>Swing//////<br><br>(brother John)<br><br>1. This is the way we clean the house (23)<br>Clean the house //<br>This is the way we<br>clean the house<br>for the new year.<br><br>2. Let's light crackers// (25)<br>Chata pata dong//<br><br>Let's have a swing//<br>Onchili chili//<br><br>(Tune: brother John<br><br>3. Oil lamp//// (27)<br>Betel////<br>Oil cakes///<br>For the new year<br><br>(Tune- one little…<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **06. The Sky We See (29)** | 1. aeroplanes<br>2. kites<br>3. fly<br>4. rain<br>5. rainbow<br><br>**Colours**<br>1. pink<br>2. orange<br>3. purple<br>4. brown<br>5. black<br>6. white | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song:**<br>Birds fly in the sky (30)<br>Shala la la la<br>Planes fly in the sky<br>Shala la la la<br>kites fly in the sky<br>Shala la la la<br>They all fly in the sky<br><br>Kites and aeroplanes// (33)<br>Flying in the sky//<br>Rainbow //<br>Beautiful rainbow, colourful rainbow<br>I like you. // |

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| | | | Pink and orange// (36)<br>Purple, brown//<br>Red, blue, yellow, green//<br>Black and white//<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **07. Things We Eat & Drink (38)** | 1. hoppers<br>2. string hoppers<br>3. pineapple<br>4. woodapple<br>5. grapes<br>6. plantain<br>7. papaw<br>8. green leaves | Let's make a fruit salad.<br><br>Let's wash the fruits.<br><br>Let's peel the fruits.<br><br>Let's cut the fruits.<br><br>I like…<br><br>Do you like….? | **Activity :**<br>Draw fruits, colour and say<br><br>**Song:(39)**<br>I like hoppers//<br>How about you? //<br>Do you like hoppers? //<br>Yes, I do//<br><br>I like hoppers//<br>How about you? //<br>Do you like hoppers? //<br>No, I don't//<br><br>(Tune: brother John)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **08. How Information is Received (41)** | 1. newspaper<br>2. letters<br>3. sad<br>4. angry<br>5. happy<br>6. notice board | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song:** (42)<br>Newspapers letters//<br>notice board//<br><br>we see news news//<br><br>happy angry sad//<br><br>(Tune: brother John)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |

| Theme | Vocabulary | Structures | Activities |
| --- | --- | --- | --- |
| **09. Changes in the Environment (44)** | 1. dry<br>2. wet<br>3. windy<br>4. sunny<br>5. rainy<br>6. dusty<br>7. tidy<br>8. untidy | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song:** (45)<br>Sunny days are dusty and dry///<br>Monday to Friday<br><br>Rainy days are windy and wet///<br>Monday to Friday<br><br>(London Bridge tune)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **10. Our Well-being (47)** | 1. see<br>2. hear<br>3. speak<br>4. smell<br>5. do<br>6. think<br>7. mind | | **Song:** (48)<br>Be careful//<br>with your little eyes<br><br>What your eyes see.//<br><br>Be careful//<br>with your little ears<br><br>What your ears hear.//<br><br>Be careful//<br>with your little mouth<br><br>What your mouth speaks.<br><br>Be careful//<br>with your little nose<br><br>What your nose smells//.<br><br>Be careful//<br>with your little hands<br><br>What your hands do//.<br><br>Be careful//<br>with your little mind<br><br>What your mind thinks.//<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| **11. How We Get Our Needs (50)** | 1. farmer<br>2. carpenter<br>3. baker<br>4. teacher<br>5. paddy<br>6. grows<br>7. bread<br>8. learn | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song:(51)**<br>1. The chair helps to sit //<br>He! Ho! The dairy oh<br>The chair helps to sit.<br><br>2. Who made the chair?//<br>He! Ho! The dairy oh<br>Who made the chair?<br><br>The carpenter made the chair//<br>He! Ho! The dairy oh<br>The carpenter made the chair.<br><br>3. Who grows paddy? //<br>He! Ho! The dairy oh<br>Who grows paddy?<br>The farmer grows paddy//<br>He! Ho! The dairy oh<br>The farmer grows paddy<br><br>4. Who makes bread? //<br>He! Ho! The dairy oh<br>Who makes bread?<br>Baker makes bread//<br>He! Ho! The dairy oh<br>Baker makes bread.<br><br>5. Who helps to learn?//<br>He! Ho! The dairy oh<br>Who helps to learn?<br>The teacher helps to learn//<br>He! Ho! The dairy oh<br>The teacher helps to learn |

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| **12. Transport** (52) | 1. wheelbarrow<br>2. lorry<br>3. tractor<br>4. motorcycle<br>5. road<br>6. traffic lights | | **Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1.<br><br>**Activity :**<br>Draw them, colour and say<br><br>**Song: (53)**<br>Wheelbarrow//<br>Brung///<br>Lorry//<br>Peep///<br>Tractor//<br>Trucka//// truck<br>Motorcycle//<br>Broom///<br>traffic lights//<br>green orange and red<br>all are moving on the road<br><br>(Jingle Bells tune)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **13. Play with Light (55)** | 1. shadow<br>2. mirror<br>3. wesak lantern | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song:** (56)<br>Me and my shadow//<br>my shadow//<br>Me and my shadow<br>You are with me.<br><br>(tune:..this is…….)<br><br>Jump a little, walk a little, one two three/// (58)<br><br>Mirror//// (60)<br>smile with me//<br>Mirror////<br>I like you///<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |

| Theme | Vocabulary | Structures | Activities |
| --- | --- | --- | --- |
| **14. Places Where People Work (62)** | 1. Paddyfield<br>2. hospital<br>3. Factory<br>4. farm<br>5. mammoty<br>6. seeds | | **Activity** :<br>Draw them, colour and say<br><br>**Song: (63)**<br>Places// where we work//<br>Paddyfield// farmers<br>work//Hospital//<br>Doctors work//<br><br>Factory//<br>Workers work//<br><br>(Jimmy tune)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| 15. Different Places in the Environment (65) | 1. river<br>2. sea<br>3. mountain<br>4. rock<br>5. jungle | | **Activity** :<br>Draw them, colour and say<br><br>**Song**: (66)<br>Rivers mountains//<br>Rocks and sea//<br>Greenish jungle//<br>Beautiful//<br><br>(Tune: brother John)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **16. People who need our help (68)** | 1. elders<br>2. babies | May I help you? | **Activity** :<br>Draw them, colour and say<br><br>**Song:** (69)<br>May I help you//<br>My grandma//<br><br>Thank you my child//<br>I need help//<br><br>May I help you//<br>My little brother// |

| Theme | Vocabulary | Structures | Activities |
|---|---|---|---|
| | | | Thank you brother<br>Thank you sister<br>I need your help//<br><br>(Tune: brother John)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |
| **Mathematics**<br>(71) | 1. shapes<br>2. circle<br>3. triangle<br>4. square | | **Activity :**<br>Draw them, colour and say<br><br>**Song: (72)**<br>Circles///// every where<br>Triangles///// everywhere<br>Squares///// everywhere<br>Shapes///// everywhere<br><br>(jingle bells tune)<br><br>**Game:**<br>Create a suitable game to help them to learn those words as shown in theme 1. |

* DVD පටයේ පටිගත කර ඇති අනුපිළිවෙළ මෙහි යොදා ඇති අංකවලින් කියවේ.

# Classroom Language

**Greeting & Wishes**

Good morning

Good afternoon!

Good evening!

Good Bye!

Good Luck!

All the best!

Happy Birthday!

Happy New Year!

Merry Christmas!

Happy Christmas!

**Requests**

May I come in?

May I go out?

Silence please

Listen to me please

Hurry up please

Be quiet

Be careful

**Polite forms**

Thank you

Please, excuse me

I'm sorry

**Simple commands**

Hands up

Hands down

Run

Jump

Start

Clap your hands

Look at me

Form a line

Form a circle

Don't go out

Get ready

**Praising**

Good

Very good

That's right

Well done

I like it

**Simple question forms**

Who is shouting?

What's this?

What's that?

What is it?

Is it a ............?

Is that a ............?

Are you ready?

# 4.0 දෙවන ජාතික භාෂාව (දෙමළ)

**හැඳින්වීම**

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව පිළිබඳ දැනුවත් බව මඟින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම දෙවන ජාතික භාෂාව ඉගෙනීම මඟින් බලාපොරොත්තු වේ.

දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම මඟින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට මෙන් ම ජාතික සමඟිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට ද දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමු වන ප්‍රධාන අවධියේ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකසා ඇත.

මෙහි දී සවන් දීම හා කතා කිරීම යන භාෂා ක්ෂේත්‍ර සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇත. ඒ අනුව මෙම නිපුණතා සකසා ඇත්තේ සිසුන්ගේ වයස, පරිණතිය හා ඔවුන්ගේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින් ය.

**ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා**

- එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
- භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
- භාෂාවක් හැසිරවීමේ යහ පුරුදු ප්‍රදර්ශනය කරයි.
- අන් අය ඉදිරියේ තම අදහස් ද ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
- කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරමින් එය අර්ථාන්විත ව භාවිත කරයි.
- කවි, ගී අසමින් ගයමින් රස විඳියි.
- තවත් භාෂාවක් හැසිරවීම මඟින් වින්දනයක් ලබයි.
- තවත් භාෂාවක් හැසිරවීමට ඇති හැකියා අගයයි.

**පළමු වන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා**

- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදිව හා සුහද ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සුහද ව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනත ව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන නිවැරදි උච්චාරණයෙන් යුතු ව නම් කරයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

**දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා**

- උපන් දින සඳහා සුබ පතයි.
- ආචාරශීලී ව, සුහද ව ඉල්ලීම් කරයි.
- පවුලේ සාමාජිකයන්ගේ ඥාතීත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.
- 1-10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.
- පාට නම් කරමින් සරල වැකි කියයි.
- අන්‍යොන්‍ය සුහදතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.
- එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ නම් කරයි.
- ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.
- අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිපදෙනකු නම් කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

සැලසුම් සහගත ක්‍රියාකාරකම් ඇසුරින් දෙවන ජාතික භාෂාවට අදාළ ව අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය ය. සිසුන් අදාළ නිපුණතා කරා ළඟා කර ගැනීමේ ලා යෝජිත ක්‍රියාකාරකම් යොදා ගැනීමට මෙන්ම අවස්ථෝචිත ව ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ද ඔබට නිදහස ඇත.

## දෙවන ජාතික භාෂාව (දෙමළ)

### විෂය නිර්දේශය

**නිපුණතාව**

උපන් දින සඳහා සුබ පතයි.

| | | |
|---|---|---|
| **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள** | ඉනිය පිරන්දනාළ් වාල්ත්තුක්කළ් | (සුබ උපන් දිනයක් වේවා) |
| நன்றி | නන්රි | (ස්තුතියි) |

**නිපුණතාව**

ආචාරශීලී ව හා සුහද ව ඉල්ලීම් කරයි.

| | | |
|---|---|---|
| புத்தகம் எடுங்கள் | පුත්තහම් එඩුංගළ් | (පොත ගන්න.) |
| பென்சில் தாருங்கள் | පෙන්සිල් තාරුංගළ් | (පැන්සල දෙන්න.) |
| இங்கே வாருங்கள் | ඉංගේ වාරුංගළ් | (මෙහෙ එන්න) |
| அங்கே போங்கள்/செல்லுங்கள் | අංගේ පෝංගළ් | (එහෙ යන්න.) |
| இங்கே பாருங்கள் | ඉංගේ පාරුංගළ් | (මෙහෙ බලන්න) |
| அங்கே இருங்கள் | අංගේ ඉරුංගළ් | (අතනින් ඉඳගන්න) |
| அங்கே ஓடுங்கள் | අංගේ ඕඩුංගළ් | (අතනට දුවන්න) |
| இங்கே நில்லுங்கள் | ඉංගේ නිල්ලුංගළ් | (මෙහෙ නවතින්න) |

**නිපුණතාව**

පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| அம்மா | අම්මා | (අම්මා) |
| அப்பா | අප්පා | (තාත්තා) |
| அக்கா | අක්කා | (අක්කා) |
| அண்ணா | අණ්ණා | (අයියා) |
| தங்கை | තංගෛ | (නංගී) |
| தம்பி | තම්බි | (මල්ලි) |

**නිපුණතාව**

මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.

| | |
|---|---|
| உங்கள் அம்மா பெயர் என்ன? | උංගළ් අම්මා පෙයර් එන්න ?<br>(ඔයාගේ අම්මාගේ නම මොකක් ද ? |
| எனது அம்மா பெயர் ............ | එනදු අම්මා පෙයර්<br>(මගේ අම්මාගේ නම .....................) |
| உங்கள் அப்பா பெயர் என்ன? | උංගළ් අප්පා පෙයර් එන්න ?<br>(ඔයාගේ තාත්තාගේ නම මොකක් ද ? |
| எனது அப்பா பெயர் ............ | එනදු අප්පා පෙයර්<br>(මගේ තාත්තාගේ නම .....................) |

| | |
|---|---|
| உங்கள் அண்ணா பெயர் என்ன? | උංගළ් අණ්ණා පෙයර් එන්න ?<br>(ඔයාගේ අයියාගේ නම මොකක් ද ? |
| எனது அண்ணா பெயர் ........... | එනදු අණ්ණා පෙයර්<br>(මගේ අයියාගේ නම ....................) |
| உங்கள் அக்கா பெயர் என்ன? | උංගළ් අක්කා පෙයර් එන්න ?<br>(ඔයාගේ අක්කාගේ නම මොකක් ද ? |
| எனது அக்கா பெயர் ........... | එනදු අක්කා පෙයර්<br>(මගේ අක්කාගේ නම ....................) |
| உங்கள் தங்கை பெயர் என்ன? | උංගළ් තංගෛ පෙයර් එන්න ?<br>(ඔයාගේ නංගිගේ නම මොකක් ද ? |
| எனது தங்கை பெயர் ........... | එනදු තංගෛ පෙයර්<br>(මගේ නංගිගේ නම ....................) |
| உங்கள் தம்பி பெயர் என்ன? | උංගළ් තම්බි පෙයර් එන්න ?<br>(ඔයාගේ මල්ලිගේ නම මොකක් ද ? |
| எனது தம்பி பெயர் ........... | එනදු තම්බි පෙයර්<br>(මගේ මල්ලිගේ නම ....................) |
| எனக்கு அக்கா இல்லை | එනක්කු (අක්කා) ඉල්ලෛ<br>(මට අක්කා කෙනෙක් නැහැ) |

**නිපුණතාව**

1 - 10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

| | | |
|---|---|---|
| ஒன்று | ඔන්රු | (එක) |
| இரண்டு | ඉරණ්ඩු | (දෙක) |
| மூன்று | මූන්රු | (තුන) |
| நான்கு | නාන්ගු | (හතර) |
| ஐந்து | ඓන්දු | (පහ) |
| ஆறு | ආරු | (හය) |
| ஏழு | ඒළු | (හත) |
| எட்டு | එට්ටු | (අට) |
| ஒன்பது | ඔන්බදු | (නවය) |
| பத்து | පත්තු | (දහය) |

**නිපුණතාව**

පාට නම් කරමින් සරල වැකි කියයි.

| | | |
|---|---|---|
| வானம் நீல நிறம் | වානම් නීල නිරම් | (අහස නිල් පාට යි) |
| இலை பச்சை நிறம் | ඉලෛ පච්චෛ නිරම් | (කොළය කොළ පාට යි) |
| வாழைப்பழம் மஞ்சள் நிறம் | වාළෛප්පළම් මඤ්ජළ් නිරම් | (කෙසෙල් කහ පාට යි) |
| கொக்கு வெள்ளை நிறம் | කොක්කු වෙල්ළෛ නිරම් | (කොකා සුදු පාට යි) |
| காகம் கறுப்பு நிறம் | කාහම් කරුප්පු නිරම් | (කපුටා කළු පාට යි) |
| ஜம்பு சிவப்பு நிறம் | ජම්බු සිවප්පු නිරම් | (ජම්බු රතු පාට යි) |

නිපුණතාව

අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.

| | | |
|---|---|---|
| எப்படி சுகம்? | එප්පඩි සුහම් ? | (සැප දුක් කොහොම ද ?) |
| நல்ல சுகம் | නල්ල සුහම් | (සුවෙන් සිටිනවා) |

නිපුණතාව

එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ කිහිපයක් නම් කරයි.

| | | |
|---|---|---|
| பென்சில் | පෙන්සිල් | (පැන්සල) |
| புத்தகம் | පුත්තහම් | (පොත) |
| மேசை | මේසෛ | (මේසය) |
| கதிரை | කදිරෛ | (පුටුව) |
| அடிமட்டம் | අඩිමට්ටම් | (අඩිකෝදුව) |

නිපුණතාව

ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| இடியப்பம் | ඉඩියප්පම් | (ඉඳිආප්ප) |
| பிட்டு | පිට්ටු | (පිට්ටු) |
| சோறு | සෝරු | (බත්) |
| பாற்சோறு | පාට් සෝරු | (කිරිබත්) |
| அப்பம் | අප්පම් | (ආප්ප) |

නිපුණතාව

අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිප දෙනෙකු නම් කරයි.

| | | |
|---|---|---|
| நாய் | නාය් | (බල්ලා) |
| பூனை | පූනෛ | (පූසා/බළලා) |
| காகம் | කාහම් | (කපුටා) |
| கிளி | කිළි | (ගිරවා) |
| அணில் | අණිල් | (ලේනා) |

*සැ.යු. : මෙම විෂය ක්ෂේත්‍රය තුළ හඳුන්වා දී ඇති වචන කථනය සඳහා මිස ලිවීම සඳහා නොවන බව අවධාරණය කරමු.*

## නිපුණතාව : උපන්දින සඳහා සුබ පතයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුවරයා පන්තියේ සිසුන්ට **வணக்கம்** (වණක්කම්) ලෙස ආචාර කරන්න.
- පන්තියේ සිසුන් ද **வணக்கம்** (වණක්කම්) ලෙස ප්‍රතිචාර දැක්වීමට යොමු කරන්න.
- ඕනෑම අයෙකුගේ උපන් දිනයක දී අප විසින් සුබ පැතුම් කිරීම හොඳ පුරුද්දක් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- අප 'සුබ උපන් දිනයක් වේ වා' ලෙස සිංහල භාෂාවෙන් කරන සුබ පැතීම **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்** (ඉනිය පිරන්දනාල් වාල්ත්තුක්කල්) ලෙස දෙමළ බසින් කළ හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.
- මෙම වගන්තිය සිසුන් ලවා කිහිප වරක් උච්චාරණය කරවන්න.
- නිවැරදි උච්චාරණය හුරු කරවීම සඳහා වචනයෙන් වචනය වෙන් වශයෙන් උච්චාරණයට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**


- සුබ පැතීම් සඳහා භාවිත කරන වැකි හොඳින් තහවුරු කරගත් පසු ගුරුවරයා සිසුන්ට බෝනික්කකු පෙන්වා ඇයට සුදුසු නමක් සිසුන් ලවා යෝජනා කරගන්න.
- අද දිනට බෝනික්කාගේ උපන් දිනය යෙදී ඇති හෙයින් සියලු දෙනා එක් වී බෝනික්කාට සුබ පතමු යැයි පවසා දෙමළ බසින් බෝනික්කාට සුබ පතන්න.
- සිසුන් බෝනික්කා වෙත සුබ පැතීම කළ පසු, ගුරුවරයා ඒ සඳහා **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දක්වන්න.
- අපට යම් අයකු සුබ පැතීමක් කළ විට හෝ අප යම් උදවුවක්/උපකාරයක් කළ විට අප විසින් ස්තුති යි යැයි පැවසීම හොඳ පුරුද්දක් බව ද දෙමළ බසින් **நன்றி** (නන්රි) යන වචනයෙන් 'ස්තුති යි' යන අදහස ප්‍රකාශ වන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.
- **நன்றி** (නන්රි) ස්තුති යි වචනය ද සිසුන් හොඳින් තහවුරු කරගන්නා තෙක් කිහිප වරක් උච්චාරණය කරවන්න.
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකු අතට බෝනික්කා වරින් වර ලබා දී අනෙක් සිසුන් ලවා බෝනික්කාට සුබ පැතීමටත් බෝනික්කා අත ඇති සිසුන් විසින් **நன்றி** (නන්රි) ස්තුති යි ලෙස ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න. රවුමේ මැද ගුරුතුමිය සිටගන්න.
- 'අද මගේ උපන් දිනය. හැම දෙනා ම මට සුබ පතන්න.' යනුවෙන් පවසා එක් එක් සිසුවාට දෙමළ බසින් උපන් දින සුබ පැතීම් සඳහා ඉගෙන ගත් වැකිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා විසින් **நன்றி** (නන්රි) ස්තුති යි යනුවෙන් ප්‍රතිචාර දැක්වීම සිදු කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. ඉන් එක් සිසුවකු කණ්ඩායමේ මැද සිටුවා අනෙක් සිසුන් ලවා එම සිසුවා හට උපන් දින සුභ පැතීම් සිදු කරන්න.
- සුබ පැතුම් ලබන සිසුවා **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දැක්වීමට ද යොමු කරන්න.
- මේ ආකාරයට කණ්ඩායමේ සියලු සිසුන්ට රවුම මැදට පැමිණ සුබ පැතුම් ලැබීමට හා ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- පහත සඳහන් පරිදි සකසා ගත් වර්ණ සහිත මල් එක බැගින් සිසුන්ට ලබා දෙන්න.

  *උදා* : පන්තියේ සිසුහු 25ක් සිටිත් නම් එක් වර්ණයකින් මල් 5 බැගින් මල් 25ක් සකසා ගන්න.





- සිසුන් පළමු වන ශ්‍රේණියේ දී ඉගෙන ගත් වර්ණ පිළිබඳ අවබෝධය තව දුරටත් තහවුරු කර ගැනීම සඳහා ගුරුවරයා පාට පහකින් යුත් මල් අතට ගෙන එකිනෙක පෙන්වා දෙමළ බසින් එහි දැක්වෙන පාට පිළිබඳ විමසන්න.

  *උදා* : **நீல நிறம்** (නීල නීරම්) නිල් පාට
- මේ ආකාරයට පාට පහ ම සිසුන් හඳුනාගෙන එම වර්ණ හඳුන්වන නම් උච්චාරණය කළ පසු ක්‍රියාකාරකම් ආරම්භ කරන්න.
- ගුරුවරයා රවුම මැද සිටගන්න.
- ගුරුවරයා විසින් ඉහත සඳහන් වර්ණ අතුරින් එක් වර්ණයක් පවසන්න.
  *උදා* : **நீல நிறம்** (නීල නීරම්) නිල් පාට
- එම වර්ණය සහිත මල් අත ඇති සිසුන් ඉදිරියට කැඳවන්න.
- ඉන් පසු එක් එක් සිසුවා තමා අතැති මල ගුරුවරයා අතට දී ගුරුවරයාට, **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்** (ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කළ්) සුබ උපන්දිනයක් වේ වා යනුවෙන් සුබ පැතීමට යොමු කරන්න.
- මෙහිදී ගුරුතුමිය විසින් **நன்றி** (නන්රි) ස්තුතියි යනුවෙන් ප්‍රතිචාර දැක්විය යුතු ය.
- නැවතත් සිසුන් රවුමේ තමන් සිටින තැනට යොමු කරන්න. නැවත වෙනත් වර්ණයක් ගුරුවරයා නම් කරන්න. එම සිසුන්ට ද ඉහත ආකාරයට සුබ පැතීම කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  මේ ආකාරයට ගුරුවරයා සියලු වර්ණ නම් කරමින් සියලු සිසුන් ක්‍රියාකාරකම සඳහා සම්බන්ධ කරගන්න.

**ක්‍රියාකාරකම 4**

- ක්‍රියාකාරකම 3 සඳහා යොදා ගත් මල් මෙම ක්‍රියාකාරකම සඳහා ද භාවිත කරන්න.
- එක් වර්ණයක මල් සහිත සිසුන් හා තවත් වර්ණයක මල් සහිත සිසුන් මුහුණට මුහුණ ලා සිටින සේ රූපයේ දැක්වෙන ආකාරයට පේළියට සිටුවන්න.



- නිල් වර්ණය සහිත මල් රැගත් සිසුන් විසින් කොළ වර්ණයේ මල් සහිත සිසුන්ට තමා ළඟ ඇති මල ලබා දී සුබ පැතීම් කිරීමටත් කොළ වර්ණය සහිත අයට ඒ සඳහා 'නන්රි' ලෙස ප්‍රතිචාර දැක්වීමටත් උපදෙස් ලබා දෙන්න.
- නැවත කොළ වර්ණය සහිත සිසුන් තමා අත පෙර තිබූ කොළ පාට මල තමා ඉදිරියෙන් සිටින සිසුන්ට ලබා දී පෙර පරිදි ම සුබ පැතීම් කිරීමටත් අනෙක් කණ්ඩායමේ සිසුන් විසින් ප්‍රතිචාර දැක්වීමටත් යොමු කරන්න.
- පන්තියේ සියලු ම සිසුන් සහභාගි වන ආකාරයට මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.
- සිසුන්ගේ අත ඇති මල්වල වර්ණ හුවමාරු වන සේ බෙදා දී පෙර පරිදි ම මෙම ක්‍රියාකාරකම නැවත නැවත සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- උපන්දින සුබ පැතීම ගීතයකින් සිදු කිරීමට සූදානම් වන ලෙස සිසුන්ට පවසන්න.
- ආසන්න දිනයක දී උපන්දිනය සමරන හෝ උපන්දිනය සැමරූ හෝ සිසුවකු ඉදිරියට කැඳවන්න.

  ( Happy birthday to you . . . . ගීතයේ තනුවට අනුව මෙම ගීතය ගායනා කරන්න.)

  | | |
  |---|---|
  | ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
  | ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
  | ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කල් (සමන්/. . . .) | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |
  | ඉනිය පිරන්ද නාළ් වාළ්තුක්කල් | இனிய பிறந்தநாள் வாழ்த்துக்கள் |

- සැම සිසුවෙකුගේ ම උපන් දින යෙදෙන දවස් මේ ආකාරයට සිසුන් ලවා සුබ පැතීම් සිදු කරන්න.

## නිපුණතාව : ආචාරශීලී ව හා සුහද ව ඉල්ලීම් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- ගුරුවරයා **ஓடுங்கள்** (ඕඩුංගළ්) දුවන්න හා **நில்லுங்கள்** (නිල්ලුංගළ්) නවතින්න යන විධාන සිසුන්ට නැවත මතක් වන සේ වරින් වර ලබා දෙමින් සිසුන් එක තැන දිවීමටත්, දිවීම නැවැත්වීමටත් කටයුතු කරන්න.
- ගුරුවරයා **அங்கே** (අංගේ) යන වචනයෙන් අදහස් වන්නේ '**අතනට**' යන්නත්, **இங்கே** (ඉංගේ) යන වචනයෙන් අදහස් වන්නේ 'මෙතනට' යන්නත් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර පහත දැක්වෙන ආකාරයට විධාන ලබා දෙන්න.
  **ஓடுங்கள்** (ඕඩුංගළ්) - දුවන්න, **நில்லுங்கள்** (නිල්ලුංගළ්) - නවතින්න, **இங்கே வாருங்கள்** (ඉංගේ වාරුංගළ් ) - මෙහෙ එන්න
- මේ ආකාරයට ම පහත දැක්වෙන විධාන ද යොදා ගනිමින් ක්‍රියාකාරකම සංවිධානය කරගන්න.

  **இங்கே பாருங்கள்** (ඉංගේ පාරුංගළ්) මෙහෙ බලන්න

  **இங்கே வாருங்கள்** (ඉංගේ වාරුංගළ්) මෙහෙ එන්න

  **இங்கே நில்லுங்கள்** (ඉංගේ නිල්ලුංගළ්) මෙහෙ නවතින්න

  **அங்கே போங்கள்** (අංගේ පෝංගළ්) එහෙ යන්න

  **அங்கே இருங்கள்** (අංගේ ඉරුංගළ්) අතනින් ඉඳගන්න

**ක්‍රියාකාරකම 2**

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම නායකයකු බැගින් පත් කරන්න.
- නායකයා විසින් ක්‍රියාකාරකම 01 හි දී ගුරුවරයා විසින් සිදු කරන ලද ආකාරයට තම කණ්ඩායමේ අනෙක් සිසුන්ට විධාන ලබා දිය යුතු අතර එම සිසුන් විධානයට අනුව ප්‍රතිචාර දැක්විය යුතු වේ.
- නායකයා ලෙස කටයුතු කිරීමට සෑම සිසුවෙකුටම අවස්ථාව සැලසෙන පරිදි මෙම ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- මෙම නිපුණතාව යටතේ හඳුන්වා දී ඇති සුහද ඉල්ලීම් සඳහා වන වැකි පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කරන අතර සුදුසු පරිදි භාවිත කරන්න.
- සිසුන් ද එම වැකි භාවිතයට යොමු වන සේ අවස්ථා සම්පාදනය කරන්න.

## නිපුණතාව : පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- අම්මා, තාත්තා, අක්කා, අයියා, නංගි, මල්ලි යන අය පැහැදිලි ව පෙන්නුම් කරන ආකාරයට දඬු රූකඩ 6ක් සකසා ගන්න.
- තම නිවසේ සිටින සාමාජිකයෝ කවුරු දැයි සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.

  *උදා :* අම්මා, තාත්තා, අයියා, අක්කා, නංගි, මල්ලි
- ගුරුවරයා විසින් 'අම්මා ' ලෙස සකස් කරගත් දඬු රූකඩය ඉදිරිපත් කරන්න.

  'මේ අපේ අම්මා'. 'අම්මා ට' දෙමළ බසින් **அம்மா** 'අම්මා' යන්න ම භාවිත කරන බව සිසුන්ට පැහැදිලි කරන්න.
- 'අම්මා' යන්න සිසුන් සමඟ කිහිප වරක් උච්චාරණය කරන්න.
- දෙවනු ව තාත්තාගේ දඬු රූකඩය ඉදිරිපත් කර 'මේ තාත්තා'- 'තාත්තාට' දෙමළ භාෂාවෙන් **அப்பா** 'අප්පා' යනුවෙන් භාවිත කරන බව පවසා සිසුන් සමඟ එම වචනය ද උච්චාරණය කරන්න.
- 'අක්කා' ගේ දඬු රූකඩය ඉදිරිපත් කර දෙමළ භාෂාවෙන් ද 'අක්කා'ට **அக்கா** 'අක්කා' යනුවෙන් භාවිත කරන බව පවසන්න. එම වචනය ද සිසුන් සමඟ කිහිප වරක් උච්චාරණය කරන්න.
- මේ ආකාරයට ම 'අයියා' යන්න සඳහා **அண்ணா** 'අණ්ණා' ලෙස යෙදෙන බව ද, 'නංගි' යන්න සඳහා **தங்கை** 'තංගෛ' ලෙස යෙදෙන බව ද, 'මල්ලි' යන්න සඳහා **தம்பி** 'තම්බි' යන්න යෙදෙන බව ද පැහැදිලි කරන්න.
- ගුරුවරයා විසින් භාවිත කරන ලද දඬු රූකඩ සියල්ල රැගෙන එක් එක් රූපය ඉදිරිපත් කරමින් පන්තියේ සිසුන්හට ඒ අය කවුරුන් දැයි දෙමළ බසින් හඳුන්වන ලෙස පවසන්න.
- සිසු අවබෝධය පිරික්සා බැලීම සඳහා අහඹු ලෙස නම් කරනු ලබන සිසුන්ගෙන් ද පිළිතුරු ලබා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- එළිමහනේ සුදුසු ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- පවුලේ සාමාජිකයන් පිළිබඳ ගීතයක් ගැයීමට සූදානම් වන ලෙස පවසා පහත දැක්වෙන ගීතය පේළියෙන් පේළිය ගුරුවරයා විසින් ගායනා කරන්න.


, , ,a d , , , , d ' ' ' $

| | |
|---|---|
| wï u d t x. , awï u d | wl la d t x. , awl la d |
| wmand t x. , awmand | ; ï ì t x. , a; ï ì |
| wK lK d t x. , awK lK d | ; xf f . t x. , a; xf f . |
| , , ,a d , , , , d ' ' ' $ | , d, ,a , , , , d ' ' ' $ |

- මෙම ගීතයේ 'එංගල්' යනුවෙන් අදහස් වන්නේ 'අපේ' යන්න යි.
- පසු ව ගීතය පෙළින් පෙළ සිසුන් සමඟ ද ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 3**

- පන්තියේ සිසුන් එළිමහනේ සුදුසු ස්ථානයකට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- ක්‍රියාකාරකම 1 සඳහා සකස් කරගත් පවුලේ සාමාජිකයන්ගේ දඬු රූකඩ හය සිසුන් අතර බෙදා දෙන්න.
- ගීතයක් වාදනය වීමට සලස්වා දඬු රූකඩ අතින් අත මාරු කරගන්නා ලෙස පවසන්න. ගීතය නතර කරන අවස්ථාවේ දී දඬු රූකඩ අතැති සිසුන්ට තමා කවුරු දැයි හඳුන්වා දිය යුතු ය.
  *උදා* : * මවගේ දඬු රූකඩය අතැති සිසුවා - **நான் அம்மா** නාන් අම්මා (මම අම්මා)
  * අයියාගේ දඬු රූකඩය අතැති සිසුවා - **நான் அண்ணா** නාන් අණ්ණා (මම අයියා)
- මේ ආකාරයට දඬු රූකඩ අතැතිව සිටින සිසුන් හය දෙනාගෙන් ම ප්‍රකාශ ලබා ගන්න. නැවත ගීතය වාදනය වීමට සලස්වා පෙර පරිදි ම ක්‍රියාකාරකම සිදු කරන්න.
- සිසුන්ට වචන පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.






**ක්‍රියාකාරකම 4**

- පන්තියේ සිසුන් 6 දෙනා බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
- සෑම සිසු කණ්ඩායමකට ම අම්මා, තාත්තා, අක්කා , අයියා , නංගි , මල්ලි යන චරිත සඳහා සුදුසු වෙස් ගැන්වීම් සිදු කරන්න.
- සිසුන් තනි තනි ව පන්තිය ඉදිරියට පැමිණ තමා හඳුන්වාදීමට අවස්ථාව ලබා දෙන්න.
  *උදා* : **நான் தங்கை** (නාන් තංගෛ) මම නංගි
- පසු ව චරිත අනුකරණයට යොදාගත් ද්‍රව්‍ය සිසුන් අතර හුවමාරු කරමින් එම චරිත හඳුන්වාදීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 5**

- එක් කාඩ්පතක පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකු නියෝජනය වන ආකාරයට පන්තියේ සිටින සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් වන සේ රූප කාඩ්පත් සකසා ගන්න.
- මේ ආකාරයට සකසා ගත් කාඩ්පත් එක් සිසුවකුට එක බැගින් වන සේ බෙදා දෙන්න.
- සැම කාඩ්පතක ම දක්වෙන්නේ පවුලක සාමාජිකයන් බව පවසන්න
- පසුව එක් එක් සිසුවාගෙන් තමා සතු ව ඇති කාඩ්පතේ දක්වෙන පවුලේ සිටින සාමාජිකයින් කවුරු ද යන වග දෙමළ භාෂාවෙන් පැවසීමට යොමු කරන්න.
- සිසුන් අතර කාඩ්පත් හුවමාරු කරමින් දරුවන් තුළ පවුලේ සාමාජිකයන් පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.





## නිපුණතාව : මිතුරන් සමඟ පවුලේ තොරතුරු හුවමාරු කර ගනියි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුතුමිය පන්තියේ සිසුන් ඉදිරියේ සිටගෙන

  නාන් කුමාරි (මම කුමාරි)

  එනදු පෙයර් කුමාරි (මගේ නම කුමාරි)

  එනදු අම්මා පෙයර් ලතා (මගේ අම්මාගේ නම ලතා) ආදි වශයෙන් පවසන්න.
- මේ ආකාරයට වාර කිහිපයක් උච්චාරණය කරන්න.
- පසු ව අහඹු ලෙස තෝරා ගන්නා සිසුවකුගෙන් **உங்கள் பெயர் என்ன?**(උංගල් පෙයර් එන්න) ලෙස විමසා පිළිතුරු ලබා ගන්න.
- නැවත **உங்கள் அம்மா பெயர் என்ன?**උංගල් අම්මා පෙයර් එන්න? (ඔයාගේ අම්මාගේ නම මොකක් ද ?) ලෙස විමසා පිළිතුරු ලබා ගන්න.
- සිසුන් දෙදෙනා බැගින් පන්තිය ඉදිරියට කැඳවන්න.
- සිසුන් දෙදෙනාට පහත දැක්වෙන ආකාරයේ දෙබසක් ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න

  **உங்கள் பெயர் என்ன?** උංගල් පෙයර් එන්න ?

  **எனது பெயர்** එනදු පෙයර් ...................... (ජනක)

  **உங்கள் அம்மா பெயர் என்ன?** උංගල් අම්මා පෙයර් එන්න?

  **எனது அம்மா பெயர்** ............ එනදු අම්මා පෙයර් ....................( සීතා)

- මේ ආකාරයට අප්පා (තාත්තා), අක්කා (අක්කා), අණ්ණා (අයියා),තංගෛයි (නංගි) තම්බි (මල්ලි) යන අයගේ තොරතුරු විමසීමට ද සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- අම්මා. තාත්තා, අක්කා, අයියා, නංගී, මල්ලි යන අයගේ රූප තරමක ගනකමින් යුතු කාඩ්පත්වල අලවා පන්තියේ සිසු කණ්ඩායම්වලට එක් කට්ටලය බැගින් ලබා දිය හැකි ප්‍රමාණයට සකසා ගන්න.
- සෑම කාඩ්පත් කට්ටලයක් ම කුඩා පෙට්ටියක් තුළට දමන්න.
- ඒවා කණ්ඩායම්වලට ලබා දී වරකට එක් කාඩ්පත බැගින් එක් සිසුවකුට ලබා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- කාඩ්පත් ලබා ගත් සිසුවා අම්මාගේ රූපය සහිත කාඩ්පත තෝරා ගත්තේ නම් ඔහු/ ඇය තමාට දකුණු පසින් සිටින සිසුවාගෙන් 'උංගල් අම්මා පෙයර් එන්න' ලෙස විමසිය යුතු අතර අනෙක් සිසුවා ඊට පිළිතුරු ලබාදිය යුතු ය.
- මේ ආකාරයට හඳුන්වා දි ඇති ප්‍රකාශ සිසුන් තුළ හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.
- යම් අවස්ථාවක 'මට අක්කා කෙනෙක් නැහැ' වශයෙන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වුවහොත් එය පහත දක්වා ඇති ආකාරයට සිදු කළ හැකි ය.

  **எனக்கு அக்கா இல்லை** (එනක්කු අක්කා ඉල්ලෛ) මට අක්කා කෙනෙක් නැහැ . . . ආදි වශයෙනි.

## නිපුණතාව : 1 - 10 තෙක් සංඛ්‍යා අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පළමු වන ශ්‍රේණියේ දී 1 සිට 5 තෙක් සංඛ්‍යා දෙමළ බසින් පැවසීමට සිසුන් හැකියාව ලබා ඇති බැවින් එම මතකය ආවර්ජනය කිරීම සඳහා සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායමකට සිසුන් 5ක් හෝ 6ක් වන සේ කුඩා කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන් කරන්න.
- සෑම සිසු කණ්ඩායමකට සකස් කරගත් කුඩා ප්‍රමාණයේ කොඩි 10ක් හා ඒවා රැඳවිය හැකි ආකාරයේ වැලි පිරවූ බඳුනක් ද ලබා දෙන්න.
- ගුරුවරයා දමිළ බසින් 1-5 අතර සංඛ්‍යාවක් පවසන්න. ඊට ගැළපෙන ප්‍රමාණයෙන් කොඩි කණ්ඩායමේ සියලු ම සිසුන්ගේ එකඟතාව මත බඳුන තුළ රැඳවිය යුතු බවට උපදෙස් ලබා දෙන්න.

  *උදා :* ගුරුවරයා -: **ஐந்து** ඓන්දු (පහ)

  ළමයි :- (කොඩි පහක් බඳුන තුළ රැඳවිය යුතු ය.)
- 1 - 5 තෙක් සංඛ්‍යා නාම පිළිබඳ මතකය ආවර්ජනය වන සේ ක්‍රියාකාරකම කිහිප වරක් සිදු කරන්න.
- අනතුරු ව 6 හා 7 යන සංඛ්‍යා සඳහා භාවිත කරන සංඛ්‍යා නාම සිසුන්ට හඳුන්වා දෙන්න.

  *උදා :* 6 - **ஆறு** ආරු (හය)


  7 - **ஏழு** ඒළු (හත)
- සිසුන් සමඟ අත්පුඩි ගසමින් 1 - 7 තෙක් සංඛ්‍යා දෙමළ බසින් කියන්න.
- පෙර පරිදි ක්‍රියාකාරකම සිදු කරන අතර ගුරුවරයා විසින් **ஆறு (ආරු) - 'හය', ஏழு (ඒළු) - 'හත'** යන වචන වැඩි වාර ගණනක් භාවිත වන පරිදි කොඩි භාවිත කරමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- මේ ආකාරයට **எட்டு** (එට්ටු) - 'අට', **ஒன்பது** (ඔන්බදු) - 'නවය', **பத்து** (පත්තු) - 'දහය' සංඛ්‍යා ද හඳුන්වා දෙන්න.
- කොඩි භාවිත කරමින් සිදු කළ ක්‍රියාකාරකම 8 -10 තෙක් සංඛ්‍යා යොදා ගනිමින් ද සිදු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමට සිටුවන්න.
- 1-10 තෙක් ඉලක්කම් ලියූ කාඩ්පත් කුඩා මල්ලක දමා ගන්න.
- එම මල්ල සිසුන්ගේ අතින් අත යවන්න.
- ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව කාඩ්පත් මල්ල අතින් අත යැවීම නතර කරන්න.
- ගුරුවරයා **எடுங்கள்** (එඩුංගළ්) ගන්න කියූ විට මල්ල අතැති සිසුවා මල්ලෙන් කාඩ්පතක් ගත යුතු ය.
- ගුරුවරයා **சொல்லுங்கள்** (සොල්ලුංගළ්) කියන්න කියූ විට කාඩ්පතේ ඇති ඉලක්කම දෙමළ බසින් පැවසිය යුතු ය.
- සිසුහු නිවැරදි ව ඉලක්කම හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරත් දැයි විමසිලිමත් වන්න. අවශ්‍ය අවස්ථාවක දී නිවැරදි කිරීම් සිදු කරන්න.
- නැවත සිසුවා ලබා ගත් කාඩ්පත එම මල්ලට ම දමා එම මල්ල සිසුන්ගේ අතින අත යවන්න. පෙර පරිදි ම ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් පේළි දෙකකට සිටුවන්න.
- පේළි දෙක ඉදිරියෙන් වැලි පිරවූ භාජන දෙකක් තබන්න. වර්ණ $A_4$ භාවිතයෙන් නිර්මාණය කරගත් 1-10 තෙක් සංඛ්‍යා වෙන ම ලියූ කොඩි කට්ටල දෙකක් සකසා ගන්න.
- කොඩි කට්ටල දෙක රූපයේ දැක්වෙන ආකාරයට වැලි පිරවූ භාජන දෙකක රඳවන්න




- ගුරුවරයා සංඛ්‍යාවක් දෙමළ බසින් පැවසූ විට කණ්ඩායම් දෙකේ පළමු සිසුන් දෙදෙනා දිවගොස් තම පේළිය ඉදිරියේ ඇති බඳුනෙන් නිවැරදි සංඛ්‍යාව දැක්වෙන කොඩිය රැගෙන ගුරුවරයාට පෙන්වා එම සංඛ්‍යාව දෙමළ බසින් ප්‍රකාශ කළ යුතු ය.
- පසු ව එම කොඩිය නැවත බඳුනේ රඳවා තමාගේ කණ්ඩායමේ පසුපසින් වාඩි විය යුතු ය.
- කණ්ඩායම් දෙකේ ම සියලු ම සිසුන් සහභාගි වන තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට වුව ද සංවිධානය කර ගත හැකි ය.

**ක්‍රියාකාරකම 4**


- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- 1 - 10 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පත් සිසුන් අතර බෙදා දෙන්න.
- ගුරුවරයා දෙමළ බසින් පවසන සංඛ්‍යාව අතැති සිසුන් රවුමේ ඉදිරියට පැමිණිය යුතු ය.
- ඉදිරියට ආ සිසුන්ට ගුරුවරයා ලබා දෙන විධානයකට අනුව ක්‍රියා කළ යුතු ය.

  *උදා :* **கை தட்டுங்கள்** 'කෛතට්ටුංගළ්', **நில்லுங்கள்** 'නිල්ලුංගළ්', **இருங்கள்** 'ඉරුංගළ්'
- සිසුන් නිවැරදි ව විධානයට අනුව ප්‍රතිචාර දැක්වූ පසුව ගුරුවරයා **போங்கள்** පෝංගළ් (යන්න.) කියා සිසුන් නැවත රවුමට පිටත් කළ යුතු ය.
- සිසුන් රවුමේ තමන්ට හිමි ස්ථානවලට ගිය පසු ඊළඟ සංඛ්‍යා නාමය පවසන්න.
- සෑම සිසුවකුට ම අවස්ථාව ලැබෙන තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5**

- 1-10 තෙක් සංඛ්‍යා දැක්වෙන රූප කාඩ්පත් පන්ති සිටින සිසුන් සංඛ්‍යාවට ප්‍රමාණවත් වන ලෙස සකසා ගන්න.
- ඒවා සෑම එකකට ම මාලයක් සේ පැළැඳිය හැකි වන අයුරින් සුදුසු පටියක් ද සවි කරන්න.

*උදා :*



- සිසුන් එළිමහනට රැගෙන ගොස්  සෑම සිසුවකුට ම සකස් කරගත් කාඩ්පත බැගින් ලබා දී ඒවා ගෙලෙහි පලඳවා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- කැසට් පටයක් ආධාරයෙන් ගීතයක් වාදනය කරන්න.  ගීතය වාදනය වන අතර සිසුන්ට රවුම වටේ සෙමෙන් දිවීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතය වාදනය වන අතර ගුරුතුමිය විසින් එම වාදනය නතර කර, යම් සංඛ්‍යාවක් ප්‍රකාශ කළ යුතු ය.  එම සංඛ්‍යාව දැක්වෙන කාඩ්පත් හිමි සිසුන් රවුමේ මැදට පැමිණිය යුතු වේ.
- නැවත ගීතය වාදනය වීමට සලස්වා රවුම මැදට පැමිණි සිසුන්ට ද නැවත රවුමක් ආකාරයෙන් සෙමෙන් දිවීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට සිසුන්ට ලැබී ඇති සංඛ්‍යා මාරු කරමින් නැවත නැවත ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- බෑගයක් හෝ කුඩා පෙට්ටියක් හෝ සපයා ගන්න.
- ඊට බහාලිය හැකි ප්‍රමාණයෙන් රබර් බෝල / වෙනත් ද්‍රව්‍ය දහයක් ද සපයා ගන්න.
- ගුරුවරිය අහඹු ලෙස සිසුවකු ළඟට ගොස් එම බෑගයෙන් හෝ පෙට්ටියෙන් හෝ ලබා ගත යුතු ද්‍රව්‍ය සංඛ්‍යාව දෙමළ බසින් පවසන්න.

  *උදා :*  **மூன்று தாருங்கள்** (මූන්රු තාරුංගළ්) තුනක් ගන්න
- එවිට අදාළ සිසුවා විසින් එම සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් ද්‍රව්‍ය ලබා ගත යුතු වේ.
- මේ ආකාරයට ගුරුතුමිය සිසුන් කිහිප දෙනෙකු ළඟට ගොස් ක්‍රියාකාරකම සිදු කරන්න.
- පසු ව ගුරුතුමිය වෙනුවට වෙනත් සිසුවකු අතට බෑගය හෝ පෙට්ටිය හෝ ලබා දී ක්‍රියාකාරකම දිගටම සිදු කරන්න.
- ගුරුතුමිය ලබා දුන් විධාන සිසුන් ලවා ම සිදු කරන්නේ නම් වඩාත් උචිත ය.
- මෙය සිසුන් කණ්ඩායම් වශයෙන් වෙන් කර වුව ද සිදු කළ හැකිය.

## නිපුණතාව : පාට නම් කරමින් සරළ වැකි කියයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- නිල්, කොළ , කහ, සුදු, කළු, රතු යන වර්ණ වෙන වෙන ම දැක්වෙන වර්ණ කාඩ්පත් 6 ලෙස සකසා ගන්න.
- වර්ණ කාඩ්පත් දෙමළ බසින් හැඳින්වීමට සිසුන් යොමු කරන්න.

  උදා - **நீல நிறம்** නිල නිරම්

  **பச்சை நிறம்** පච්චෛ නිරම්

  **வெள்ளை நிறம்** වෙල්ලෛ නිරම්................ ආදී වශයෙන්

- **வானம்** (වානම්)අහස, **இலை** (ඉලෛයි)කොළය. **வாழைப்பழம** (වාලෛප්පලම්) කෙසෙල්, **கொக்கு** ( කොක්කු)කොකා, **காகம** (කාහම්)කපුටා, **ஜம்பு** (ජම්බු) ජම්බු යන දේවල රූපය සපයා ගන්න.
- ඒවා පහත දැක්වෙන ආකාරයට වර්ණ කර ගන්න.

  අහස - නිල් පාට

  කොළය - කොළ පාට

  කෙසෙල් - කහ පාට

- රූප කාඩ්පත්වල දැක්වෙන රූප සිංහල බසින් හඳුන්වා දෙන්න.
- පසු ව අහස, කොළය, කෙසෙල් යන දේ දෙමළ බසින් හඳුන්වන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න.

  අහස -**வானம்** වානම්

  කොළය - **இலை** ඉලෛයි

  කෙසෙල් - **வாழைப்பழம்** වාලයිප්පලම්

- පසු ව එම රූපවල දැක්වෙන වර්ණ ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පසුව රූපයේ සහ වර්ණය යන දෙක ම එක් කර ඒවායේ වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරිමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* **வானம் நீல நிறம்** වානම් නීල නිරම් (අහස නිල් පාට යි)

  **இலை பச்சை நிறம்** ඉලෛයි පච්චෛ නිරම්(කොළය කොළ පාට යි)

- මේ ආකාරයට අනෙක් රූප ද හඳුන්වා දී එවායේ වර්ණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- අහස. කොළ, කෙසෙල්, කොකා, කපුටා වැනි දේ ඇතුළත් වන ආකාරයට වර්ණ නොගැන්වූ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- සැම සිසුවකුට ම එකක් බැගින් වන සේ එම චිත්‍රවල පිටපත් ලබා දෙන්න.
- ගුරුවරයා පහත දැක්වෙන ආකාරයට සිසුන්ට උපදෙස් ලබා දෙන්න. ඒ අනුව චිත්‍රය වර්ණ ගැන්වීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* **வானம் நீல நிறம்** වානම් නීල නිරම්

  **இலை பச்சை நிறம** ඉලෛ පච්චෛ නිරම් . . . ආදී වශයෙන්

- සිසුන් විසින් චිත්‍ර වර්ණ ගන්වා අවසන් වූ පසු අහඹු ලෙස තෝරා ගන්නා සිසුන්ගෙන් එහි දැක්වෙන රූපවල ඇති වර්ණ පිළිබඳ ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව : අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය සඳහා සුහද කතාබහේ යෙදෙයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුවරයා විසින් තමන්ගේ දෙඅත්වලට පලඳවා ගත හැකි ආකාරයෙන් රූකඩ දෙකක් නිර්මාණය කරගන්න.

  *උදා :* කුරුල්ලෙක් සහ පූසෙක්

  හාවෙක් සහ බල්ලෙක්

- එක් අතක තිබෙන සත්ත්ව රූපය චලනය කරමින් ගුරුවරයා විසින් අනෙක් සත්ත්ව රූපයෙන් **எப்படி சுகம்?** (එප්පඩි සුහම් ?) සුවදුක් කොහොම ද යනුවෙන් විමසන්න.
- නැවත කටහඬ වෙනස් කර අනෙක් සත්ත්ව රූකඩය චලනය කරමින් **நல்ல சுகம்** (නල්ල සුහම්) හොඳින් ඉන්නවා ලෙස පිළිතුර ලබා දෙන්න.
- අප යම් අයකුගෙන් සුවදුක් කෙසේ ද යන්න විමසීමේ දී දෙමළ බසින් **'එප්පඩි සුහම්'** ලෙස විමසන බවත්, ඊට පිළිතුර වශයෙන් 'සුවෙන් සිටිනවා' යන්න **நல்ல சுகம்** 'නල්ල සුහම්' ලෙස පවසන බවත් පැහැදිලි කරන්න.
- නැවතත් රූකඩ යොදා ගනිමින් කිහිප වතාවක් දෙබස නැවත ඉදිරිපත් කරන්න.
- මේ ආකාරයට රූකඩවල සිටින සතුන් සිසුන්ගෙන් ද සිසුන් සතුන්ගෙන් ද වශයෙන් සුවදුක් විමසීම සිදු කරන්න.
- මේ ආකාරයට ගුරුවරයා විසින් සිසුන්ගෙන් ද **எப்படி சுகம்?** 'එප්පඩි සුහම්' ලෙස විමසා ඔවුන් වෙතින් පිළිතුර ලබා ගන්න.
- සිසුන්ට ද ගුරුවරයාගෙන් ඒ ආකාරයට විමසීමට අවස්ථාව ලබා දෙන්න. මෙම වැකි හොඳින් සිසුන් තුළ තහවුරු වන තෙක් සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ යුගල වශයෙන් හෝ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- සමාන්තර පන්තියක ගුරුවරයකු/වෙනත් ගුරුවරයකු ගෙන්වා පන්තියේ සිසුන්ගෙන් මේ ආකාරයට සුවදුක් විමසීමට අවස්ථාව ලබා දී සිසුන් ඒ සඳහා පිළිතුරු ලබා දීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2**

- සුවදුක් විමසන ආකාරය හා ඊට පිළිතුරු ලබා දෙන ආකාරය ගීතයක් ආකාරයට සිසුන් සමඟ ගායනා කරන්න. මෙහිදී ගුරුවරයා විසින් ගීතය හොඳින් සිසුන්ට හුරුවන තෙක් ගායනා කර පසුව ප්‍රශ්නය එක් පාර්ශ්වයක් විසිනුත් පිළිතුර එක් පාර්ශ්වයක් විසිනුත් ලබා දෙන ආකාරයෙන් ද ගීතය ගායනා කරන්න.

| | | | |
|---|---|---|---|
| *උදා :* ගුරුවරයා | - | එප්පඩි සුහම් // | **எப்படி சுகம்?** // |
| සිසුන් | - | නල්ල සුහම් // | **நல்ல சுகம்** // |
| ගුරුවරයා | - | එප්පඩි සුහම් // | **எப்படி சுகம்?** // |
| සිසුන් | - | නල්ල සුහම් // | **நல்ல சுகம்** // |

**ක්‍රියාකාරකම 3:**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සෑම කණ්ඩායමක් ම පේළි ආකාරයෙන් සිටුවන්න.
- එම පේළි අතරින් පළමු පේළියේ සිසුන් පමණක් සිටගෙන සිටීමට සලස්වන්න.
- අනෙක් පේළිවල සිසුන් ඔවුන් සිටින ස්ථානයේ ම සිටගෙන සිටින සිසු පෙළ හොඳින් පෙනෙන ආකාරයෙන් වාඩි කරවන්න.
- සිටගෙන සිටින පේළියේ පළමු සිසුවා දෙවන සිසුවා වෙත හැරී දෙවන සිසුවාගෙන් .**எப்படி சுகம்?** (එප්පඩි සුහම්) සැප දුක් කොහොම ද යනුවෙන් විමසිය යුතු ය.
- එවිට දෙවන සිසුවා **நல்ல சுகம்** (නල්ල සුහම්) හොඳින් ඉන්නවා ලෙස පිළිතුර ලබා දිය යුතු ය.
- නැවත දෙවන සිසුවා තෙවන සිසුවා වෙත හැරී පෙර පරිදි ම විමසීම කළ යුතු අතර තෙවන සිසුවා ඊට පිළිතුරු ලබා දිය යුතු වේ.
- ප්‍රශ්නය ඉදිරිපත් කරන සිසුවා වෙත පිළිතුර ලැබුණු පසු ඔහු/ඇය පේළියේ තමා සිටි තැන ම වාඩි විය යුතු ය.
- මේ ආකාරයට පේළියේ අවසන් සිසුවා තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- පේළියේ අවසන් සිසුවා ගුරුතුමිය වෙත ගොස්, **எப்படி சுகம்?** (එප්පඩි සුහම් ?) ලෙස විමසිය යුතු අතර, ගුරුතුමිය ඊට ප්‍රතිචාර දැක්විය යුතු ය.
- මෙසේ අනෙක් පේළි සඳහා ද ක්‍රියාකාරකම සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව : එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ කිහිපයක් නම් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

* **பென்சில்** **(පෙන්සිල්)** - පැන්සල
* **மேசை** **(මේසෙ)** - මේසය
* **அடிமட்டம்** **(අඩිමට්ටම්)** - අඩිකෝදුව
* **கதிரை** (කදිරෛ) පුටුව
* **புத்தகம** (පුත්තහම්) පොත යන වචන පහ ඉගැන්වීම සඳහා පන්ති කාමරයෙන් ද්‍රව්‍ය සපයා ගන්න. නොඑසේ නම් කුඩා ආකෘති සකස් කර ගන්න.

- උපකරණ පහ වෙන වෙන ම පෙන්වමින් එම උපකරණ දෙමළ භාෂාවෙන් හඳුන්වන්න.
- නැවත නැවත එම ද්‍රව්‍ය සිසුන්ට ඉදිරිපත් කරමින් ඒවා දෙමළ බසින් හඳුන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- මෙතෙක් ඉගෙන ගත් උපකරණ (පොත, පැන්සල, මේසය, පුටුව, අඩිකෝදුව) සපයා ගන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- සිසුන් සිටින තැනට ආසන්න ව ද්‍රව්‍ය කිහිපයක් තබන්න.
- ඉතිරි උපකරණ තරමක් දුරින් තබන්න.
- ගුරුවරයා ළඟ ඇති උපකරණ පෙන්වමින්,

  *උදා :* * මේ පැන්සල
  * මේ අඩිකෝදුව
  * මේ පොත ලෙස හඳුන්වා දෙන්න.
- පෙන්වූ උපකරණවලට දෙමළෙන් කියන නම් සිසුන්ගෙන් විමසන්න.
- 'මේ පැන්සල' යනුවෙන් දෙමළෙන් කියන්නේ කෙසේ දැයි හඳුනා ගනිමු යැයි කියමින්,
  * **இது** (ඉදු) පෙන්සිල්'- මේ පැන්සල

  යන්න සිසුන්ට හඳුන්වා දෙන්න. සිසුන්ට වචන හුරු වන තෙක් උච්චාරණය කරන්න.
- මේ ආකාරයට **கதிரை** (කදිරෛ) පුටුව හා **மேசை** (මෙසෙ) මේසය වචන දෙකත් හඳුන්වා දෙන්න.
- අප ළඟ ඇති යම් දෙයක් පෙන්වීමට **இது** 'ඉදු' යන වචනය භාවිත කරන බව සිසුන්ට අවධාරණය කරන්න.
- ගුරුවරයා සිටි තැන ම සිට,
  * අර මේසය
  * අර පුටුව කියමින් දුරින් ඇති උපකරණ හඳුන්වා දෙන්න.
- මේසයට හා පුටුවට දෙමළෙන් කියන නම් සිසුන්ගෙන් විමසන්න.
- 'අර මේසය', 'අර පුටුව' යන්න දෙමළෙන් කියන ආකාරය හඳුනා ගනිමු යැයි පවසන්න.
- **அது மேசை** 'අදු මේසෙ' ලෙස හඳුන්වා දෙන්න.
- මෙය සිසුන්ට හුරු වන තෙක් උච්චාරණය කරන්න.
- **அது கதிரை**'අදු කදිරෛ' ද මෙලෙස ම හඳුන්වා දෙන්න.

- නැවත ගුරුවරයා සිසුන් සමඟ මේසය අසලට ගොස් එතැන ඇති උපකරණ **இது** 'ඉදු' යොදමින් ද, ඈතින් ඇති උපකරණ තුන **அது** 'අදු' යොදමින් ද හඳුන්වා දෙන්න.
- සිසුන්ට උච්චාරණය හුරු වන තෙක් මේ අයුරින් ක්‍රියාකාරකමේ නිරත වන්න.
- මෙම නිපුණතාව යටතේ සිසුන්ට හඳුන්වා දුන් වචන තව දුරටත් තහවුරු කිරීම සඳහා සිසුන් සමග මෙම ගීතය ගායනා කරන්න.
- ගීතයේ දැක්වෙන ආකාරයේ ද්‍රව්‍ය ද යොදා ගනිමින් ගීතය ගායනා කිරීම වඩාත් උචිත වේ.
- කණ්ඩායම් වශයෙන් හා තනි තනි ව ද ගීතය ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| 1. | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | එඩුංගළ් . . . | எடுங்கள் |
| 2. | අදු පේනෛ | அது பேனை |
| | අදු පේනෛ | அது பேனை |
| | අදු පේනෛ | அது பேனை |
| | තාරුංගළ් . . . | தாருங்கள் |
| 3. | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | එඩුංගළ් . . . | எடுங்கள் |
| 4. | ඉදු පෙන්සිල් | இது பென்சில் |
| | ඉදු පේනෛ | இது பேனை |
| | ඉදු බෝත්තල් | இது போத்தல் |
| | තාරුංගළ් | தாருங்கள் |


- අවට තිබෙන පෑන්, පැන්සල්, බෝතල් වැනි ද්‍රව්‍ය යොදා ගනිමින් ද මෙම ගීතය සිසුන් සමග ගායනා කරන්න.

## නිපුණතාව : ආහාර වර්ග කිහිපයක නම් ප්‍රකාශ කරයි.


### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**


- ඉඳිආප්ප, පිට්ටු, ආප්ප, බත්, කිරිබත් යන කෑම වර්ග සහිත පින්තූර ළමයින්ට පෙන්වන්න.
- එම ආහාර වර්ග සිංහල බසින් හඳුන්වා දෙන්න.
- පසුව එම ආහාර වර්ගවල නම් එකිනෙක දෙමළ බසින් පවසන ආකාරය හඳුන්වා දෙන්න.%




இடியப்பம் (ඉඩියප්පම්) ඉඳිආප්ප




பிட்டு (පිට්ටු) පිට්ටු



சோறு (සෝරු) බත්



பாற்சோறு (පාට්සෝරු) කිරිබත්




அப்பம் (අප්පම්) ආප්ප

- මෙම ආහාර වර්ග තුනේ රූප එකින් එක පෙන්වමින් ගුරුවරයා විසින් නම් කරනු ලබන සිසුන්ගෙන් එම ආහාර වර්ගයට දෙමළ බසින් භාවිත කරන වචනය විමසන්න. සිසුන් සියලු දෙනාට ම ආහාර වර්ග පිළිබඳ ව හොඳින් අවබෝධ වන තෙක් මෙම ක්‍රියාකාරකමෙහි නියැළෙන්න.
- සිවු වනුව හා පස් වනුව හඳුන්වා දී ඇති ආහාර වර්ගවල නම් ද හොඳින් හුරු වන තෙක් සිසුන් ලවා එම වචන නැවත නැවත කියවන්න.

**ක්‍රියාකාරකම 2**

- ඉගෙන ගත් ආහාර වර්ගවල නම් භාවිත කරමින් මෙම ක්‍රීඩාව සිදු කරන්න.
- මේ සඳහා පහත දැක්වෙන ආකාරයට ආහාර වර්ගවල රූප යොදා ගනිමින් එක් සිසුවකුට එකක් බැගින් ලැබෙන සේ කාඩ්පත් සකස් කර ගන්න.
- විවිධ වර්ණවලින් කාඩ්පත් සකස් කර ගැනීම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී සිසුන් නිරීක්ෂණයට පහසු වනු ඇත.



- සිසුන් එළිමහනට රැගෙන ගොස් රවුමක් ආකාරයට සිටුවන්න.
- පින්තූර කාඩ්පත් එක බැගින් සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා විසින් එක් ආහාර වර්ගයක නමක් පවසන විට එම ආහාර වර්ගය සහිත රූප කාඩ්පත් හිමි සිසුන් රූපය ඔසවා තමාගේ අත ඇති රූපයේ දැක්වෙන දේ ශබ්ද නඟා පැවසිය යුතු ය.


  *උදා :* ගුරුවරයා - **அப்பம்** අප්පම්

  ළමයි - ( රූපය පෙන්වමින්) අප්පම්

- මේ ආකාරයට ක්‍රියාකාරකම කිහිප වරක් සිදු කර රූප කාඩ්පත් සිසුන් අතර මාරු කරගන්න.
- පෙර පරිදි සෑම ආහාරයක් ම හොඳින් මතක සිටින තුරු ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 3:**

- සිසුන් එළිමහනට රැගෙන ගොස් කණ්ඩායම් පහකට බෙදන්න.
- සෑම කණ්ඩායමක් ම පහත දැක්වෙන ආකාරයට ආහාර වර්ගය නමින් නම් කරන්න.




- ගුරුවරයා ආහාර වර්ගයක නම දෙවරක් පවසන විට එම ආහාර වර්ගයට අදාළ කණ්ඩායම දෙවරක් අත්පුඩි ගැසීම කළ යුතු බව පවසන්න.
- සෑම කණ්ඩායමකට ම අත්පුඩි ගැසීමට හැකි වන සේ සියලු ම ආහාර වර්ගවල නම් දෙවරක් කියවන්න.
- සියලු ම කණ්ඩායම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථා කිහිපයක් ලබා දී නැවත එම කණ්ඩායම්වල ආහාර වර්ගවල නම් මාරු කරමින් ගුරුවරයා වෙනුවට සිසුවකු යොදා ගෙන මෙම ක්‍රියාකාරකම ආහාර වර්ගවල නම් පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම 4**

- සිසුන් එළිමහන් ස්ථානයකට කැටුව යන්න.
- සිසුන් ඉගෙන ගත් ආහාර වර්ගවල නම් සෑම එකක් ම නියෝජනය වන පරිදි ඔවුන් නම් කරන්න.
- පන්තියේ සිටින සිසු සංඛ්‍යාවට එකක් අඩු වන සේ පුටු රවුමක් ආකාරයට තබා පුටුවල සිසුන් වාඩි කරවන්න.
- පුටුවක් අහිමි සිසුවා රවුම මැද සිටුවන්න.
- මැද සිටින සිසුවා ඉගෙන ගත් ආහාර වර්ග අතරින් එක් ආහාර වර්ගයක නම පැවසූ විට රවුමේ සිටින සිසුන් රවුම තුළ එහා මෙහා දුවමින් තමාට හිමි ආහාර වර්ගයේ නම ශබ්ද නගා උච්චාරණය කරන අතර පුටු මාරු කර ගත යුතු ය.
- ඒ අතර රවුම මැද සිටින සිසුවා හිස් පුටුවක වාඩිවීමට උත්සහ කළ යුතු වේ.
- නැවත පුටුවක් අහිමි වන සිසුවා රවුම මැදට පැමිණ පෙර පරිදි ක්‍රියාකාරකම සිදු කළ යුතු ය.

## නිපුණතාව : අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිප දෙනෙකු නම් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සිසුන් කණ්ඩායම් පහකට බෙදන්න.
- බල්ලා, පූසා, කපුටා, ගිරවා, ලේනා යන සතුන්ගේ විශාල ප්‍රමාණයේ රූප සපයා ගන්න.
- එම රූපවල සිටින්නෝ කවුරු දැයි සිසුන්ගෙන් විමසන්න. පසු ව එක් එක් සත්ව රූපයට අදාළ දෙමළ වචනය සිසුන්ට හඳුන්වා දෙන්න.

| | | |
|---|---|---|
| **நாய்** | නායි | (බල්ලා) |
| **பூனை** | පූනෛ | (පූසා) |
| **காகம்** | කාහම් | (කපුටා) |
| **கிளி** | කිළි | (ගිරවා) |
| **அணில்** | අණිල් | (ලේනා) |

- වචන හොඳින් තහවුරු කරගන්නා තෙක් එක් එක් සිසුවකුගෙන් එම සත්තු කවුරු ද යන්න විමසා පිළිතුර ලබා ගන්න.

**ක්‍රියාකාරකම 2**

- ක්‍රියාකාරකම 1 සඳහා නිර්මාණය කළ සත්ත්ව රූප දඬු රූකඩ ආකාරයෙන් සකස් කරගන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැටුව යන්න.
- සිසුන් රවුමක් ආකාරයට සිටුවා ගුරුවරයා විසින් එක් අවස්ථාවක එක් දඬු රූකඩයක දැක්වෙන රූපය බැගින් සිසුන්ට පෙන්වන්න.
- එහි දැක්වෙන රූපයේ දෙමළ වචනය කිහිප වතාවක් කියවන්න.
- පසු ව එම සතාගේ චර්යාවන් (ගමන් කරන ආකාරය වැනි) නිරූපණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට අනෙක් සතුන්ගේ රූප ද ඉදිරිපත් කරමින් සිසුන් අදාළ වචනය උච්චාරණයටත් සත්ත්ව චර්යා අනුකරණයටත් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන් කණ්ඩායම් 5කට බෙදන්න.
- සිසුන් එකිනෙකා පසුපස එකිනෙකා සිටින සේ පේළි ආකාරයට සිටගැනීමට සලස්වන්න.
- සෑම පේළියක ම පළමු සිසුවාට සකස් කරගත් එක් සතකුගේ (සකස් කරගත්) දඬු රූකඩය බැගින් ලබා දෙන්න.
- පේළි අතරින් එක් පේළියක සිටින සිසුන්ට රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වන්න.
- තම කණ්ඩායමට ලැබී ඇති සත්ව රූපය කණ්ඩායමේ අනෙක් සිසුන්ට ද පෙනෙන සේ ඔසවන ලෙස දඬු රූකඩය අතැති සිසුවාට පවසන්න.
- පසු ව ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව එම කණ්ඩායමේ සිසුන් විසින් අදාළ සත්ත්වයාගේ නම ප්‍රකාශ කර ඊට අනුරූප යම් හැසිරීමක් ඉදිරිපත් කළ යුතු වේ.

  *උදා :* සිසුන් - **காகம்** 'කපුටා'

  'කාක්' 'කාක්' යන හඬ නගමින් පියාඹන ස්වරූපයක් ඉදිරිපත් කළ යුතු වේ.
- එම කණ්ඩායමේ සිසුන් ඉදිරිපත් කිරීම් සිදු කරන අතර අනෙක් කණ්ඩායම්වල සිසුන්ට එම සතාගේ නම කියමින් ආමන්ත්‍රණය කළ හැකි වේ.

- නැවත ගුරුවරයා ලබා දෙන සංඥාවකට අනුව සිසුන් පේලියක් ආකාරයට සිටගත යුතු ය.
- කණ්ඩායම් 5 විසින් ම මේ ආකාරයට තමාගේ කණ්ඩායමට හිමි සත්ත්ව රූපයට අදාළ නම ප්‍රකාශ කර චර්යා ඉදිරිපත් කළ යුතු වේ.
- පසු ව කණ්ඩායම් සතු සත්ත්ව රූප මාරු කරමින් සතුන්ගේ නම් හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී රවුමට පැමිණෙන කණ්ඩායමේ සිසුන්ට අනෙක් සිසුන් ලවා විධාන ද ලබා දිය හැකි වේ.

| | | |
|---|---|---|
| *උදා :* **பூனை** | පූනෛ | ඕඩුංගළ් |
| **நாய்** | නායි | තුල්ලුංගළ් |
| **காகம்** | කාහම් | නිල්ලුංගළ් |

> * දෙවන ජාතික භාෂාව ලෙස දෙමළ ඉගැන්වීමේ දි ගුරුවරයකු වශයෙන් ඔබට වැදගත් විය හැකි වචන කිහිපයක්
>
> | | | |
> |---|---|---|
> | **வேண்டாம்** | වේණ්ඩාම් | එපා |
> | **தெரியும்** | තෙරියුම් | දන්නවා |
> | **தெரியாது** | තෙරියාදු | දන්නේ නෑ |
> | **ஆம்** | ආම් | ඔව් |
> | **இல்லை** | ඉල්ලෛ | නැහැ |

.

# 5.0 සෙල්ලම් මිදුල

පළමු වන ශ්‍රේණියට පිවිසෙන දරුවන්ගේ සමබර වර්ධනයක් සඳහා බුද්ධිමය මෙන් ම ශාරීරික, චිත්තවේගී හා සාමාජික වර්ධනය ද අත්‍යවශ්‍ය යි. ඒ සඳහා පන්ති කාමරයෙන් බැහැර වින්දනාත්මක සැලසුම් ගත පරිසරයක ක්‍රියාශීලී ලෙස හැසිරීමට අවස්ථා දරුවනට තිබිය යුතු ය. පන්තියේ සියලු ම දරුවන්ට වින්දනාත්මක ක්‍රියාශීලී අවස්ථා ලබා දෙන තැනක් ලෙස සෙල්ලම් මිදුල හඳුන්වා දිය හැකි ය.

"සෙල්ලම් මිදුලේ" බොහෝ ප්‍රයෝජන තිබේ. බුද්ධි වර්ධනයෙන් ඉදිරියෙන් සිටින සමහර දරුවෝ පන්ති කාමරයේ වැඩ ඉක්මනින් නිම කරති. එයින් පසු ඔවුන්ගේ හැසිරීම් අන් දරුවන්ට කරදර සහිත යයි බොහෝ විට මැසිවිලි නැඟේ. එවැනි දරුවන් ද ගුරුවරයාට පෙනෙන තෙක් මානයේ තිබෙන ආරක්ෂාකාරී ව සැකසුණු සෙලල්ම් මිදුල වෙත යොමු කළ හැකි ය. දරුවන්ගේ ඕනෑ එපාකම්, කැමති අකමැතිකම්, හැකි නොහැකිකම් අනුව සෙල්ලම් තෝරා ගැනීමට මෙහි සීමිත අංගෝපාංග පමණක් ප්‍රමාණවත් නැත. මෙවැනි සෙල්ලම් මිදුලකට

- රිංගීමට
- පැද්දීමට
- නැඟීමට
- එල්ලීමට අවස්ථා තිබීම යෝග්‍ය ය.

**මේ අනුව සෙල්ලම් මිදුලේ දී සිසුන් නිරත වන ක්‍රියාකාරකම් මඟින්**

- රිංගීම, පෙරළීම, දිවීම, පැනීම, එල්ලීම වැනි මූලික චලන හැකියා දියුණු කෙරේ.
- සමායෝජනය, සමබරතාව, රිද්මය, නම්‍යතාවය හා නිවැරදි ඉරියව් පවත්වා ගැනීම දියුණු කළ හැකි ය.
- සිසුන්ගේ හසුරු කුසලතා දියුණුවට මඟ පෑදේ.
- සහයෝගය, සාමූහික ව කටයුතු කිරීම, බෙදා හදා ගැනීම, ඉවසීම, එකිනෙකාට උපකාර කිරීම වැනි යහපත් ගුණාංගවලට මඟ පැදේ.
- මානසික තෘප්තිය අත්වන ආකාරයට නිදහසේ ක්‍රියාකාරකම්වල නියැළීමට මෙය සුදුසු ම ස්ථානයකි.
- භාෂා සංකල්ප (ශ්‍රවණ විභේදනය, දෘෂ්ටි විභේදනය, පෙර ලිවීමේ කුසලතා, මනෝචාලක කුසලතා වැනි පූර්ව භාෂා සංකල්ප)
- ගණිත සංකල්ප සංවර්ධනය සඳහා මෙය ඉතා වැදගත් ස්ථානයකි.

*උදා :* * නැඟුම් රාමුවේ නැඟීමට සැලැස්වීම ඔවුන්ට නිදහසේ අභිමත පරිදි නැඟීමට යොමු කිරීම.

* උඩින් ම සිටින්නෝ කවු ද? ඊට පහළින් සිටින්නේ කවුද? පහළින් ම සිටින්නේ කවුද? වැනි ප්‍රශ්න අසමින් සංකල්ප වර්ධනය කළ හැකි ය.

* සීසෝව භාවිතයෙන් සිසුන්ගේ බර පිළිබඳ සංකල්පය (උඩ යට, දුර ළඟ, ඉහළ පහළ, සෙමෙන් වේගයෙන්, ලොකු කුඩා වැනි සංකල්ප ... ) සාධනය කළ හැකි ය.

* පටිපාටිගත කිරීම පිළිබඳ ගණිත පාඩමට පෙර ටයර් මං පෙතෙහි සිසුන් ක්‍රියාකාරී ව යෙදවිය හැකි ය.


සෙල්ලම් මිදුල ප්‍රාථමික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රවල සංකල්ප වර්ධනය සඳහා ඉවහල් වන ආකාරයට භාවිත කිරීම වැදගත් ය. ඒ සඳහා සෙල්ලම් මිදුලේ උපකරණ භාවිත කරන විට ගුරුවරයාගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වෙයි. විශාල මාංස පේශි වර්ධනය, ස්නායු පේශි සමායෝජනය ආදී ශාරීරික වර්ධනයට යොමු වන ක්‍රියාකාරකම්වල යෙදෙන අතර ම සංකල්ප වර්ධනය කළ හැකි ය.

ඒ සඳහා දරුවන්ගේ වර්ධනයට තුඩු දෙන තවත් අංගෝපාංග එකතු කරමින් සෙල්ලම් මිදුල සංවර්ධනය කිරීම නිර්මාණශීලී ගුරුවරයාට පැවරෙන අභියෝගයකි.

පහත දැක්වෙන උදාහරණ ඇසුරෙන් සෙල්ලම් මිදුල ඵලදායී ආකාරයෙන් යොදාගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ව විමසා බලමු.

*නිද :* පළමු වන ශ්‍රේණිය

මවුබස විෂයයෙහි දී අතෙහි සියුම් මාංස පේශි හසුරුවමින් රූල් අතර අකුරු ලිවීමට සිදු වේ. මෙම හැකියාව වර්ධනය සඳහා අක්ෂර ලිවීමට පෙර හා එයට සමගාමී ව විශාල පේශි හසුරුවමින් වැඩි ඉඩකඩක් තුළ සිය ශරීරය මැනවින් හැසිරවීමට සිසුන් හුරු වීම අවශ්‍ය ය.




**ගුරුවරයාට මැදිහත් විය හැකි ආකාරය**

කාට ද පුළුවන් උමග තුළින් උමගේ නොගැටී යන්න.
කාට ද පුළුවන් ටයර්වල නොගැටී රිංගන්න.

*නිද :* මවුබස - පිල්ලම් භාවිතය

පිල්ලම් අකුරේ උඩ යට හා පැත්තෙන් ලිවීමට සිදුවේ. එබැවින් රවුමේ දරුවන් සිටින තැන් පිළිබඳව ගුරුවරයා මැදිහත් ව හුරු කිරීමෙන් සංකල්ප වර්ධනය යොමු වේ.




සමන් ඉන්නේ නිමාලිට ඉහළින් ද පහළින් ද?
දෙවනු ව සමන්ට ඉහළට නැගීමට සලස්වන්න.
දැන් මෙසේ ඇසිය හැකි ය.
සමන් දැන් ඉන්නේ නිමාලිට ඉහළින් ද පහළින් ද?

**ගණිත සංකල්ප - පටිපාටිගත කිරීම**
පිටුපසින් තිබෙන ටයරය ලොකු ම එක ද? පොඩි ම එක ද?




2 වන ශ්‍රේණියේ දී මෙම තත්ත්වය තව දුරටත් දියුණු කළ යුතු වේ. එක් එක් උපකරණය භාවිත කිරීමට යොදා ගන්නා සේ සකස් කර ගත හැකි ය.

නිදː සිසුවා තබන පියවරට අනුව, අනෙක් සිසුන් වාරයක් බැගින් අත් පොළසන් දෙන අතර එක ම අනුරූපතාව ඇති කිරීම




**ගණිත සංකල්ප අභිමත ඒකකවලින් දිග මැනීම**
නිදː අනෙක් කෙළවරට තව පියවර කීය ද?



**ගණිත සංකල්ප - සාපේක්ෂ පිහිටීම**

නිද : පළවෙනි පොල් කට්ටට වඩා තුන්වෙනි පොල් කට්ටට
නැග්ග විට කොපමණ උසක් නැග ඇත් ද?



**ගෙදර වැඩ පැවරීම**

පාසල් කාලය වෙන් කිරීම පවා සිදු කරන්නේ සිසුන්ගේ පරිණතිය පිළිබඳ මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාපනික මූලධර්ම පදනම් කර ගනිමිනි. පළමු වන ප්‍රධාන අවධියේ සීමිත පැය ගණනකට පාසල් කාලය සීමා වන්නේ ඒ අනුව ය.

ගෙදර වැඩ පැවරීමේ දී මේ පිළිබඳ දැඩි වගකීමකින් කටයුතු කළ යුතු ය. මවුබස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ආගම යන විෂය හතරක ගෙදර වැඩ එක වර පැවරූ විට, මේ සියල්ලට ම බඳුන් වන්නේ එක ම සිසුවකු හා සිසුවියක නිසා ඔහු හෝ ඇය දැඩි පීඩාවකට පත් වේ. එබැවින් ගෙදර වැඩ පවරන විට ශිෂ්‍යයාගේ පරිණතියට ඔරොත්තු දෙන අත්‍යවශ්‍ය ම වැඩ සුළු ප්‍රමාණයක් පමණක් පැවරීමේ වගකීම ගුරුවරයාට පැවරෙයි. දින පතා සිය දරුවන්ගේ ගෙදර වැඩ සඳහා කාලයක් වෙන් කළ හැක්කේ ඉතා ම් සීමිත දෙමාපිය පිරිසකට පමණකි.

සීමිත කාලයක් තුළ පාසල් පරිසරයෙන් පමණක් ලබා දිය නොහැකි ඉගෙනුම් අත්දැකීම් සඳහා අවශ්‍යම අවස්ථාවල දී ගෙදර වැඩ පැවරීම කළ හැකි ය. එහෙත් ඒවා පැහැදිලි ව හා නිවැරදි ව යොමු කිරීම ද ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම ද කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

# 6.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## 1.0 හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් සඳහා ඵලදායී වූ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරු මහත්ම-මහත්මීන්ට සිසුන් ඉගෙනීමේ දී පෙන්නුම් කරන දුෂ්කරතා හා දක්ෂතා පිළිබඳ ව සුවිශේෂී අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව පන්තියේ සිටින සියලු ම සිසුන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් ක්‍රම සංවිධානය කළ හැකි ය. මේ පුළුල් අරමුණෙන් පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් හඳුන්වා දිය හැකි ය. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් තක්සේරු කිරීමේ, විවිධ අරමුණු තිබේ. ස්ථාපන කාර්ය, අනාවරණ කාර්ය, උපදේශන කාර්ය, සහතික පත් ප්‍රදානය කිරීම හා පර්යේෂණ කාර්ය මෙහි දී ප්‍රධාන වේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීම ප්‍රධාන වශයෙන් ම අනාවරණය හා උපදේශනය යන කරුණු මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුහු ඉගෙනීමේ දි බොහෝ ගැටලු පෙන්නුම් කරති. ගුරු මහත්ම මහත්මීන් උගන්වන අතරතුර ඒවා හොඳින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම අවශ්‍ය ය. තම පන්තියේ සිටින එක් එක් ශිෂ්‍යයා සුවිශේෂ ලෙස මුහුණ පාන ගැටලු හඳුනාගෙන ඒ එක් එක් ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයට ඉගෙනුම් කටයුතු සංවිධානය කිරීම අවශ්‍ය ය. ඒ මඟින් සෑම සිසුවකු ම විෂයමාලාවෙන් අපේක්ෂිත නිපුණතා කරා කැටුව යාමට ගුරුවරුනට පුළුවන. සිසුන් පළමු වැනියා දෙවැනියා වශයෙන් තරා කිරීම හෝ දක්ෂ සිසුන් හා දුර්වල සිසුන් වශයෙන් වර්ග කිරීම හෝ වැනි කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ අරමුණු නොවේ.

## 2.0 සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපාය

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපාය ප්‍රධාන කරුණු දෙකක් යටතේ හඳුන්වා දිය හැකි ය.

### 2.1 සිසු ප්‍රගතිය විධිමත් ලෙස තක්සේරු කිරීම

ඉගැන්වීමේ ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට පූර්ව සූදානමකින් හා සැලසුමකින් යුතු ව මුළු අවධානය ම ඒ කෙරෙහි යොමු කොට කරනු ලබන තක්සේරු කිරීම විධිමත් තක්සේරු කිරීම වශයෙන් හැඳින්විය හැකි ය. ඒ යටතේ විධිමත් පරීක්ෂණ හා ක්‍රියාකාරකම් භාවිත කෙරේ.

### 2.2 සිසු ප්‍රගතිය අවිධිමත් ක්‍රමෝපාය භාවිත කර තක්සේරු කිරීම

සිසුන් ඉගෙනීමේ යෙදී සිටින අතරතුර ම ඊට බාධා නොවන ආකාරයෙන් තොරතුරු රැස් කිරීම මෙහි දී සිදු කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කිරීම, සිසුන් සමඟ තනි තනි ව හෝ කාණ්ඩ වශයෙන් හෝ සාකච්ඡා කිරීම, සිසුන් වැඩවල නිරත ව සිටින අතරතුර ඔවුන්ගේ වැඩ නිරීක්ෂණ කර තොරතුරු ලබා ගැනීම, සිසුන්ගේ ගෙදර වැඩ ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමෝපාය භාවිත කරනු ලැබේ. මෙහි දී ගුරුවරයාගේ වෘත්තීය භාවය අතිශයෙන් වැදගත් වේ. ගුරුවරයා විසින් ගනු ලබන විනිශ්චයයන් වඩාත් නිවැරදි ව ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතු ව කටයුතු කිරීම අවශ්‍ය ය. අවිධිමත් ක්‍රමෝපාය මඟින් සිසුන් පිළිබඳ ව විස්තරාත්මක වූත් ගුණාත්මක වූත් තොරතුරු ලැබෙන හෙයින් ඒවා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී වනු ඇත. සිසුන් පිළිබඳ ව ගුරුවරුන් අවිධිමත් ලෙස ගන්නා තීරණවල වලංගුතාව ද ඉතා ඉහළ බව බොහෝ පර්යේෂණ මඟින් අනාවරණය වී ඇත.

## 3.0 තක්සේරු කිරීමේ විවිධ ස්වරූපයන්

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වනුයේ නිර්ණායක මූලික තක්සේරු කිරීම වේ. මෙහි දී ගුරුවරයා මුල් කරගත් අවිධිමත් ක්‍රමවේද කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

තක්සේරු කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සිදු කළ හැකි ය. ඒ අනුව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්භවන තක්සේරු කිරීම හා සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් වර්ග කළ හැකි ය.

**සම්භවන තක්සේරු කිරීම**

යම් ඉගෙනුම් අදියරක් අතරතුර දී නිරන්තරයෙන් සිසු ඉගෙනුම් දක්ෂතා හා දුබලතා පිළිබඳ ව සොයා බැලීම සම්භවන තක්සේරු කිරීම යි. අඛණ්ඩ තක්සේරු කිරීම යනුවෙන් ද මෙය හඳුන්වනු ලබයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලුවලට ඉතා ම ප්‍රායෝගික විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය ය. එසේ නැතහොත් සිසුන් ලබන අසාර්ථකත්වය ඔවුන් තව දුරටත් පසුබට සිසුන් බවට පත් කිරීමට හේතු වේ. එහෙයින් සිසුන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් සැලකිය යුතු ය.

**සම්පිණ්ඩිත තක්සේරු කිරීම**

ඉගෙනුම් අදියරක් අවසානයේ යම් ඉගෙනුම් කොටසක් කොතෙක් දුරට සාධනය කරගෙන ඇත් ද යන්න පරීක්ෂා කිරීම සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ඒ අනුව වාරයක් අවසානයේ හෝ අවුරුද්දක් අවසානයේ හෝ එම අවුරුද්ද තුළ උගන්වන ලද විෂය කරුණු අලළා සකස් කළ ප්‍රශ්න පත්‍රයක් මඟින් සිසුන් ලබාගත් ප්‍රගතිය තක්සේරු කළ හැකි ය. එහෙත් මෙවැනි තක්සේරු කිරීමක් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වඩාත් යෝග්‍ය යැයි නිර්දේශ කිරීම අපහසු ය.

**නිර්ණායක මූලික තක්සේරු කිරීම**

විෂයමාලාවේ අන්තර්ගතය හා නිපුණතා අනුව සකස් කරගත් ඉගෙනුම් පල කරා සිසුන් ළඟා වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම නිර්ණායක මූලික තක්සේරු කිරීම යි. ප්‍රාථමික ශ්‍රේණි සඳහා පිළියෙළ කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ මවුබස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සහ පොදු තක්සේරු කිරීමේ පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර එක් එක් පත්‍රිකාවක් සඳහා සකස් කළ තක්සේරු කිරීමේ දී අවධානය යොමු කළ යුතු ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත.

පහත දක්වා ඇත්තේ ගණිතය, මවුබස, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සහ පොදු තක්සේරු කිරීම සඳහා සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක කිහිපයකි.

**ගණිතය** - *උදා* : තරමින් වෙනස් වූ ද්‍රව්‍ය හෝ රූප හෝ තුනක් පටිපාටියට තබයි.
**මවුබස** - *උදා* : සරල වැකි ශබ්ද නඟා කියවයි.
**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්** - *උදා* : යහපැවැත්ම සඳහා සෞඛ්‍ය පුරුදු ප්‍රදර්ශනය කරයි.
**පොදු තක්සේරුව** - *උදා* : අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි.

## 4.0 කාර්ය සාධන ගොනුව

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ඉතා ම ඵලදායී ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනු සලකනු ලැබේ. සිසුන් ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලු, ඔවුන් තුළ තිබෙන දක්ෂතා අඛණ්ඩ ව ඇගයීමේ ක්‍රමයක් වශයෙන් මෙය වැදගත් වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බොහෝ ගුරුවරුන් එක් එක් සිසුන්ගේ වැඩ වෙන වෙන ම ගොනුවල එකතු කිරීම පුරුද්දක් වශයෙන් කරනු ලැබේ. එහෙත් කාර්ය සාධන ගොනුව මෙයට වඩා ඉදිරියට ගිය ක්‍රියාවලියක් සේ සලකනු ලැබේ. ඒ අනුව කාර්ය සාධන ගොනුව සිසුන්ගේ දක්ෂතා මෙන් ම ඔවුන් ඉගෙනීමේ මුහුණ පාන ගැටලු නිරූපණය වන ආකාරයට ඉතා අර්ථාන්විත ලෙස සකස් කළ සිසුන්ගේ වැඩ එකතුවක් ලෙස සලකනු ලැබේ. එය සිසුවා පිළිබඳ ව පැහැදිලි අදහසක් දක්වන සුළු දෙයක් විය යුතු ය. කාර්ය සාධන ගොනු පිළියෙළ කිරීම ගුරුවරයාගෙන් ගුරුවරයාට වෙනස් විය හැකි ය. නිශ්චිත

ක්‍රමයක් දැක්වීම අසීරු ය. නිර්මාණාත්මක ගුරුවරයකුට තමා ගේ ම ක්‍රමයක් අනුගමනය කරමින් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධන ගොනුවක් සකස් කළ හැකි ය. කාර්ය සාධන ගොනුවකට ඇතුළත් කළ හැකි දේ මොනවා ද? බොහෝ දුරට ඒවා සිසුන්ගේ වැඩවල නියැදි, ලියු ලේඛන, සාදන ලද ගණන්, අඳින ලද චිත්‍ර, කරන ලද නිර්මාණ විය හැකි ය. එසේ ම ගුරුවරයා විසින් ලියන ලද කෙටි සටහන් ද එයට ඇතුළත් කළ හැකි ය.

## 5.0 කෙටි සටහන් ලිවීම හා පිරික්සුම් පත් භාවිත කිරීම

සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනීමේ ගැටලු හඳුනා ගැනීමේ දී එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන තොරතුරු කෙටි සටහන් වශයෙන් තබා ගැනීම ද බොහෝ ප්‍රයෝජනවත් වේ. පන්තියේ උගන්වන අතරතුර දී සිසුන් පිළිබඳ ව තොරතුරු සමුදායක් ගුරුවරුන්ට ලැබේ. එහෙත් මෙම තොරතුරු අර්ථාන්විත ලෙස ප්‍රයෝජනයට ගැනීමක් බොහෝ විට සිදු නොකෙරේ. එ නිසා සිසුන් පිළිබඳ ව අනාවරණය කරගන්නා තොරතුරු පොතක කෙටි සටහන් වශයෙන් තබාගෙන ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගත හැකි ය.

පිරික්සුම් ලැයිස්තු ද එසේ ම ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයකි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති නිර්ණායක කරා සිසුන් ළඟා වී ඇත් දැයි තීරණය කිරීම සඳහා ඒ පිරික්සුම් ලැයිස්තු උපයෝගී කර ගත හැකි ය.

## 6.0 තක්සේරු කිරීමේ පත්‍රිකා හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු සටහන් කර වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති හතරක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කර ඇත. ඒවා මවුබස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොදු තක්සේරු පත්‍රිකා ලෙස නම් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සටහන් කළ යුතු ය. පොදු තක්සේරු පත්‍රිකාවේ තක්සේරු කිරීමට භාජනය කළ යුතු බොහෝ "ඉගෙනුම් පල" වසර පුරා ම සොයා බැලිය යුතු අයුරින් විහිදී ඇත. මෙහි දී එක් වාරයකට එක් සිසුවකුට එක් කොටුවක් බැගින් යොදා ගැනීමට හැකි වන පරිදි ඉගෙනුම් පලයකට කොටු තුන බැගින් වෙන් කර තිබේ.

එක් එක් සිසුවා සම්බන්ධයෙන් එක් එක් ඉගෙනුම් පලය යටතේ ඔබ රැස් කළ තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ආකාරයට සංකේත යෙදීමෙන් වාර්තා කළ හැකි ය.

| **තීරණය** | **සංකේතය** |
|---|---|
| සාර්ථක ව කරයි | √ |
| දුෂ්කරතා පෙන්නුම් කරයි/ තව දුරටත් උදවු අවශ්‍යයි | • |

යම් ඉගෙනුම් පලයක් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් පලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත් නිර්ණායක උපයෝගී කර ගැනීමට හැකි ය.

පන්තියේ සියලු ම සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ ව ගනු ලබන තීරණ එක ම නිර්ණායක කට්ටලයක් මත පදනම් කර ගනු ලැබූ විට ඒවායේ ඒකාකාර බවක් ඇති වන හෙයින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වීමට අපහසු විය හැකි ය.

## 7.0 අනාවරණය හා ප්‍රතිකාර්ය

අවිධිමත් - සම්භවන තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වන්නේ අනාවරණයයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රයේ "●" සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය. සිසුවා මුහුණ දෙන දුෂ්කරතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදා නැවත තක්සේරු කිරීමට භාජන කළ යුතු ය. එම "●" සංකේතය, අනතුරු ව "√" සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගකීම යි.

හඳුනා ගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මඟ හැරවීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම ද වැදගත් ය. මේවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය විය හැකි ය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු "●" සංකේත ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකි ය. ඒවා හඳුනාගෙන සුදුසු ක්‍රියා මාර්ග ගෙන සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 8.0 වෙනත් කරුණු

- එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් ආධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වළකින්න.
- එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොතරම් ළඟා වී ඇත් දැයි සොයා බැලිය යුතු ය.
- තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට තක්සේරුකරණ සකස් කිරීමට පන්තිය භාර ගුරුවරයා ම සමත් විය යුතු ය.

## මව්බස තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

| තක්සේරු කිරීමේ පරිමාණය | |
|---|---|
| සාර්ථක ව කරයි | ✓ |
| දුෂ්කරතා පෙන්නුම් කරයි | |
| තව දුරටත් උදවු අවශ්‍ය යි | • |

| | | | | | | | සිසුන්ගේ නම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 1. පවසන දෙයට අවධානයෙන් යුතු ව සවන් දෙයි. |
| | | | | | | | 2. පවසන දේ පිළිබඳ අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි. |
| | | | | | | | 3. වචනවල ශබ්දමය වෙනස අවබෝධය සඳහා අවධානයෙන් යුතු ව සවන් දෙයි. |
| | | | | | | | 4. ළමා නිර්මාණවලට වින්දනාත්මක ව සවන් දෙයි. |
| | | | | | | | 5. අන් අයගේ අදහස්වලට සංයමයෙන් යුතු ව සවන් දෙයි. |
| | | | | | | | 6. ළමා කවි/ගීත තාලයට ගායනා කරයි. |
| | | | | | | | 7. මුල, මැද, අග ගැළපීමකින් යුතු ව කතන්දර පවසයි. |
| | | | | | | | 8. තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව ප්‍රකාශ කරයි. |
| | | | | | | | 9. අන් අයගේ අදහස්වලට සංයමයෙන් පිළිතුරු සපයයි. |
| | | | | | | | 10. පවසන දේ අවබෝධ කරගෙන ඊට අදාළ ව තම අදහස එක් කරයි. |
| | | | | | | | 11. ප්‍රශ්නාර්ථ ලකුණට අනුගත ව සරල වැකි කියවයි. |
| | | | | | | | 12. කොමාවට අනුගත ව සරල වැකි කියවයි. |
| | | | | | | | 13. නිවැරදි ව වචන ශබ්ද කර කියවයි. |
| | | | | | | | 14. එක් එක් වචනයක් කෙරෙහි අවධානයෙන් යුතු ව කියවයි. |
| | | | | | | | 15. නිවැරදි උච්චාරණයෙන් යුතු ව සරල වැකි කිහිපයකින් යුතු කුඩා ඡේද කියවයි. |
| | | | | | | | 16. අකුරුවල නිවැරදි බව කෙරෙහි සැලකිලිමත් ව ලියයි. |
| | | | | | | | 17. ලිවීමේ දී කොමාව උචිත පරිදි වැකිවල යොදයි. |
| | | | | | | | 18. ප්‍රශ්නාර්ථ ලකුණ නිවැරදි අර්ථ ගැන්වීමකට වාක්‍ය අවසානයේ යොදයි. |
| | | | | | | | 19. සරල වැකි දෙකක් නිවැරදි ව ලියයි. |
| | | | | | | | 20. උපදෙස් අවබෝධ කරගෙන සරල ලිඛිත ක්‍රියාකාරකම්වල යෙදෙයි. |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

| | | | | සිසුන්ගේ නම<br>තක්සේරු කිරීමේ පරිමාණය<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>තවදුරටත් උදවු අවශ්‍යයි • |
|---|---|---|---|---|
| | | | | 1. පාසල් පරිසරය අලංකාරව, පිරිසිදු ව හා ක්‍රමවත් ව පවත්වාගෙන යාමට දායක වෙයි. |
| | | | | 2. ස්නායු, පේශී සමායෝජනය සඳහා සෙල්ලම් මිදුලේ උපකරණ භාවිත කරයි. |
| | | | | 3. දෙමව්පියන් හා නිවසේ සිටින අනිකුත් සාමාජිකයින් තම යුතුකම්-වගකීම් ඉටු කිරීම සඳහා සිදුකරන කටයුතු විස්තර කරයි. |
| | | | | 4. අවට පරිසරයේ සතුන් බාහිර ස්වරූපය අනුව සරල ව වෙන්කර දක්වයි. |
| | | | | 5. අවට පරිසරයේ ගැවසෙන සතුන් නිරීක්ෂණය කර, එම සතුන්ගේ චර්යාවන් වාර්තා කරයි. |
| | | | | 6. විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ව ආකෘති හා චිත්‍ර නිර්මාණය කරයි. |
| | | | | 7. රෝගවලින් ආරක්ෂා වීම සඳහා යහපත් ආහාර පුරුදු පවත්වා ගනියි. |
| | | | | 8. ශරීර ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වන චලන ගවේශන ක්‍රියාකාරකම්වල යෙදෙයි. |
| | | | | 9. අවුරුදු චාරිත්‍රවල නියැලීමෙන් තමන්ට හා සමාජයට සිදුවන ප්‍රයෝජන විස්තර කරයි. |
| | | | | 10. ශාරීරික සමබරතාව පවත්වා ගනිමින් දෛනික කටයුතුවල යෙදෙයි. |
| | | | | 11. ස්වභාවික ආලෝකයේ බලපෑම නිසා පරිසරයේ විවිධ දේවල සිදුවන වෙනස්කම් සොයා බලයි. |
| | | | | 12. වැස්ස, සුළඟ නිසා ආසන්න පරිසරයේ සිදුවන අහිතකර බලපෑම් අවම කර ගැනීමට දායක වෙයි. |
| | | | | 13. සුළඟ ආධාරයෙන් ක්‍රියාකරවිය හැකි උපකරණ නිර්මාණය කර භාවිත කරයි. |
| | | | | 14. ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ව භාවිත කිරීමට කටයුතු කරයි. |
| | | | | 15. ජලය තැනකින් තැනකට ගෙන යා හැකි ක්‍රම අත්හදා බලයි. |
| | | | | 16. දෛනික පවිත්‍රතාව නිසි පරිදි පවත්වා ගැනීම සඳහා ජලය භාවිතයට ගනියි. |
| | | | | 17. පාසලේ කටයුතුවල දී යහපත් හැසිරීම් ප්‍රදර්ශනය කරයි. |
| | | | | 18. පාසලේ පොදු නීති රීතිවලට අනුගත ව ක්‍රියා කරයි. |
| | | | | 19. මැහුම් සම්බන්ධ මූලික හුරුකම් ලබයි. |
| | | | | 20. වෙළෙඳ පොළක දී කටයුතු කළ යුතු අයුරු හඳුනාගෙන ප්‍රකාශ කරයි. |
| | | | | 21. හිරු එළියෙන් සිදු වන බලපෑම් පිළිබඳ අත්දැකීම් විස්තර කරයි. |
| | | | | 22. අහසේ සුන්දරත්වය පිළිබඳ කියවෙන සරල කවි, ගී ප්‍රකාශනාත්මක චලන සහිත ව ගායනා කරයි. |
| | | | | 23. උදවු අවශ්‍ය අය සඳහා උදවු කිරීමට ඉදිරිපත් වෙයි. |
| | | | | 24. අනාගත අවශ්‍යතා සඳහා සම්පත් ඵලදායී ව භාවිත කරයි. |
| | | | | 25. තොරතුරු නිවැරදි ව ලබා ගැනීමේ හා ලබා දීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. |
| | | | | 26. අභිරූපණ මගින් සිදුකරන භාව ප්‍රකාශන මනාව සන්නිවේදනය කරමින් වින්දනයක් ලබයි. |
| | | | | 27. මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයේ සිදු වී ඇති අයහපත් වෙනස්කම් සහිත ස්ථාන යහපත් ස්ථාන බවට පත් කර ගැනීමට කටයුතු කරයි. |
| | | | | 28. අවට පරිසරයේ ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා පසට සිදු වී ඇති හානි වලක්වා ගැනීමට කටයුතු කරයි. |
| | | | | 29. මිනිසුන් ජීවිකාව සඳහා සිදු කරන විවිධ කාර්යයන්වලින් ඉටුවන සේවයේ අගය ප්‍රකාශ කරයි. |
| | | | | 30. ආසන්න පරිසරයේ මිනිසුන් වැඩ කරන ස්ථාන පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි. |

## පොදු තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

| | | | | |
|---|---|---|---|---|
| | | | | සිසුන්ගේ නම<br>තක්සේරු කිරීමේ පරිමාණය<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>තවදුරටත් උදවු අවශ්‍යයි • |
| | | | | 1. පන්තියේ දී අන් අය කෙරෙහි ගරුත්වයෙන් යුතු ව ක්‍රියා කරයි. |
| | | | | 2. බෙදා හදාගෙන කටයුතු කිරීමේ අගය ප්‍රකාශ කරයි. |
| | | | | 3. පෞද්ගලික පිරිසිදුකම ගැන සැලකිලිමත් ව කටයුතු කරයි. |
| | | | | 4. තමා අවට පරිසරය පිරිසිදු කර ගැනීමට දායක වෙයි. |
| | | | | 5. අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි. |
| | | | | 6. අන්‍යයන් සමඟ සුහද ව කතා බහ කරයි. |
| | | | | 7. සුහද ලෙස අන්‍යයන්ගෙන් උදවු ලබා ගනියි. |
| | | | | 8. පරිසරයට ආදරය කරයි. |
| | | | | 9. නිමාවක් දකින තුරු අවධානයෙන් වැඩ කරයි. |
| | | | | 10. උපකරණ නිවැරදි ව භාවිත කරයි. |
| | | | | 11. පාවිච්චියෙන් පසු උපකරණ නිසි තැන තබයි. |
| | | | | 12. වැඩක් අවසානයේ උපකරණ හා ස්ථානය පිරිසිදු කරයි. |
| | | | | 13. ආරක්ෂාව ගැන සැලකිලිමත් ව කටයුතු කරයි. |
| | | | | 14. ස්වයං ඉගෙනුමට කැමැත්තක් දක්වයි. |
| | | | | 15. උචිත අවස්ථාවල දී සරල දෙමළ වචන භාවිත කරයි. |
| | | | | 16. අවස්ථානුකූල ව දෙමළ බසින් සුබ පැතුම් වදන් භාවිත කරයි. |

# 7.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

## 1.0 හැඳින්වීම

නිපුණතාවක් යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ දැනුම, කුසලතා, ආකල්ප හා හරවල සංකීර්ණ සංකලනයකට ය. විවිධ ආකාරයේ නිපුණතා තිබිය හැකි ය. සමහර නිපුණතා කුසලතා වැඩියෙන් බර වූ ඒවා වන අතර තවත් සමහරක් දැනුම හෝ ආකල්ප හෝ දිශාවලට වැඩියෙන් බර වූ ඒවා වීමට ඉඩ ඇත.

1 වන ප්‍රධාන අවධිය අවසන් කරනු ලබන සිසුන් **අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය ලබා ගෙන ඇතැයි තහවුරු කිරීමක්** කළ යුතු බව නව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා සැලැස්මෙහි සඳහන් කර ඇත. පැහැදිලි ව අවබෝධ කර ගත යුතු කරුණු කිහිපයක් මෙම ප්‍රකාශයේ ඇතුළත් ව ඇත.

එනම්

- අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?
- 1 වන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?
- ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

මේ එක එකක් පිළිබඳ ව විස්තර වශයෙන් විමසා බලමු.

## 2.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?

විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී එහි අන්තර්ගතය තේරීමට වැදගත් ස්ථානයක් හිමි වේ. විවිධ හැකියා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි සරල මෙන් ම සංකීර්ණ නිපුණතා, විෂයමාලාවකට සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලැබේ.

1 වන ප්‍රධාන අවධිය අවසන් කිරීමට ප්‍රථම 2 වන ශ්‍රේණියේ සෑම සිසුවකු ම පාහේ අනිවාර්යයෙන් ම ඉහළ මට්ටමක දක්ෂතා ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා සමූහයක් විෂයමාලා අන්තර්ගතයේ අඩංගු ව ඇත. සෑම සිසුවකු ම විසින් ප්‍රගුණ කළ යුතු යැයි අපේක්ෂා කරන මෙම නිපුණතා අප විසින් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ගණයට අයත් වනුයේ

- ඉගෙනුම තව දුරටත් ගොඩ නැඟීමට හා පවත්වාගෙන යැමටත්,
- යහපත් පුරවැසියකු ලෙස සාර්ථක ව ජීවත් වීමටත් අනිවාර්යයෙන් ම අවශ්‍ය නිපුණතා වේ.

සැමට අධ්‍යාපනය ලබා දීමේ සම්මුතිය යටතේ සියලු ම සිසුන් තුළ අඩු ම වශයෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වර්ධනය කරවීමට අප බැඳී ඇත.

පන්තියේ සියලු ම සිසුන් ගෙන ආ යුතු ඉහළතම ප්‍රාප්ති මට්ටම ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කිසි විටෙකත් සැලකිය යුතු නොවේ. වඩා දක්ෂ සිසුන් විසින් වර්ධනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන එහෙත්, සියලු ම සිසුන් සඳහා අත්‍යවශ්‍ය යැයි නොසැලකෙන ඉහළ මට්ටමේ නිපුණතා සමූහයක් ද විෂයමාලා අන්තර්ගතයෙහි ඇත. ඒවා අභිමත ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ.

ගුරුවරයාගේ අරමුණ විය යුත්තේ පන්තියේ සෑම සිසුවකු තුළ ම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉහළ මට්ටමකට වර්ධනය කරන අතර, සිසුන් වැඩි දෙනකු තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමට පියවර ගැනීම ය.

## 3.0 පළමු වන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?

පළමු වන ප්‍රධාන අවධිය අවසන් කරන සිසුන් විසින් ඉහළ මට්ටමක හැකියාවන් ප්‍රදර්ශනය කළ යුතු යැයි අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයක් හඳුනාගෙන ඇත. මේ හඳුනා ගැනීමේ දී 1 වන හා 2 වන ශ්‍රේණියේ විෂය නිර්දේශ සම අනිකුත් විෂයමාලා ද්‍රව්‍ය ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, කථිකාචාර්යවරුන්, විෂයමාලා සංවර්ධනයන් සහ ප්‍රවීණ අධ්‍යාපනඥයන් රැසකගේ අදහස් සැලකිල්ලට භාජන කරන ලදි. එමෙන් ම වෙනත් රටවල ප්‍රකාශයට පත් කර ඇති මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රාප්ති මට්ටම් ද අධ්‍යයනය කරන ලදි.

හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහය විෂයයන් වශයෙන් වෙන් වෙන් ව නොව, පොදු ලැයිස්තුවක් වශයෙන් සකස් කර ඇත. එම ලැයිස්තුව තුළ සන්නිවේදනයට, පෞරුෂත්වයට, පරිසරයට, වැඩ ලෝකයට සූදානම් වීමට, ආචාරධර්ම හා ආගමට, ක්‍රීඩා විවේකයට සහ ඉගෙනුමට ඉගෙනීමට අදාළ නිපුණතා අන්තර්ගත ය.

## 4.0 ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

යම් නිපුණතාවකට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප පිළිබඳ ව උසස් මට්ටමේ හැකියා ප්‍රදර්ශනය කරනු ලබන සිසුවකු එම නිපුණතා ප්‍රවීණයකු ලෙස මෙහි දී පිළිගැනෙනු ඇත. උසස් මට්ටමක හැකියාවක් ලබා තිබේ දැයි තීරණය කිරීමට තක්සේරු කිරීම් මඟින් රැස් කළ විවිධ ආකාරයේ තොරතුරු සහ අදාළ නිර්ණායක එක් එක් නිපුණතාවට අදාළ ව සලකා බැලීමට සිදු වෙනු ඇත.

යම් නිපුණතාවක් සම්බන්ධ ව ප්‍රවීණ මට්ටමට පැමිණි සිසුවකු තුළ දක්නට ලැබිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- එම නිපුණතාවට අදාළ ඊළඟ ඉහළ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව තව දුරටත් ඉගෙනීමට පෙලඹීමක් ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව තමා තුළ ආත්ම විශ්වාසයක් ඇති බව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට සම්බන්ධ දැනුම හෝ කුසලතා හෝ තවත් අයකුට පැහැදිලි කර දීමට හෝ ඉගැන්වීමට හෝ හැකියාවක් පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව විශේෂ උනන්දුවක් හෝ ආශාවක් හෝ දක්වන බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව සම්බන්ධ ගැටලුවකට මුහුණ පෑ විට එය ස්වාධීන ව විසඳා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට අදාළ කාර්ය බොහෝ දුරට නිවැරදි ව කරයි.
- ආකල්පවලට අදාළ නිපුණතාවක් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි.

## 5.0 නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දී ම සිදු කළ යුත්තකි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනාගෙන ඇත.

(අ) අවිධිමත් තක්සේරු ක්‍රම මඟින් අඛණ්ඩ ව රැස් කර වාර්තා කර ඇති තොරතුරු පමණක් ඇසුරෙන් තීරණයක් ගැනීම. (සම්භවන තක්සේරු තොරතුරු පමණි)

(ආ) ඉහත (අ) හි සඳහන් තොරතුරුවලට අමතර ව සම්පිණ්ඩිත තක්සේරු කිරීමක් හෝ වැඩි ගණනක් හෝ ඇසුරෙන් තීරණයක් ගැනීම.

ඉහත සඳහන් ක්‍රම භාවිත කර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟා වී ඇත් ද යන්න පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධයෙන් පිළියෙළ කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගත ව ඇත.